

# මකරන්ද

[illegible] මල්ලවආරච්චි

# 01

උදිත් මුදියන්සේ නවදිල්ලියේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයෙන් හා ලක්නව්හි භාත්ඛණ්ඩ ආයතනයෙන් සම්මාන සහිත උපාධි ලැබ ලංකාවට ආවේ මේ මෑතකය. කුඩා කල සිටම සෞන්දර්ය විෂයනට ඇලුම් කළත් මෙතරම් දුර ගමනක යෙදීමට ඔහු සිතා සිටියේ නැත.

නැසී යන පාරම්පරික නැටුම් හා සංගීත කලාව ආරක්ෂා කිරීමේ තදබල ඕනෑකමක් උදිත්ගේ පියාවන මුදියන්සේට තිබුණි.

ලොකු පුතා වන නිහාල් වෛද්‍ය පීඨයට ඇතුළත්ව දැන් රජයේ රෝහලක වෛද්‍යවරයෙක් මෙන් සේවය කරයි. දෙවැන්නා ඉංජිනේරුවෙක් ලෙසද නෙවැත්තිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ කථිකාචාර්යවරියක ලෙස සේවය කරයි. පවුල් බාලයා වන උදිත් පියාගේ කලාවන් හැදෑරීම පිළිබඳ ලොකු අයියා හා පොඩි අයියා කිසිසේත් කැමති වූයේ නැත.

පවුලේ වැඩිමලා වන සුදේශ්ට නුවර සිටින පියා බැලීමට ඒමටවත් වෙලාවක් නැත. හෙතෙම සිංහල ජාතික පක්ෂයක විධායක සභාවේ සිටින උද්යෝගිමත් නායකයෙකි. ඔහු පවසන පරිදි සිංහල ජාතිවාදීන් බිහිවීමට උචිත භෞතික පරිසරයක් රටේ ඇත.

දෙවැන්නා වන ජගත් පුනරුත්ථාපනයට අදාල රාජ්‍ය

විපතට පත් ප්‍රදේශවල ආයතනයක සේවය කරන නිසා යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතුවල නිරත වෙමින් සිටියි. ඔහු මෙම කටයුතුවල යෙදෙන්නේ කැපවීමෙන් යුතුවය. රටක ජාතියක ඉදිරි ගමන ආපසු හැරවීමට යුද්ධයකට පුළුවන. අද අපි විනෝද ගමන් ලෙස ගොස් නරඹන්නේ වරින්වර එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවල ප්‍රතිඵලයන්ය. දමිළ ආක්‍රමණ නූනා නම් අප අගනුවර අනුරාධපුරය වන්නට ඉඩ තිබුණි. එසේත් නැතිනම් පොළොන්නරුව වන්නට ඉඩ තිබුණි. කොට්ටේ තෙක් වූ පරසතුරු ආක්‍රමණවල ප්‍රතිඵල අපි විනෝද ගමන් ගොස් නරඹමු. ඉන්දියාවේ පැතිර තිබූ බුදුදහම මුස්ලිම් ආක්‍රමණ නිසා විනාශ වී දැන් එහි ඇත්තේ නටබුන් පමණි. නාලන්දාවේ පිහිටි බෞද්ධ විශ්වවිද්‍යාලයේ තිබූ පොත්පත් හය මාසයක් ගින්නෙන් දැල්වූ කතාව අසත්‍යයක් නොවේ. මේ අතීත යුද්ධවල ප්‍රතිඵලය. දෙවෙනි ලෝක යුද්ධයෙන් වූ විපත් ඊටත් වඩා වැඩිය.

මෙ ජනවාර්ගික යුද්ධයත් ජනතාව විඳින අත්දැකීමය. දශක දෙකක් තිස්සේ සිංහල දමිළ ජනතාව අත් විඳින දුක් ගැහැට පොදුය. උන් හිටි තැන් අහිමි වූවෝ දමිළ ජනතාව පමණක් නොවේ. සිංහල දමිළ මුස්ලිම්වරු අද සරණාගතයන්ව ජීවත් වෙති. මේ විසි වසර තුළ විඳි දුක් කරදර ඔවුන්ගේ ජීවිතවල කොටස් වී ඇත. සරණාගත කඳවුරුවලම විවාහ වෙති, මධුසමය ගත කරති. දරුවන් බිහි කරති, ගැහැනු දරුවන් වැඩිවියට පත් වෙති, වියළි ආහාර සලාක ලබති. මාරාන්තික ලෙඩ රෝගවලට මුහුණ දෙති. මියැදෙති. හදිසියෙන් මායිම් ගම්මානවලට එන ත්‍රස්තවාදී ප්‍රහාරවලට මුහුණ දෙති. මෙය ත්‍රස්තවාදයට මුහුණ දෙන හැම රටකටම පොදුය.

ජගත්ට භාරව ඇත්තේ රජයේ උපදෙස් මත යුද්ධයෙන් විනාශ වූ නගර නිර්මාණය කිරීමය. හෙතෙම සිය කටයුත්ත මනාව ඉටුකරන්නෙකි. හිරෝෂිමා නාගසාකි නගරයට බෝම්බ වැටුණු පසු ජපානය නැවත ගොඩ නොඑනැයි මිත්‍ර පාක්ෂිකයන් කිසිසේත් නොසිතන්නට ඇත. ජපානය මේ අභියෝගය මැඩගෙන ඉදිරියට පැමිණ ඇත. ජගත් සිතන්නේ ජපානය මෙන් සුන්දර නගරයක්



බිහි කිරීමටය. පවුලේ තුන්වැනියා වන ජයනි පොඩි අයියාගේ අදහස් කවදාවත් පිළිගත්තේ නැත. විශ්වවිද්‍යාල ඉතිහාසය පිළිබඳ කථිකාචාර්යවරියක වන ජයනි මුදියන්සේ පොඩි අයියා පිළිබඳව කිසිම පැහැදීමක් නැත. විද්‍යා විෂයන්ගෙන් ඉදිරියට යාමට හැකිව තිබියදීත් කලා උපාධියක් ගත්තේ වැඩිමල් පිරිමි සහෝදරයන් විරුද්ධ වෙද්දීය. රටට ජාතියට ආදරේ නැති පිරිසක් බිහි වෙන්නට පටන් ගත්තේ ඉතිහාසය විෂය ධාරාවෙන් ඉවත් කිරීමෙන් පසුවය. රටට, ජාතියට, ආගමට ආදරය කරන පුරවැසියන් බිහිවීමට නම් අනිවාර්යයෙන්ම ඉතිහාසය දැන ගත යුතුය. රටක ඉතිහාසයක් නැති පිරිසක් බිහි වුවහොත් ඔවුන් අභිමානයක් නැති නිකමුන් බව ඇය පිළිගත් කරුණකි. අපි අභිමානවත් ජාතියකව සිටි බවට අපගේ ඉතිහාසය දොස් තබයි. වැව හා දාගැබ සංස්කෘතිය තුළ ස්වයංපෝෂිත ජාතියක්ව සිටි බවට සෙල්ලිපි සාක්ෂි දරයි.

අද ඇතැම්හු ඉතා සැලසුම් සහගත ලෙස ඉතිහාසය විකෘති කිරීමේ කුමන්ත්‍රණයක යෙදෙමින් සිටිති. වැඩි කලක් යන්නට මත්තෙන් අපි මේ රටේ දෙවන පුරවැසියන් වන බවට අපක්ෂපාති ජනනායකයන් පවසන කතාවේ සත්‍යයක් ඇතැයි පිළිගැනීමට සිදුව ඇත. මෙම දරුවන් හතර දෙනාගේ පියා වන මුදියන්සේ විජේසිංහ පාරම්පරික නැටුම් ශිල්පියෙකි. හෙතෙම දේවාලයට තේවාව කරමින් පාරම්පරික නැටුම් ශාස්ත්‍රය ආරක්ෂා කරගත්තේය. බාල පුතා මෙම නැටුම් හා සංගීත කලාව ආරක්ෂා කිරීම පිළිබඳව හෙතෙම සතුටට පත්ව සිටියේය.

පවුලෙන් කවුරුන් හෝ මෙම උතුම් කලාව ආරක්ෂා කරාවි යන විශ්වාසයක් මුදියන්සේගේ සිතේ තිබුණි.

උදිත් දිල්ලි විශ්වවිද්‍යාලයෙන් හා භාත්කණ්ඩ විද්‍යා පීඨයෙන් සංගීතය හදාරා පැමිණියත් මුදියන්සේ සතුටු වූයේ නැත. කර්නාටක සංගීතය පිළිබඳව ඉගැන්වීමට ද මුදියන්සේ සිතුවේය. පෙරදිග සංගීත හා නැටුම් පිළිබඳ විදේශ සංචාරය යෙදෙද්දී ඔහුට මුණ ගැසුණු දමිළ මිත්‍රයෙක් ඇත. මෛත්‍රීලිංගම් දමිළ සංගීතය හා

නැටුම් පිළිබඳව ගුරු උපදේශකයෙක් වශයෙන් ඒ දිනවල සේවය කරමින් සිටි බව මුදියන්සේ දනී. ඒ දිනවල ඔහු පදිංචිව සිටියේ යාපනයේය. තරුණ කාලයේ ආරම්භ වූ මෙම හිතවත්කම තවම පවතී. නුවර පැමිණි කිප අවස්ථාවකම 'ලේවැල්ලේ" පිහිටි නිවසට පැමිණ ඇත. යුද්ධය නැති යුගයේ යාපනයට ගිය අවස්ථාවලදී වෛත්‍යාලිංගම්ගේ නිවසේ නතර වී ආගන්තුක සත්කාර ලැබ ඇත.

ඒ දිනවල වෛත්‍යාලිංගම් හොඳ කඩවසම් තරුණයෙකි. නැටුම, ගැයුම, වැයුම එකසේ ප්‍රගුණ කර සිටි හෙතෙම මුදියන්සේගේ හොඳම මිතුරා බවට පත්ව සිටියේය.

ජාතීන් අතර වූ හොඳ හිත, විශ්වාසය, සහෝදරත්වය බිඳ දැමීමට මේ ඊනියා යුද්ධය හේතු විය. ඉකුත් විසි වසර පුරා මිතුරන් දෙදෙනාට හමුවීමට ලැබී නැත. ඉඳහිට ලිපියක් මගින් දෙදෙනා සම්බන්ධකම් පැවැත්වූහ. වෛත්‍යාලිංගම් පදිංචිව සිටියේ යුද්ධය තදබල ලෙස පැතිර ගිය ප්‍රදේශයකය. අවසන් වරට පැමිණි ලිපියෙන් ඔහුට දැන ගැනීමට ලැබුණේ කොළඹ පදිංචියට පැමිණි බවය.

මුදියන්සේ තදබල ලෙස රෝගාතුර වූ හෙයින් අඩු වශයෙන් තේවාවටත් යාමට ලැබුණේ නැත. ලේවැල්ලේ පිහිටි සිය නිවසට වී විවේක සුවයෙන් ගත කළේය.

උදිත් සංගීතය හා නැටුම් හදාරන බව ලිපි මගින් වෛත්‍යාලිංගම් දැන සිටියේය. කර්නාටක සංගීතය හා භරත, කතකලි වැනි දක්ෂිණ භාරතීය ශිල්පය කිසියම් දිනෙක තමාගෙන් පසු කිසිවෙකුට ඉගැන්වීමට ඔහු සිතා සිටියේය.

අද යාපනයේ සිටින තරුණ තරුණියන්ට සංගීතය කලාව පිළිබඳ උනන්දුවක් නැත. වීණාව, වයලීනය, බෙරය වෙනුවට අත් හුරුකර ඇත්තේ බෝම්බයට හා තුවක්කුවට හා සයිනයිඩ් කරලටය.

සැබැවින්ම මෙයට තරුණ පරපුර වගකිව යුතු නැත.



නිදහසින් පසු පත්වූ සෑම රජයක්ම මෙයට වගකිව යුතුය. එසේ වුවද පුද්ගලයෙක් තුළ නිසගයෙන් ජනිත වන කලා කෞශල්‍ය නැති කිරීමට නොපුළුවන. වෛත්‍යාලිංගම් වැල්ලවත්තේ පිහිටි නිවසට වී සිටියේය.

කොළඹ සිටින දමිළ පවුල්වල කිහිප දෙනෙකුට ඔහු පන්ති පවත්වාගෙන යමින් සිටියේය. මෙහි ඉගෙනීමට එන ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිසිවෙක් නර්තනය හා ගායනය පිළිබඳව එතරම් කැමැත්තෙන් එන බවක් නොපෙනේ. අද උඩරට, පහතරට, සබරගමු නර්තන විලාශයන් විනාශ වෙමින් පවතී.

රූපවාහිනියේ හා ප්‍රසිද්ධ වේදිකාවේ ඉදිරිපත් වන වර්තමාන නැටුම් නිසා සම්ප්‍රදායික කලාවන්ට මරු පහරක් එල්ලවී ඇත. වෛත්‍යාලිංගම්ගේ පන්තිවලට එන සිසු සිසුවියන්ගෙන් වැඩි දෙනෙක් මෙහි රැඳී නොසිටින්නේ ඉන්දියානු නැටුම් කලාව ද විනාශ වෙමින් පවතින හෙයිනි.

රූපවාහිනී විකාශන ආයතනවලින් දිස්වන නැටුම් පිළිබඳව වෛත්‍යාලිංගම් දැඩි කනස්සල්ලට පත්ව සිටියේය.

පොදුවේ සමස්ත කලාවම මේ බිඳ බිඳ වැටීමට මේ ව්‍යසනය බලපා ඇත. සිංහල ගීතවලට යොදා ඇති නැටුම් පිළිබඳ ඔහුගේ සිතේ පවතින්නේ කලකිරීමකි. තමා මිය යාමට ප්‍රථම මෙම නැටුම් ශිල්පය ඉගැන්වීමට හෙතෙම සිතා සිටියේය.

වෛත්‍යාලිංගම් දෙදරු පියෙකි. දෙදෙනාම ගැහැනු දරුවන්ය. විසි එක්වෙනි වියේ පසුවන චේතා වෛත්‍යාලිංගම් යාපන සරසවියේ ඉගෙනුම ලබමින් සිටී. උමා වෛත්‍යාලිංගම් දහනම වියේ පසුවන අතර කොළඹ හින්දු බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබයි. චේතා උමාටත් වඩා නැටුමට ගැයුමට දක්ෂව සිටියාය. එක්තරා දමිළ ජාතිවාදී පක්ෂයකට සම්බන්ධ වී සිටින නිසා සමස්ත කලාවම අමතක කර ඇත. මේ තරුණියන්ගේ සිතුවිලි පිළිබඳව හරියටම කිසිවෙකුට කීමට නොපුළුවන. මේ සිටින්නේ යුද්ධයේ

අත්දැකීම අතර බිහිවූ දමිළ ගැහැනු ළමුන්ය. ජාතීන් අතර අවබෝධයක් නැත. චේතාගේ සිතට මේ වෛරය තදබල ලෙස බලපා තිබුණි.

උමාගේ සිත තරමක් හෝ මෘදුවී තිබුණේ කොළඹ ජීවත් වන හෙයිනි.

වේතාලිංගම්ට මේ යුද්ධය ප්‍රබලව බලපෑවේ නැත. සිංහල, දෙමළ, මුස්ලිම් මිතුරන් රැසක් ඔහුට ඇත. කොළඹ සිටියදී හොඳට දරුවන්ට සිංහල භාෂාව ද ඉගැන්නුවේය. විද්‍යාලය අවසන්ව පැමිණි පසු උමාට පියාගේ සංගීත පන්තියේ ඉගැන්වීම් කටයුතුවල නිරතවීමට සිදුවෙයි. අප්පාට ලැබෙන විශ්‍රාම වැටුපෙන් හැම දෙයක්ම කළ නොහැකි බව උමා දනී. අප්පා උපයන මුදලින් කොටසක් යාපනයේ ඉගෙන ගන්නා සොයුරියට ද යැවිය යුතුය.

නිවසට ඉගෙන ගැනීමට එන සිසුන් වැඩි වුවහොත් ආදායම ද හොඳ වේ. මෙහි ඉගෙනුම ලබන්නේ දමිළ සිසුන් පමණි. බොහෝ විට හැන්දෑවේ සංගීත පන්තිය භාරව සිටින්නේ උමාය.

මේ දිනවල නව පාසල් වාරය සඳහා සිසුන් බාර ගැනීම සිදුවෙයි. එදින අප්පා බැහැරක ගොස් සිටි නිසා උමා පන්තියේ කටයුතු ආරම්භ කළාය. පන්තියට සිසුන් බඳවා ගැනීම අවසන් බව කළුලෑල්ලේ සටහන් කළ ඇය එය ගේට්ටුවෙන් පිටත තබා සුපුරුදු ලෙස ඉගැන්වීම ආරම්භ කළාය.

කිසිවෙක් ගේට්ටුවට ශබ්ද කරන හඬ ඇසුණි. එය ඉගැන්වීමට බාධාවකි. පන්තිය පිළිබඳ දන්නා කෙනෙක් නම් දොර ඇරගෙන ඒම කරයි. දොරට ගැසීමේ ඉවරයක් නැත. ඇය පන්තිය නවතා ගේට්ටුව අසලට ගියේ කෝපයෙන් යුතුවය. සුදු කලිසමකින් හා තාන් කමිසයකින් සැරසී සිටි තරුණයා දුටු විට කෝපය වැඩිවුණි. කළුලෑල්ලේ දෙමළෙන් ලියා තිබියදී මෙසේ කරදර කිරීම සදාචාර සම්පන්න නැත.

"තමිල් තෙරියාදා.."



දෙමළ දන්නෙ නැද්ද..?"

ඇය කෝපයෙන් ඇසුවාය. තරුණයා එය ගණන් ගත් බවක් පෙනුණේ නැත.

"තමිල් තෙරියාද.. දෙමළ දන්නෙ නෑ."

ඔහු ඇය දෙස නොබලා කීවේය. වයස විසි හතරකට වඩා නැත. සම්පූර්ණයෙන් රැවුල කපා නැත. කෙල්ලෙකුගේ සිත උදුරා ගන්නා පෞරුෂයක් තිබුණි.

## 02

උමා වේතාලිංගම් එකළුල්ලේ තරුණයා දෙස බලා සිටියාය. පැහැදිලිවම මොහු දමිළ අයෙක් නොවේ. මෙම සිංහල තරුණයා කිසිම සැලකිල්ලක් නැතිව කතා කිරීම පිළිබඳව ඇගේ සිතේ ඇති වූයේ කෝපයකි.

තමා දෙමළ දන්නවාද යන ප්‍රශ්නය ඇසුවේ දෙමළෙනි. එසේ විමසුවේ කළුලෑල්ලේ කළ සටහන අනුවය.

දෙමළෙන් පිළිතුරු දුන්න ද ඔහු සිංහල අයෙක් බව ඇය දැන ගත්තාය.

වයස විසි හතරකට වඩා වැඩි නැත. හොඳට වැඩුණු දේහයකට උරුමකම් කී හෙතෙම පිටාර ගලන යෞවනයක් සහිත අයෙකි. තමා දෙස බැලුවේ කිසිම සැලකිල්ලක් නැතිවය. ඔහු අත සුදු ලියුම් කවරයක් තිබෙනු උමා දුටුවාය.

"අයි වෝන්ට් මීට් මිස්ටර් වේතාලිංගම්.."

තරුණයා උමා දෙස නොබලා කීවේය. මොහොතක් ඔහු දෙස බලා සිටි ඈ යළි ගේට්ටුව වසා මව හමුවීමට ගියාය.

"අම්මා..."

උමා මවට කතා කළාය. අම්මා සිටියේ ඇඳේ වැතිර ගෙනය.

"අම්මා අප්පාවෙයි පාකරෝ යාරෝ චන්ද්‍රකරික්‍රාන්ග."

"අප්පා හම්බ වෙන්න කවුදෝ ඇවිදින්.."

"අප්පා ඉල්ලෙන්ඩු සොල්ලු.

"තාත්තා නෑ කියල කියන්ඩ."

"අම්මාවයි කූපට රාංග

"අම්මට කතා කරනව."

උමා අම්මාට මෙම කාර්ය පවරා පුහුණුවීම් කටයුතුවලට යාමට සූදානම් වුණාය.

"නාං කුකම එන්ඩ සොල්ල"

"මම නිදියි කියල කියන්න."

සාවිස්ත්‍රි අනිත් අතට හැරී දෑස් පියා ගත්තාය. දින ගානක් තිස්සේ පවතින මේ හිසරදය නිසා වේදනාවට පත්ව සිටියාය. කොහොමටත් සාවිත්‍රි ඉංග්‍රීසි බෙහෙත්වලට කැමති නැත. යාපනයේ සිටියදී නම් ඒ වෙනුවෙන්ම සිදින ලද තෙල් වර්ග තිබුණි. ඉන්පසු සුව වූයේ සැමියාගේ සිංහල මිතුරෙක් ගෙනැවිත් දුන් තෙල් වර්ගයකිනි. නුවර සිටි ඒ මිතුරා වසර ගණනාවකින් හමුවී නැත.

බර වයන දවසට හිසේරදය වැඩිවෙයි. දුව උගන්වන්නේ කර්නාටක සංගීතය නිසා එම හඬ ශ්‍රවණය කිරීම අසීරු නැත. කොහොමටත් උමාගේ කටහඬ මිහිරිය. සරල හෝ ශාස්ත්‍රීය ඕනෑම ගායනයක් ඇයට පුළුවන. ඇතැම් රාත්‍රියක ඇය පියා සමඟ 'ගසල්' ගායනාවන්හි යෙදෙයි. තම නින්දට බාධා කරමින් මේ ආවේ



කවුද? උමා කාමරයෙන් පිටව යනු සාවිස්ත්‍රි බලා සිටියාය. නැවුම්ම ගැයුම්ට උපන් හපන්කමක් ඇති උමා මනා හැඩ රුවින් යුතුය.

මේ හැමටම වඩා දක්ෂතා ප්‍රකට කළේ යාපනේ ඉගෙන ගන්නා ලොකු දුව වෙන වේනාය. ඇය ඇය කෙලෙසකින්වත් නැවත මේ ජන ජීවිතයට නොඑනු ඇත. දශක දෙකකට ආසන්න කාලයක් ඔවුන් දුටුවේ යුද්ධය පමණි. ඔවුන් පොදු සතුරා ලෙස දුටුවේ සිංහලයන් පමණි. දැනට විශ්වවිද්‍යාලයේ එක්තරා සටන්කාමී සංවිධානයක් සමඟ බැඳී සිටින නිසා ඇගේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වෙනස්ය. වේනා සිය සොයුරිය වන උමාවත් ඇගේ සංවිධානයට ගැනීමට ප්‍රබල උත්සාහයක යෙදෙමින් සිටී. ඇය මෙවන් සෞන්දර්ය කාර්යක යෙදවීම තුළින් දරුණු අදහස් සිතට ඇතුල් කිරීමෙන් වැළැක්වීමට දෙමාපියන් උත්සාහ ගත්හ.

උමා යළි ගේට්ටුව අසලට ගියේ පැමිණ සිටි තැනැත්තා ගොස් ඇද්දැයි බැලීම සඳහාය. ගේට්ටුව විවෘත නොකර තුඩා කවුළුවෙන් ඇය බැලුවාය.

හොඳට වැඩුණු පිරිමි දේහය සිත් ගන්නා සුළුය. ලා වර්ණ කලිසමකින් හා සුදු පාට කමිසයකින් සැරසී සිටි ඔහුගේ මුහුණේ රැවුල සිද දමා තිබුණේ යාන්තමිනි. පැහැදිලිව ඔහු සිංහල ජාතිකයෙකි. ම.. සැර පාටයි.. ආඩම්බර පාටයි. එහෙත් ඔහු කවරෙක්ද නොදන්න ඇතුළට ගත නොහැක. ඇය ආපසු මව හමුවීමට ගියේ තරුණයා දෑසී අවවේ සිටගෙන සිටිනු දුටු හෙයිනි.

"ගියාද?"

"පෝත ඉල්ලෙයි වෙලියෙ තික්කිරෙත්

"යන්නෙ නෑ එළියට වෙලා ඉන්නවා."

උමා මව අසලින් ඉඳගත්තාය.

ඔහු ආවේ අප්පා හමුවීමට බව පැහැදිලිය. මොනතරම් හෝ හදවල අවශ්‍යතාවයක් විය හැක. එසේ වුවද අප්පාගේ අවසරයක්

නැතිව පිරිමියෙක් ඇතුළට ගත නොහැක.

ඇය යළි සංගීත පන්තියට ගියාය. පන්තිය යළි ආරම්භ කෙරිණ. මෙහි පැමිණ සිටින සිසුවියන්ට අවශ්‍යව ඇත්තේ කර්නාටක සංගීතය හැදෑරීමටය. ඔවුන් සමග ගීත ගායනයේ යෙදී පුහුණුව දෙමින් සිටියදී ඇයට යළි අප්පා හමුවීමට පැමිණි තැනැත්තා සිහිවුණි.

තේ කෝප්පය පසෙක තැබූ ඇය පන්තියේ පිරිසට නොදැනෙන සේ ගේට්ටුව අසලට ගියේය. පන්තියේ සිටි නිසා එම තැනැත්තා පිළිබඳව සෙවීමට ලැබුණේ නැත. කිසිසේත්ම මෙතක් වේලා රැඳී සිටීතැයි සිතිය නොහැක. ඇය කුඩා කවුළුවෙන් ගේට්ටුව දෙස බැලුවේය.

ඇය පුදුම වූයේ දුටු ඉරියව්වේම පසුවන තැනැත්තා දකිමෙනි. කුඩා සිදුරෙන් ඇය කාටත් රහසින් එම අරුම පුදුම තැනැත්තා දෙස බලා සිටියාය. කැපී පෙනෙන තියුණු පෞරුෂයක් ඔහුට හිමිව තිබුණි.

විශේෂයෙන් සිංහලයන් ඇසුරට නොසුදුසුය. වසර දහස් ගණනක් තිස්සේ ඒ බව ඔප්පු කර ඇත. මේ දිනුත් වර්ධනය වෙමින් පවතින්නේ සදාකාලික අමනාපයයි. මොහු නම් එවන් අයෙක් නොවේ.

දන් ඊළඟ පන්තිය ආරම්භ වීමට නියමිතය. ඇයට නිවසින් ඇමතුමක් ලැබුණි.

"උමා... කෝල්.."

ඇයට මවගේ හඬ ඇසුණි. උමා තවත් තත්පර කිපයක් එදෙස බලා සිටියාය. ඇය ආපසු හැරී නිවස තුළට ගියාය.

"අප්ප කතා කරනවා.."

අම්මා ඇඳේ සිටම කීවාය. උමා රිසීවරය ගත්තාය.



"උමා දුව.. මට හැන්දෑමව පන්තියට එන්න විදිහක් නෑ."

"අනේ අප්පා.. මට මහන්සියි."

"එහෙනම් ගසල් සින්දු ටිකක් කියන්න. මම පරක්කු වෙනවා."

"පරක්කු වෙලා ඉඳලා හරියන්නෙ නෑ. අප්පා හම්බ වෙන්න කවුද ඇවිදින්."

"ඉතින් මම මොටද? අවශ්‍යතාවය බලන්න. පන්තිවල නම් ඇඩ නෑ කියන්න."

"පන්තිවලට බැඳෙන්න නෙමෙ වගේ. තාත්තව හම්බ වෙන්න ඕනැලු."

"මම එන්න පරක්කුයි."

"අප්පා එයා සිංහල කෙනෙක්."

වෛතාලිංගම් මොහොතක් කල්පනා කළේය. දමිළ නොවන කෙනෙක් තමා හමුවීමට එන්නේ කුමකටද? මීට දශක කිහිපයකට ඉහත නම් ජාති භේදයක් නැතිව කොයි කා සමගත් ඇසුරු කළ හැටි සිහිවෙයි. අද තත්ත්වය ඊට වෙනස්ය.

"හෙල්ලෙන්නෙ නැතිව ගේට්ටුව ගාවට වෙලා ඉන්නව. පැය තුනකට වැඩියි."

"මොකක් හරි වැදගත් හේතුවක් වෙන්න ඕනෑ. ඔයාට කතා කරන්න බැරි නම් අම්මට කියන්න."

"අම්මා ඔළුව කකියනවා කියලා නිදි. අම්මට සනීප නෑ. එහෙනම් අප්පා එන්න. ඉඳලා යන්නෙ නෑනෑ."

රිසීවරය තබා ඇය යළි පන්තියට ගියාය. සුවයෙන් සිටියා නම් මේ කර්නාටක පන්තිය මෙහෙයවන්නේ අම්මාය. එහෙත් පන්තියේ සිසුවියන් වැඩිපුර කැමැත්තක් දක්වන්නේ තමන්ගෙන් ඉගෙනීමටය. ඉලේරාජ්ගේ කැසට් පටයක් දමා එය ශ්‍රවණය කිරීමට

ඉඩ හැර දමා සිටියේ කෙටි විවේකයක් ගැනීම සඳහාය. දූත් හොඳටම සැඳෑ වී ඇති බව හැඟී ගියේ සිසුවියන් කැඳවාගෙන යාමට දෙමාපියන් එකා දෙන්නා නිවසට එනු දකිමෙනි.

යළි අම්මා සාදා දුන් තේ කෝප්පයත් පානය කරමින් සිටියදී අප්පා මුණ ගැසීමට පැමිණි තැනැත්තා සිහිවුණි. මෙතෙක් වේලා රැඳී සිටීමට කිසිම හේතුවක් නැත. තේ කෝප්පය පසෙක තබා ඇය සෙමින් දොරකඩ අසලට ගොස් බැලුවාය.

"දෙවියනේ.."

ඇය තිගැස්සුනාය.

ප්‍රථම දුටු දසුනෙන් කිසිම වෙනසක් කර නැත. මීට පැයහතරකට පෙර පෑ අව්වේ සිටි ඉරියව්වෙන්ම නොසැලී සිටින රූපකාය දුටු ඈ සසල වූවාය. යාබද මාවතේ වූ විදුලි පහන්වල එළිය මුහුණට වැටී තිබුණි. ඇය අම්මා වෙතට දුව ගියාය.

"අම්මා.. අප්පා හම්බ වෙන්න ආව බෝයි තවම ඉන්නවා."

"දෙවියනේ.. දවල් ඉඳලා.. ඔයා යන්න කිව්වෙ නැද්ද?"

"අප්පා නෑ කියලා කිව්වා. එච්චරයි."

"හරි පව් වැඩක්නෙ. පැය හතරකට වැඩියි නේද?"

"මම මොනවා කරන්නද අම්මා. මටම පුදුමයි. හරියට ස්ටැචු එකක් වගේ හෙල්ලෙන්නෙ නැතිව ඉන්නවා. ගිහින් බලන්න."

සාවිස්ත්‍රි ඇඳෙන් නැගිට්ටාය.

"දූත් අප්පාගෙන් බැණුම් අහන්ට වෙනවා. යමු බලන්ට."

සාවිස්ත්‍රි ගේට්ටුව අසලට ගියේ මේ පැමිණ සිටින අය කවුදැයි බැලීම සඳහාය.

පන්තියට බඳවා ගන්න කෙනෙක් නම් ඒ සඳහා නිශ්චිත ක්‍රියා පිළිවෙතක් ඇත. පූර්ව සාකච්ඡාවක යෙදීමෙන් පසු පන්තිය



පටන් ගන්නා දිනට ඇතුල් කර ගැනීම සිදුවෙයි. මෙය ඊට වෙනස් කතාවකි. දුව පවසන්නේ පැමිණ ඇත්තේ සිංහල තරුණයෙකි. උමා සම්පූර්ණයෙන්ම ගේට්ටුව හැර විවෘත කළේය.

"අන්න බලන්න... අන්න බලන්න."

උමා පුදුම වූයේ මීට පැය පහකට ඉහත සිටගත් පරිද්දෙන්ම ඔහු සිටගෙන සිටීමය.

වෛත්‍යලිංගම් මැතිනිය ගේට්ටුව ළඟ හිටගෙන සිටින ආරෝහ පරිනාහ දේහයෙන් යුත් සිංහල තරුණයා දෙස බලා සිටියාය.

ජාතියට ආවේණික ගැඹුරු පෙනුම මතුව තිබුණේ තරුණ පෙනුම නිසාය.

"කාගේ කවුද? ආවේ මොටද?"

"ගිහින් කතා කරන්න."

උමා පහත් හඬින් කීවාය. වෛත්‍යලිංගම් මැතිනිය ගේට්ටුව විවෘත කර තරුණයා අසලට ගියාය.

"කාව හම්බ වෙන්නද ආවෙ..?"

වෛත්‍යලිංගම් මැතිනිය තරුණයාගෙන් ඇසුවාය. උමා මව පසුපසට වී සිටියාය.

"ආචාර්ය වෛත්‍යලිංගම් මහත්තයා හම්බ වෙන්න ආවෙ.."

"කොහේ ඉඳලද ආවෙ..?"

"මම නුවර ලේවැල්ලෙ ඉඳලා ආවෙ. මගෙ නාත්තා මුදියන්සෙ."

"මුදියන්සෙ.... මුදියන්සෙ.."

වෛත්‍යලිංගම් මැතිනියගේ මුහුණේ සිනාවක් සටහන් වුණි. උමා අම්මා දෙස බලා සිටියාය. තරුණයා පිළිබඳ පූර්ව දැන හැඳුනුම්

කමක් ඇතැයි ඇයට සිතුණි. යාබද මහල් නිවාසවල හා ගෙවල්වල සිදුවන හොර මැරකම් පුදුමය. එයට දෙමළ සිංහල භේදයක් නැත. යාපනේ නෑදෑකම් පවසා නිවසට පැමිණ නිවසේ සියල්ල කොල්ල කා ගෙන ගිය කතා රැසක් මේ අවට ඇත. මෙ ඊට හාත්පසින් වෙනස් කතාවකි. මේ තැනැත්තා සිංහලයෙකි. ඔවුන් දමිළ ජාතියේ සතුරන් වන්නේ අද ඊයෙක නොවේ. දමිළ මිනිසුන්ගේ සිවිල් අයිතීන් උදුරා ගෙන සිටින මොවුන් කිසිසේත් විශ්වාස කළ නොහැක.

''අම්මා... පොඩ්ඩකට එන්න.''

ඇය මවගේ අත ගෙන පසෙකට ගියාය.

''අම්මා මේ මොනාද කරන්න හදන්නෙ..?''

''කෝ... කතා කරන්න දුන්නයැ. ඒ අපි දන්න කෙනෙකුගේ පුතෙක් වගේ.''

''ඇතුළට ගන්න එපා. අප්පා එනකල් ඉමු.''

ඇය තරුණයාට නෑසෙන සේ කීවාය.

# 03

අම්මාගේ මුහුණ සිනාවෙන් පිරී යනු උමා දුටුවාය.

''එතකොට මේ පුතා උදින්ද?''

ඔහු සැහැල්ලු සිනාව මුව සරසා ගෙන පහත් වී මවට වදිනු උමා බලා සිටියාය. මේ අම්මා බොහෝ කලක් දන්නා හඳුනන තැනැත්තෙකි.



''අනේ... ඇයි පුතා මෙච්චර වෙලා ඒ බවක් නොකිව්වෙ..?''

''අම්මා.. මට ඇතුළට එන්න ඉඩ දුන්නෙ නෑ.''

තරුණයාගේ අනපේක්ෂිත කතාවෙන් උමාගේ සිතේ ඇතිවූයේ අමනාපයෙකි. හරි වැඩක්නෙ යාළුවො වින්නිය මම කොහොමද දන්නෙ. එක්කො අම්මලාව අඳුනන බවක් කියන්න ඕනෑ. මිනිස්සු කොටවන්න නම් හරි දක්ෂයි. ඇය ආපසු හැරී නිවස දෙසට දිව්වේ අමනාපයෙන් යුතුවය.

පන්ති අවසන්ව සිසුවියන් නිවෙස් බලා ගොස් ඇති නිසා පරිසරයේ පැවතුණේ නිහඬ බවකි. මුහුණ සෝදා වෙනත් ඇඳුමකට මාරු වූ ඇය කාමරයට වී සිටියේ අමුත්තා තවමත් නිවසේ රැඳී සිටී හෙයිනි. අම්මා පැමිණියේ සිනාසෙමිනි.

''තාත්තගෙ හොඳම යාළුවගෙ පුතා.. හරි හොඳ දරුවෙක්.''

සාවිත්‍රී කීවාය.

''හරි කේලම්කාරයෙක්. මම ඒ වගේ අයට කැමති නෑ.''

''ඒ ළමයා හොඳ ළමයෙක්. ගිහින් තේ එකක් හදාගෙන එන්න.''

''මට බෑ තේ හදන්න. හොඳ ළමයෙක් කිව්වනෙ. ඔයාම හදලා දෙන්න.''

''මොකද ළමයො ගෙදර ආ කෙනෙකුට ඔහොමද කතා කරන්නෙ.''

''මම හොඳා අක්කා හිටියා නම් සිංහල කොල්ලෙක් ගේට්ටුවෙන් ඇතුළටවත් ගන්න එකක් නෑ.''

''ඒ තාත්තගෙ යාළුවෙකුගෙ දරුවෙක්. මම ඒ ළමයව වඩාගෙන ඉඳලා තියෙනවා.''

''ඒ ඒ දවස්වල. දැන් අම්මට වඩා ගන්න බැහැනෙ.''

ඇය සිනාසුණාය.

"යනවා කතාව තියලා තේ එකක් හදාගෙන එනවා."

එහි විධානයක් කැන්පත්ව තිබුණි.

නිවසේ රසකැවිල්ලක් වරදින්නේ නැත. සිපුත් ඇතුළත් කිරීමට එද්දී ලබ්වූ පෙට්ටියක් ගෙන ඒම වරදින්නේ නැත. සැමියා සමඟ නුවර ලේවැල්ලේ වලව්වට ගිය විට සංග්‍රහ කළ හැටි සිහිවෙයි.

උදිත් මේ ගමන ආවේ පියාගේ ඉල්ලීම නිසාය. පාරම්පරික උඩරට, පහතරට, සබරගමුව හැරුණු විට විවිධ නාට්‍ය සම්ප්‍රදායන් ඉගෙන ගත් හැටි සිහිවෙයි. තමා ලද අධ්‍යාපනයෙන් ගෙගතම සතුටට පත්වූයේ නැත. මේ ලිවිය දුන්නේ පියාගේ මිතුරාට දීමටය. වැල්ලවත්තට පැමිණි ඔහුට මේ නිවස සොයා ගැනීමට අසීරු වූයේ නැත. ඇතුල්වන ගේට්ටුව අසල වූ කළුලෑල්ලේ දෙමළෙන් කිසියම් දැන්වීමක් දමා තිබුණත් එය ඔහුට තේරුම් ගැනීමට නොහැකි වුණි. ගේට්ටුවට තට්ටු කළේ අංකය නිවැරැදි වූ හෙයිනි. දොරටුව විවෘත වුණි. එළියට පැමිණියේ දමිළ තරුණියකි. කීප වරක්ම ගේට්ටුවට ගැසීම නිසා ඇය කෝපයට පත්ව ඇති බව කීමට තවත් සාක්ෂි අවශ්‍ය වූයේ නැත. "දෙමළ දන්නෙ නැද්ද?" යන්න ඇය විමසුවේ දෙමළ බසිනි. ඇය අවධාරණය කළේ කළුලෑල්ලේ වූ දෙමළ වැකිය පිළිබඳවය. යන්තමින් දෙමළ වචන දැන සිටි හෙයින් ඔහු දන්නා දෙමළෙන් පිළිතුරු දුන්නේය. ඇය වේගයෙන් ගේට්ටුව වසා ගියේ කෝපයෙන් යුතුවය.

බැලූ බැල්මට අවුරුදු 19-20 තරමේ වූ ඇය මනා හැඩරුවින් යුතු පැහැපත් තරුණියකි. පියා දුන් ලිපිය වෛකාලිංගම් මහතාට දිය යුතුමය.

අභ්‍යන්තරයේ සංගීත පන්තියක් පැවැත්වෙන හඬ ඇසේ. ඉන්දියාවේදී "කර්නාටක" සංගීතය හදාරා ඇති නිසා උගන්වන්නේ මොනවා දැයි ඔහුට තේරුම් ගත හැකි වුණි. තාල රාග උච්චාරණයේදී



ඇතැම් දෝෂ ඔහු තේරුම් ගත්තේය.

කවුරුන් හෝ පැමිණ එළියේ සිටින තමා දෙස බලන අයුරු ඔහු දුටුවේය.

මේ ලිපිය නොදී යා නොහැක. පැය තුන හමාරකට පමණ පසු යළි ගේට්ටුව විවෘත වුණි. අවුරුදු පණස් පහක පමණ දමිළ කාන්තාවක් සමඟ කලින් පැමිණි යුවතිය එළියට එනු ඔහු දුටුවේය. මෙහි පැමිණ ඇත්තේ වෛකාලිංගම් මහතාගේ බිරිඳ බැව් ඔහු තේරුම් ගත්තේය.

තමා ආදරයෙන් පිළි නොගැනීම පිළිබඳව ඔහු එකවරම දමිළ යුවතියට දොස් පැවරීමට සිතුවේ නැත. ඔහුගේ සිතේ අසතුටක් ඇත්තේ නැත. ඔහුගේ සිතේ අසතුටක් ඇත්තේ අප්පච්චි කෙරෙහිය. මීට දශක කීපයකට ඉහත ජාතීන් අතර හිතවත් කමක් තිබුණු බව සැබෑය. අද ඒ තත්ත්වය නැත. දැන් හැමදෙනා අතරම මිනිස්කම යටපත් වෙමින් පවතී.

"එන්න පුතා ඇතුළට."

"නෑ අම්මා අවශ්‍ය නෑ. මම ආවේ අංකල්ට මේ ලියුම දෙන්නයි."

"පුතා උදිත්ද?"

කාන්තාව උදිත් දෙස බලා ඇසුවාය.

"කොහොමද මගේ නම දැන ගත්තේ."

"පුතාට උදිත් කියන නම දැම්මෙ අපි දෙන්නයි. යමු ඇතුළට."

යුවතියගේ නම් මුහුණේ කිසි සතුටක් නැත. ඔහු සාලයේ අසුන් ගත්තේය. ඇය තමා පිළිගත්තේ ආදරයෙනි. සාලයේ සිටියදීම තේ පිළියෙල කිරීමට වෛකාලිංගම් මැතිනිය දුවට කිව්වාය. ඇය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව ඔහු දන්නා දෙමළෙන් තේරුම් ගත්තේය. ඉන්පසු ඇය දුන්නේ නියෝගයකි. තරුණිය ඇතුළට

ගියේ නොකැමැත්තෙනි. වෛත්‍යලිංගම් මැතිනිය නිවස තුළට ගිය පසු පරිසරයේ නිහඬ බවක් ඇති වුණි. ඔහු අසුනින් නැගී සිටියේ තරමක පාළුවක් දැනුණ හෙයිනි. මේසය මත 8 × 12 ප්‍රමාණයට ලොකු කරන ලද ඡායාරූපය වෙත ඔහුගේ නෙත ගැටුණි. "කතක්" සම්ප්‍රදායේ අභිනය සමඟ රූපයක් විදහා දක්වන එම රූපය සිත් ගන්නා සුළුය. එහෙත් දැන් මොහොතකට පෙර සිටියේ කුරිරු පෙනුමෙන් යුතු ගැහැනියකි. එම ඡායාරූපය එක්වරම සිත් ඇදගන්නා නිර්මාණයකි. එදෙස බලා සිටියදී කාමරයට පිවිසි රුව දුටු විට වෙනත් දෙයක් බලන බවක් ඇඟෙව්වේය.

වෛත්‍යලිංගම් මහත්මිය ආවේ යුවතිය කාමරයට පිවිසෙනවාත් සමගය.

"එන්න පුතා තේ එකක් බොන්න."

"එපා අම්මා මම තේ බීලයි ආවෙ."

උමා ආපසු හැරී උදිත් දෙස බැලුවාය. පෙරවරු තුනේ සිට ගල් පිළිමයක් සේ ගේට්ටුව ළඟට වී සිටියා විනා තේ බීමට ගිය බවක් මතක නැත.

"තේ බොන්න පුතා."

"මට අම්මගෙ අතින් ඇල් වතුර එකක් ගේන්න ඒ ඇති."

උදිත්ගේ වදන යවුල් පහරක් මෙන් උමාගේ සිතට වැදුණි. තේ සෑදීමට නොහැකි යැයි කී කතාව ඔහුට ශ්‍රවණය වන්නට ඇත. මම කිව්වෙ ඇත්ත. මට ඔය කොහේවත් නැති එවුන් හුරතල් කරන්නට වෙලාවක් නැත. අම්මා ගෙනා වතුර වීදුරුව පානය කරන හැටි ඇය බලා සිටියේ කෝපයෙන් යුතුවය.

"පුතාලගෙ තාත්තා ඉස්සර යාපනේ එනකොට අපිට මුංඇට පැණි කැවුම්, ආස්මී උයාගෙන එනවා."

ඇය රටටම ගැළපෙන වෛරයක් නැති දෙමළ ගැහැනියකි.

"එහෙනම් 'ලඩ්ඩු' එකක් කාලා පස්සෙ තේ එක බොන්න."



අම්මාගේ යෝජනාවට කවර ප්‍රතිචාරයක් දක්වාවිද යන්න ඇයට දැන ගැනීමට අවශ්‍ය වුණි.

"අම්මා දෙන නිසා ලඩ්ඩු එක නම් කන්නම්. තේ නම් එපා."

මාතෘකාව වෙනස් වුණේ ෆොටෝ ඇල්බමය පෙරලද්දීය.

"මෙන්න ඉන්නවා පුතාගෙ තාත්තා."

"හාතේ අඳුනන්නවත් බෑ. මේක අපේ ගෙදර නෑ. මේ ඉන්නෙ අංකල්. දෙන්නා කැනඩාවෙදි ගත්ත ෆොටෝ එකක්."

අප්පච්චි හා වෛත්‍යලිංගම් අංකල් බොහෝ කලක් ළඟින් ඇසුරු කළ දෙදෙනෙක් බව ඔහු දනී. පවුල් දෙක මෙතරම් සමීපව සිටි බවක් ඔහු දැන සිටියේ නැත.

"මේ ඉන්නෙ ලොකු දුව "වෙතා" ජැෆ්නා කැම්පස්"

"මේ මෝඩ මූණ තියෙන කෙනා කවුද?"

ඔහුගේ කතාවට වෛත්‍යලිංගම් මැතිනිය උස් හඬින් සිනා සෙන්නට වූවාය. මෝඩ කෙල්ල කීමෙන් උදිත් තමාගෙන් පළි ගන්නේ යැයි සිතුණි. කිසිවෙක් කවදාවත් තමාට මෝඩ කෙල්ල කියා නැත. එසේ වුවත් හිතට තරහක් දැනුණේ නම් නැත.

"එහෙනම් අම්මා අංකල් ආවම මේ ලියුම දෙන්න. මම ආයෙ කෝල් එකක් දීලා එන්නම්."

"අනේ ඉඳලා යන්න. දැන් අංකල් එයි."

"බෑ අම්මා මට යන්න ඕනෑ. රෑ වුණොත් නුවර එක්ස්ප්‍රස් එක අල්ල ගන්න බැරි වෙයි."

"මේ රෑ නුවර යන්නෙ කොහොමද? අපරාදෙ ඇවිදින් ඉන්නෙ පුතා ආපු විත්තිය කිව්ව නම් අංකල් කතා කරපු වෙලේ කියන්න තිබුණා."

"මට ඇතුළට එන්න දුන්නෙ නෑනෙ අම්මා."

ඔක්කෝටම වැරදිකාරි මම. ඇය ඉවතට හැරුණාය. ඇස්වලට කඳුළු පිරෙන්නට ආසන්නය.

"මේ රෑ නුවර ඇරියා කිව්වොත් අංකල් මට බණීවි. තියෙන දෙයක් කාලා උදේ යන්න. කාමර තියෙනවා."

අම්මා කතා කරන්නේ රටේ ප්‍රශ්නයක් නැති බවක් සිතමිනි. ත්‍රස්තවාදයක් රටේ පවතී. එය දැන් යුද්ධයක් දක්වා පැතිර ඇත.

චේතා විශ්වවිද්‍යාලයේ විප්ලවකාරී සංවිධානයක සාමාජිකාවකි. ඇයගේ පෙම්වතා සෘජු ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධ වූවෙකි. මෙම තත්ත්වයෙන් ඇය මුදවා ගැනීමට බැරිය. චේතා මෙහි පැමිණි හැම විටම වෙර දරන්නේ උමාව ද එම සංවිධානයට සම්බන්ධ කරවා ගැනීමටය. වරින්වර ඇතිවන සමාදානකම් තාවකාලිකය. වෙනම ජාතියක්, වෙනම භාෂාවක් හා සංස්කෘතියක් ඇති පිරිසකට වෙනම රටක් තිබීමේ කිසි වරදක් නැත. දමිළ වීරුවන් ඉතිහාසයේ හැම යුගයකම වෙනම ජාතියක් ලෙස වෙන්ම සිටීමට වෙර දරූහ.

අක්කාට හා තමාට තේරෙන දෙයක් අම්මාට හා අප්පාට නොතේරීම පුදුමයකි. දන්නා ඉතිහාසයේ තමා දුටුවේ ලේ ගලන යුද්ධයකි. උපන් මව් බිමට යාමට නොහැක. ඒ කාලයේ තිබූ ගෙවල් දොරවල් මෝටාර්, කාලතුවක්කු, වෙඩිවලින් විනාශ වී ගොස්ය. පැහැදිලි සටනක් තිබියදී මූනිච්චාවට සිනා සී කතා කිරීමට පුළුවන් කමක් නැත.

හැමෝම සිටින්නේ සුළු ජාතියක් ලෙස පාගා දැම්මටය. අම්මලාට ඒ තත්ත්වය තේරෙන්නේ නැත. එකට එක කියාගෙන ආවා, දුන්න ගේ එක ඕවෙට නෑ. එහෙම අය එක්ක යාළුකම් තියන්න බෑ. තව ගෙදර නතර වෙන්නත් හදනවා. අම්මා පසුවන්නේ සැබෑ සතුටින් යුතුවය.



"එහෙම නම් අම්මා මම යනවා. මම වෙනින් වෙලාවක එන්නම්."

උදිත් අසුනින් නැගිට මවට ආචාර කරන අයුරු උමා බලා සිටියා.

# 04

අම්මා උදිත් සමගින් ගේට්ටුව අසලට යනු උමා බලා සිටියාය. ඔහු අම්මාගේ දෙකම්මුල් සිප සමුගෙන සිටව ගියේ පවුලේ කෙනෙක් මෙනි. මේ පිළිබඳව කිසිම දෙයක් කීවේ නැත. මොනවා හරි කීවා නම් ඒක වාදයකට පැටලීමට එක් හේතුවකි. පරිසරයේ පැවතුනේ නිහඬ බවකි. අප්පා තවම නැත. ඔහු ආවේ සිතුවාටත් වඩා ප්‍රමාදවීය.

තිදෙනෙකුට ප්‍රමාණවත් ඉටිලි හා වඩේ ගෙනැවිත් තිබුණි. රාත්‍රී ආහාරයට තිදෙනා අසුන් ගත්හ.

"මුරුගවේල් අතේ මම චේතාට සල්ලි යැව්වා.. ඒකයි එන්න පරක්කු වුණේ.."

"ආපහු කැම්පස් එක ස්ට්‍රයික් කියලා ටී.වී. එකේ පෙන්නුවා."

"චේතා ජැෆ්නා කැම්පස් එකේ තිබ්බ එක වැරදියි."

"ආ... කියන්න බැරිව ගියා.. ඔයාට ලියුමක් තියෙනවා."

"කාගෙන්ද..?"

"ඔයාගෙ නුවර යාළුවා මුදියන්සේ මහත්තයා ලියුමක් එවලා."

''ඇයි ඉතිං මෙච්චර වෙලා කිව්වෙ නැත්තෙ.. කොහොමද එව්වෙ..?''

''කවුද කොල්ලෙක් ලියුම ගෙනාවා..''

''වැදගත් විදිහට කතා කරන්න. අප්පා මතකද අපි නම තිබ්බ උදිත් පුතා..''

''ඇයි නැත්තෙ..? ඇයි ඒ දරුව මම එනකල් තියාගත්තෙ නැත්තෙ..?''

''මෙච්චර වෙලා ඉඳලා ගියා.''

රාත්‍රී ආහාර ඉක්මනින් ගත් චේතා ලිංගම් ලිපිය බලද්දී ඔහුගේ සිතට සතුටක් පිවිසුණි.

''මගෙ යාළුවා එවල තියෙන්නෙ..''

''මොකද කියල තියෙන්නෙ..?''

''මගෙන් ඉගෙන ගන්න එවලා..''

ඔහු සිනාසුණේය.

''ඔන්න මට නම් උගන්වන්න කියන්න එපා. ඒකා හරි අහංකාර කොල්ලෙක්. මට බෑ..''

''ඔයාගෙන් මොනව ඉගෙන ගන්නද..? හාක්බණ්ඩ ඉඳලා ඇවිදින් තියෙන්නෙ..''

''එහෙම නම් මෙහෙ ආවෙ මොකද.. අම්මා නටන්න හෙම දන්නවද..?''

''මොනාද මේ අහන්නෙ.. පාරම්පරික නැට්ටුවෝ.. පුදුම බලගතු හඳහනක් තියෙන්නෙ.. සංග්‍රහ කළේ නැද්ද..?''

''ඔත් උඹරක්වත් බීව්වෙ නැහැ.''

''ඒ කොල්ල හරි ආඩම්බරයි අප්පා..''



''මම නම් අවුරුදු ගානකින් දැක්කෙ නැහැ..''

''හෙට එනව කිව්වා..''

උමා දත් මැද මුහුණ සෝදා ඇඳට ගියාය. මෙතෙක් කල් පිරිමි දැක නැතිවා නොවේ. උතුරේ සිටින හැම ජීවිතයකම ප්‍රශ්න ඇත. හැම ජීවිතයක්ම සරල නැත. ඔවුන් ගෙවන්නේ අතිශයින් රළු ජීවිතයකි. සෞන්දර්යට බර පිරිමි ජීවිත නැත. වැඩිමහල් සොයුරිය වන චේතා දැන් මේ රළු ජීවිතවල කොටස් කාරියක්ව ඇත. දෙමාපියන් නිතරම දුක් වන්නේ ඇය මෙම තත්වයෙන් ගොඩ ගැනීමට නොහැකි වීම ගැනය.

හිතේ අමනාපයක් ගොඩනැගුණු හැටි සැබෑවකි. හදබල වෛරයක් ඇති වීමට නම් කිසිසේත් පුළුවන්කමක් නැත.

නින්ද ළඟාවූයේ නොදන්නා වෙලාවකය. පිබිදෙන විට ඉකුත් දින රැයේ සිදුවූ සියල්ල අමතකව තිබුණි. පසුදින නිවාඩු දිනයක් බැවින් ඇය නරමක් වෙලා නිදා ගත්තාය. උදේ කිරි කාරයාගෙන් කිරි ගන්ට යන්නේ අප්පාය. තේ සූදානම් වන තෙක් උදේ පත්‍රය බැලීම අප්පාගේ සිරිතය.

මේ දිනවල අම්මා අසනීපයෙන් පසුවන නිසා උදේට කෑම පිළියෙල කිරීමක් සිදුවන්නේ නැත. බොහෝවිට උදේට කෑමත් ගෙන ඒම සිදුවෙයි.

''බඩගිනියි..''

උමා මවගේ උරහිසේ හිස හොවා ගත්තාය.

''අප්පාට කියන්න.. ඉදිආප්පද.. තෝසෙද..?''

''අප්පා බඩගිනියි..''

චේතා ලිංගම් උදේ කෑම ගෙන ඒමට නිවසින් පිටව ගියේය. උදේ නමයට පන්තිය ආරම්භ වන නිසා කලින් ආහාර ගෙන සූදානම් විය යුතුය.

අප්පා ගිය නොබෝ වේලාවකින් දොරට ගසන හඬ ඇසුණි.

"දුව.. කවුද අර ගේට්ටුව කඩන්න හදන්නෙ.. කුණු ගෙනියන්න ඇවිදින්ද..?"

කුණු ගෙනියන්න තව වෙලා තියෙනවා. ඇත්තමයි බණිනවා..

"මොකද මේ රණ්ඩුවට යන්නෙ.. කවුද බලන්න.. පත්තියට නම් ගන්න බැහැයි කියන්න."

ඇය ගේට්ටුව විවෘත කළාය. පිළිමයක් සේ නොසැලී සිටින තැනැත්තා දුටු ඇය මොහොතක් නතර වුණි. අද හැඳගෙන සිටිගේ කොලරයක් නැති සුදු අත් කොට කමිසයකි. සුදු කලිසමක් හා සුදු පාවහන් දෙකක් පැළඳ සිටිනු ඇය දුටුවාය.

"මිස්ට චෛත්‍ය ලිංගම්."

"අප්පා ඉන්නවා."

"ඉතිං හිටපුහදන්.."

ඔහු ඇය දෙස නොබලාම කීවේය.

"මෙක හරි කෝලමක් වුණානෙ.."

'අම්මා..' ඇය ගේට්ටුව විවෘත කර සිටියදීම කෑ ගැසුවාය.. සාවිත්‍රි ආවෙ ඇගේ කෑ ගැසීම අසාය.

මා හැකිව මෙයාට කිසි දෙයක් කරගන්න බැ.. ඉස්සරහට මොනාව කරගනීද දන්නෙ නෑ..

"එළවළු කරන්නෙද..?"

"වෙන කරන්නයක් බලන්නකො.."

උමා මවගේ අත අල්ලා ගෙන ගේට්ටුව අසල සිටගත්තාය. උදිත් දුටු සැණින් සාවිත්‍රිගේ මුහුණේ සිනාවක් සටහන් විය.

"ඇයි මේ දරුවට එන්න දුන්නෙ නැත්තෙ.."



සාවිත්‍රි දුවගේ කන සෙමින් මිරිකුවාය.

"ඌයියා.. කන.."

ඇය අමනාපයෙන් කීවාය. ඔහු වත්තට පිවිසුනේ කණ රිදවා ලද ජයග්‍රහණයෙන් යුතුවය. අම්මා ඔහුගේ අතින් අල්ලා ගත්තේ තමාට නොදක්වන ආදරයෙන් යුතුවය. උමා ඔවුන් පසුපස සාලය දෙසට ගියාය.

"ඉඳගන්න පුතා.."

"කෝ ඇන්ටි අංකල්..?"

"මේ.. කඩේට ගියා.. දැන් එයි.."

"උමා තේ හදන්න.."

"බෑ.."

ඇය කෙටියෙන් කීවේ දෙමළෙනි. නිවසට එන ආගන්තුකයින් ආදරයෙන් පිළිගනු ලබන්නේ උමා විසිනි. අද ඇගේ හැසිරීම වෙනස්ය. වගා වෙමින් පවතින ජාති භේද ප්‍රශ්නය මත හැම පුද්ගලයෙක්ටම චෝදනා නැගිය නොහැකිය.

ලොකු දුවට නම් සිංහල පිරිස පෙන්වීමට බැරිය. පොඩි දුවත් එසේ වෛර කරනවද..

ඇගේ නෙත ගියේ නිවස තුලට පිවිසෙන සැමියා වෙතය. ඔහු බිරිඳට කෑම පාර්සලය දී තරුණිය දෙස බැලුවේය.

"අඳුනනවද බලන්න.."

"මගෙ ඇගේ වූ දාපු කොල්ලව අඳුනන්න බැරිද..?"

උදිත් පහත් වී චෛත්‍ය ලිංගම්ට වැන්දේය. අප්පා උදිත්ව ආදරයෙන් වැළඳ ගත්තේය.

"ඇයි මාවත් වූවලින් නාවනවා.."

ඔවුන්ට එය සිනාසීමට හේතුවක් වුණි. සිතේ අමනාපයක්

තිබුණත් සියුම් සතුටක් සිතට පිවිසුණි. සිනාසීමට ඕනෑකම තිබුණත් ඇය ඉවතට හැරී එය වලකා ගත්තාය. ජාතීන් අතර මෙවන් හිතවත්කමක් තිබුණේ ද යන්න සිතා ගැනීමටවත් බැරිය. යාපනය හා ඒ අවට අම්මාගේ හා අප්පාගේ නෑයන් සිටියත් කිසිම පිරිමියෙක් නිවසට ඒමට අවසර දී නැත. පුදුම වූයේ දරුවෙක් ලෙස නිවසට ඒමට අවසර දීමය. ඊටත් වඩා ආදරයෙන් පිළිගැනීමය.

තාත්තා හා අම්මා සියල්ල අමතක කර ඔහු හා කතා කරනු පෙනේ. එක අතකට ඔවුන් ප්‍රීතිමත් වීම සතුටට කරුණකි. හදිසියෙන් වූ පිබිදීම නවතා දැමීමට ඇය අදහස් කළේ නැත.

උමා කඩිනමින් කෑම කාමරයට ගියාය. තවම උදේ තේ පානය නොකර ඇති බව දනී. කඩිනමින් ඇය මේසය සකස්කර පිඟන් තැබුවාය.

''අම්මා..''

ඇය දොරකඩ ළඟ සිට හිස වැනුවාය.

''ඇයි අන්න අප්පා බණිනවා. අර ළමයව පිළිගත්තෙ නෑ කියල.''

''රතු පලස් දමන්න කිව්වෙ නැහෙ අම්මා..''

''ඔහොම කතා කරන්න එපා..''

ඇය කතා කළාය.

''තේ ලැස්තියි.. මම ලැස්ති කළා කියල කියන්න එපා.. එතකොට බොන එකක් නැහැ.''

සාවිත්‍රිට දුව පැවසූ දෙය පිළිගත හැක.

මේ දරුවා පිටස්තරයෙක් යැයි නොසිතේ. ඒ දිනවල මෙවැනි පිරිමි දරුවෙක් සිටියොත් මැනවැයි සිතූ හැටි මතකය.

''යමු පුතා තේ බොන්න..''



''එපා අම්මා.. මම උදේ තේ බීලයි ආවේ..''

''කමක් නෑ පුතා.. අපිත් එක්ක තේ බොමු..''

චෛත්‍ය ලිංගම්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට පුලුවන් කමක් ඔහුට තිබුණේ නැත.

මේ ගමන ආවෙ අප්පච්චිගේ ඉල්ලීම පිටය. සිංහල ජාතික සංවිධානයේ සිටින ලොකු අයියා සහ විශ්ව විද්‍යාලයේ උගන්වන අක්කා සැබැවින්ම ජාතිවාදීන්ය.

අද ලෝකයේ බහුලව පවතින්නේ ජාතිවාදී සංවිධානයන්ය. සිංහල මිනිසුන් සිටින්නේ එම බස කතා කරන්නේ සිංහලයන් පමණි.

ද්‍රවිඩ ජාතිය වෙනත් රටවල ද සිටිති. එම භාෂාව කතා කරන අය ද වෙන රටවල ද සිටිති. එනිසා අපගේ අනන්‍යතාවය ආරක්ෂා කරගත යුතුය.

''ඇයි පුතා කල්පනා කළේ සයිවර් කෑම හින්දද..?''

''නෑ අංකල්.. මට මේව කාල හොඳට පුරුදුයි.''

උදේ ආහාරය ගනිමින් කතා කළේ පාඩම් පටන් ගන්නා ආකාරය පිළිබඳවය.

''උමා එක්ක ගායනය ඉගෙන ගන්න පුලුවන්..''

ඔහු නිහඬව සිටියේය.

''ඇන්ටි එක්ක ශාස්ත්‍රීය සංගීතය ඉගෙන ගන්න පුලුවන්.''

ඔහු හිස සලා සිනාසුණේය. උමා මව අසලට වී සිටියා විනා කිසිවක් කීවේ නැත.

''දැන් පුතා නවතින්නෙ කොහෙද..?''

''හැමදාම නුවර ඉඳල එන්නයි හිතන් ඉන්නෙ..''

''එහෙම බෑ.. සමහර ගායනා රෑ පාන්දර කරන්න වෙනවා. ඒ නිසා නවතින්න වෙයි..''

අප්පා තරුණයා මෙහි නතර කර ගනිතැයි යන සැකය සිතේ ඇතිවුණි. තව කාමර කීපයක් හිස්ව තිබුණත් පිටස්තරයෙක් නතර කරගත නොහැක.

''අප්පා පිට අය නම් ගෙදර නවත්තගන්න එපා..''

ඇය අප්පාට තේරෙන අයුරින් කීවාය. ඇත්තටම ගැහැනු ළමයෙක් ඉන්නා ගෙදරක පිටස්තර පිරිමියෙක් නතර කර ගැනීම යුතු නැත.

''කොහොමටත් මෙයාට නතර වෙන්න තැනක් හොයා දෙන්න ඕනෑ. නැති නම් මගෙ යාලුවා අමනාප වෙයි.''

තේ පානයෙන් පසු තරමක් වෙලාවක් යනතෙක් ඔවුහු කතා කරමින් උන්හ. පන්ති පටන් ගැනීමට ප්‍රථම කාමරයට ගොස් කණ්නාඩිය ළඟ සිටගත්තාය. මේ කරන්නේ අප්පා විසින් පවරන ලද කටයුත්තකි.

''දුව.. එහෙනම් ගිහින් පන්තිය පටන් ගන්න.''

ඇය එක එල්ලේ තරුණයා දෙස බලා සිටියාය. ශිල්ප ඥානය නිකම් දිය නොහැක. ඇය ඔහුට හිසින් සංඥා කළාය.



# 05

සංගීත ශාස්ත්‍රය මහා සාගරය මෙනි. දන්න ඉගෙන කෙළවර කිරීමට පුළුවන් කමක් නැත. අප්පච්චිට ඒ බැරෑරුම් කටයුත්ත මෙහිදී නොපුළුවන. ඉටු කරගත හැකි වුවත් මේ දමිළ තරුණිය ගෙන් ඉගෙනීමට නොපුළුවන. එක්වරම අභිමානයක් සිතට පිවිසුනි. ඇය කෙතරම් දක්ෂ වුණත් ඇගෙන් ඉගෙන ගැනීමට ඔහු කැමති වූයේ නැත. උමා වැනි අහංකාර තරුණියකගෙන් ඉගෙන ගැනීමට ඔහු කිසිසේත් කැමති වූයේ නැත. උමා පැහැදිලිවම තරුණයාගේ සිත හැඳින සිටියාය. සිංහල දෙමළ අරගලය නිමාවට පත්ව නැත. පැහැදිලිව යුද්ධයක් පවතින මොහොතක අප්පා විසින් කරන ලද්දේ බරපතල වරදකි. අප්පා හා මීට වසර විස්සකට ඉහත සිටි මිතුරන් අතර සබඳකම් තියෙන්ට පුළුවන. අද එවැනි සම්බන්ධකම් පැවැත්විය නොහැක. එය සැබැවින්ම පැවැත්වෙන යථාර්ථයට වඩා වෙනස්ය. මුහුණට මුහුණ දී කතා කිරීමට බැරි කෙනෙක් සමග ඇසුරක් පැවැත්වීමට නොහැක.

පෙර දිග අධ්‍යාපන ක්‍රමය අනුව ඒ හා බැඳි සම්ප්‍රදායන් ඇත. ගුරුවරයාට ආචාර කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුය. තමාගෙන් ඉගෙන ගැනීමට අප්පා විසින් කියා සිටියත් ඔහු තමා මගහැර ගිය හැටි ඇය දුටුවාය.

උමා කේලමක් ලෙස පියාට කීවේ නැත. ඕනෑ නම් ආවදෙන් ඇය සිත හදා ගැනීමට උත්සාහ කළාය.

අප්පා තමාට බාර දුන්නත් සතියක් ගතවන තෙක් වුවද ඔහු මූණ ගැහුනේ නැත.

''අර ළමයා ආවෙ නැද්ද?''

''කොයි ළමයද?''

උමා මවගෙන් ඇසුවාය.

''අප්පගෙ යාළුවාගෙ පුතා.''

''එක දවසයි දැක්කෙ. ඊට පස්සෙ දැක්කෙ නෑ.''

''දූව.. ඔයත් නරකයි. ඇයි ඒ ළමයගෙ හිත කැඩෙන්ට කතා කළේ?''

''මට කාගෙවත් හිත හොඳ කරන්ට ඕනෙ නැහැ.''

අප්පා එදවස ආවේ තරමක් පමාවීය. මුහුණ සෝදා සාලයට පැමිණි සැණින් විමසුවේ උදිත් ගැනය.

''අද උදිත් ළමයා ආවෙ නැද්ද?''

නුදුරින් සිටිය ද උමා පිළිතුරක් දුන්නේ නැත. එන කෙනෙකුට උගන්නනවා හැරුණු විට ඔවුන් පිළිබඳ සෙවීමට කිසිම උවමනාවක් නැත.

''සාවිස්ත්‍රි අර ළමයා ආවද?''

''එදායින් පස්සෙ දැක්කෙ නෑ. ගමේ ගියාද දන්නෙ නෑ.''

''ගමේ යන්නෙ නෑ.''

ඔහු මොහොතක් කල්පනා කළේය. වර්තමාන පරපුර පිළිබඳව කිසිම විශ්වාසයක් නැත. මේ හැම ප්‍රශ්නයක්ම නිර්මාණය කරගෙන ඇත්තේ ඔවුන් පිළිබඳව ඇති අනවබෝධය නිසාය. නිවසට පැමිණි තැනැත්තා පිළිබඳව කිසිවක් කිව නොහැක.

''මේ ළමයා උදිත්ට මොනවත් කිව්වද දන්නෙ නෑ.''

''නෑ අප්පා. මම කිසි දෙයක් කිව්වෙ නෑ.''

අනවශ්‍ය ප්‍රශ්නයක් නිසා තමාට දෙමාපියන්ගෙන් බැනුම් අහන්න සිදුවීම පිළිබඳව ඇය උදිත් සමඟ අමනාපයට පත්ව සිටියාය.

උමා පෙරවරුවේ නිවසින් බැහැරව ගියේ අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහාය. උතුරු නැගෙනහිර ප්‍රශ්න දිග් ගැස්සෙමින් තිබිණ. එම ඔඩු දුවන ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට කිසිවෙකුට



කිසිම ඕනෑකමක් නැත. ඉන්දියානු සංස්කෘතික ශාලාවේ පැවති උත්සවයකට සහභාගි වූ ඇය ඉන් පිටතට ආවේ කෞශල්‍යා සමඟිනි. පරිසරයේ මොනවා හෝ වෙනසක් සිදුව ඇත. බස් නැවතුම්පළවල්වල පිරිස් රැස්ව සිටිනු පෙනේ.

''උමා මොකක්හරි ප්‍රශ්නයක්.''

''බස් නෑ. කොහේ හරි බස් කොන්දොස්තර කෙනෙකුට පහර දීමක් වෙලා. ඒ නිසා බස් ස්ට්‍රයික් එකක්.''

උමා කීවාය.

''උන්ට නම් ගඟල මදි. බස් එකක් එලවන්ට දන්නෙ නෑ.. කතා කරන්ට දන්නෙ නෑ.''

''හරි වැඩේ. මෙච්චර දුර පයින් යන්ට බෑ. ආටෝ කාරයො එක්ක යන්නත් බයයි.''

''අපිට නම් කමක් නෑ. උමා වගේ ලස්සන කෙල්ලෙක් තනියම යන්ට එපා. මාත් එන්නම්.''

කෞශල්‍යා කීවාය.

''ඔන් ඔචට නම් මම කැමති නෑ. පිරිමින්ට ගැහැනු මසක් කැත ලස්සන අවශ්‍ය නෑ. අපි පරිස්සම් වෙන්න අපි දැන ගන්න ඕනි.''

''එහෙනම් අපි පයින් යමුද?''

''ඔව්. ඒක ඇඟට ගුණයි.''

ඔව්හු සෑහෙන වේලාවක් බසයක් එනතෙක් බලා සිට ගමන් ඇරඹූහ. පරිසරයේ සැබවින්ම වෙනසක් සිදුව ඇත. දවස පුරාම පැතිර තිබුණේ මලානික වැසි බර ගතියකි. මුහුද දෙස සිට හමා එන තෙත සුළං රැළි මුහුණේ වදී. නිනම් මොහොතක හෝ වැසි වැටෙනැයි පවසන පූර්ව දැනුම් දීමක් එම පණිවිඩයේ ඇත.

''අර කවුද බෝයි කෙනෙක් ආඩා කිව්වා. ඒ කතාව කිව්වෙ

නැමෙ."

ගමනට අත් වැලක් සපයනුවස් කෞශල්‍යා කීවාය.

"කියන්න දෙයක් නෑ. ඒ කතාව එච්චරයි. ඊට පස්සෙ ආවෙ නෑ."

"සිංහල බෝයි කෙනෙක් කිව්වා නේද?"

"අපෙ අප්පගෙ යාළුවෙකුගෙ පුතෙක්. ඒගොල්ලො කැන්ඩියන් ඩාන්සර්ස්ලා."

"ඉතින් විස්තර කියන්නකො. මේ වගෙ හමුවීම් තමයි ලව් ස්ටෝරියක් වෙන්නෙ."

කෞෂි සිනාසුනාය.

"මෙ පිස්සු නැතුව ඉන්න. මම ඒකා දිහා හරියට බැලුවෙවත් නෑ."

"ඔයා පන්තියෙ ඉඳලා වරින් වර ගිහින් බලලා එන හැටි මට මැව්ලා පේනවා වගේ. වතුර තිබහයි මොනවා හරි බොමුද?"

"මේ ඉක්මනට යමු. මා ගාව සල්ලි නෑ."

"ලඩ්ඩු එකක් කාලා ෆලුඩා එකක් බොමු."

කෞෂි යෝජනා කළාය.

"උඹ නම් පුදුම කෙල්ලෙක්. මම නම් කවදාවත් කඩයකට ගිහින් නෑ."

"එහෙම බෑ උමා. ගැහැනු සුකුමල ලද බොළඳ බව ඇත්ත. අද තත්ත්වය ඊට වෙනස්. චෙන්නයිවල ඉන්දෙද්දි අපි අපේ වැඩ තනියම කර ගන්නා."

ඔව්හු දමිළ සිසිල් බීම හලක් වෙත ගොස් අසුන් ගත්හ. කෞෂි පවසන්නේ සැබෑවකි. අද ගැහැනුන්ට පැවරී ඇති වගකීම විශාලය. පොදුවේ ගැහැනු මුහුණ දෙන ප්‍රශ්නවලට අමතරව දමිළ



ජාතිකයන්ව ඉපදීම නිසා පැණ නගින ලද ප්‍රශ්න ද ඇත. ගත වූ දශ අට වසර තුළ ඇයට සිංහල තරුණයන්ගෙන් ප්‍රශ්න පැන නැගී නැත. හදිස්සියෙන් දිනෙක දඟකාර සරදමක් කළ ද ඔවුන් වෙතින් කදබල බලපෑමක් ඇතිව නැත.

එහෙත් යනෙන තැන තමාට කරදරයකට සිටින දමිළ පිරිමි කීප දෙනෙක් ඇත. හින්දු බාලිකා විද්‍යාලය අසල, කෝවිල අසල හා සංස්කෘතික මධ්‍යස්ථානයේදී තම ඇසුර ඉල්ලා පසුපස එන එක් තැනැත්තෙක් නිසා ඉගෙනීම පවා එපාවී ඇත. සිදුවන හැම දෙයක්ම දෙමාපියන්ට නොපවසන්නේ එය ඔවුන්ට කරදරයක් විය හැකි බව දන්නා හෙයිනි.

"ගේන දෙයක් ඉක්මනින් ගෙනෙන්."

උමා සිසිල් බීම ශාලාවේ අසුන් ගනිමින් කීවාය.

"පොඩ්ඩක් රෙස්ට් කරලා යමු."

"මම කවදාවත් මේ වගේ කඩවලට තනියම ඇවිදින් නෑ."

"කසාද බැඳලා ළමයි හම්බ වෙලා දරුවොත් අරගෙන එන්න ඉගෙන ගන්න ඕනෑ."

"ලැජ්ජා නැද්ද..? හෙමින් කතා කරපන්."

වේටර් ගෙනා රසකැවිල්ල ප්‍රණීතය.

"රසයි. තව එකක් කන්න සල්ලි තියෙනවද?"

"කාපං.. කාපං.. හැබැයි උඹ දවසක අරන් දෙන්න ඕනෑ. ආටාවලින් යන සල්ලි වියදම් කරලා කමු."

දෙමාපියන්ගෙන් වෙන්ව මේ ගෙවන ජීවිතයේ ද මිහිරක් ඇත.

"කෞෂි.. සල්ලි මදි නම් මාත් ගානක් දෙන්නම්. වේටර්ටත් ටියක්වත් දීපං."

කොෆි වේටර්වරයාට කතා කළාය.

"ඇයි මිස් තව මොනාවත් ඕනැද?"

"බිල ගේන්න."

උමා කීවාය.

"සල්ලි ප්‍රශ්නයක් නෑ. ඔක්කොම හරි."

වේටර් වරයා මඳ සිනාවෙන් යුතුව කීවාය.

"අපි කැව ඒවට බිල ගෙවන්න ඕනෑ."

උමා කීවේ තරමක අමනාපයෙන් යුතුවය.

"මිස් අර පිටිපස්සෙ ඉන්න සර් බිල ගෙව්වා."

උමා පසුපස හැරී බැලුවාය. තමා දෙස කෑදර සිනාවකින් බලා සිටින උදයන් දුටු විට සිතේ ඇති වූයේ කෝපයකි. ඔහු සෑහෙන කරදරයක් බවට පත්ව ඇත.

"අපේ බිල ගේන්න."

උමා සැරෙන් කීවාය.

"ඒ බිල සෙට්ල්. උදයන් සර්ගෙ එකවුන්ට් එකට දැම්මා."

"මෙතන දන්සැල් දාලා නැහැ. කරුණාකරලා අපේ බිල ගේන්න."

"ඔන්න ඔහේ ගෙව්වාවෙ."

කොමලතා කීවාය.

අසුනෙන් නැගී සිටි ඇය කැෂියර් කවුන්ටරය අසලට ගොස් මේසය මත මුදල් තැබුවාය.

"ලඩ්ඩු හතරයි, ෆලූඩා දෙකයි."

ඇය මුදල් ගෙවද්දී උදයන් ඇය අසලට ආවේය.



"උමා මට මේ සල්ලි ගෙවන්න ඉඩ දෙන්න."

ඇය පිළිතුරක් නොදී ඉතිරි සල්ලි සිය අත් බෑගයේ දමා ගත්තාය.

උදයන් කෝටිපති ව්‍යාපාරිකයෙකි. ඔහු දැන් 'උදයන්' සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කරයි. පියාගේ මුදලින් සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන හෙතෙම ගත කරන්නේ යහපත් ජීවිතයක් නොවේ.

නිතරම ඔහුගේ සහායට තරුණ ආරක්ෂකයන් සිටී. ඔහුගේ වාහනය පසුපස පරිවාර වාහනයන් ද එයි.

උමා හදිසියේම එළියට ආවාය.

"උමා අද බස් ස්ට්‍රයික් එකක්ලු. ඉන්න මම ඔයාව ගෙදරට ඇරලන්නම්."

ඔහු සිය සුඛෝපභෝගී රථය දක්වමින් කීවේය.

"අවශ්‍ය නෑ. අපිට පයින් යන්න පුළුවන්."

"ඔන්න ඔහේ යමු බං. මගේ කකුල් දෙකත් රිදෙනවා."

උමා ඉදිරියට යද්දී හෙතෙම ඇගේ මඟ අවුරා සිට ගත්තේය.

"ඉන්න මම ගිහින් දාන්නම්."

"ප්ලීස් ලිව් මී එලෝන්. මට මගේ පාඩුවේ ඉන්න ඉඩ දෙන්න."

ඇය අමනාපයෙන් කීවාය.

උදිත් තවාතැන වෙත යමින් සිටියදී සිසිල් පැන් හලට ආවේ කිසිවක් පානය කිරීම සඳහාය. සිසිල් පැන් වීදුරුව පානය කර පිටතට එද්දී ඈතින් සිටි උමා හඳුනා ගත්තේය. කිසියම් තරුණ පිරිසක් තම ගුරුවරයාගේ දියණිය වන උමාට කරදර කරනු ඔහු දුටුවේය. අනුන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වීමට නොපුළුවන. එකවරම

උමා තමා දෙස අහිංසක ලෙස බැලුවේ උපකාරයක් අපේක්ෂාවෙනි. අසුනින් නැගිට සිටි උදිත් ඔවුනතරට ගියේය.

''උමා කැව නම් බිව්ව නම් මොකද කරන්නේ... ඉක්මනට යන්න.''

නීලන් හා උදයන් උදිත් දෙස එකවරම බැලූහ.

අයියේ... මේ අනුන්ගෙ වැඩවලට හොට දාන්නෙ නැතිව යනවා යන්න.''

උදයන් කීවේය.

''අනුන් නෙවේ.. මේ මගේ නංගි.. මොකක්ද ප්‍රශ්නය..?''

''කන්න හිතුණාම කබරයත් තලගොයා වෙනවලු. මේ දෙමළ ගර්ල් තමුසෙගෙ නංගි වුණේ කොහොමද?''

උදයන් ඇසුවේය.

''දැනගන්ට ඕනැද? මම තමයි මෙයාගෙ අක්කා බඳින්න ඉන්නෙ. මේ මගෙ නෑනා.''

ඔහු කටට ආ දෙය කීවේය.

උදයන් දෑස් අයා උදිත් දෙස බලා සිටියේය. යාපනේ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන චේතා වෛතාලිංගම් විවාහ කර ගැනීමට සිටින්නේ තමාය. චේතා සිංහල තරුණයෙක් සමග බැඳී සිටින බව විශ්වාස කිරීමට නොහැකි විය. සිංහල තරුණයා උමාව ත්‍රීවිලරයක නංවා යවනු ඔහු බලා සිටියේ කෝපයෙන් යුතුවය.



# 06

උදිත් විසින් නතර කර දුන් ත්‍රීවිලරයෙන් නිවසට ගියා විනා සිදුවූයේ කුමක්දැයි උමා දැන සිටියේ නැත. නිවසට පැමිණ බොහෝ වේලාවක් යනතෙක් කිසිම දෙයක් ගැන සිතීමට පුළුවන් කමක් ඇයට නොතිබුණි.

''බස් ස්ට්‍රයික් නේද?''

ගේට්ටුව අසල සිටි අම්මා විමසුවාය. එයට පිළිතුරක් දීමට තරම් එකලස් සිතක් නොතිබුණි. අම්මා තමා පසුපස එනු දුටු ඇය කාමරයට පිවිස ඇඳේ ඉඳගත්තාය. මීට මඳ වේලාවකට ඉහත සිදුවූ දෙයින් සිත සසලව තිබුණි.

''ඇයි මහන්සිද? ත්‍රීවිලර් එකේ එන්න සල්ලි තිබුණද?''

''මා ගාව සල්ලි තිබුණෙ නෑ.. කොහොම දෙයි.''

සිදු වූ කිසිවක් මවට පැවසීමට පුළුවන් කමක් නැත.

''වැඩිපුර අතේ කීයක්වත් තියාගන්න ඕනෑ කියන්නෙ මේ නිසයි.''

අම්මා කාමරයෙන් පිටව ගිය පසු සල්වාරිය ගලවා මොහොතකට ඇඳේ හාන්සි වුණාය.

කවර ජාතියකට අයත් වුවත් උදයන් වැනි පුද්ගලයන් ඇසුරු කිරීමට සුදුසු නැත. එහෙත් ඔවුනට ඇත්තේ ප්‍රබල පිළිගැනීමකි. තරුණ සංවිධාන සඳහා කැපී පෙනෙන මෙහෙයක් ඉටුකර ඇතැයි චේතා අක්කා පවසයි. නිතර වැල්ලවත්ත ප්‍රදේශයේ හැසිරෙන ඔහුට ඇත්තේ ලොකු තත්ත්වයකි. ඔහුට ඇති පිළිගැනීම පිළිබඳ විවාදයක් නැත. එහෙත් මේ තරම් දෙමළ ගැහැනු සිටියදී තමා පසුපස එන්නේ ඇයි..? ප්‍රධාන ප්‍රශ්නය එය නොවේ.. මෙවන් මොහොතක තමා ගලවා ගැනීම සඳහා ඉදිරිපත් වූ උදිත් පිළිබඳව නොසිතාම බැරිය.

මැරයන්ගෙන් ඔහුට හිරිහැරයක් සිදුවුණාද? එම ප්‍රශ්නය විසඳීමට ප්‍රථම පැමිණීමෙන් තමා වෙතින් බලවත් වරදක් සිදුවිනැයි ඇයට සිතේ. ඔවුන් ''වේතාගේ'' සමීප හිතවතුන්ය. ඔවුන්ගෙන් උදිත්ට හිරිහැරයක් සිදුවුනාද? එය නොවන්නට කිසිසේත් හේතුවක් නැත. දිවා ආහාරය ගැනීමටවත් සිතේ සතුටක් තිබුණේ නැත.

''අර ළමයා පන්ති ආවේ නැද්ද?''

අප්පච්චිගේ හඬ ඇසුණි.

''අද බස් ස්ට්‍රයික් එකක්.''

අම්මා පිළිතුරු දෙන හඬ ශ්‍රවණය වුණි.

''ඔයා ඉස්සෙල්ලාම ඒ ළමයට උමාගෙන් ඉගෙන ගන්න කිව්ව එක වැරදියි.''

වෛතාලිංගම් මැතිනිය කීවාය.

''උදිත් එච්චර මෝඩ ළමයෙක් නෙමේ. අපි කලාව ඉගෙන ගනිද්දි නිපුණ නම් මිසක් වයස, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භේදය සලකන්නෙ නෑ. උදිත් ඒ සිද්ධාන්තය තුළ ඉන්න බව මම දන්නවා.''

''කෝ උමා...? ''ඉන්ඩියන් කල්චර් සෙන්ටර්'' එකට ගියාද?''

''ගිහින් ආවා. ඔය නිදන් ඉන්නෙ..''

ඇඳේ පහසු ලෙස වැතිර සිටිද්දී ඇයට දෙමාපියන්ගේ සාකච්ඡාව ඇසුණි. ඇයට එකවරම අම්මගේ හඬ ඇසුණි.

''උමා මෙන්න කෝල්..''

''තියන්න අම්මා මම මෙහෙන් ගන්නම්.''

ඇය රිසීවරය ඔසවමින් කීවාය. ඇයට එකවරම කෞශලාගේ හඬ ඇසුණි.

''මම මේ ඔයාට කතා කරන්න විදිහක් නැතිවයි හිටියෙ. වෙච්ච කිසි දෙයක් ගෙදරට කිව්වෙ නෑ ඒකයි.''



''හරි වැඩේනෙ වුණේ. මේක නිකම්ම වෙන්න බෑ. උදයන් අපි පස්සෙන්ම ඇවිදින්.''

''ඒක නෙමේ ඊට පස්සෙ වෙච්ච දේ..''

''කවුද ඔයාව බේරගත්ත බෝයි..?''

''ඒ තමා උදිත්. මගෙන් මියුසික් ඉගෙන ගන්න එන සිංහල බෝයි..''

''හානේ.. දැනුයි මට කතාව තේරුණේ. හැන්ඩ්සම් කොල්ලෙක්.''

''ඔහොම හිටියට හරි ආඩම්බරයි. තවම මා එක්ක වචනයක්වත් කතා කරල නෑ. තැන්ක්යූ වෙරිමච්. උඹ අතේ සල්ලි නොතිබුණා නම් අපිට සිද්ධ වෙන්නෙ පයින් එන්නයි. ගෙදරට යන්න කීයක් ගත්තද?''

''ත්‍රීවිලර් කාරයා සතයක්වත් ගත්තෙ නෑ.''

''හානේ.. උදයන් සල්ලි ගෙවලද?''

''නෑ උදයන් නෙමේ.. අර සිංහල බෝයි ඩ්‍රයිවර්ට සල්ලි දීලා.''

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

''මාව බේරගන්න ගිහින් උදිත්ට කරදරයක් වුණාද දන්නෙ නෑ.''

''ඒක තමා ප්‍රශ්නෙ. ඒ වුණාට ඒ ගැන එච්චර මහන්සි වෙන්න එපා.''

''නෑ කෙල්ලෙ කරපු උදව්ව මතක තියෙන්න ඕනෑ. ජාති මොනවා වුණත් ගැහැනියක්ගෙ ආත්ම ගෞරවය එකයි. ඒකට ජාති භේදයක් නෑ.''

''ඒක ඇත්ත. ගැහැනියකුගේ අවසරයක් නැතිව එයාව

ස්පර්ශ කරන්න බෑ. කවුරු වුණත් කමක් නෑ උඹව බේර ගන්නෙ.''

උමා පිළිතුරක් දුන්නේ නැත. ඇගේ කතාව සත්‍යයකි. එහෙත් පවතින වාතාවරණය තුළ කිසිවක් කළ නොහැක. කවුරු කෙසේ සැහැල්ලුවට සිතුවත් රට තුළ යුද්ධයක් පවතී. ඒවා පෞද්ගලිකව ජනතාව සතු වූ ඒවා නොවේ. මේවා දේශපාලනඥයන්ගේ ප්‍රශ්නය.

''මට උදයන් විශ්වාස නෑ. අර බෝයිට මොනවත් කළාද දන්නෙ නෑ.''

''ඒක තමා. ඔයාට බැරිද මේ ගැන ටිකක් හොයලා බලන්න.''

''උඹ බය නැතුව හිටපං..'' කෞශල්‍යා කීවාය.

සිදුවූ කිසිවක් ඕනෑකමින් කළ ඒවා නොවේ. උදිත් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක් ලෙස සේවය කරන අක්කා හමුවීමට ගියේ ඇගේ ආරාධනය අනුවය. ඉගෙනීමේ කටයුතු සඳහා මාස්පතා සැමදෙනාගෙන්ම මුදල් ලැබෙයි. ඒ පිළිබඳව වැඩි කැමැත්තක් නැති වුණත් මාස්පතා එය ගත යුතු වෙයි.

''දැන් මොකක්ද කරන්න කල්පනාව...?''

ජනනි සොයුරාගෙන් ඇසුවාය.

''හැමදාම අප්පච්චි වගේ පෙරහැරට නටන්නද හිතන් ඉන්නෙ.''

''ඉතින් ඒකෙ ඇති වරද මොකක්ද? ලේසියෙන්ම ලෝකය දිනා ගන්න පුළුවන් වන්නෙ කලාවෙන් විතරයි.''

''ඔය මෝඩ කතා කියන්නෙ නැතිව සංගීත විද්‍යාලෙ කථිකාචාර්ය තනතුරකට ඇප්ලිකේෂන් එකක් දාන්න.''

''දැන්ම එපා කියලා අප්පච්චි කියනවා. මාව අර වෛතාලිංගම් කියන මාස්ටර් ගාවට දම්මා.''

''මොනවද මල්ලි ඔඹ කරන්නෙ. අප්පච්චිට පිස්සුවෙන්නැති. ඔයාටත් පිස්සුද? ඒ අයත් එක්ක ආශ්‍රය කරන්න එපා.''



අක්කා කතා කරන්නේ ජාතික හැඟීමෙන් යුතුවය. අද බොහෝ දෙනෙක් මේ ඉතිහාසය සානුකම්පිත ලෙස විකෘති කිරීමට පිඹුරුපත් සකසති. අපේ සැබෑ ඉතිහාසය හැම ශ්‍රී ලාංකිකයෙක්ම දැන ගත යුතුය. අපේ වීරකම්, අපේ අනුවන කම්, අපේ ඉතිහාසයේ රට බේරාගත් විරුවන්, රට පාවා දුන්නන්ගෙන් මේ ඉතිහාසය පිරී පවතී. ජනනි අක්කා නිජබිම පිළිබඳව වූ සංකල්පය පැහැදිලි ලෙස ඉදිරිපත් කළේ පුරා විද්‍යාත්මක සාධක අනුවය. ඇය උතුරු නැගෙනහිර පිළිබඳව වූ නිබන්ධන අතියයින් තර්කානුකූල ඒවාය. බොහෝ දෙනාගේ ඇස් මේ ඉතිහාස තොරතුරු පිළිබඳව යොමුව තිබුණි.

''මිස්ටර් වෛතාලිංගම් අප්පච්චිගෙ හොඳම යාළුවෙක්. එයා දීලේවැල්ලෙ'' අපේ ගෙදරත් ඇවිදින් තියෙනවා.''

''ඔව් මට මතකයි අපි යාපනේ ගිහින් තියෙනවා. ඒත් අපිට ඒ අතීත ඉතිහාසයට එන්න බෑ. දැන් ඒ මිනිස්සු අපට විරුද්ධයි.''

''මාත් පෞද්ගලිකව ඒ ගෙවල්වලට යන්ට කැමති නෑ. ඒත් සංගීතයට, කලාවට භාෂාවක් නෑ. නිර්මාණකරුවෝ විදිහට අපි ඒවා ඉගෙන ගන්ට ඕනෑ.''

''ඒක තමා සැබෑ කලාව. ඒක වෙන අයගෙන් ඉගෙන ගන්න පුළුවන්. ඒත් මේ මිනිස්සු ගාවට යන්ට එපා.

අක්කා දැඩි ලෙස නොකිව්වත් ඔවුන් හා හිතවත්කම් පැවැත්වීම පිළිබඳව ඇය කිසිම අනුකූලතාවයක් දැක්වූයේ නැත.

''ඊයේ නතර වුණේ කොහේද?''

''මගෙ යාළුවෙක්ගෙ බෝඩිමේ. මිස්ට වෛතාලිංගම්ගෙ ගෙදර ලොකුයි. එහෙ නතර වෙන්න පුළුවන්.''

''නෑ.. නෑ.. ඒ ගෙවල්වල නතර වෙන්න ඕනෑ නෑ. ඔයා මෙහෙ එන්න. මෙහෙ ඉන්න. ඔන්න කිව්වා.. කෑම කන්න ගෙදර යන්න එපා.''

මෙහි පැමිණීමෙන් සිදුවූයේ බරපතල වරදකි. සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්ය පදවියක් ලබා ගැනීමට මේ අධ්‍යාපනය හොඳටම ප්‍රමාණවත්ය. දිවා සමයේ ගියේ රූපවාහිනී නිවේදක තනතුරක් සඳහා වූ පරීක්ෂණයකටය. එතරම් කරදරයක් නැතිව එම තනතුර ලැබුණේ සංගීත දැනුම නිසාය. ලොකු ආදායමක් නොලැබුණත් අගනුවර රැඳීමට එය හොඳ රැකුලක් යැයි ඔහු සිතුවේය. ඔහු එදින ඉන්දීය සංස්කෘතික මධ්‍යස්ථානයට ගියේ නවදිල්ලියේ පදිංචිව සිටින දැනට මෙහි සේවය කරන එක් සේවිකාවක් හමුවීමටය. ජේබාදත් එක් වරක් පමණ නවදිල්ලියේදී මුණ ගැසී ඇත. නිවසින් එවන ලද ඇඳුම් පාර්සලයක් දීමට ඔහු ජේබාදත් හමුවීමට සංස්කෘතික මධ්‍යස්ථානයට ගියේය. පාර්සලය ඇයට දී ආපසු එන ගමනේදී සිසිල් බීම වීදුරුවක් පානය කිරීමට ගිය හැටි මතකය.

සිසිල් බීම ශාලාවට පැමිණි යුවතිය හඳුනා ගැනීමට ගතවූයේ නිමේෂයකි. දින දෙකක් ඇය හමුවූ හැටි මතකය. විසිර තිබූ ලස්සනක් තිබුණත් අද එය තිබූ ලෙස කැපී පෙනෙනු ඔහු දුටුවේය. හැඳ සිටියේ ලා කොළ පැහැති සල්වාරියකි. දමිළ බවක් නම් පෙනෙන්නට නැත. පන්ජාබි හෝ කේරල පෙනුමක් ඇය වෙතින් දිස්වුණි.

තමාව සාදරයෙන් නොපිළිගත්ත ද ඇයට සංගීත ශාස්ත්‍රය පිළිබඳ හොඳ අවබෝධයක් ඇති බව ඔහුට හැඟුණි. දමිළ ස්තෝත්‍ර ගී, කර්ණාටක සංගීතය මුසුව ගායනා කරන හැටි ඔහු අසා තිබුණි. ඉන්දියාවේදී තමා මේවා ප්‍රගුණ කර තිබුණත් ඔහු ඒ පිළිබඳව කිසිවක් කීවේ නැත. එසේ වුවත් ජන ගී, පාරු ගී, ගැමි නැටුම් වැනි දේ පර්යේෂණ කරමින් සිටින නිසා ඔවුන් දන්නා දේ නිහතමානීව ඉගෙනීමට ඔහු සිතා සිටියේය. එක් පසෙක සිට බලනවිට ඇගේ රුව මනා ලෙස කැපී පෙනුණි. අසුනෙන් නැගිට යනවිට උපතින් නිම වූ ගැහැනු හැඩය සිත අවුල් කිරීමට සමත් වුණි. ඔවුන් සිසිල් බීම පානය කරද්දී තරුණ ගැටව් පිරිසක් ඇයට කරදර කරන හැටි ඔහු දුටුවේය. ඔවුන් උමා හඳුනන දෙමළ තරුණ



පිරිසක් යැයි ඔහුට සිතුණි. එහෙත් මේ සිදුවන්නේ තරුණිය අකමැති කටයුත්තකි. එහෙත් නොදන්නා පිරිසකගේ පෞද්ගලික ප්‍රශ්නයකට මැදි වීමට සිතුනේ නැත. එහෙත් සිසිල් බීම හලෙන් පිටතට පැමිණි පසු තරුණයා උමාට බලපෑමක් කරනු දුටු පසු සිතට කෝපයක් පිවිසුණි.

"කරුණාකරලා මේ ගර්ල්ට යන්න දෙනවා."

උදිත් තරුණියට හිරිහැර කිරීමට සූදානම් වන තරුණයාට කීවේය.

"අයි මොනවා කළාම තමුසෙට මොකද? මේ තමුසෙගෙ කවුද?"

"මේ මගෙ වයිෆ්ගෙ නංගි.."

ඔහු මේ කතාව නිසා තමා දෙස බලා සිටි හැටි සිහිවුණි.

"වේනා" උඹේ කවුද?"

"වේනා මගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්"

ඔවුන් තරමක් සන්සුන් වූයේ ඉන් පසුවය. වේනා යන නමක්වත් ඔහු අසා නොතිබුණි. කෙසේ හෝ ඇය නිදහස් වීම පිළිබඳ ඔහුගේ සිතේ ඇති වූයේ සතුටකි.

# 07

සිදුවූ දේ පිළිබඳව සියලු තොරතුරු කෞශල්‍යා සමඟ කතා කිරීමට නොපුළුවන. කොළඹ නතරව සිටියත් යාපනය හා සම්බන්ධකම් පවතී. "වේනා" අක්කා එක්සත් මිශන ව්‍යාපාරයක සාමාජිකාවක් බව සැවොම දනිති. මෙම ව්‍යාපාරවල සම්බන්ධ වූවනට නිල වශයෙන් පෙම් සබඳතා පැවැත්වීම තහනම්ය.

එයට දොස් තැබීමට පුළුවන් කමක් නැත. සකල විධ හැඟුම් තුළ පළිගැනීමේ, වෛර කිරීම, සිතුමක ශාසන නැත. එහෙත් අද

ඒ හැම විකෘති වී ඇත. ඇය මේ තත්ත්වයට පත්ව සිටීම පිළිබඳව සැමෝම දනිති. මේ පිළිබඳව කිසිවකුට කිරීමට දෙයක් නැත.

ඇය බලා සිටියේ උදිත් එන තෙක්ය. මොනවා කරනවද දන්නෙ නෑ. දූන් පාඩම කීයක් පහු වුණාද?

පෙරවරුවේ පන්තිය ආරම්භ වුණි. පාසල් නිවාඩුව තිබූ හෙයින් පිරිස වැඩිවී ඇත. වෙනදා ඉගැන්වීමට තිබූ උනන්දුව අද නැත. මේ පිටස්තරයෙක් පැමිණ සිත අවුල් කළේ යැයි ඇයට සිතුණි.

එම සතිය ගෙවී ගියේ කුසීත ලෙසිනි. මෝසම් වැසි ආරම්භව තිබූ නිසා නිවසින් පිටව යාමටවත් නොසිතේ. පන්තිවලට කෙටි නිවාඩුවක් දී තිබුණ නිසා පරිසරයේ පැවතුණේ නිහඬ බවකි. වෙනදා සිතාරයක, සර්පිනාවක හෝ බෙරය මුසු කර්ණාටක සංගීතයෙන් ඔපවත් වූ ගීතයක හඬ නිවස පුරා පැතිරුණ ද අද පවතින්නේ තද නිහඬ බවකි. පැද්දෙන පුටුවට වී දවසේ පත්‍ර බලා නිම කළ අප්පා කාමරය දෙසට යනු ඈ බලා සිටියාය. ආපසු පැමිණ රූපවාහිනිය ක්‍රියාත්මක කළ හෙතෙම උස් හඬින් කෑගසන්නට පටන් ගත්තේය.

''සාවිත්‍රී.. ඉංගවාංග.. උමා වාංග..''

ඔහු රූපවාහිනිය දෙස බලා උස් හඬින් කෑගැසුවේය. අප්පාට වැදගත් ප්‍රවෘත්ති බොහෝ විට උමාට කිසි වැදගැම්මක් නැත. ආරාධනා කළහොත් නොගොස් බැරිය. අම්මා අසුන්ගෙන සිනා මුහුණින් යුතුව තමා අමතන හඬ ඇසුණි.

උමා ගොස් රූපවාහිනියට යොමු වූ දෙනෙතින් යුතුව අසුන් ගත්තාය. එය සිංහල වැඩසටහනකි. ඇයට රූප රාමුවේ සිටි නිවේදකයා හඳුනා ගැනීමට ගත වූයේ නිමේෂයකි. උදිත් හඳුනා ගන්න ද එතරම් උනන්දුවකින් බලන බවක් දක්වූයේ නැත.

''මේ අපේ මාස්ටර්ගෙ පුතා උදිත් නේද? දුව මේ ප්‍රෝග්‍රෑම් එක රෙකෝඩ් කරන්න.''



''ඔව්.. ඔව්.. පේන්නෙ නැද්ද කැසට් එකට ගන්න එක හොඳා..''

සාවිත්‍රී කීවාය.

සාකච්ඡාව කරමින් සිටියේ හාත්බාණ්ඩ සරසවියෙන් නිපුන් උපාධිය ලද නිර්මාණ කරුවෙක් සමගය. ඇය කැසට්ටය ක්‍රියාත්මක කළාය. කතා කරමින් සිටියේ සංගීත මහා සම්ප්‍රදායට එක් වූ දෙස් විදෙස් ජන සංගීතය පිළිඳබවය.

ගංගාධාර ශිෂ්ටාචාර බිහි වූ රටවල සංගීතයට ඔරු පාරු ගී නිතැතින්ම පිවිස තිබුණි. බංගලාදේශය, කේරලය, පන්ජාබය වැනි රටවල නිර්මාණ කරුවන්ගේ සරල හා ශාස්ත්‍රීය ගීතවලට ඔරු පාරු ගී පිවිස තිබුණි. රාහුල් දේව, බර්මන් වැනි සංගීත අධ්‍යක්ෂවරුන්, රවි ශංකර් වැනි චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සිනමා කෘතිවලට ජන සංගීතය ඇතුළත් කර තිබුණි.

''මේ ළමයා මෙච්චර දක්ෂ කෙනෙක් බව මම දනං හිටියේ නෑ.''

මෙවනාලිංගම් කීවේය.

''අප්පා ලැස්ති වුණේ මාව පල් කරන්නයි. පේනවද පණ්ඩිත කතා කියන හැටි.''

උමා මඳ සිනාවක් පෑවාය.

සැබැවින්ම එය හරවත් සාකච්ඡාවකි. හෙතෙම නිවේදක කටයුතුවලට අමතරව උඩැක්කිය වාදනය කරමින් වැඩ සටහන විචිත්‍රවත් කළේය.

''මේ කොළඹට අපෙන් ඉගෙන ගන්න දෙයක් නෑ.''

''එහෙම නම් මෙහෙ උගන්වන්න ගන්න.''

මව කීවාය.

''මේ.. මේ.. ඔතනැති කරදර ගෙදරට දමා ගන්න එපා.

දන්නවනෙ අක්කගෙ හැටි.."

"ඔව් ඒක ඇත්ත. බැරි වෙලාවත් ගෙදර ඉන්න වෙලාවක ආවොත් ආවේශ වෙයි තමා.."

මව කීවාය.

"ඒ වුණාට මට මේ උදව්ව කරන්න වෙනවා. දෙමළ සිංහල කෝලහාලවලදී මාව ලේවැල්ලට අරන් ගිහින් ආරක්ෂා කළා."

ඊට එහා ඒ පිළිබඳව කිසිවෙක් කතා නොකළහ.

දිවා ආහාරයෙන් පසු ඇය කාමරයට ගියාය. උදය වරුවේ රෙකෝඩ් කරන ලද කැසටය ඇය සුරක්ෂිතව තබා ගත්තාය. උගන්වන්න ගියා නම් මම පල්වෙනවා. එම වැඩසටහන යළි නැරඹීමට සිතුණත් ප්‍රසිද්ධියේ කළ නොහැක. කවුරුත් නැතිව තනිපංගලමේ එය රසවිඳිය යුතුය.

පාසල් යාම, පන්තියේ කටයුතු කිරීම, කර්නාටක සංගීතය ඉගැන්වීම වැනි කටයුතුවලින් දවස ගෙවී ගියත් එහි වූ ඒකාකාරී භාවය වෙනස් වූයේ නැත. මෙම ඒකාකාරී බව බිඳී ගොස් සිතට නව පිබිදීමක් පිවිසි එක්තරා දිනයක් මෙනය. තරුණ සිතට පිවිසෙන සිතුවිලිවලට සීමා බන්ධන නැත.

හින්දු කෝවිලට ගියේ අම්මා සමගය. වෙනදා වන්දනාව සඳහා වූ සංස්කෘත, දමිළ ගාථා මුවින් පිටදන්නේ නිතැතිනි. අද ඒවා කිසිවක් මුවට නොනැගෙයි. කෝවිලට නුදුරෙන් මහ සයුර පිහිටා ඇත. ඈත දියඹේ සිට ගලා එන දිය රැළි ගල් පරවල වැදී විසිර යනු පෙනේ. එකම සතුට ලෙස තිබුණේ හමන සුළඟේ සිහිලසක් තිබීමය. කිසිවෙක් තමා අසල ගැවසෙනු දුටු ඈ හිස එසෙව්වාය.

"මොකද මේ මුහුද දිහා බලන් ඉන්නේ. මුහුදට පනින්නද?"

කෞෂලාගේ පැමිණීමෙන් සිතට මහත් සතුටක් ගලා ආවේ යැයි ඇයට සිතුණි.



"මම උඹව හම්බ වෙන්නමයි හිටියෙ."

"මාත් එහෙමයි."

කෞෂලා කීවාය.

"ඊයේ උදේ ටී.වී. ප්‍රෝග්‍රෑම් එකක් ගියා දැක්කද?"

"ඔව්.. අර මියුසිෂන් කෙනෙක් ගැන කරපු සිංහල ප්‍රෝග්‍රෑම් එකද? කියල වැඩක් නෑ.. ඒක නම් ඔයාලට වැදගත්. ඒකා මාර කොල්ලෙක්. සංගීතය ගැන නොදන්න දෙයක් නෑ."

උමා පිළිතුරක් දුන්නේ නැත.

"උඹ ඒ බෝයි අඳින්නෙ නැද්ද?"

"දැකලා පුරුදුයි.. ඒත් එච්චර මතකයක් නෑ.."

"උදයන්ගෙන් මාව බේර ගත්තෙ.."

"ඕ.. අයියෝ.. දැන් මතකයි. උඹේ ගෝලයා."

"මොකුත් දන්නෙ නැති විදිහට ඉඳලා අපිව පල් කළා. අපි ගෙදර කතා වුණේ ඒකයි. ගසල් සින්දුවකුත් කිව්වා."

අම්මා කැඳවන තෙක් ඇය කතා කරමින් සිටියේ උදින් ගැනය.

රාත්‍රියේ නිවසට ආවේ සයිබර් හෝටලයකින් රාත්‍රී ආහාරය රැගෙනය. නිවසට ගොඩවනවාත් සමගම චේතාගෙන් ඇමතුමක් ලැබුණි.

"කොහේද මෙච්චර වෙලා හිටියෙ..?"

උමාට අක්කාගේ හඬ ඇසුණි. ඇය කවදාවත් තමාට ආදරයෙන් අමතනවා අසන්නට ලැබී නැත.

"අපි කෝවිල් ගියා."

"කෝ අම්මා.. අප්පා.."

''ඒ දෙන්නා තවම ගේට්ටුව ගාව. ඉන්න අම්මාට දෙන්නම්.''

''නෑ.. නෑ. මට ඔයයි ඕනෑ. හොර පූසි වගේ ඉඳන් හොර වැඩ කරනවා. මට අහුවෙන්නෙ නෑ කියල හිතුවද?''

''මොකද වලිගෙ පෑගිලද? ඉන්නවකො අම්මට කියන්න.''

''ඔයාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවද?''

''ආඩවනේ.. මේ මට. ආ ප්‍රූ මැඩ..''

''මේ මට බොරු කරන්න එන්න එපා දන්නවද? ඔක්කොම මට ආරංචි වෙනවා. බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියට මට කමක් නෑ. හැබැයි සිංහල එකෙක් එක්ක නම් යාළුවෙන්න එපා.''

''මේ ඔයාට මොකද වෙලා තියෙන්නෙ. කියනවා අම්මට දන්නවද?''

''කවුද සිංහල එකෙක් ඔයාව හඳුන්වලා දීලා තියෙන්නෙ වයින්ගෙ නංගි කියලයි. එතකොට මිනිහා බැඳලා තියෙන්නෙ මාවයි.''

ඇගේ කතාව අවබෝධ කර ගැනීමට උමාට තරමක වේලාවක් ගතවුණි.

''ඔයාව බැන්ද නම්.. මම ඒ කතා කළ කෙනාගෙ නෑනා.''

''ඔයාව උදයන් හම්බ වුණාද?''

ඇගේ මතකයට උදිත් ගලා ආවේ ඉන් පසුවය.

''හා.. දැනුයි මට කතාව තේරුණේ. ඒ උදයන් කියන මෝඩයට මගෙ පස්සෙන් එන්න එපා කියන්න දන්නවද?''

''උදයන් පාරක පාරගන්න එපා. ඒ අයට ලංකාවෙ නෙමෙ ඉන්දියාවෙ වුණත් ඕනෑම දෙයක් කරන්න පුළුවන්.''

''ඒවා වෙන දේවල්. අපිට අපේ පාඩුවෙ නිදහසේ ඉන්න ඕනෑ. උදයන්ගෙන් මාව බේරල ගෙදරට යැව්වෙ ඒ සිංහල බෝයි නම්.''



''ඒ බෝයි කිව්වලු මාව බැඳල ඉන්නෙ එයයි කියලා.''

තරහව අමතක කරමින් දෙදෙනා එකවර සිනාසුනහ.

''අතේ නිතරම ආයුධ තියෙනවා. ඒ බෝයිට වෙඩි තොතිබ්බා ඇති. උදයන් ඇවිදින් නිලන්ට ඒ කතාව කියලා.''

''හානේ.. උදයන් කියන එකා කේලම් කියන හාකි ආච්චි කෙනෙක් වගෙයි නේද?''

උමා කීවාය.

''ඒක නිව්ව වෙලේ ඉඳන් නීලන් මා එක්ක කතා කරන්නෙ නෑ.''

''විනාගෙ ඉවර වෙච්ච ගමන් ඔයා කොළඹ එන්න. ආයුධ අතට ගන්න හිතන්න එපා.''

''දන් කරන්න දෙයක් නෑ. අප්පාට කියන්න එපා. ආයුධ පුහුණුවත් අරන් ඉවරයි. ඉවිස් අවර් ඩියුටි. අපිට අපේම රටක් වෙනුවෙන් සටන් කරන්න වෙලා තියෙනවා.''

''තව ටිකක් හිතන්න. අයියටත්, මල්ලිටත්, අක්කටත්, නංගිටත් ඉන්නෙ ඔයා විතරයි.''

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

''තීරණය අරන් ඉවරයි. ඒ අය අපේ පවුල් ගැනත් පරීක්ෂාවෙන් ඉන්නවා. ඒ හින්දා ඔයා අපේ සටනට නොගැළපෙන දේවල් කරන්න එපා.''

''ඔයාට නෙවේ ප්‍රශ්නෙ තියෙන්නෙ. එයා බැඳලා තියෙන්නෙ මාව නෙමේ ඔයාවයි.''

''හොඳයි මම ඒක බලාගන්නම්. හැබැයි එකක් මතක් කරන්න. ගින්නක් නැතිව දුමක් නගින්නෙ නෑ.''

ඇයව වේනාගේ සරදම ඇසුණි.

# 08

නිවස තුළට පැමිණි අප්පාට සොයුරියගෙ ඇමතුම බාරදී උමා සිය කාමරයට ගියාය. ඇඳුම් නොගලවාම ඇය ඇඳේ ඉඳගත්තේ වෙහෙස නිසාම නොවේ, ඉතා කුඩා සිදුවීමක් සිත කැළඹීමට පාර කැපූ හැටි. යොවුන් වියේ පසුවන්නියකට ආදරය ඉඳුල් කට ගෑ යුතු නැත. පාසල් යන යුගයේ හින්දු විද්‍යාලයේ සිට නිවස වෙත එන කාලය තුළ ජාති භේදයක් නැතිව පිරිමින්ගේ නෙත් රැහැන් තමා දෙසට යොමු වුණු හැටි මතකය. කවදා හෝ තමා අත ගන්නේ දමිළ කෙනෙකි. එහෙත් කිසිදාක කිසිම විටෙක ආදරයක් ගැන ඇය සිතුවේ නැත. වැඩි කාලයක් ජීවත් වුණේ කොළඹ නාගරික පරිසරය තුළය. එහිදී තරුණ පිරිස ආදරයෙන් බැඳීමට තමා පෙළඹූ හැටි මතකය. විවාහය යන සංසිද්ධියට කවදා හෝ මුහුණ දීමට සිදුවන බව දන සිටියත් මෙතරම් ඉක්මනින් සිත සසල වෙතැයි සිතුවේ නැත.

ගවුම ගලවා මුහුණ සෝදාගත් ඇ වෙනත් සැහැල්ලු ඇඳුමකට මාරුවී කණ්නාඩිය ඉදිරිපස සිට ගත්තා. ප්‍රතිබිම්බය අවලස්සන නැත. ඇය සෙමින් ජනේලය විවෘත කළාය. මුහුද සිප හමන සුළං නිවස තුළට පිවිසෙයි.

යාබද නිවසේ සිටින්නෙත් සිටින්නෙත් යාපනයේ දමිළ පවුලකි. "සින්දු භෛරවි" රාගයෙන් නිර්මාණය වූ ගීතයක් ගුවන් විදුලියෙන් මිදී එනු ඇසේ. සිත උද්දාමයට පත්වීමට හේතුවක් නැතැයි කිව නොහැක. එහෙත් මෙතරම් හදබල ප්‍රවේගයක් සිදුවෙතැයි ඇය සිතුවේ නැත. අම්මා එනු දුටු උමා ඇය අසලට ගියාය.

"එන්න කෑම කන්න."

"මනු බඩගිනි නෑ."

"එහෙම වෙන්නෙ කොහොමද? දුන් රෑ කමයවත් කිට්ටුයි."



"අම්මා.."

ඇය මවගේ කර වටා අතක් දමා හුරතල් වූවාය. සාවිත්‍රී හිස ඔසවා බැලුවා විනා පිළිතුරක් දුන්නේ නැත.

"අම්මා මට ඩාන්සිං ඉගෙන ගන්ට ඕනෑ."

"ඔයා කතක්, මණිපුරි නැටුම් ඉගෙන ගෙන තියෙනවනෙ. දුව "අරංගේත්‍රම්" කළානෙ. තවත් මොනවද?"

"මම උඩරට නැටුම් ඉගෙන ගන්ට ඕනෑ."

"ඒකට කලායතනයකට යන්ට ඕනෑ. නැටුම් හොඳ වුණාට ගායනා ඉගෙන ගන්න ඕනෑ. දෙමළ අපිට ගායනා ඉගෙන ගන්ට අමාරුයි."

"අම්මා අප්පට කියනවද?"

"මම මොටද කියන්නෙ. අප්පා කැමති වෙන එකක් නෑ. කෑම මේසෙදී කියලා බලමු."

ඔවුහු රාත්‍රී ආහාරය සඳහා අසුන් ගත්හ.

"මට ඉට්ලි එකක් ඇති."

උමා කීවාය.

"මොකද මේ ළමයට වෙලා තියෙන්නෙ. [illegible] කියෙනවා නම් බේත් ටිකක් අරන් දෙන්න."

වෛතාලිංගම් කීවේය.

"ආයෙත් ලොකු දුවගෙ හිතේ කැක්කුමක්ද? [illegible] මගෙත් ඔළුවෙ කැක්කුම හැදිලා ඉන්නෙ. [illegible] සංවිධානෙන් බේර ගන්න බැරුව ගියානෙ. [illegible] ඒකයි."

"අනෙක් සල්ලි තිබුණ නම් [illegible] විශ්වවිද්‍යාලෙට හරි [illegible]

"අප්පා අක්කව වෙනස් කරන්ට බෑ. එයා මටත් එන්න කියනවා."

"ඔයා හෙම ඒ පැත්ත පළාතෙ යන්ට එපා. වෙතා අපිට වඩා ඒ අයට යටත්. කොළඹ එක්කගෙන ඇවිදින් නිව්රෝසර්ජන් කෙනෙකුටවත් පෙන්වන්න ඕනෑ."

"වෙතාට තියෙන්නෙ මට තියෙන ඔළුව කැක්කුමමයි."

උමා මවට ඇසින් ඉඟිපෑවාය.

"මෙන්න මෙයාට උඩරට නැටුම් ඉගෙන ගන්න ඕනැලු."

වෛත්‍යලිංගම් එක්වරම පිළිතුරක් දුන්නෙ නැත. නාට්‍ය කලාව හදාරන හැම ශිල්පියෙක්ම උඩරට, පහතරට, සබරගමු වැනි නාට්‍ය සම්ප්‍රදායන් ඉගෙන ගත යුතුය. මේ නර්තනයන් සඳහා ගායනයන් ද ඉගෙනීම අත්‍යවශ්‍ය වේ.

ශාන්ති කර්මවල ද තාලානුකූල ගීත ඇත. කොහොඹ කංකාරි, රට යකුම, දෙවොල් මඩු, කිරිමඩු, පහන් මඩු, සූනියන් කැපීම, සන්නි යකුම වැනි ශාන්ති කර්මයන්හි ගායන අවස්ථා ඇත. මේ රිද්මයානුකූල චලන ගී ගැයීමට සිංහල භාෂාව දත සිටිය යුතුය.

"අනේ අප්පා.. හා කියන්නකෝ.."

"ඉගෙන ගන්න තියෙනවා නම් හොඳයි. උඩරට නැටුමට දහ අට වන්නම තියෙනවා. ඒවත් කියන්න ඉගෙන ගන්න ඕනෑ. අපි දෙමළ නේද?"

"ව්‍යක්තම විදිහට නෙමෙ තරමක් කියන්න බලන්නම."

"හා කාගෙන්ද ඉගෙන ගන්නෙ. ඔයාට පන්ති යන්න තියෙනවා, ගෙදර උගන්වන්න තියෙනවා." මව කීවාය.

"එක ක්‍රමයක් තියෙනවා."

දෙමාපියන් ඇය දෙස බැලුහ.



"කොහේවත් යන්න ඕනැ නෑ. මට ගේ ඇතුළෙ ඉඳන් ඉගෙන ගන්න පුළුවන්."

"ඒ කොහොමද..?"

සාවිස්ත්‍රි ඇසුවාය.

"උදිත් උඩරට නැටුම් දන්නවා. අනේ අප්පා මට උගන්වන්න කියන්න."

ඔහු මඳ සිනාවෙන් යුතුව සිටියා විනා එකවරම කිසිවක් කීවේ නැත. එය කදිම යෝජනාවකි. අද රටේ තත්ත්වය අනුව පොඩි දුව වැනි තරුණියන් තනිව යැවිය නොහැක.

"අප්පා උදිත්ට කියනවද?"

"උදිත්ව මෙහාට එව්වෙ ඉගෙන ගන්නයි."

"ඔව්.. වී කැන් ෂෙයාර් අවර් නොලේජ්"

"අපි හෙට උදේට බලමු."

උදිත්ට දින කිහිපයකින් වෛත්‍යලිංගම් මහතාගේ නිවසට යාමට ලැබුණේ නැත. කොළඹ රැඳී සිටීම සඳහා මුදලක් සොයා ගත යුතුය. මේ නිවේදක තනතුර ලැබුණේ මිතුරෙකුගේ සහායෙනි. මෙම අවස්ථාව එක්වරම නැතිකරගත නොහැක. ටික දිනක් ප්‍රමාදවී පන්ති යනව. ඔහු සිතා ගත්තේය. උදිත් වැඩසටහන ආරම්භ කිරීමට ප්‍රථම වෛත්‍යලිංගම් මහතාගේ නිවසට ගියේය.

කුලී රියෙන් බැස ගේට්ටුව අසලට ගියේය. දොරට කීපවරක් තට්ටු කළේය. කිසිවෙකුත් නැත. යළි කීපවරක් ශබ්ද කළේය. නිවසේ අය බැහැර ගොස් මෙනි.

මඳ වේලාවකට පසු ගේට්ටුව විවෘත වෙනු ඔහු දුටුවේය.

දුටු දසුනින් ඔහු තිගැස්සී සිටියේය. හැඳ සිටියේ කොට කලිසමකි. විශේෂයෙන් දමිළ යුවතියන් මෙවන් ඇඳුම් අඳින්නේ නැත. අද හැම දෙයක්ම වෙනස්වී ඇත. ඇය මෙච්චරම ලස්සන

යුවතියක් බව ඔහු දැන සිටියේ නැත. ඉකුත් දිනයේ නැති සිනාවකින් අද තොල් පෙති සැරසී තිබුණි. ඔහු ද සිනාවක් පෑවේය. කුඩා මිදුලේ මල්වලට වතුර දැමීමේ කාර්ය ඇය යළි ආරම්භ කළාය.

උදිත් ගිය නොබෝ වේලාවකින් ඇය නිවස තුළට ගියාය. මේ හැඳ සිටින ඇඳුම පිටින් ඔහු ඉදිරියට යා නොහැක. ඇඳුම මාරු කරගෙන එද්දී අම්මා තේ සූදානම් කරනු ඇය දුටුවාය.

''අම්මා අරක ඇහුවද?''

''මේ ආව ගමන් අහන්ට පුළුවන්ද?''

''මොකද උදිත් කියන්නෙ..?''

''පාඩම් ඉගෙන ගන්න බැරිලු.''

එක්වරම සිත ඔත්පොල වූවක් මෙන් දැනුණි. හරියට සිත උදුරාගත් තැනැත්තා උදිත් විම සිත දුකට පත්විමට හේතුවකි.

''ඇයි අම්මා එන්න බැහැයි කියන්නෙ. මම එදා හරියට පිළිගත්තෙ නැති නිසාද?''

ඇය මවගේ උරහිසින් අල්ලා ඇසුවාය.

''ඔව් එහෙමත් වෙන්න ඇති. ගැහැනු ළමයි දැන ගන්න ඕනෑ අමුත්තෙක් ආවම ආදරයෙන් පිළිගන්න.''

''ඉතින් අම්මා ඒ දැනුවත්ව නෙමෙයිනෙ. අයි ඇපොලජයිස් ඉට්. මට සමාවෙන්න කියන්න.''

පැහැදිලි කඳුළක් දෙනෙත් වට කර ගන්නවා ඇයට දැනුණි. එහෙත් අම්මා ඉදිරියේ කඳුළු පෙන්වීමට පුළුවන් කමක් නැත.

''පොඩි දූව..''

ඇයට අප්පාගේ හඬ ඇසුණි.

''බෑ අම්මා මට යන්ට..''

''දැන් උඩරට නැටුම් ඉගෙන ගන්න ඕනෑ කිව්වා නේද?''



''අපේ ගෙදර එන්න බැහැයි කියනව නම් මම එන්නෙ මොටද?''

ඇය ආපසු හැරී නිවස තුළට ගියේ අප්පාට ද අසීකරු වෙමිනි.

වෙතාලිංගම් උදිත්ව ආදරයෙන් පිළිගත්තේය.

''වාඩිවෙන්න පුතා. අපි එනකල් බලන් හිටියා. ඇයි ආවෙ නැත්තෙ..?''

''මට තාවකාලික පොඩි රස්සාවක් හම්බ වුණා. ඒක අතාරින්න බෑ.''

''ඔව් ඒක හොඳා..''

''අපි පුතාගෙ ප්‍රෝග්‍රෑම් එක දැක්කා. ගොඩක් ලස්සනයි.''

සාවිත්‍රී කීවාය.

''ගිහින් තේ එකක් හදාගෙන එන්න.''

''එපා අංකල් මම තේ බිලයි ආවෙ.''

බිරිඳ නිවස තුළට ගිය පසු ඔහු තොරතුරු කතා කළේය. ඔහුට එකවරම දියණියගේ යෝජනාව සිහිවුණි.

''අපේ පොඩි දුව පොඩි උදව්වක් ඉල්ලනවා. සාවිත්‍රී.. දුවට එන්න කියන්න..''

උමා සාලයට ආවේ තරමක් වේලා ගත වූ පසුවය. ඇය සැටියට නොපැමිණ වේවැල් පුටුව අල්ලා ගෙන සිටියාය.

''මම කියන්න ඕනෑ නෑ පොඩි දුව කියන්න.''

''මට බෑ..''

ඇය බිම බලා ගත්තාය.

උදිත් තමා ඉදිරිපස සිටින රුවැත්තිය දෙස බලා සිටියේය.

නිවසට පිවිසෙද්දී ඇඳ සිටි ඇඳුම දුටු සැණින් අවංකවම සිත විසිර ගිය බව කිව යුතුය.

## 09

වෛත්‍යලිංගම් මහතා උදිත් සමඟ තරමක් වේලා කතා කරමින් සිටියේය. සැබැවින්ම මේ දරුවා හොඳ ළමයෙකි. ඕනෑ තරම් වෙලාවක් සංවාදයේ යෙදිය හැකි ප්‍රිය මනාප පුද්ගලයෙකි.

"පුතා මේ අපේ උමාට උඩරට නැටුම් උගන්වන්න බැරිවෙයිද?"

වෛත්‍යලිංගම් ඇසුවේය. උදිත් එක්වරම පිළිතුරක් දුන්නේ නැත. සාවිත්‍රී ඒ අසල සිටියා මිසා කතාවට සම්බන්ධ වූයේ නැත.

"මම ඒ තරම් දක්ෂයෙක් නෙමෙ අංකල්. මගෙන් ඉගෙන ගන්න දෙයක් තියෙනවා නම් ඒතරත් උගන්වන්නම්."

සාවිත්‍රී උදිත්ගේ නිහතමානී, නිරහංකාර කම ප්‍රිය කළාය. ඔහු භාත්ඛණ්ඩ විශ්වවිද්‍යාලයෙන් සම්මාන සහතික ලද පාරම්පරික නැටුම් ශිල්පය හැදෑරූ අයෙකි. තමා දන්නා බව ලෝකයාට අඬහැරපෑම නියම කලා කරුවෙකුගේ සිරිත නොවේ. නියම කලා කරුවෙකුට ජනතා සම්මානය හිමිවීම වළක්වනු බැරිය. කලාව සැබවින්ම ස්වාභාවිය යුතුය. කලා ක්ෂේත්‍රයේ ඇති ඇතැම් හිස් නිර්මාණවලට ඇති ආයු කාලය අඩුය.

ඉතිහාසය තුළ අවිච්ඡින්නව යුග යුග රැඳෙන්නට නම් එහි සැබෑ ගුණාත්මක භාවයක් තිබිය යුතුය.

"මා දන්නා තරමින් පුතා දක්ෂයි."



"ඔව්. ඇත්තටම අප්පච්චි වගේම පුතා දක්ෂයි."

සාවිත්‍රී සැමියාගේ අදහස අනුමත කළාය.

"අංකල් මට මේ ගැන තව හිතන්ට ඕනෑ."

"හොඳයි.. වැඩසටහන ඉවර වෙච්ච ගමන් එන්නකෝ. අපි විවේකව කතා කරමු."

"අද මම නුවර යන්න හිතාගෙනයි ඉන්නෙ."

උමා ආපසු ආවේ පණිවිඩය දැන ගැනීම සඳහාය.

ඇය පැමිණි මොහොතේම උදිත් නිවසින් පිටව ගියේ ඇගේ සිතට දුකක් ඇතුළු කරමිනි.

"පන්ති කරන්න බෑ කිව්වද?"

ඇය ඈතට යන උදිත් දෙස බලා ඇසුවාය.

"බෑ කිව්වෙ නෑ.. එයා දන්නෙ නෑ කිව්වා."

සාවිත්‍රී කීවාය.

"ඒ බොරු අම්මා. එදා ටෙලිවිෂන් එකේ කතා කළ හැටි මතකද?"

ඇය කතා කළේ තරමක අමනාපයෙන් යුතුවය.

"කලාවෙන් ජීවත්වන අය හැටියට මුලින්ම සිතිය යුතු දෙයක් තියෙනවා. අපි අපේ නෙවේ. අපි අපිට කලින් හිටපු යුග පුරුෂයින්ගෙ ප්‍රතිඵල."

අවස්ථාවක් ලද විට අප්පා දෙන අවවාද හරවත්ය.

"ෂෙලි, වර්ඩ්ස්වත්, මිල්ටන්, කිරුක්කරල් වැනි ඉංග්‍රීසි දෙමළ කවියන් අපට කවි මඟ පාදලා තියෙනවා.."

වෛත්‍යලිංගම් කීවේය.

"ලියෝටොල්ස්ටෝයි, වික්ටර් හියුගෝ, චාල්ස් ඩිකන්ස්,

ඇන්ටන් චෙකොෆ්, ඇලෙක්සැන්ඩර් ඩූමාස්, මැක්සිම් ගෝර්කි, ගෝල්ෆෙක්ත්, ඇල්බෙයර්කැමූ, ප්‍රංශ ජාතික ෆ්ලොබෙයර් විතරක් නෙමේ මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්. ඒ. සිල්වා, ගුණදාස අමරසේකර, කරුණාසේන ජයලත් වගේ සිංහල නවකතා කරුවෝ නිසයි අද ඉන්න අය ලියන්න ඉගෙන ගත්තෙ. එහෙම නැතිව නිර්මාණ කරුවො ඕපපාතිකව පහළ වෙන්නෙ නෑ. සැබෑ නිර්මාණ කරුවො කාගෙවත් සම්මාන මත යැපෙන්නෙ නෑ."

අප්පා නිර්මාණ කටයුතු වෙනුවෙන් පෙර වදනක් සැපයුවේ ඇයි දැයි සිතුණේ පසුවය.

කලාවට ජාතියක්, භාෂාවක් නැත. ජාතියක් වෙනුවෙන් සටන් වැදීමට කලා කරුවෙකුට පුළුවන් කමක් නැත.

රස විඳීමට ඇති රසඥතාවය හැරුණු විට ජාතිවාදයක් කලාව තුළ නැත. අප්පා තමා දැනුවත් කළේ උදිත්ගෙන් ඉගෙනීමට පසුබිම සකස් කරමිනි.

"උදිත් හැන්දෑවේ එන්නම කිව්වද?"

"ඔව්. සමහරවිට එයි. නුවර යන්න ඕනෑ කතාවකුත් කිව්වා."

උදිත් රූපවාහිනී වැඩසටහනට පෙනී සිට සවස් වරුවේ නිවසට යාමට සිතුවේය. වෛත්‍යලිංගම් මහතාගේ නිවසට ගියේ නැටුම් ඉගෙනීමට වුවද තමාට ඒ සඳහා වෙලාවක් ලැබුණේ නැත. ප්‍රධාන ප්‍රශ්නය වූණේ හදිස්සියෙන්ම කලින් බලාපොරොත්තුව සිටි තාවකාලික රැකියාවක් ලැබීමය. එක්වරම එය අතැර දැමීමට ද පුළුවන් කමක් නැත. දැන් මතුව ඇත්තේ වෙනත් ප්‍රශ්නයකි. වෛත්‍යලිංගම් මහතාගේ දූව වන උමාට උඩරට නැටුම් උගන්වන මෙන් කරන ලද ආරාධනය එකවරම බැහැර කිරීමට පුළුවන් කමක් නැත. එය සරල සිදුවීමක් ලෙස සිතිය යුතු නැත.

සිංහල සමාජය තුළ බොහෝ සේවාවක් රැකියාවක් තත්ත්වයේ පිළිගැනීමක් නැත.



සිංහල වෙදකම පැවතුණේ රැකියාවක් ලෙස නොවේ. සිංහල වෛද්‍යවරයා බුලත් අතට තැබූ මුදල දෙස බැලුවේ නැත. ශාන්ති කර්මය රැකියාවක් නොවුණි. ආතුරයාට සෙත් ශාන්තියක් කිරීම එකම බලාපොරොත්තුව විය. ඔවුන් කිසිවිටෙක ගුරු පඬුරු දෙස බැලුවේ නැත.

නැටුම් කලාව වැනි සෞන්දර්ය විෂයක් හැම පුද්ගලයෙකුටම ප්‍රිය වන්නේ නැත. ඊට ප්‍රථම අදාළ තැනැත්තාගේ හෝ තැනැත්තියගේ හැකියාව හඳුනා ගැනීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි. දමිළ තරුණියක ගායන, වාදන මුසු උඩරට නැටුම ඉගැන්වීම පහසු නැත. ඒ හැමටම ප්‍රථම අප්පච්චිගේ අවසරය ගත යුතුය. රැකියාවක් ලෙස හඳුනා ගැනීම නොකළත් අප්පච්චි එම ශිල්පය ද දැන සිටියේය. ජොතිර් විද්‍යාව පමණක් නොව පරම්පරාවෙන් පැමිණි සර්වාංග වෙදකම ද හෙතෙම දැන සිටියේය. පවුලේ බාලයා ලෙස සැලෙන දුරට උදිත් වෙදකම ද දැන සිටියේය. ඉපැරණි ගම නිර්මාණයට තිබුණේ වෙදකම, ශාන්තිකර්මය වැනි දේ සම්මිශ්‍ර වීමෙනි.

සැදෑ වරුවේ වෛත්‍යලිංගම් මහතාගේ නිවසට ගියේ උමාගේ හඳුනා ඉල්ලා ගැනීම සඳහාය.

උමා තමාට අහංකාරකම් දැක්වුවත් අප්පච්චිගේ මිතුරාගේ ඉල්ලීම ඉවතලිය නොහැක.

ගේට්ටුව අසල සිට ගත් ඔහු දොරට තට්ටු කළේය. තමා ආවේ වැරදි වේලාවක යැයි ඔහුට සිතුණි. කෝවිල් ගොස් ඒමට තව වේලා ගතවනු ඇත. ආපසු යාමට ද තැනක් නැත. දමිළ ජාතිකයන් ගැවසෙන ප්‍රදේශයක අවේලාවේ ගැවසෙන්නට පුළුවන් කමක් ද නැත. පැමිණි ප්‍රථම දිනයේත් මෙලෙස සිටීමට සිදුවූ හැටි සිහිවෙයි.

මඳ වේලාවකට පසු ගේට්ටුව අසල ශබ්දයක් නැඟුණා ඇසුණි. සමහරවිට ඇතුළේ සිටින අය පිටත සිටින අයව

නිරීක්ෂණය කරන්නට ඇත. සෙමින් ගේට්ටුව විවෘත වුණි.

ඔහුගේ නෙත යොමු වුණේ ගේට්ටුව විවෘත කළ රුවැත්තිය වෙතය. සමහර විට නිවසේ සිටින ඇය මෙසේ නිදහස් ඇඳුමින් සැරසී සිටිනවා විය හැක. කොට කලිසමකින්, ඉස්කිනියකින් සැරසී සිටි ඇය අත තරමක "ටෙඩිබෙයාර්" කෙනෙක් විය. තියුණු ලෙස කැපී පෙනෙන රූමත්කමක් ඇයට තිබිණි. නැටුමට හොඳ ලස්සන ආකර්ශන කයක් ඇයට තිබුණි. ප්‍රථම දිනයේදීම ඒ සුන්දර යුවතියට මේ කලාව තුළ මහා දිගු ගමනක් යාහැකි යැයි ඔහු සිතුවේය. ගැහැනුකම වූ කල තවත් කිසිම සුන්දරකමක් හා සැසැඳිය නොහැක. හාත්බන්ධ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබද්දී තමාට මුණ ගැසුණු යුවතියන් ඔහුට සිහිවෙයි. කේරලය, බිහාරය, අන්ද්‍රා, මහාරාෂ්ඨ වශයෙන් වූ සෑම ප්‍රාන්තයකින්ම පැමිණි සුරූපිනියන් ගැන මතකය. එම ගැහැනු අතුරින් සුරූපිනියක් තෝරා ගැනීම එතරම් ප්‍රබල ගැටළුවක් වූයේ නැත. ඒ සියල්ල අතැර ආවේ මැඩගත් සිතින් යුතුවය. එහෙත් මේ නෙත ඉදිරියේ දකින දසුන සිත මංමුලාවට පත්කරන සුළුය. ඇයට තිබුණේ චිත්තාකර්ෂණීය සුදු පා දෙකකි. ඔහු හිස ඔසවා උමා දෙස බැලුවේය. අප අතර දැඩි හිතවත් කමක් හෝ දැඩි සබඳතාවයක් නැත.

"අයි වෝන්ට් මීට් මිස්ට වෛත්‍යලිංගම්."

උමා සිනාමුසු මුහුණින් යුතුව බලා සිටියාය.

"එන්න ඉඳගන්න."

ඇය විවෘතව කීවාය.

ඔහු නිහඬව නිවස තුළට ගියේ ඇය කළ විවෘත ආරාධනය අනුවය. අසුන් ගත්තේ වෛත්‍යලිංගම් මහතා දකින අටියෙනි. නිවස තුළ පැතිර තිබුණේ දැඩි නිහඬ බවකි.

ඔහු බලා සිටියේ වෛත්‍යලිංගම් එනතෙක්ය. එසේත් නැතිනම් සාවිත්‍රි මහත්මිය එතැයි ඔහු සිතුවේය. මඳ වේලාවකට පසු සිසිල් බීම වීදුරුවක් ඔත්දේසිය මත තබා පැමිණි දමිළ



කාන්තාව ඔහු නෙත ගැටුණි.

"ඔහොම තියන්න."

ඔහු සිසිල් බීම වීදුරුව ස්ටූලය මත තබන මෙන් ඇයට කීවේය.

නිවස තුළට ගිය උමා යළි ආවේ නැත. කාගේවත් සිසිල් බීම වීදුරුවක් පිළිගැනීමේ කිසි අවශ්‍යතාවයක් නැත. නිවසේ කිසිවෙක් තවම නැත. මෙහි රැඳී සිටීමේ කිසිම තේරුමක් නැත.

"කෝ.. වෛත්‍යලිංගම් සර්..?"

ඔහු දමිළ තරුණියගෙන් ඇසුවේය.

"නෝනයි මහත්තයයි කෝවිල් ගියා.."

ඔහු අසුනින් නැගී සිටියේ තරමක කෝපයෙන් යුතුවය. උදික් අසුනින් නැගී සිටියේ නිවසින් පිටව යාම සඳහාය. ගේට්ටුව විවර කර ඉන් පිටව යාමට ගත් උත්සාහය අසාර්ථක වූයේ ගේට්ටුවට ඉබ්බා දමා වසා තිබූ හෙයිනි. ඔහු ගේට්ටුවට ගැසුවේ කෝපයෙන් යුතුවය.

වෙනත් ඇඳුමින් සැරසුණු යුවතිය කුඩා මල්වත්තේ සිටිනු ඔහු දුටුවේය. ඔහු කෝපයෙන් යුතුව ඇය අසලට ගියේය.

"ගේට්ටුව අරින්න.."

ඇය නිහඬව සිටියාය.

මට යන්න ඕනෑ.. ගේට්ටුව අරින්න."

"බෑ.."

ඇය උඩවැඩියා මලකට සාත්තු කරමින් කීවාය.

"මට යන්න ඕනෑ."

"ඉතින් යන්න.."

ඇය සැහැල්ලු ලෙසින් කීවාය. මුහුණේ අඩු වශයෙන් සිනාවක්වත් නැත.

"ඩෝන්ට් ගෝ යන්නෙපා. අප්පා එයි."

ඇය කතා කළේ විධානයක් ලෙස නොව, ආරාධනයක් ලෙසිනි.

"එන්න මල් බලන්න."

ඇය අවධානය යොමු කළාය.

එකවරම ඇය තම සිත වෙනස් කළේ යැයි ඔහුට සිතුණි. මේ පිළිබඳ සාකච්ඡා කිරීමට ඔහුට සිතුණේ නැත. ඔහු මල් ගොමුවේ සිටින යුවතිය දෙස බැලුවේය. මල් අතර ගැවසෙන ඇය තවත් මලක් මෙනි. ඔහු ඒ සුන්දර තරුණ යුවතිය දෙස බලා සිටියේය. ගේට්ටුවෙන් පැණීමට සූදානම් වෙත්ම දොරට ගසන හඬ ඇසුණි. උමා දූවචිත් ගේට්ටුවේ ඉබි යතුර ඇරියාය. චෛත්‍යලිංගම් හා බිරිඳ උදිත් ආදරයෙන් පිළිගත්තේය.

"යමු පුතා ඇතුළට. උදිත් ආවා කියලා දුව කෝල් කළා."

"ඇයි දුව මේ දරුවා එළියෙ තිබ්බෙ..?"

"මට ඇතුළට එන්න එපා කිව්වා."

උදිත් කීවේය.

"බොරු අම්මා. ඇතුළට කතා කළා. බොන්නත් දුන්නා."

ඇය අමනාපයෙන් කීවාය.

ඔව්හු නිහඬව නිවස තුළට ගියහ.

"ඉඳගන්න පුතා. අර කිව්ව වැඩේ කොහොමද? මෙයා උඩරට නැටුම් ඉගෙන ගන්න කැමතියි. ඒ වෙනුවට දුව ඔයාට නැටුම් උගන්වයි."

"අංකල් නැටුම් උගන්වන්න කලින් මෙයාගෙ හඳහන බලන්න ඕනෑ. මේ හඳහන අප්පච්චිට පෙන්වන්න ඕනෑ."



ඔවුහු එකිනෙකාගේ මුහුණ බලා ගත්හ. චෛත්‍යලිංගම් හා බිරිඳ කෙටි සංවාදයක යෙදුණාහ.

"පොඩි දුවගෙ හඳහන දෙන්නම්. ඒ විතරක් නෙමේ ලොකු දුවගෙ හඳහනත් බලලා දෙන්න ඕනෑ."

චෛත්‍යලිංගම් කීවේය.

# 10

උදිත් නුවර ගියේ සති කීපයකට පසුවය. කොළඹ මෙතරම් කලක් රැඳී සිටින්නට ඔහු සිතා සිටියේ නැත. බලාපොරොත්තු නොවූ ලෙස ලැබුණු කුඩා රැකියාව අතැර දැමීමට ඔහුට සිතුණේ නැත. අධ්‍යාපනය අවසන් කර රැකියා ලබා ගැනීමට සිහිම මුලාවකි. පවුලේ බාලයා නිසා සහෝදර සහෝදරියන් තිදෙනාගෙන් මාස්පතා මුදලක් ලැබෙයි. කවුරු නොදුන්නත් අප්පච්චි දෙන මුදල ඔහුට නොකඩවා ලැබෙයි. ඒ නිසා ආර්ථික වශයෙන් ඔහුට එතරම් ප්‍රශ්නයක් නැත.

උමාට ඉගැන්වීම පිළිබඳ එතරම් කැමැත්තක් නැත. එහෙත් චෛත්‍යලිංගම්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට නොහැකිවන.

නිවසට එන්නට හොඳටම රෑ බෝවී තිබුණු හෙයින් ඔහු කාමරයට වැදී නිදා ගත්තේය. පසුදින පිබිදුනේ අම්මාගේ හඬිනි.

"එන්න තේ බොන්න.."

ඔහු මුව සෝදා සාලයට ගොස් තේ කෝප්පය අතට ගත්තේය.

"පොඩි පුතා.. අහන්නත් බැරිව ගියා. කොහොමද ඉගෙනීමෙ වැඩ."

"නවම පන්තියට යන්න බැරි වුණා. පොඩි රස්සාවක් හම්බ වුණා. ඒක අතාරින්න බෑ."

"අක්කත් දැකලා කතා කළා. පුතාට ඒ රස්සාව ගැළපෙනවා කිව්වා."

"කොහොම හරි ඒ වැඩෙත් ඉවරයක් කර ගන්න ඕනෑ. වෛත්‍යලිංගම් මොනවද කිව්වෙ..?"

"අප්පච්චිව නිතරම මතක් කරනවා. ඒ අස්සේ වෙන වැඩක් බාර වුණා."

"ඒ මොකක්ද?"

"වෛත්‍යලිංගම්ලුගෙ දූවට උඩරට නැටුම් උගන්වන්න කිව්වා."

"වෛත්‍යලිංගම්ගෙ ලොකු දූවද?"

"ඒක මම දන්නෙ නැහැ."

"ඒ දවස්වල ලස්සන හුරතල් පොඩි කෙල්ලෙක් හිටියා.."

"ඇයි ඊට පස්සෙ තවත් දුවෙක් හම්බ වුණා කිව්වනෙ.."

මව කීවාය.

"එහෙනම් පොඩි ළමයා වෙන්න ඕනෑ."

කාමරයට ගිය උදිත් ගැහැනු ළමුන් දෙදෙනාගේ හඳහන් දෙක ගෙනාවේය.

"මෙන්න මේක තමයි නැටුම් ඉගෙන ගන්න දුවගෙ හඳහන. අනිත් එක ජැෆ්නා කැම්පස් එකේ ඉන්න දූවගෙ හඳහන."

"මැණිකේ.. පුතාගෙ හඳහනත් දෙන්න."



අප්පච්චි සිය කාමරයට යමින් කීවේය. හැම කටයුත්තක්ම කරන්නට ප්‍රථම අප්පච්චි හඳහන් බැලීම සිරිතකි.

තේ පානය කර පුවත්පත බලමින් සිටියදී අප්පච්චි සිනාමුසු මුහුණින් යුතුව සාලයට එනු උදිත් දුටුවේය.

"හොඳයි වරදක් නෑ.. ඉගැන්නුවට කමක් නෑ.."

"පුතාට ගැළපෙන හඳහනක් නම් මැණිකෙ තියෙනවා.."

"ඒ කොහෙන්ද?"

"අපිට ගැළපෙන්නෙ නැති වුණාට වෛත්‍යලිංගම්ගෙ ලොකු දූවගෙ හඳහන පොඩි පුතාට ගැළපෙනවා. මේ වගේ හඳහන් දෙකක් මගෙ ජීවිතේට දැකලා නෑ. දෙන්නා එක් වුණොත් යකඩයක් ඇල්ලුවොත් රත්තරන් වෙයි."

"අපිට දෙමළ පවුල්වලින් කටයුතු කරන්න ඕනෑ කමක් නෑ. ඕනෑ නෑ."

"මම කිව්වෙ නිකං. සිංහල ගෑනු ළමයෙක් වුණා නම් කෙළින්ම ගිහින් අහනවා."

තාත්තා සතුටෙන් කතා කරනු ඔහු බලා සිටියේය.

"හඳහන් දෙකම හොඳයි. වැඩිමලාගෙ හඳහන හොඳටම හොඳයි කියන්න. ලොකු ළමයට මේ දවස්වල අපලයි. කවදා හරි හොඳ විවාහයක් වෙනවා කියන්න."

ඔහු හඳහන් දෙක බෑගයට දමා ගත්තේය.

"අප්පච්චි අර ඔලුවෙ කැක්කුමට දාන බේත් තෙලක් තිබුණා නේද?"

"කාටද?"

"වෛත්‍යලිංගම් ඇන්ටිට ඔළුවෙ කැක්කුමක් තියෙනවා කියලා කිව්වා. අප්පච්චි ගාව තෙලක් තිබුණා නේද?"

''තිප්පිලි, ඉඟුරු, කොත්තමල්ලි කලං හතර බැගින් ගෙන පත හතර දෙකට හින්දලා දෙකේදී පොරි පොට්ටනිය දාලා පත බාගෙට හින්දලා උදේ සවස තෙල් ටිකක් දාන්න ඕනි.''

මේ ගමනේදී ගෙන යා යුතු භාණ්ඩ රැසක් තිබුණි. උඩරට බෙරය, බේත් තෙල් බෝතලය, අම්මා සාදා දුන් රස කැවිලි කොළඹ ගෙන යා යුතු විය.

චේතා යාපනයේසිට කොළඹ ආවේ බෙහෙත් ගැනීම සඳහාය. ඉගෙනීමේ කටයුතුවලට මෙන්ම පක්ෂ සංවිධාන කටයුතුවල යෙදීමට ද ඇයට ලැබුණේ නැත. සටන් පෙරමුණට නොගියත් ඇය වරින්වර කඳවුරුවලට ද සහභාගි වී ඇත. ඇය තදබල ලෙස හිතේ වේදනාවෙන් පසුවන නිසා මිත්‍රව සිටින උදයන් ද ඇය පක්ෂයේ කටයුතුවලින් ඈත්වීම ගැන කිසිවක් කීවේ නැත.

නිවාඩුවේ කොළඹ ආවේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහාය.

අප්පා චේතාට බෙහෙත් ගැනීම සඳහා ස්නායු ශල්‍ය විශේෂඥයෙක් වැහැල් කිරීමට ගොස් සිටි නිසා නිවසේ සිටියේ ඇය හා අම්මා පමණි.

වැල්ලවත්තේ සමුද්‍රාසන්න නිවස කවදත් සුවදායකය. මුහුද සිප හමන සුළං රැළි නිවස තුළට පිවිසෙයි. පරිසරය යාපනයේ මෙන් කර්කශ නැත. ගමන් වෙහෙස නිම වනතෙක් ඇඳට වී සිටි ඇය ඉස්තෝප්පුවේ වේවැල් පුටුවක ඉඳගත්තාය.

උදයන් ඉගෙනීමට වඩා මුල්තැන දුන්නේ පක්ෂයේ කටයුතුවලටය. සුළු ජාතික අයිතීන් දිනා ගත හැක්කේ වෙනම රාජ්‍යයක් පිහිටුවීමෙනි. උතුරු නැගෙනහිර වෙනම රාජ්‍යයක් ඇති කිරීම සඳහා ගෙන යන මේ සටන ජයග්‍රහණය කිරීමට සන්නද්ධ අරගලයක යෙදීමේ කිසිදු වරදක් නැත. මහජාතිය විසින් සුළු ජාතීන්ගේ අයිතීන් නොදීමේ ප්‍රවණතාවය වැඩිය. මෙම සටන ඊළඟ පරම්පරා වෙත ගෙන යාමේ දමිළ ජාතිකයන් ලෙස තම



යුතුකමකි.

මෙම ව්‍යාපාරයේ යෙදෙන්නෙකුට පූර්ව දැනුම් දීමකින් තොරව තමා සිටින පරිසරයෙන් යාමට නොහැක. රෝගාතුර භාවය නිසා අවශ්‍ය වෛද්‍ය උපදෙස් ගැනීමට යාම සඳහා නිලන්ගේ අවසරය හා අනුමැතිය ලැබුණි.

වැල්ලවත්තේ නිවසේ කුඩා ගෙවුයනේ ඇවිදිද්දී දැනුණේ සිසිලසකි. මේ හිසේ වේදනාව ඇතිවී සැහෙන කාලයකි. හැම දරුවෙකුටම පෙළ ගැසුනු ජීවිතයක් ඇත. සැබැවින්ම දරුවන් සතු ළමා ලෝකය ඔවුන් වෙතින් බැහැර කළ යුතු නැත. යුද්ධයක් සමඟම දේශපාලනඥයන් දරුවන්ගේ ළමා ලෝකය දූෂණය කර ඇත. අවුරුදු දහ අට දක්වා හැම කෙනෙක්ම දරුවෙක් බව එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියත් පිළිගෙන ඇත. තමා අවි පුහුණුව ලැබුවේ ළමා සොල්දාදුවෙක් ලෙසය. තම සිතේ ආදරය කිරීමට තිබූ මිනිස්කම අඩු යැයි සිතේ. සිතට කාවැද්දා තිබූ පරමාර්ථය හැරුණු විට සෙසු වටිනාකම්වල පිළිගැනීමක් නැත. සම්ප්‍රදායිකව නිදහස විවේචනය, දෙමාපිය නෑදෑ සබඳතා අහිමිය. මේ සටන්කාමය ජීවිතය දන් සිරුරට සවිමත් ලෙස බද්ධව ඇත. නිවසේ කිසිවෙක් නැත. මේ තනිවීම තුළ බොහෝ දේ සිතීමට සිත බල කළ හැටි සිහිවෙයි. එහෙත් ඒ රාමුවෙන් පිට සිතීමට උවමනා නැත. දොරට කිසිවෙක් තට්ටු කරන හඬ ඇසුණි. සමහරවිට ඒ එන්නේ පත්තියට බැඳීමට එන සිසුවියක් විය හැක. සංගීත පන්තිය මුළු ජීවිතය පුරාම තම ජීවිතය පුරා තිබූ හැටි මතකය. හැඟුණ වැඩුනේ මේ සප්ත ස්වර සමඟය. ඕනෑම භාණ්ඩයක් වාදනය කිරීමට පුළුවන. ඕනෑම ශ්‍රැතියක ගීයක් ගායනය කරන්නට පුළුවන්. අම්මා කාන්තා තමා නැලෙව්වේ උත්තර භාරතීය දක්ෂිණ භාරතීය ගීතයක් ගයමිනි. දොරට ශබ්ද කරන හඬ නතර නොවීම පිළිබඳව සිතේ ඇතිවුණේ කෝපයකි. සෙමින් ගොස් කුඩා කවුළුව විවෘත කර පිටත සිටි අය දෙස බැලුවේ කෝපයෙන් යුතුවය.

කුඩා සිදුරෙන් බලද්දී පිටත සිටි අය වෙත ඇගේ නෙත

යොමු වුණි. වයස අවුරුදු විසි හතරකට වැඩි නැත. තියුණු කැපී පෙනෙන පිරිමි පෙනුමක් ඔහු වෙත තිබුණි. බණින්නට සිතාගෙන ආවත් එකවරම එම බලපුළුවන්කාරකම පෙන්වන්නට පුළුවන් වූයේ නැත. එක්වරම සිත සසලවීමට තුඩු දුන් අදෘශ්‍ය බලය කුමක්ද? ආදරය, ප්‍රේමය සිතට චිකිත්සක ක්‍රමයකි. ඉන් සිතට පිවිසෙන ආවේගයන් කිසිවෙකුට වැළැක්විය නොහැක.

සංවිධානය තුළ ආදරය කිරීම සපුරා තහනම්ය. එහෙත් උදයන් හොර රහසේ තමාට ආදරය කිරීමට පෙළඹ සිටී. ඔහු කෙරෙහි කිසිම හැඟීමක් නැත. උදයන් තම ඊළඟ නිලධාරියා නිසා ඔහුගේ විධානයන් පිළිගැනීමට සිදුව ඇත. අවි දරන විප්ලවකාරී ගැහැනු සිතක මෙවන් වෙනසක් ඇති වෙතැයි කිව නොහැක. කිසියම් දිනෙක තමා හමුවට එක්තරා පුද්ගලයෙක් පැමිණෙන බව තම මිතුරියකගේ නිවසේදී තමාට අනාගත වාක්‍ය පැවසූ කාන්තාව ඇයට සිහිවුණි. ඒ එන තැනැත්තා පූර්ව ආත්ම භාවවල තමා සමඟ ජීවිතය බෙදාගෙන සිටි තමා වෙනුවෙන් ජීවිතය පිදූ තැනැත්තෙක් බව ඇය පැවසූ හැටි මතකය. එහෙත් ගෙදර කවුරුවත් නැති මොහොතක පිටස්තරයෙක් නිවස තුළට කැඳවාගෙන ගැනීමට පුළුවන් කමක් නැත. පැහැදිලිවම ඔහු දමිළ තරුණයෙක් නොවන බව පෙනේ.

පිළිතුරක් නොදී ඉස්තෝප්පුවේ සිමෙන්ති පොළොවේ බිත්තියට හේත්තු වී සිටියාය. සිත මෙතරම් සසල වූ මොහොතක් මතක නැත. ඉකුත් අතීතයේ ඉගෙනුම ලබද්දී ලැබූ සටන් පුහුණුවේ කිසිම අනුකම්පාවක් නැත. වෙඩි තැබීම, ආයුධවලින් කපා මැරීම වැනි සිද්ධියකදී පළි ගැනීම ප්‍රධාන වේ. එක දසුනකින් හිත මේ විදිහට සසල වීමට කිසිම හේතුවක් නැත.

මේ වනවිට ඔහු යන්ට ඇත. ඈ නැගිට ගේට්ටුව අසලට ගොස් කුඩා කවුළුවෙන් බැලුවාය. ඇය තිගැස්සී සිටියේ තරුණයා නොගොස් සීරුවෙන් සිටිනු දකීමෙනි. තරුණයා දෙස බලා සිටියදී සිත ඒ මේ ඇත විසිරුණේ ඇයි දැයි කිව නොහැක. මෙසේ සිත



බොළඳ වීම බොළඳ කතාවක් ලෙස සිතිය යුතු නැත.

ගැහැනු ජීවිතයක සිදුවන වෙනස්කම් පිළිබඳව අපට කීමට පුළුවන් කමක් නැත. ඕනෑ වෙලාවක ඕනෑම දෙයක් විය හැක. විශ්වාස කිරීම පුළුවන්ද බැරිද යන්න වෙනම කතාවකි. ගැහැනු ජීවිතය පෙළ ගැසුණු ආකාරයට නිම කිරීමට නොපුළුවන. කුඩා කවුළුවෙන් දකිද්දී මෙතරම් ප්‍රභා සම්පන්න නම් හැබෑවටම දක්කොත්.. යළි ඇය පැමිණ අසුන් ගත්තාය.

ගේට්ටුවට ගැසීම යළි ඇසුනේ හිත හදාගත් පසුවය.

සැබෑ ලෝකය වෙනස්ය. දුන් පවතින්නේ තීරණාත්මක සටනකි. ඒ වෙනුවෙන් හැම දමිළ ජාතිකයෙක්ම කිසියම් කැප කිරීමක් කළ යුතුය. ඇය වෛරයක් පවත්වාගෙන ගියේ සංවිධානය වෙනුවෙනි. යළිත් දොරට ගසන හඬ ඇසුණ සැනින් කෝපයක් ඇතිවුණි. ගේට්ටුව අසලට යද්දී අම්මාගේ හඬ ඇසුණි.

''චේතා.. දුව.. දොර අරින්න..''

ගේට්ටුව විවෘත කරද්දී අප්පා හා තරුණයා සුහද කතාබහේ යෙදෙමින් සිටිනවා චේතා දුටුවාය.

''අම්මා ඒ සිංහල බෝයි කවුද? ඇවිදින් හුඟක් වෙලා.''

ඇය මවගේ පිළිතුර අපේක්ෂාවෙන් කීවාය.

# 11

නිවස තුළට යාමත් ප්‍රථම තරුණයා කවුදැයි දැන ගැනීමට තදබල ඕනෑකමක් චේතා වෙත තිබුණි. අප්පා හා කතා කළේ සිංහලෙනි. රටේ මෙතරම් ප්‍රශ්න තිබියදී සිංහල තරුණයෙකු ගෙට ගැනීම ඇත්තටම සුදුසු නැත.

"කවුද ඒ සිංහල බෝයි..?"

"අප්පගෙ යාළුවෙකුගෙ පුතෙක්.."

"අප්පගෙ තෙමේ අම්මගෙ වුණත් කමක් නෑ සිංහල අය ඇතුළට ගන්නෙ මොකද?"

"අප්පගෙන් නැටුම් ඉගෙන ගන්න අපේ ගෙදර එවලා."

"මොකක්ද මේ කරල තියෙන්නෙ.."

චේතා මවගේ කාමරයට පිවිසෙමින් කීවාය.

"මේ පුතාලගෙ අප්පච්චි අප්පා එක්ක එකට ඉගෙන ගෙන තියෙනවා. ඔයා පුංචි දවස්වල ඒ අම්මලා ඔයාව වඩාගෙනත් තියෙනවා."

"දැන් ඒ වගේ දේවල් කතා කරන්න අවශ්‍ය නෑ. වහාම පිට කරන්න කියලා අප්පට කියන්න."

උමා ආවේ ඔවුන් කතා කරමින් සිටියදීය. උදිත් දකීමෙන් සිතට පිවිසි සතුට ඇයට දරා ගැනීමට නොහැකි වුණි.

"දුව හවස ඔයා දොස්තර බලන්න යන්න ඕනෑ."

"එහෙම නම් අම්මා මම නංගි එක්ක ඩොක්ටර් බලන්න යන්නම්. නංගි ඔයා ඩොක්ටර් ඉන්න තැන දන්නවද?"

"ඔව්.. ඔව් මම දන්නවා. අපි යමු."

"අර ළමයට බොන්න දෙයක් දෙන්න ඕනෑ."



"එපා බොන්න දෙන්න. එයාව අරින්න."

ඇය දොර රෙද්ද මැත්කර සාලය දෙස බැලුවාය. අප්පා හා උදිත් කතා කරමින් සිටින සුහද විලාශය දෙස බලා සිටියාය. නොබෝ වේලාවකින් අප්පා එනු දුටු චේතා නැගී සිටියාය.

"අප්පා අර සිංහල කොල්ලා වහාම යවන්න."

ශෛවතලිංගම් එකවරම පිළිතුරක් දුන්නේ නැත. ඉකුත් දශක දෙක තුළ උතුර නැගෙනහිර ඉපදුන දරුවන් දුටුවේ සාමකාමී පරිසරයක් නොවේ. ඇසුවේ ළමා මනස ග්‍රහණය කරන හොඳ වදන් නොවේ. මීට ඉහත ජීවත්වූ පිරිස පිළිබඳව දැන් කතා කිරීමේ තේරුමක් නැත. ඔවුන්ගේ සිත සැබෙවින්ම කුරිරු වී ඇත.

"ඉස්සර දෙමළ සිංහල මිනිස්සු අතර වූ සම්බන්ධකම්, යාළුකම් අද නෑ. නුවර මිනිස්සු යාපනේ ගිහින්, කීරමලෙන්, කාසිකුඩාවෙන් නාල ආව කියන කතා අද බොරු. අපට දිනා ගන්න රටක් තියෙනවා."

"දුව.. කියන දේ අහන්න."

"බෑ අප්පා. කියන දේ අහපු කාලයක් තිබුණා. දැන් ඒවා කතා කරන කාලෙ ඉවරයි. ටෙල් හිම් ටු ගෝ.."

උමා මේ කතාවට සවන් දුන්නා විනා ඊට මැදිහත් වීමට ගියේ නැත. මෙම අරගලයට දිගු ඉතිහාසයක් ඇත. මිනිස්සුන්ට නිදහසේ ඉපිද, නිදහසේ මිය යන්නට ඇති අයිතිය සැමදා තිබිය යුතුය. මිනිසා ජීවත් වීමට දරන ප්‍රයත්නයන්හි නිමාවක් නැත. ප්‍රකෝපකාරී පිරිස හා එකවරම සංවාදයේ යෙදීමට නොපුළුවන.

"මට මේ ළමයාව එක සැරේම එලවන්න පුළුවන් කමක් නෑ. මේ මගේ හොඳම යාළුවගෙ පුතා."

ඇය පිළිතුරක් දිගත නොහැකිව ලත වූවාය. සංගීතයට, කලාවට ලැදි පියා බෙහෙවින් සංවේදී පුද්ගලයෙකි.

"එයා ඇවිදින් ඉන්නෙ මට කැන්ඩියන් ඩාන්ස්

උගන්වන්නයි.''

චේතාගේ සිතට යළි කෝපයක් පිවිසුනේ උමාගේ කතාවෙනි.

''ආ යූ මැඩ්. මොකක්ද උඩරට නැටුම් ඉගෙන ගන්න තියෙන විශේෂ ඕනෑකම. භරත, කතක් ඒ නැටුම් හොඳටම ඇති.''

''නැටුම් ශිල්පියෙක් වුණාම හැම නාට්‍ය සම්ප්‍රදායක්ම ඉගෙන ගන්න ඕනෑ. අක්කා උදිත් ඒ ප්‍රොපෙෂනල් ඩාන්සර් හි ඉස් අ ග්‍රැජුවෙට්.''

''බොරු කියන්න එපා. ග්‍රැජුවෙට් කෙනෙක් කියලා හිතන්නවත් බෑ.''

ඇය දොර රෙද්ද මැත්කර අසුන්ගෙන සිටින උදිත් දෙස බලා සිටියාය.

ඉන් සිත අවුල් වූ බවක් දැනේ. එය සැබැවින්ම මෝඩ සිතුවිල්ලකට සමානය. දුවූ සැණින් සිත සසල කරවන සම්භාවිතාවක් තිබිය නොහැක. එසේ වන්නේ බොළඳ නිර්මාණයකය. හින්දු හා දෙමළ කාව්‍යයන්හි ගැහැනු පිරිමි දුටු සැණින් එකිනෙකා බැඳී පේ්‍රමාවන් රැසක් පුරාණ කාව්‍යයන්හි දක්නට ඇත.

යටත් විජිතවලින් ධන සම්පත් එංගලන්තයට ගලා එමින් තිබුණ යුගයේ බිහි වූයේ වික්ටෝරියානු ගීත සම්ප්‍රදායන්ය. ශේක්ස්පියර්ගේ රෝමියෝ ජුලියට්, හැම්ලට්, ඔතෙලෝ වැනි කාව්‍යයන්හි නිර්මාණ අගය පිළිබඳ කිසිම ප්‍රශ්නයක් නැත. අන්තර්ගතය වී ඇත්තේ තදබල වූ ප්‍රේමය හා රාජකීය ආරවුල්ය. ඊට පසු සුද්දන්ට සිනාසීමට අවශ්‍ය නිර්මාණ බිහිවුණි. චාලිචැප්ලින් වැනි නිර්මාණ කරුවන් විහිළු කාරයන් බවට පත්වූයේ අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍යතාවයන් නිසාය. සිංහල, දෙමළ ජාතීන් අතර ඇහැදිලි සටනක් පවතින මෙවන් යුගයක තමාටත් නොරා සිත සසලවීම පිළිබඳව ඈ තැති ගත්තාය.



''මට මේ දරුවා එලවන්ට පුළුවන් කමක් නෑ. අපි කලක් ළඟින් ආශ්‍රය කළා. අපි වැඩට ගිහින් එනකල් උදිත්ගෙ අම්මා ඔයාව බලා ගත්තා.''

''මුදියන්සෙයි, මැණිකෙයි එනකල් අපි උදිත්ව බලාගෙන තියෙනවා.''

අම්මා කීවාය.

''අම්මා ඒ හැම දෙයක්ම අයිති අදට නොවේ අතීතෙට. ඒ කුඩා සිදුවීම් ජීවිතයේදී අපි මුහුණ දුන් සාමාන්‍ය සිද්ධීන් පමණයි. ඒ නිසා අපේ ගමන වෙනස් කරන්න බෑ. එයාව යවන්න.''

''අපි දූත් ඉගෙන ගන්න එන්න කියලනෙ අක්කා තියෙන්නෙ.''

''සතුරෙකුගෙන් වුණත් අපි දැනුම ලබා ගන්න ඕනෑ.''

චෛත්‍යලිංගම් කීවේ දුවට කරුණු වටහා දීම සඳහාය.

''සතුරා නිකන් දෙන දෙයක්වත් ගන්න එපා කියලයි තියෙන්නේ.''

චෛත්‍යලිංගම් මඳ වේලාවක් කල්පනා කළේය. මෙය සැබැවින්ම සටන් බිමක් නොවේ. සටන් බිමක තිබිය දෙමාපිය දරුවන් සමඟ සිටින විට බල නොපායි. මේ හැම තීසියක්ම පියා ලෙස තම පෞරුෂය හා ගෘහ මූලිකයා ලෙස පවත්වාගෙන යා යුතුය.

''මොන දේ වුණත් මම ගත්ත තීරණය වෙනස් කරන්නෙ නැහැ.''

අප්පාට කේන්ති ගිය බැව් තේරුම් ගිය නිසා ඇය නිහඬ වූවාය.

චෛත්‍යලිංගම් මැතිණිය ආවේ තේ බන්දේසිය ද රැගෙනයි.

''අපරාදෙ කරදර වුණේ.''

''මොන කරදරයක්ද? මේ අපි තේ බොන වෙලාව.''

ඔහු මදක් ඈතින් තිබූ පාර්සලයක් ගෙනැවිත් ඇය අත තැබුවා.

''මේක අම්මා දෙන්න කිව්වා.''

''මොනවද?''

ඇය සිනා මුසු මුහුණින් යුතුව පාර්සලය දිග හැරියාය.

''අප්පා.. උමා..''

ඇය සැමියාට හා පොඩි දුවට කතා කළාය.

වෛත්‍යලිංගම් පැමිණ රස කැවිලි දෙස බලා සිනාසුණේය.

''පැණි වළලු, කොණ්ඩ කැවුම් කොහෙන්ද මේ..?''

''මුදියන්සේ මැණිකේ හදලා එවලා.''

උමා කළේ ප්‍රථමයෙන්ම පැණි කොණ්ඩා කැවුමක් හා උඳු පැණි වළල්ලක් ගැනීමය.

''මොකද පොඩි දුව මේ කරන්නේ..? මේ පිට ළමයෙක් ඉන්දෙද්දි කනවා.''

''කමක් නෑ කැවාවෙ..''

''චේතාට හිඟින් දෙන්න.''

උමා පැණි කැවුම් රැගෙන කාමරයට ගියාය. චේතා ඉවතට හැරී සිටියේ අමනාපයෙන් යුතුවය. අප්පා සමග අමනාපයෙන් සිටින නිසා ඒ දෙසවත් බැලුවේ නැත.

''ආ.. කැමක්.''

''මට එපා..''

''අපිට කන්න හම්බ වෙන්නේ නැති දෙයක්. මී පැණි වගේ රසයි.''



චේතා සොයුරිය අත වූ රසකැවිල්ල දෙස බැලුවාය. එම රස කැවිල්ලේ මිහිරි සුවඳක් විහිද යමින් තිබුණි.

''කන්න ළමයෝ.. මේවා ගෙනාවෙ උදිත්.''

''ඕන්නෑ අපට..''

ඇය ඉවතට හැරුණාය.

චේතා කවදත් නපුරුය. ඇගේ හැසිරීම පැමිණ සිටින උදිත්ට දැන ගැනීමට ඉඩ නොතැබීමට සැමෝම වග බලා ගත්හ.

උදිත් තේ පානය නිම කර නිවසින් පිටව යාමට සූදානම් වුණි.

''එහෙම නම් මම යනවා.''

''දැන් ඉතින් කවද්ද මේ ළමයට උගන්වන්න පටන් ගන්නේ. සරස්වතී පූජාවක් පවත්වන්න ඕනැයි කිව්වා නේද?''

''ඔව්. පූජාවක් තියන්න ඕනෑ කිව්වා. අපේ අප්පච්චි මගේ හඳහනත් එව්වා. අන්කල්ටත් හඳහන බලන්න පුළුවන් කිව්වා.''

''උගන්වන්න හඳහන හොඳ නම්, බලන්න තියන්නේ හොඳ නැකැතක් විතරයි.''

''ඔව් ඉතින් නැටුම් සාස්තරේ පටන් ගන්න කොට හොඳ වෙලාවක් බලන්න ඕනෑ. එහෙම නම් මම යනවා.''

''අපි දැන් එළියට යනවා. ඉන්න මගින් බස්සවන්නම්.''

''නෑ අන්කල් මට මෙතනින් බස් එක තියෙනවා.''

''මේ අපේ ලොකු දුව යාපනේ ඉඳලා ඇවිදින්. මෙයාට බෙහෙත් ටිකක් ගේන්න යන්න තියෙනවා.''

කවිනාමින් සූදානම්ව ගරාජයේ දමා තිබූ බවුකනිය රථයට ගන්නට සූදානම් වුණා.

''උදිත් පුතා මේ වාහනේ ගන්න පොඩි කල්පුවක් දෙනවද?''

උදිත් කුඩා ගරාජයේ තිබූ වාහනය එළියට ගැනීමට තල්ලුවක් දුන්නේය.

වෛත්‍යලිංගම් මහතා මෙම රථය මිලයට ගෙන වසර පහළොවකි. පවුල් දරුවෙක් බවට පත්ව සිටින මෙය මේ පළාතට ඇති පරණම වාහනය වේ. දැනට තියෙන වාහනවලට වඩා 11 ශ්‍රී කාණ්ඩයේ වාහනය හොඳ යැයි හෙතෙම කියයි. මෑතක සිට තරමක ප්‍රශ්න ඇතිව තිබුණත් එය සකස් කිරීමට ලැබුණේ නැත. රථයේ තෙල්, වතුර බැලූ හෙතෙම එය ප්‍රාණවත් කළේය.

"එන්න උදිත් ඉස්සරහට."

ඔහු නිහඬව පැමිණ රථයේ අසුන් ගත්තේය.

"කෝ.. එන්න චේකා.."

නිවසේ සිට තරුණ යුවතියක් රථය ළඟ සිට ගත්තාය.

"කෝ නංගි.. එයාටත් කතා කරන්න."

"අප්පා.. අම්මා තනියම දාලා එන්න බෑ. නංගිව තියලා යමු."

"එහෙම නම් යමු."

රථය ගේට්ටුවෙන් පිටවන හැටි උමා බලා සිටිනු උදිත් දුටුවේය. රථය මහ මඟට පිවිසි නොබෝ වෙලාවකින් වැසි වැටෙන්ට වුණි. මහ මඟ මිනිසුන්ගෙන් හිස්වීමට ගත වූයේ මොහොතකි. මහ පාරේ කාණු පිරී ඇති හෙයින් මාවත් යටවීමට ගත වූයේ මොහොතකි. එකවරම රථය මහ මඟ නතර වුණි.

"ඇයි අප්පා..?"

"නතර වුණා."

"මෙහෙම වැස්සොත් යන්න බැරි වෙයි."



# 12

තවම වැස්ස තුරල්ව නැත. අප්පාගේ කබල් වාහනයේ නාවා නම් වෛද්‍යවරයා හමුවීමට යා හැකිව තිබුණි. යළි හිස පුපුරන්නට තරම් වේදනාවක් හට ගත්තාය.

වාහනය දමා ත්‍රීවීලයක් ගෙන යන මෙන් යෝජනා කළේ හිසේ වේදනාව දරනු බැරිවය. අප්පා සිටියදී වැස්සේ තෙමෙමින් ත්‍රීවීලය නතර කිරීමට ගිය මෝඩයා කෙරෙහි ඇගේ සිතේ අමනාපයක් ඇති වුණි. මොහුගේ කට කැඩිච්ච කතාව තවම සිතින් ඉවත්ව නැත. උදයන්ගේ කතාව නිසා නීලන් තමාගෙන් පළිගැනීමට සූදානම් වන හැටි සිහිවෙයි. සිහිනෙන්වත් නොදුටු කෙනෙකුට වෛර බැඳීම එතරම් සාධාරණ නැත. වැස්සේ තෙමෙමින් සිටින උදිත් මෝඩයා දෙස ඇය බලා සිටියාය.

"අංකල් මේන් වැක්සිය."

"අයියෝ.. මේ දරුවා තෙමුණා. නගින්න පුතා.. නගින්න."

"එපා අංකල්. මම මේ කාර් එකට වෙලා ඉන්නම්. මේකත් බලාගන්න ඕනැනේ."

"බයවෙන්න එපා. මේ කාර් එක ගන්න කෙනෙක් නෑ. නගින්න ඇතුළට."

හෙතෙම රථයට නැග්ගේ අප්පාගේ බලවත් ඉල්ලීම නිසාය. මෙවන් සිදුවීම් ජීවිතයේ එතරම් ප්‍රබල සිද්ධීන් ලෙස සැලකිය නොහැක. තමා ඉපදුන දිනයේ සිට දුටුවේ දෙමළ ජාතියට සිදුවූ අසාධාරණකම්ය. මෙම උපකාර කිරීම තුළ අගේ කළ හැකි දෙයක් නැත.

"දුව මේ ළමයා හොඳටම තෙමිලා. අතේ ලේන්සුවක් නැද්ද?"

ඇය නෑසුනාක් මෙන් සිටියාය. වෛත්‍යලිංගම් තාත්තා දුවගේ ස්වභාවය දනී. චේකා කර එල්ලාගෙන සිටි බෑගය විවෘත කළ ඕනු

එහි වූ තුවා ලේන්සුව ගෙන උදිත්ට දුන්නේය. සාකච්ඡා වූයේ කුමක්දැයි ඔහුට අවබෝධ වුණි. තම හිස පිසදමා ගැනීමට ලේන්සුව නොදීමට තරම් ඇය අකාරුණික වුණි. වැස්සට තෙමී උණසන්නිපාතය හැදුනත් මෙවැන්නියකගේ උපකාරය අවශ්‍ය නැත.

"පුතා මෙකෙන් ඔළුව පිහදා ගන්න."

"ඕන්නෑ අංකල්. දූත් බෝඩිමට ගිහිල්ලා නාන එකනෙ. කාගෙවත් ලේන්සු අවශ්‍ය නෑ."

දූක්කද හින්ට් එක ගහපු හැටි. කරන්නම් හොඳ වැඩක්.

"එපා නම් දෙන්න අප්පා.."

ඇය ලේන්සුව උදුරා ගැනීමට සූදානම් වුණත් වෛත්‍යලිංගම් එය දුන්නේ නැත.

"කෝ දෙන්න මගෙ ලේන්සුව..."

හෙතෙම ලේන්සුව දුවට දීමෙන් වැළකී සිටියේය.

"පිහදා ගන්න ළමයෝ.."

අප්පා ඔහුගේ හිස පිසින හැටි ඇය බලා සිටියාය. වැස්ස තුරල්ව නැත.

"කොහේද පුතාගෙ ප්ලැට් එක තියෙන්නේ. යමු.. ගිහින් දාලා එන්නම්."

"දූත් ඒක පහුකරලයි ඇවිදින් තියෙන්නෙ. මේ වැඩේ කරගන්න."

"මම කියන්නද.. මේ දොස්තර ඉන්න තැන හරියට දන්නෙ නෑ. ඔයත් ඉන්නව නම් හුඟක් හොඳා.."

"එහෙනම් අංකල් මම මෙහෙන්ට වෙලා ඉන්නම්. ගිහින් බෙහෙත් අරන් එන්න."



"ඒක හොඳයි. අපි ගිහින් එන්නම්."

උදිත් චේතා යන අයුරු බලා සිටියේය. මැය පැහැදිලිවම උමාට වෙනස්ය. චේතා අසනීපයෙන් පසුවන බව ඔහුට වැටහී ගියේ ඇය වෛද්‍යවරයා හමුවීමට ගිය හෙයිනි.

සමහරවිට ඇය හිස ඔසවා නොබලන්නට ඇත්තේ අසනීපය නිසා විය හැක. එහෙත් ගැහැනියෙක් තුළ නිහතමානී බවක් තිබිය යුතුය. ඔහු පුටුවක අසුන් ගත්තේය. එහි සිට බලන කළ ඔබ්බෙන් පිහිටි රථගාල පෙනෙයි. තවම වැස්ස තුරල්ව නැත. මේ දිනවල හැඳෑ සමයට වැසි වැටීම නිබඳව සිදුවේ. මෙහි පැමිණීමෙන් සිදුවූයේ අනවශ්‍ය ප්‍රශ්නයකට යළිත් මුහුණ දීමටය.

තරමක ප්‍රමාදයක් ඇති වුණේ නියම වේලාවට වෛද්‍යවරයා නොපැමිණි හෙයිනි. කලින් ගිය දිනෙක වෛත්‍යලිංගම් මහතා ආවේ තරමක් වේලා ගතවූ පසුවය. ඔහු චේතාගේ අතින් අල්වාගෙන ආවේ ඇය අසනීපයෙන් පසුවන නිසාය.

"පුතා.. මෙන්න මේ බේත් ටික ෆාමසියෙන් ගේනවද?"

"දෙන්න අංකල්"

ඔහු බෙහෙත් තුණ්ඩුව රැගෙන ෆාමසියට ගියේය.

බෙහෙත් ගැනීමට තරමක් වේලාවක් ගතවුණි. ඔහු එනවිට යුවතිය හිස පියාගේ උරහිස හොවාගෙන සිටිනු ඔහු දුටුවේය.

"හරි අංකල් බේත් ගෙනාවා."

"සල්ලි ගත්තෙ නෑනෙ.."

වෛත්‍යලිංගම් කීවේය.

"ආ.. ඒක පස්සෙ ගන්න බැරියැ.. මේ වෙලාවෙ මින්නෑ මම ත්‍රීවීලර් එකක් කතා කරන්නම්."

චේතා නිවසට ගියේ හිසේ වේදනාවෙන් යුතුවය. හිසට

බෙත් දුන්නේ සිංහල වෛද්‍යවරයෙකි. වේදනා නාශක බෙහෙත් හැරුණු විට වෙනත් බෙහෙත් දුන්නේ නැත.

නින්ද යාමට දුන් බෙහෙත ගත් ඇය ඇඳේ හාන්සි වුණි.

''කොහොමද බෙත්වලට..''

උමා සොයුරියගේ ඇඳේ පසෙක ඉඳගනිමින් ඇසුවාය.

''හරි අමාරු වුණා. දැන්නම් ටිකක් හොඳයි වගේ. මම හිතුවෙ ඔළුව පුපුරාවි කියලයි.''

''ඔයාගෙ අමාරුව අම්මටත් තියෙනවා.''

''මට තිබුණෙ මැරෙන්න තරම් වේදනාවක්. අනේ නංගි මගෙ බෙත්වලට සල්ලි දෙන්න බැරිව ගියා. අර කොල්ලා තමයි සල්ලි ගෙව්වෙ..''

''අප්පා දෙන්ට ඇති. මෙ එන්නේ අප්පා..''

''අප්පා.. අර බෙත්වලට සිංහල බෝයිට සල්ලි දුන්නද?''

''උදිත්ට සල්ලි දුන්නා. ඒත් ගත්තෙ නෑ.''

''මොකද අප්පා කරන්නෙ.. සල්ලි නොදුන්නොත් මම බෙත් බොන්නෙ නෑ. නොගන්න හේතුව මොකක්ද? ඒ මගෙ කවුද?''

''ඒවා නම් අපි දන්නෙ නෑ.'' උමා කීවාය.

''ඔච්චර නපුරු වෙන්න එපා දුව. ඒ බෝයි දුවට බෙතකුත් ගෙනාවා කිව්වා.''

''මට බෙත් එවන්න එයා කවුද? ඩොක්ටර් කෙනෙක්ද?''

''ඔව්.. හොඳ වෙද පරපුරක්. ඒ ළමයගෙ තාත්තා කසායක් එක්ක ඔළුවට දාන තෙලක් එව්ලා. මේ බෙහෙතින් පස්සේ ඒක බීලා බලන්න.''

''මට ඔය කාගෙවත් තෙල් බෙත් ඕන නෑ. මම ඉංග්‍රීසි



බෙහෙත් බොනවා.''

''මහ නපුරු කෙල්ලෙක්. මොන තැකතක ඉපදිලාද දන්නෙ නෑ.''

යැයි කියන්නට සිතුණු මුත් වෛත්‍යලිංගම් එය ඉවසා සිටියේය. දරුවන් තමාගේ වන්නේ ටික කාලයකටය. එහෙත් ආසියාතික සමාජයේ මිය යනතෙක්ම දෙමාපියන් දරුවන් තමාගේ ඇසුරෙන් මුදවන්නේ නැත. යුරෝපය, නැගෙනහිර යුරෝපය, ජපානය වැනි ආසියාතික රටවල්වල දෙමව්පිය දරු සම්බන්ධතා දුරස්ව ඇත.

යුද්ධය සමස්ත සමාජයම උඩුයටිකුරු කර ඇත. මිනිසුන්ගේ මානව දයාව අභියෝගයට ලක්ව ඇත. පිරිමි නැති තම පවුලට සිටින්නේ ගැහැනු දරුවන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා සෙසු සමාජයත් සමඟ හොඳින් ජීවත්වේ යැයි වෛත්‍යලිංගම් සිතුවේය. එහෙත් අද තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්ය.

තමාට හොඳ දරුවන් දෙදෙනෙක් නිර්මාණය කිරීමට නොහැකි වී ඇතැයි බිරිඳ චෝදනා කරන හැටි ඔහු දනී. එහෙත් කළ යුතු යමක් නැත.

දරුවන්ගේ චර්යාවන් වෙනස් කිරීමේලා දෙමාපියන්ට කළ හැකි කාර්යයන් රැසක් ඇත. ගුරු දෙගුරුන් හා නියමයන් ජන ජීවිතයේ ප්‍රධාන තැනක් ගනී. දරුවන්ගේ සිත්වල ශුද්ධ මානසිකත්වයක් ඇතිවීම සමඟ ඔවුන් නොමඟ යති. මොන දේ වුවත් දරුවන් බැහැර කිරීමට නොපුළුවන. යුද්ධය පවතින අතර වුවද ඇය මෙහි ආවේ එනිසාය.

බිරිඳ ආවේ කල්පනාවේ නිමග්නව සිටියදීය.

''දුවට බෙත් දුන්නද?''

''විශේෂ බෙහෙත් නෑ. පේන්කිලර්ස් වගයක් දීලා තිබුණා.''

සාවිත්‍රි කීවාය.

''ආයුර්වේදයට ගිහින් බේතක් අරන් දුන්නා නම් සනීප වෙනවා. මේ කෙලී සිංහල බෙත්වලට කැමති නැහැල්ලු.''

''සිංහල, දෙමළ කියලා බෙහෙත්වලට ජාති නෑ. ගස් මුල් බේත්වලට ජාතිවාදයක් නෑ. මහ පිස්සු ළමයි.''

ඔහු චේතා සිටින කාමරයට ගියේ තරමක කෝපයකින් යුතුවය. දොර රෙද්ද මෑත්කර බලද්දී ලොකු දුව ඇඳ බදාගෙන සිටින හැටි ඔහු නෙත ගැටුණි. ඇය සැබැවින්ම හිසේ වේදනාවෙන් පසුවන බව ඔහුට හැඟෙයි. ඔහු ආපසු සිය කාමරයට ගියේය.

''මේ දරුවාගේ හඳහනවත් බලන්න ඕනෑ.''

වෛත්‍යලිංගම් මැතිණිය සැමියා අසල අසුන් ගනිමින් කීවාය.

''ඒක තමා මම මේ ලෑස්ති වෙන්නෙ...''

මුහුණ සෝදා ගෙන වෛත්‍යලිංගම් මහතා ලොකු දුවගේ හඳහන බලන්නට සූදානම් වුණි. මේ ගෙවී යමින් පවතින්නේ අපල කාලයකි. කරදර තිබුණත් මේ හඳහන වාසනාවන්ත එකකි. ඊළඟට උදිත්ගේ හඳහන දෙස ඔහු මඳ වේලාවක් බලා සිටියේය. ත්‍රිශූලාකාර ලෙස උපතින් පිහිටා ඇති ග්‍රහයන් නිසා මොහු කවදා හෝ ලංකාවේ ප්‍රසිද්ධ, ජනප්‍රිය පුද්ගලයෙක් වන බව කිසිම සැකයක් නැත. කවදා හෝ හොඳ විවාහයක් සිදුවන බවට කිසිම වාදයක් නැත. ග්‍රහචාරය අනුව ඔහුට හිමිවන්නේ හොඳ අදහස් ඇති ගැහැනු කෙනෙකි. උමාගේ හඳහන අනුව නැට්ටුම් ඉගෙනීමේ ප්‍රශ්නයක් නැත. එහෙත් මේ හඳහන් සැබැවින්ම කලාතුරකින් හමුවන විදියේ හඳහන් දෙකකි. වෘත්තීය ලෙස හඳහන් නොබැලුවත් මෙම ශාස්ත්‍රය ඔහු මැනෙවින් හදාරා තිබුණි. ලොකු දුවගේ හා මෙම තරුණියාගේ හඳහන් දෙස සසැඳුවේ ඒවායේ ඇති කැපී පෙනුණ ලක්ෂණ නිසාය. මෙවන් හඳහනක් ජීවිත කාලය තුළ දැක නැත. ප්‍රශ්න නැතිවාම නොවේ. මොවුන් ආත්ම ගණනාවක සිට එකට ජීවත් වූ, දිවි පිදූ, ආදරයෙන් බැඳුණු යුවළකි.



එහෙත් මෙය කවදාවත් සිදුවිය නොහැකි දෙයකි. බිරිඳටවත් නොදන්වා එම රහස ඔහු තනියම ආරක්ෂා කළේය.

# 13

කොළඹ පැමිණියාට පසු හිසේ වේදනාව තරමක අඩුවක් දැනුණි. පැමිණි දින සිට හැමදාම හැන්දෑවට කුඩු සොද වැටීමට නිසා දේශගුණයේ සැබෑ වෙනසක් ඇතිව තිබුණි. ගන්නා ලද වේදනා නාශක බෙහෙත් නිසා තරමක සහනයක් ලැබ තිබුණි. උදේ පාන්දරින් නැගිට මුහුදු වෙරළ දිගේ තනිව ඇවිද්දාය. මුහුද සිප හමන සුළඟින් ළය පිරෙයි. තනිවී මහ සයුර දෙස බලා සිටි විට සිත ඒ මේ අත විසිර යයි. උතුරේ සිටියදී හැම නිමේෂයකම පවත්නා සඳහා යොමුවූ මනසින් සිටීමට සිදුවූ හැටි මතකය. තදබල ලෙස හිස වේදනාව ඇතිවී නොතිබුණා නම් මේ ගමන තමාට එන්ට නොලැබෙන බැව් ඇය දනී.

චේතා උදිත් පිළිබඳව අමනාපයෙන් සිටියේ මෙහි ඒමට ප්‍රථමය. උදයන් නිතරම හැසිරෙන්නේ තමා පිළිබඳ සැකයෙන් යුතුවය. තමාට ඒ තත්ත්වය උදා කළේ උදිත්ය. දකින්නාටත් ප්‍රථම තම වෛරකාරයා බවට පත්වූ හැටි. ඔහුගේ කතාවෙන් උදයන්ට දැනගන්ට ලැබුණේ තමා ඔහුගේ බිරිඳ බවය. එවන් කතාවක් කීමට තිබුණ අයිතිය කුමක්ද? පළිගැනීම සිතේ දරාගෙන සිටියත් එය පවත්වා ගෙන යාම අසීරු වූ හැටි සිහිවෙයි. තමා සමඟ රථයෙන් ගිය දිනයේ ඔහු වැස්සේ තෙමී තෙමී ත්‍රිවීලයක් සොයන්නට ගිය හැටි සිහිවෙයි. ගල්පරයක වැදුණු දිය රළේ විසිතුරු බවත් ඇය දුටුවාය. ගල් තලයෙන් නැග ඇය යළි ගමන් ඇරඹුවාය. හිස පිසදා ගැනීමට ලේන්සුව දෙන මෙන් අප්පා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප

කළ හැටි යළි සිහිවුණි. මේ හැමටම වඩා සිත සසල කළේ හෙතෙම තමා වෙනුවෙන් බෙහෙත්වලට මුදල් ගෙවා ඇති බව දැනගත් පසුවය. තම බෙහෙත් වෙනුවෙන් හය හත්සීයක මුදල් ගෙවීමට තරම් ඇති ඕනෑකම කුමක්ද? ඔහු මෝඩයෙකැයි සිතෙන්නේ එබැවිනි. මේ හැමටම වඩා ප්‍රධාන දෙය වන්නේ තමා මෙහි රැඳී සිටි සතිය තුළ ඔහු නිකමට හෝ තමා දෙස නොබැලීමය. ඔවුන් සිතා සිටින්නේ තම ජාතිය මෙරට දෙවෙනි පුරවැසියන් බවය. බැහැර කිරීම් ප්‍රතික්ෂේප කිරීම, රැවටීම, ඝාතනය කිරීම සංඛ්‍යාත වූ විශාල වැරදි සංඛ්‍යාවක් දමිළ ජාතියට සිදුව ඇත. උඩරැටියන් කොහොමටත් ආඩම්බරය. එවන් පුද්ගලයෙක් යටතේ නංගි නැටුම් හැදෑරීම පිළිබඳව ඇය අසතුටු වූවාය. කොළඹ කොල්ලො සෙල්ලක්කාර වැඩියි. බැරිවෙලාවත් මෙකී සිංහල කොල්ල එක්ක යාළු වුණොත්.. ඒ තරම නැටිටිච්චි.

සරස්වතී පූජාව පැවැත්වීමට ඇත්තේ පෙරවරු නමය පසුවී විනාඩි පනස් හතරටය. මෙම උත්සවයට නොයා සිටීමට තීරණය කළේ අකමැත්ත ප්‍රකාශ කිරීම සඳහාය.

උමා මෙම දිනය එනතෙක් බලා සිටියේ අසමාන සතුටින් යුතුවය. කතක්, මනිපුරි වැනි නාට්‍ය සම්ප්‍රදායන් හදාරද්දී මෙතරම් සතුටක් දැනුණේ නැත. පිටරට නාට්‍ය සම්ප්‍රදායන් හදාරනවාට වඩා දේශීය දෙයක් හැදෑරීම හොඳය. අප්පා මේ කටයුත්තට කැපවීමෙන් කටයුතු කරන්නේ ඇයි දැයි උමා දනී. උදිත්ගේ පියා තම පියාගේ හොඳම මිත්‍රයා බැවිනි. විශේෂයෙන් මේ උඩරට නැටුම් සම්ප්‍රදාය ඉගෙනීමට ලැබීම සතුටට කරුණකි.

අප්පා සරස්වතී පූජාව සකස් කළේ හදබල කැමැත්තෙනි. උදිත් උදෙන්ම පැමිණ පූජාවට සූදානම් වුණි. මෙම උත්සවයට අම්මා, අප්පච්චි පැමිණ සිටි මුත් අක්කා මගහැර සිටීම ඇගේ සිතට හදබල ලෙස බලපෑවේය. ඇය සොයුරියගේ තත්ත්වය පැහැදිලිව දනී. විශේෂයෙන් ඔහුගේ ජාතිකත්වය පිළිබඳව ඇය දරන අදහස උමාට වැටහෙයි.



මල් පහන් පූජාවන් පවත්වද්දී සිතට දැනුණේ සතුටකි. ඔහු උත්සව ආරම්භ කළේ මඟුල් බෙර වාදනය කරමිනි. මේ නිවසේ කිසිදාක උඩරට බෙරයක් වාදනය වී නැත.

උමා බෙර වයන උදිත් දෙස බලා සිටියාය. ඊළඟට ඇගේ නෙත යොමු වූයේ දොරට හේත්තු වී සිටින අක්කා වෙතය. අත් බැඳ දොරට හේත්තු වී තමා දෙස බලා සිටින තපුරු තරුණිය වෙත උදිත්ගේ නෙත යොමු වුණි. නැටුමට ඇති ආදරය නිසා උමා මෙය ප්‍රගුණ කිරීමට කැමති වුවත් එය සැබැවින්ම හිමි විය යුත්තේ චේතාටය. දකින ඕනෑම කෙනෙකුට මෙම යුවතිය දෙස තවත් වරක් බැලීමට ඕනෑ කමක් ඇතිවීම පුදුමයක් නොවේ. මෙම අපූර්ව බව නිකම්ම ගැහැනියකට හිමි වන්නේ නැත. අප නෙතින් සිහින් දකින හැම ගැහැනියක්ම අපේ බවට පත් කර ගත නොහැක. අප ලබන වින්දනය, අපූර්ව බව, චමත්කාරය තවත් දෙයක් හා සසැඳිය නොහැක. භරතමුණී සිය නාට්‍ය ශාස්ත්‍රයේ නව නාට්‍ය රසයක් දක්වා ඇත. රංගනයට ප්‍රවිශ්ට වන හැම ශිල්පිනියක් තුළම මෙම වාසනා ගුණය නැත.

තම සොයුරියගේ වැදගත්ම අවස්ථාවකට සහභාගි නොවීමට තරම් අකාරුණික වූ චේතා කෙරෙහි විශේෂ යමක් සිතේ ඇතිවූයේ නැත. සරස්වතී පූජාව නිමවා ඔහු ආපසු නවාතැනට ගියේ රූපවාහිනී වැඩසටහනට පෙනී සිටීම සඳහාය. මෙහි ආවේ නැටුම් ඉගෙනීමටය. අවසානයේ සිදුවූයේ ඉගැන්වීමටය.

අප්පච්චිගේ කලායතනයේ නැටුම් ඉගැන්වීම සඳහා පහසුකම් ඇත. උඩරට නැටුම් ඉගැන්වීමට වෙනම ස්ථානයක් මෙහි සකස් කළ යුතු විය. උඩරට නාට්‍ය සම්ප්‍රදාය හදාරා නොතිබුණත් ඊට අදාල පහසුකම් වෛත්‍යලිංගම් මහතා සපයා දුන්නේය.

කඳේ හා අත් පාවල ඇද හැර ගැනීම සඳහා හැම ශිල්පියෙක්ම ''දණ්ඩියමේ'' නැටිය යුතුය. ඇස්, අත්වල රාංගික හැසිරවීම අත් සරඹ නමින් හැඳින්වේ. දණ්ඩි කඳෙන් ඇත්ව කරන නැටුමට ''ගොඩ සරඹ'' නමින් හැඳින්වේ. මෙහි සරඹ දොළහක් ඇති අතර,

කස්තිරම් ද දොළහක් ඇත. මේවා හොඳ අභ්‍යාසයකින් කළ යුතු ඒවාය.

කතිකා කරගත් පරිදි නැටුම පටන් ගන්නේ පෙරවරු හතටය. උදේ පැමිණ ගේට්ටුවට ශබ්ද කර උදිත් පසෙකට වී සිටියේය. චෛත්‍යලිංගම් හෝ උමා දොර විවෘත කරාවි යැයි ඔහු සිතා සිටියේය.

ගේට්ටුව විවෘත කළ සැණින් ඔහු තිගැස්සී සිටියේ චේතාගේ උවන දැකීමෙනි. උදිත් කිසිසේත් ඇගේ දසුන දැකීමට අපේක්ෂා කළේ නැත. යුවතියක් දැකීමෙන් සිත මෙතරම් සසල වීමට කිසිම හේතුවක් නැත. මෙය මේ මොහොතේ පමණක් සිදු වූවක් නොවේ. දුටු හැම මොහොතකම එකම වරද සිදුවන්නේ ඇයි..? සිතට කෝපයක් පිවිසුනේ සිනාවක්වත් නැති මුහුණ දැකීමෙනි. ඇය පහත් කරගත් හිසින් යුතුව නිවස දෙසට පියවර මනිනු ඔහු දුටුවේය.

නැටුම් පුහුණු වන වේලාවට නාවත් ඇය ඈත සිට නරඹන බව ඔහු දැන සිටියේය. සරඹ පුහුණු වෙද්දී අත්වල ඇඳ සකස් කළ යුතුය. උමා නැටුම් කලාව හදාරා තිබුණ නිසා නාට්‍ය පැවරුමක් ඉගැන්වීම අසීරු නැත. එහෙත් රංගන විලාශයන් කියාදීම සඳහා ඇගේ අත ස්පර්ශ කිරීම වළක්වනු බැරි විය. තමා මෙම යුවතිය හා රංගනයේ යෙදෙන අයුරු චේතා බලා සිටින්නේ සතුටින් නොවන බව උදිත් දනී. මෙහි පැමිණි දින සිට චේතා පිළිබඳව සියුම් ලෙස හදාරද්දී කැපී පෙනෙන දෙයක් ඇත. උමා තමාගෙන් නැටුම් ඉගෙන ගන්නවාට අකමැති බව උදිත් දනී. හොර බැළලියක මෙන් වටේ යමින් සිටින චේතා කෝප කිරීමට ඔහු සිතා ගත්තේය. නැටුම නැටුවත් ඇය එදෙස නොබලා ගමන් කරයි. නැටුම් පන්තිය අවසන් වූ සැණින් නිවසින් පිටවීමට සූදානම් වුණි. ඔහු ඇඳුම් මාරු කරගෙන ආවේය.

''සර්... තේ බොන්න එන්න.''

''ඕන්නෑ. එපා.''



ඔහු කමිසය සකස් කරමින් කීවේය.

''නංගි.. නංගි...''

''අන්න නංගි කතා කරනවා.''

''ඔහෙ කතා කරපුදෙන්. මම යන්නෙ නෑ.''

ඇය උදිත් අසලට වී කීවාය. චේතා පැමිණ සතියකි. එදා සිට කළේ වෙනස්කමය. උදිත්ගෙන් නැටුම් ඉගෙන ගන්නවාට සඳබල අකමැත්තක් ඇති බව උමා දනී. ඔහු නර්තන විලාශයක් උගැන්වීම සඳහා තම අත් ඇල්ලුවේ ගුරුවරයෙක් ලෙසිනි. ඉදිරියට නොපැමිණ ඈත සිට බලා සිටින චේතා නිසා ඇතැම් විට ඉගෙනීමට ද අපහසුය.

''ඉහින් කතා කරලා එන්න.''

''ඔය කතා කරන්නෙ මට බණින්නයි. අක්කා සර් එක්කත් තරහෙන් ඉන්නෙ.''

උදිත් එකවරම යුවතිය දෙස එක එල්ලේ බලා සිටියේය. උපකාරයක් කළා හැර අමනාප වීමට කිසිවක් තමා කර නැත.

''එයා මා එක්ක තරහ වෙන්න හේතුවක් නෑ. මේ තරම්වත් ඇසුරක් නෑ.''

''ඉන්න සර් මම කතා කරන්නෙ මොකද අහලා එන්නම්.''

උමා උද්‍යානයේ ඒ මේ අත කැරකෙමින් සිටි සොයුරිය වෙත ගියාය. යාපනයේ සිටියදී මෙතරම් කැපී පෙනෙන ලෙස ඇන්දේ පැළැන්දේ නැත. ලා දුඹුරු කලිසමකින් හා කමිසයකින් සැරසී සිටි හැටි මනකය. පැමිණි දෙසතිය තුළ වූ සැබෑ වෙනස කුමක්ද? පිටාර ගලන ලස්සන ගැහැනුකමට ඈ උරුමකම් කීවාය.

''ඇයි කතා කළේ..?''

''නැටුම් ඉගෙන ගන්න නම් මනත මොකද තවත් කකාවි. යන්න අරිනවා.''

චේතා කීවාය.

"සර් ඉන්න නෙවේ ආවෙ යන්නයි."

"මෙ.. ඔයාගෙ කට වැඩියි දන්නවද?"

"අම්මා මෙන්න අපිට බණිනවා."

සාවිත්‍රි එළියට ආවේ ගැහැනු දරුවන් දෙදෙනාගේ රණ්ඩුව ඇසීමෙනි.

"අනේ ඇත්තට මොකද මේ වෙලා තියෙන්නෙ. නයි මුගටි වගේ ඔනෑම වෙලාවක ඇවිලීගෙන යනවා."

"අම්මා මෙයාව දූන්ම හදා ගන්න වෙයි."

චේතා මව දෙස බලා කීවාය.

"මගෙ හදන්ට දෙයක් නෑ. ඔයා හැදෙන්න. ඔයාගෙයි හදන්න දේවල් තියෙන්නෙ."

"මොකක්ද කිව්වෙ..? මොකක්ද කිව්වෙ..?"

චේතා ඉදිරියට ආවාය.

"ලොකු දුව.. මේ ඔයාගෙ නංගි නේද? ටිකක් ඉවසන්නකො."

අම්මාගේ කතාව නිසා ඇය සන්සුන් වූවාය.

"ආ.. මෙන්න බෙත්වල සල්ලි ගිහින් දෙනවා."

"මගෙයැ බෙත්. ඔයාගෙනෙ. ඔයා ගිහින් දෙන්න."

"බලන්නකො අම්මා."

"ඔයා රණ්ඩු නොකර ඉන්න. ඒක මම බලා ගන්නම්. ගිහින් අර ළමයට තේ බොන්න දෙන්න."

මවගේ පසුපස උමා යන්නට සූදානම් වුණි. චේතා සොයුරියගේ අතින් අල්ලා ගත්තාය.



"මම අරක අහන්නද?"

"මොකක්ද?"

"උදයන් ඔයාගෙන් මොකක්ද අහපු වෙලේ මේ බෝයි ක්‍රිව එක අහන්නද?"

උමා සැහැල්ලු ලෙස සිනාසුනාය.

"කට වරද්ද ගන්න එපා. සර් ඒක ඇත්තයි කිව්වොත් ඔයාට එයා එක්ක යන්ට වෙයි."

ඇය දුව ගියේ චේතා කැගසද්දීය.

"හිටපං උගන්වන්නම් පාඩමක්."

චේතා සොයුරිය පසුපස එළවා යමින් කීවාය.

## 14

අම්මා සමඟ කතා කරන අතර පවා තමා දෙස නොබැලීමට තරම් අකාරුණික වූ උදිත් පිළිබඳව තරමක අමනාපයක් සිතේ සටහන් වුණි. අමනාපයක් සිතේ තිබූ බව සැබෑවකි. හිරු දුටු පිනි මෙන් සෙමින් අතුරුදහන්වනු චේතාට දැනෙයි. ඔහුට තිබුණේ දියාරු නැති පිරිමිකමකි. එකට ඉගෙන ගත්, එකට අවිදුරු දමිළ පිරිමි දහස් ගණනක් ඇයට මුණ ගැසී ඇත. දක්ෂ කුවක්කු කාරුවකු වූ උදයන්ට තිබුණේ නිවට පෙනුමකි. එවන් පිරිමි සැබැවින්ම සමාජයට වෛර කරති. පිරිස අතර නෙතෙම ප්‍රධාන තැනක් ඉසිලුවේ සටන් ක්‍රීඩාකට සහභාගි වී ජය ලබා තිබූ හෙයිනි. එම කාරෙ ගති පැවතුම නිසා ඔහු ඉදිරියෙන් සිටියේය. උදිත්ට මෙන් ගැහැනියකගේ සිත තිරකර අල්ලා ගන්නා පිරිමිකමක් උදයන්ට නැත. ඇය අම්මා සමඟ එළුවන් වෙළඳ පොළේ ඇවිද්දදී යළි උදිත්

මූණ ගැසුණි.

"ඇන්ටි යමු මොනවා හරි බොන්න යමුද?"

උදිත් කළ යෝජනාව පිළිබඳව සිතේ සතුටක් ඇති වුණත් එය බාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට ඇය සිතුවාය. දිව ගිලෙන්නට තරම් පිපාසයක් ඇත.

"අම්මා එපා.."

ඇය මවගේ අතින් අල්වා ගත්තාය. ඇය කතා කළේ දෙමළ බසිනි. මව හා දුව අතර සාකච්ඡාවක් සිදුවෙමින් පැවතුනි. වෛත්‍යාලිංගම් මැතිනියට උදිත්ගේ ආරාධනය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන් කමක් තිබුණේ නැත.

"එන්න ඇන්ටි. මෙක හොඳ බොම්බෙ සුවීට් මාට් එකක්. අපි මොනවා හරි බොමු."

ඔහු නිහඬව සිසිල් බීම හළ වෙත ගියේය. වෛත්‍යාලිංගම් මැතිනිය දුවට ඉදිරියෙන් සිසිල් බීම හල වෙත ගියාය. ඇය නිහඬව මව පසුපස ගියාය. චේතා සිසිල් බීම හල වෙතට ආවේ අකමැත්තෙනි.

"මොනවද බොන්නෙ ඇන්ටි...?"

"පුතා කැමති දෙයක්."

"මෙයාට."

"දුව බොන්නෙ මොනවද?"

"මම වතුර බොනවා."

මෑකි මේ දරුවගෙ හිත රිදෙව්වා. බැණ වැදීමට සිතුණු මුත් ඇය එය ඉවසුවාය.

ගැහැනු මෙතරම් ආඩම්බර විය යුතු නැත. ඔවුන් කල එළි වන්නේ නිහතමානී වූ තරමටය. ගැහැනියකගේ නිරහංකාර



නිහතමානිකම ගුණ සුවඳක් සේ පැතිර යති. උදිත් නිකමටවත් යුවතිය දෙස බැලුවේ නැත. එය විජාතිකයෙක් පවත්වාගෙන ගිය සිසිල් බීම හලක් නිසා ඇය දමිළ භාෂාවෙන් කතා කර වතුර වීදුරුවක් ගෙන්වා ගත්තාය.

"අම්මට මේ රස කැවිලි අගුණ නෑ."

"එහෙම කිසි අමාරුවක් මට නෑ. මට තියෙන්නෙ චේතාට වගේ හිසේ අමාරුව විතරයි."

ඇය මඳ සිනාවෙන් යුතුව උදිත් පිළිගන්වන ලද රසකැවිල්ල අතට ගනිමින් කීවාය. ඒ වනවිටත් චේතා සිටියේ හිසේ අත තබාගෙනය.

"තවම දුවගේ හිසේ අමාරුව සනීප නැද්ද?"

"නෑනෙ. පුතා. පෙති බිව්වෙ නැතිනම් වේදනාව ඇතිවෙනවා."

"සිංහල බෙහෙත් තියෙනවා කරන්න කැමතිද අහන්න."

ඇගේ මුහුණට සතුටක් පිවිසුනේ ඉන් පසුවය. චේතා එතරම් කැමැත්තක් දක්වන බවක් නොපෙනුණි.

"අප්පච්චිගෙ වෙදකම කරනවද?"

"වෙදකම දන්නවා. ඉගෙන ගන්නට වෙදකම කරන්නෑ."

ඔහු මඳ සිනාවෙන් යුතුව කීවේය.

"මේ ළමයාට එළිවෙනකල් නින්ද යන්නෙ නෑ."

ඔහු පිළිතුරක් නොදී නිහඬව සිටියේය. මෙම සමාජයේ මිනිසුන්ට හොඳ ගුණ දහම් කියා දුන් පිරිස අතර දේශීය වෛද්‍යවරයාට හිමි වන්නේ ප්‍රධාන තැනකි. ඔවුන් සිසිදාක වෙළඳ පළේ අලෙවි වී නැත.

"පුතා හවසට එනවා නේද?"

"ඔව් ඇන්ටි."

ඔවුන් සමුගෙන ගිය පසු උදිත් නවාතැනට ගියේය. පිළියෙල කර ගත්තේ ව්‍යාංජන දෙකකි. මස් මාළු නොකන නිසා කෑම එතරම් තදබල ප්‍රශ්නයක් නොවේ. ජීවිතය ආරක්ෂා කර ගැනීමට සතෙකුගේ මස් කෑම ඔහු පිළිකුල් කළේය. රටත් එක්කම කෑම පිළියෙල කළ ඔහු නිදාගත්තේය.

විවේක දින සැඳෑ වරුවේ ඔහු වෛතෘලිංගම් මහතාගේ නිවසට යාමට සිතුවේය. ප්‍රධාන ප්‍රශ්නය වී පවතින්නේ උමා උනන්දුවෙන් ඉගෙනීමය. මෙහි මූලික අවස්ථාව ඉගැන්වූ පසු ඇයට වෙනත් පන්තියක හෝ ඉගෙන ගැනීමට පුළුවන.

උදිත් සැඳෑ වරුවේ නිවසට ගියේ ඉක්මනින් නවාතැනට යා යුතු හෙයිනි.

ඔහු සුපුරුදු ලෙස ගේට්ටුවට තට්ටු කළේය. සැමිණි දින හයේම වේනා පැමිණ ගේට්ටුව විවෘත කර පහන් කරගත් හිසින් යුතුව ගිය හැටි මතකය. හමු වූ ප්‍රථම දිනයේ සිට හැසිරීමේ සුළු ප්‍රගතියක් දිස් වුණි. තමාට පසු බා ගමන් කරන ගමන සිමන ළතාවේ ගැහැනියකට හිමි සෞන්දර්ය රැඳී තිබුණි.

දොර විවෘත කළේ වේනා දකිනි අටියෙනි. ආදරයට සෙනෙහසට හුරු බැඳීමක් නැති වුවත් ඇය සිත අසල සස්මන් කරන්නියකි. ශමවැනි රූමත් කාන්තාවක් විදෑත පියයේදී හමුවූවා මතකය. ආදරය වැනි සුවිශේෂී වූ සිද්ධියකදී ජාතියක්, ආගමක්, භාෂාවක්, සංස්කෘතියක් එතරම් වැදගත් සීමා බන්ධන වන්නේ නැත. ගැහැනියක වෙතින් තමා දකින සුන්දර බවට අඩංගු ප්‍රතිගතයේ අඩුවක් තිබුණි. වේනා එසේ නොවේ.

දොර විවෘත කළේ වේනාගේ මව විසිනි.

"එන්න පුතා ඇතුළට."

ඔහු ගේට්ටුවෙන් ඇතුළට පිවිස එය වැසීමට සහාය වුණි.

"කෝ අන්කල් ඉන්නවද?"

ඔහු ගෙනෙන ලද බෑගය පසෙක තබමින් කීවේය.

ඇතින් සිටි වෛතෘලිංගම් උදිත්ව ආදරයෙන් පිළිගත්තේය. ඔහු උමා සුදානම් වනතෙක් සාලයේ අසුන් ගෙන සිටියේය.

"පුතා තේ එකක් බීලම පටන් ගන්නවද?"

"නෑ අන්කල් දැන්ම එපා."

සැඳෑ පන්තියේ සංගීත පන්ති පවත්වා උමා නැටුම් ඉගෙන ගැනීමට සූදානම් වෙමින් සිටින්නීය.

"වේනාට සැහෙන දවසක ඉඳන් හිසේ අමාරුවක් තියෙනවා. ඒකට සිංහල වෙදකමක් කරන්නයි හිතාගෙන ඉන්නේ."

"ඔව් ඒක හොඳා. ඉංග්‍රීසි බෙහෙත් තාවකාලික වේදනා නාශකයක් විදිහට හොඳා."

වේනා දොර රෙද්ද මෑත්කර බලා සිටියාය.

"පුතා මෙන්න මේ දුවට බෙහෙත් ලියලා දෙන්නකෝ. වේනා මෙහාට එන්න."

වේනා සෙමින් සෙමින් ඔවුනතරට ආවාය.

"ඉඳගන්න."

ඔහු පහත් හඬින් කීවේය. ඇය එක එල්ලේ බලා සිට මුහුණ පහත් කර ගත්තාය.

"මොකක්ද ලෙඩේ ඉතිහාසය."

ඔහු යුවතිය දෙස බලා සිටියාය.

"කියන්න දුව. දුවගේ ලෙඩේ කියන්න. අපි දන්නෙ නැහැනෙ."

"අම්මා කියන්න."

ඇය පහත් කරගත් හිසින් යුතුව කීවාය.

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය. ඒ ස්පර්ශය ලද සැණින් නොදන්නා කාන්දම් බලයක් ගතට පිවිසුනාක් මෙන් දැනුණි. ඔහු තම නාඩි පරීක්ෂා කරද්දී නංගි කාමරයට පිවිසෙනු දුටු ඇය නැගිට ගත්තාය. ඇය සිනාසුනේ සරදමකට මෙනි.

"කෝ දිව දික් කරන්න."

"ඔහොම නෙවේ හොඳට දිව දික් කරන්න."

"ඔය ඇති මට බෑ."

ඇය අමනාපය ප්‍රකාශ කළාය.

ගැහැනියකගේ ඇඟ ස්පර්ශ කිරීමට නීත්‍යානුකූල බලය ඇත්තේ වෛද්‍යවරයෙකුටය. එසේම අයිතිය විවාහක සැමියාට ද ඇත.

"අත්කල් පොඩි බෙහෙත් කරලා බලමුද?"

හෙතෙම චේතා දෙස නොබලා කීවේය.

"මම එච්චර දක්ෂ කෙනෙක් නෙමේ. මේ බෙහෙතට සනීප වුනොත් අප්පච්චි හම්බ වෙන්න යන්න වෙයි."

"කොහොමටත් මම අප්පච්චි හම්බ වෙන්න යන්නයි හිටියෙ. තවම කාර් එක හදා ගන්න බැරි වුණානේ."

"මේ කබල් කාර් එකේ ගියොත් අපිට කඳු තල්ලු කරන්න වෙයි."

"එහෙම කියන්න එපා. මේක අපි දෙන්නගෙ ජීවිතයට හුගක් උදව් වෙච්ච වාහනයක්.

"උදව් වුණු බව ඇත්ත. ඒත් මේකෙන් ගියොත් අපිට කඳුගන්නාවෙ කන්ද තල්ලු කරන්න වෙයි."

ඇය සිනාසුනාය.

"වාහනයක් හයර් එකට අරන් හරි යමුකෝ.."



"ගෙදරින් ගෙනාපු තෙලක් තියෙනවා. ඒකෙන් අල්ලට ටිකක් අරන් හිසට දමන්න. තව පොඩි කසායක් තියෙනවා.. බොන්න දෙන්න වෙයි."

ඔවුන්ගේ සංවාදය තුරුස්නා සුළුය. හිසේ වේදනාව දරනු බැරිය. ඇය ඇඳ බදා කොට්ටයේ හිස හොවාගත්තාය.

අද නැටුම් පුරුදු විය නොහැක. බෙරපද නාදය ඇගේ හිසට හොඳ නැති බැව් උදිත් දනී.

"සර් අද අපි නටන නැටුම මොකක්ද?"

උමා ඇසුවාය.

"අක්කට සනීප නැතිව ඉන්දෙද්දී බෙර ගහන්න හොඳ නැහැනෙ. ඒ නිසා අපි ගායනා කරමු."

"අක්කට ආදරේද?"

ඇය මාතෘකාව වෙනස් අතකට යොමු කරමින් ඇසුවාය.

"ඔව් ආදරෙයි."

"අක්කත් ඒ බව දන්නවා."

ඇයගේ මුහුණ ලස්සන සිනාවකින් සැරසී තිබුණි.

"අක්කා දැනගත්තේ කොහොමද?"

"දවසක් මතකද අපි කූල් ඩ්‍රින්ක් එකක් බොන්න ගිහින් ඉන්දෙද්දී නිලන් කියන බෝයිට කිව්ව කතාව."

"මට එච්චර මතකයක් නෑ."

"මේ කවුද කියලා මාව පෙන්නලා ඇහුවම මගෙ නෑනා කිව්වා මතකද?"

"ඒ බෝයිගෙන් ඔයාව බේරගන්න දෙයක් කිව්වා මතකයි. ඒත් ඒක හිතලා ඕනෑකමින් කිව්ව එකක් නෙවේ."

"දැන් හරි දෙයක් තමා වෙලා තියෙන්නේ.. ඒ කතාව චේතාට ආරංචි වෙලා. දැන් ඔයාට බණින්නයි ඉන්නෙ."

"මම කියන්නෙ කතාව ඇත්ත කියලා."

ඔවුහු එකවර සිනාසුණාහ.

චේතා නළලේ අත තබාගෙන පන්තිය දෙසින් යනවිට උමා නිහඬ වූවාය. ඇය මෙහි ආවේ ඇයි දැයි උමා දනී.

උදිත් බෙර වාදනයකින් තොරව නැටුමට අදාළ වූ ගායනා සම්ප්‍රදායන් පිළිබඳව වූ පාඩම උමාට කියා දුන්නේය. නමස්කාර ගාථාවලින් පටන්ගෙන ශ්ලෝක, ග්‍රහ පන්ති කවි, ප්‍රශස්ති, උඩැක්කි උපත, මල් යහන් කවි, පැල් කවි, ගොයම් කවි වශයෙන් ශිෂ්‍යයෙක් විසින් අනිවාර්යයෙන් දත යුතුය.

උමා වැඩිකලක් කොළඹ අවට හැසිරීම නිසා මේ ගායනා ඉගෙන ගැනීමට අසීරු වූයේ නැත.

ගීත ගැයීමේ මනා හැකියාවක් ඇයට තිබුණි. සම්සාද් බෙගම්, අල්කා යාග්නි, අනුරාධා පොඩ්වාල් මෙන්ම ලතා මංගේෂ්කර් වැනි හින්දුස්තානි ගායිකාවන්ගේ ගීත ඒ ශෛලියේ සිටම ගැයීමට හැකියාවක් තිබුණි. උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත සම්ප්‍රදායන් හදාරා ඇති ඇයට සිංහල උච්චාරණය ඉගෙනීමට අපහසු නැත.

ගීත ඉගෙන ගනිමින් සිටියදී අප්පා එනු දුටු උමා ඒදෙස බැලුවාය.

"පුතා මේ ළමයා ඔළුව කකියනවා කියනවා. අපි අර බෝතලේ තියෙනවා කිව්ව තෙල් බෝතලේ ගේමුද?"

"කෝ.. චේතා කොහේද ඉන්නේ..?"

"ඇඳට වෙලා කොට්ටෙට තද කරගෙන ඉන්නවා. පව් අප්පා.. අඬනවා."

ඔහු මොහොතක් කල්පනා කළේය. අප්පච්චි විසින් වෙදකම ඉගැන්වූවත් එය වෘත්තිය මට්ටමින් කිරීමට ඔහුට සිතුණේ නැත. අප්පච්චිගෙන් පසු මෙම හස්ත සාර ගත්තත් එය භාවිත පරීක්ෂා කළේ නැත.



"යමු කාමරේට."

ඔහු ශෛවතාලිංගම් මැතිනිය අනුව චේතා නිදන කාමරයට ගියේය. ඒ වනවිටත් ඇය සිටියේ කොට්ටයේ මුහුණ හොවා ගෙනය.

"දුව මෙන්න උදිත් ආවා."

එහෙත් ඇය හිස එසෙව්වේ නැත. ඇය දෑස් විවර කර උදිත් දෙස බලා සිටියාය. අප්පච්චි ඉගැන්වූ නිල ශාස්ත්‍රයෙන් ප්‍රයෝජන ගැනීමට ඔහු සිතුවේය. දෙකන් ඔස්සේ හිස දෙසට දිවෙන ඇගේ නිලයන් ඇල්ලුවේ සැමවිටම බලා සිටියදීය.

# 15

සිංහල පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රය පරපුරෙන් පරපුරට පැමිණෙන්නකි. කිසියම් වෛද්‍ය පරපුරක් සතු හස්තසාරය වෙනත් අයකට යන්නෙ නැත.

මුදියන්සේ පරපුර සතු වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනුමට කෙනු දරුවන් කිසිවෙක් සතුටු වූයේ නැත. උදිත් මෙම ශිල්පය ඉගෙන ගත්තේ පියාට දක්වන ගෞරවයක් ලෙසය. සැම දෙයක්ම ආරක්ෂා කළේ එහි සැබෑ වටිනාකමක් ඇති හෙයිනි. නිල ශාස්ත්‍රය වූකලී පැවත එන්නේ පරම්පරාගත රහසක් ලෙසය.

චේතාගේ රෝගය සුව කිරීමට ප්‍රථමයෙන්ම නිල ශාස්ත්‍රය යොදා ගැනීමට සිතුවේ ඇයට ප්‍රහර්ෂයක් ඇති කිරීමට නොවේ. මූලිකව වා පිත්, සෙම් කිපීම නිසා මෙවැනි රෝග ඇතිවිය හැක.

අද රෝගී තත්ත්වය සෙවීම සඳහා ස්කෑන් පරීක්ෂණ ඇත. ඒ හැමටම ප්‍රථම තාවකාලිකව ඇගේ හිසේ වේදනාව නතර කළ යුතුය. නිලය ඇල්ලූ නොබෝ වේලාවකින් චේතාගේ හිසේ වේදනාව නැතිව ගියේය.

ඒ හැම දෙයක්ම සිදුවූයේ තරයේ දෑස් වසා සිටියදීය. ඉන් අනතුරුව කිසියම් තෙලක් හිසේ ගල්වනු ඇයට දැනුණි.

''දුව දැන් කොහොමද? සනීපද?''

ඇයට අම්මාගේ හඬ ඇසුණි. මීට ස්වල්ප වේලාවකට පෙර සිටියේ හිසේ වේදනාවෙන් කෑ ගසමිනි. එය නැතිවී ගොස් පුදුමාකාර සහනයක් ගලා එනු ඇයට දැනුණි. හිස සම්භාහනය කරන්නේ කවුදැයි ඇය දෑස් විවර කර බැලුවාය. එපමණ ආත්ම ශක්තියක් ඇය වෙත තිබුණේ නැත. බෞද්ධාගමිකයෙකු වූ හෙතෙම තමාගේ හිස පිරිමැද්දේ පිරිත් සජ්ඣායනයක යෙදෙමිනි. අටවිසි පිරිත නිමවා ජින පඤ්ජරය ගයද්දී නොදැනුවත්වම වාගේ ඇගේ දෙනෙත් කඳුලෙන් පිරී ගියේය.

පැහැදිලිවම ඔහු තමා වෙනුවෙන් කරන්නේ අභිර්වාදයක් බව ඇයට හැඟෙයි. හින්දු සාහිත්‍යයේ බොහෝ ධාතු ප්‍රත්‍යවල ඇති සාම්‍යත්වය නිසා ලෙඩින් පසුවන තමාට ආශීර්වාදයක් වේවා යනු පැතුම ඔහු ගීතවත්ව ගැයුවේය.

''සබ්බාව මංගල මුපද්දව දුක්නිමිත්තං
සබ්බීති රෝග ග්‍රහ දෝස මදේස නින්දා
සබ්බන්තරාය භය දුක්සුපිනං අකන්තං
සංඝානු භාව පවරේන පයාතු නාසං''

මේ ආශිංසනය කරනු ලබන්නේ තමාගේ ජාතියක නොවන කෙනෙකුටය. හරයාත්මකව අප හැම පුද්ගලයාටම ගෞරව කළ යුතු ආදරය කළ යුතුය.

අප අතර විවිධ අපේක්ෂා ප්‍රාර්ථනා තිබිය යුතුය. ඒවා පරයා ජයග්‍රහණය කළ ලෝකායත්ත පණිවිඩයක් ඇත. සියලු රෝග



දුරුවේවා, ග්‍රහ දෝස අපල කරදර ඔබ දකින නරක සිහිනයක් පවා නැතිවේවායි පැතීමට ඔහු සමාධිගතව සිටී.

''දුක්ඛප්පත්තාච නිද්දුක්ඛා..

භයප්පත්තාච නිබ්බයා

සෝකප්පත්තාච නිස්සෝකා...''

කොපමණ පෘථුල වූ ප්‍රාර්ථනයක්ද? අපි අවි දරන්නේ බිය නිසාය. දුකට පත්ව සිටින අය දුකින් මිදේවා, භයට පත්ව සිටින අය බියෙන් මිදේවා, දුරුවේවා.. ආශිංසනය නිමා වන විට ජීවිතය මහා පෙරළියකට පත්වීනැයි ඇයට සිතුණි. හිසේ කැක්කුම නැතිවීම සිත් පෙරළියකට හේතුවූවා නොවේ. අප යමක් දිනා ගත යුතු ක්‍රම ක්‍රිහිපයක් ඇත. කැමැත්තෙන් හෝ බලයෙන් එය පුළුල් ක්ෂේත්‍රයක සිට සාකච්ඡා කළ යුත්තකි.

පිරිත අවසානයේ ඔහු ඇගේ නළල සෙමින් සෙමින් පිරිමැද්දේය.

''දුව.. සනීපයි නේද..?''

සාවිත්‍රී ඇසුවාය.

චේතා නිරවුල් ලෙස සිනාසුන ද දෙනෙත් කඳුලෙන් තෙත්ව තිබුණි.

චෛත්‍යලිංගම් ඇඳේ ඉහ අද්දර සිටියේය. ඉතා සාහසික ලෙස ඉකුත් දශක දෙක තුළ සමාජය වෙනස්වී තිබුණි. ගිහිගත් ලෝකයට මෙම දහම් පණිවිඩය සිසිලකි. තම මිත්‍රයාගේ පුතා සෙසු තරුණ පිරිස්වලට ආදර්ශයකි. බටහිර හැම දෙයක්ම අවිචාරයෙන් පිළිගන්නා අයට මේ දූත්තේ පණිවිඩයකි. නිල අල්ලා ලෙඩය සුව කරනැයි ඔහු කිසිසේත් සිතුවේ නැත.

''දුව උදිත්ට වඩින්න. මේ ඉන්නෙ පිඳිය යුත්තෙක්.''

''නෑ. නෑ.. අන්කල් අවශ්‍ය නැහැ.''

ඔහු අසුනෙන් නැගිට්ටේය. නිහඬව සාලයට ගියේය. පරිසරය පුරා පැතිර තිබුණේ නිහඬ බවකි. චේතාට මොනවා හෝ පැවසීමට තිබුණත් නිහඬ වූයේ උදයන් අවසරයක් නැතිව කාමරයට එනු දැකීමෙනි.

"යන්න කාමරයෙන් එළියට. මම පස්සෙ එන්නම්."

චේතා උදයන්ගේ හදිසි පැමිණීම පිළිබඳව නොසතුටට පත්ව සිටියාය. ඔහු අමනාපයෙන් ගිය බැව් චේතා දනී.

මුහුණ සෝදා ඇඳුම් ඇඳීමට එකවරම නොපුළුවන. නෑදෑයෙකු වුවත් අනවසරයෙන් ඇතුළට ඒම සදාචාර සම්පන්න නැත. ඔහු එළියට ගියේ තමා සමඟ අමනාපයෙන් බව චේතා දනී. අද මෙහි පැමිණ ඇත්තේ තමාව කැඳවාගෙන ගාමට විය හැක. තමා පසුවන තත්ත්වය ඔහුට අවබෝධ වන්නට ඇත. ඇය හිසේ ගැල්වූ බෙහෙත් තෙල පිටින්ම උදයන් සමීපයට ගියේය. උදයන් එළියේ අසුනකට වී සිටිනවා ඇය දුටුවාය. එළියට පැමිණි චේතා දෙස ඔහු බැලුවේ නැත.

"ඔයා බස් එකේද ආවේ..?"

"නෑ. ඒ නයින් බස් එකක ආවෙ. ලොක්කාට ඔයා ගැන හැකයි. ඔයා ගැන වාර්තාවක් ඉල්ලනවා."

"මට සනීප නෑ කියලා ඔයා වාර්තා කරන්න."

"මේක පොඩි ඔළුවෙ කැක්කුමක් විතරයි. යුද්ධයේදී අසාධ්‍ය වෙච්ච අපේ අය තවත් ඉන්නවා."

ඇය ඔහු කෝප කිරීමට අදහස් කළේ නැත.

"මෙච්චර කල් ඉංග්‍රීසි බෙහෙත් කළා. හරි ගියේ නෑ. මේ අද ඉඳලා සිංහල බේත්."

ඔහු උපහාසාත්මක සිනාවකින් යුතුව ඇය දෙස බලා සිටියාය.



"ඉංග්‍රීසි බෙහෙත් හොඳ නැති වුණාට සිංහල බෙහෙත් නම් හොඳට අල්ලලා ගිහින් වගේ.."

ඔහු අවඥා සහගතව කීවේය.

"කියන්න තමයි හිටියේ.. සිංහල බෙහෙත් ගුණයි."

"ලැබුණ තොරතුරු බොරු නෙමේ.."

"මොනවද?"

"ඔයා සිංහල කොල්ලෙක් එක්ක යාළු වෙලා ඉන්නවා කියන කතාව."

"කවුද උදයන් ඔයාට මේ බොරු කියන්නෙ. ආවට පස්සෙ ගෙදරින් පිට ගියේ නෑ."

ඔහුගේ නෙත යොමුව තිබුණේ මදක් ඔබ්බෙන් පිහිටි නැටුම් පන්තිය වෙතය. තමාව හොඳින් දන්නා හඳුනන උමා අද හැසිරෙන්නේ නොහඳුනන පරිදිය. සැහැල්ලු දිග කලිසමකින් හා අත් නැති ස්කිනියකින් සැරසී නැටුම් පුහුණුවේ යෙදෙන උමා ඔහුට පෙනෙයි. පැහැදිලිවම ඇය අසල සිටින්නේ සිංහල නැටුම් ශිල්පියෙකි. වෙනසකට ඇත්තේ ඇය ඉගෙන ගනිමින් සිටින්නේ සිංහල මිනිසුන්ගේ නැටුමක් වීමය. සිංහල නැටුම් කලාව උඩරට, පහතරට, සබරගමු වශයෙන් වෙනස් සම්ප්‍රදායන් ඇත. මෙර වයන විලාශය අනුව මෙය උඩරට නැටුම් ක්‍රමයට අයත්ය.

"මේ උගන්වන්නෙ උඩරට නැටුම් නේද?"

ඇය හිස වනා එය අනුමත කළාය.

"කවුද උදිත් කියන්නේ..?"

"උදිත් කියන්නේ ඒ නැටුම් උගන්වන බෝයි."

"එහෙනම් තිලන් කිව්ව කතාව හරි."

ඇය මේ පිළිබඳව හොඳින් දැන සිටියාය. උදිත් පැවසූ කතාව

ඔහු අද සාක්ෂි සහිතව ඔප්පු කරගෙන ඇත. ඔහුගේ මුහුණට කුරිරු පෙනුමක් පිවිස ඇත.

"උදිත් කියන්නේ කවුද?"

"අප්පා එක්ක එකට ඉගෙන ගත්ත යාළුවෙකුගෙ පුතෙක්."

"හා.. එහෙනම් යාළුකමට ඉතිහාසෙකුත් තියෙනවා."

ඇය පිළිතුරක් දුන්නේ නැත.

"දැන් මම එනකොට මොනාද එයා කාමරයට වෙලා කළේ..?"

"මට වෙදකම් කළා."

ඔහුගේ මුහුණේ වියරු සිනාවක් සටහන් වුණි.

"මිනිහා වෙදෙක්ද?"

"ඔව්. ඒගොල්ලො පරම්පරාගත සිංහල වෙදකවරු."

අම්මා සිසිල් බීම වීදුරුවක් රැගෙන එනු වෙතා දුටුවාය.

"උදයන් ජැෆ්නා ඉඳලා එන ගමන්ද?"

"ඔව් නැන්දා. මම චේතාව බලන්න ආවා."

"බලන්නකො පුතා මේ ළමයට නාම සනීප නෑ. නිව්රෝ සර්ජන්ලා කීප දෙනෙකුටම පෙන්නුවා. තවම කිසි ගුණයක් නෑ."

ඇය සිසිල් බීම ඔත්දේසීය පාමින් කීවාය. ඔහු නිහඬව එය අතට ගත්තේය.

"මේක මේ පරම්පරාගත ලෙඩක් වගේ මටත් චේතාට වගේමයි. අව්වේ ඉන්න බෑ. එළියට යන්න බෑ."

"කවුද අර සිංහල බෝයි ගෙට ගෙන්වා ගත්තෙ. විශේෂයෙන්ම දෙමළ අපට බලපාන ප්‍රශ්න තියෙනවා දන්නෙ නැද්ද?"



සාවිත්‍රී එක්වරම පිළිතුරක් දුන්නේ නැත. සිංහල දෙමළ සාමාන්‍ය මිනිසුන්ට බලපාන ප්‍රබල ප්‍රශ්න නැත. උගතුන්ට මෙන්ම සාමාන්‍ය මිනිසුන්ට ජීවන වියදම, උගතුන්ට මෙන්ම සාමාන්‍ය මිනිසුන්ට බලපාන ජීවන මගක් නැති රැකියා විරහිත භාවය හා දේශපාලනඥයන්ගේ ඔල මොට්ටලකම් නිසා බිහිව ඇති යුද්ධය හැම ජාතියටම පොදුය. ඒ හැර පළවෙනි හරස් වීදිය, බ්‍රිස්ටල් වීදිය, කුමාර වීදිය, කෙයිසර් වීදිය, බංගසාල වීදිය, රෝහිණී පටුමග එකී නොකී හැම වීථියකම වෙළඳ ආධිපතිත්වය දරන්නේ සිංහල මිනිසුන් නොව දමිළ හා මුස්ලිම් වෙළඳුන්ය. ඔවුන්ට පැහැදිලිවම ජාතිවාදයක් නැත. සිංහල දෙමළ භේදයක් නැතිව කොයි කාටත් තොග සිල්ලර වෙළඳාමේ යෙදෙමින් ජීවත් වෙති. රටක් බෙදා වෙන්කර ජීවත් වීමට සටනක් නැත.

"අවුරුදු විස්සක් තිස්සේ යුද්ධයක් තියෙන බව දන්නෙ නැද්ද?"

"සටනට එන්න කලින් දේවලුත් අපි දන්නවා. යුද්ධ කරන්න ඕනෑ අපිට නෙමේ."

"අර බලන්න... අර බලන්න අර සිංහල එකා නංගිගෙ අතින් ඇල්ලුවා."

"නටන්ට පුරුදු කරනකොට එහෙම තමයි."

"උමා කතක්, මනිපුරි වගේ නැටුම් දන්නවා. උඩරට නැටුම් ඉගෙන ගන්නේ නුවර පෙරහැරට නටන්ටද?"

වෛත්‍යලිංගම් මහතා ආවේ ඔවුන් කතා කරමින් සිටියදීය.

"මොකද උදයන් කියන්නේ..?"

"දැන් ඒ ගැන කතා කරල වැඩක් නෑ. මාමා කවදත් සිංහල මිනිසුන්ගෙ පැත්තෙනෙ."

"මම කාගෙවත් පැත්තෙ නෙමේ මම ඉන්නෙ මිනිසුන්ගෙ

පැත්තෙ.''

ඔහු සැහැල්ලු ලෙස කීවේය.

''අපි මේ රටේ දෙවන පුර වැසියො විදිහට හිටියා ඇති. දැන් අවතීර්ණ වෙලා තියෙන්නෙ තීරණාත්මක සිදුවීමකට.''

මෙම නැනැත්තා සමග කතා කිරීමේ තේරුමක් නැත. මේ දූඩි මතධාරී උන්මාදය අද ලෝකය පුරා පැතිර ගොස් ඇත. චේතාත් මෙම කඳවුරක සාමාජිකාවක් බව වෛතාලිංගම් දනී. කොයි වෙලේ ඇගේ ජීවිතයට අනතුරක් වේදැයි පැවසිය නොහැක. මේවායේ මැදිහත්කරුවන් මොවුන්ය.

''මම ආවේ චේතාව එක්කගෙන යන්න.''

උදයන්ගේ ඒ කතාව නිසා වෛතාලිංගම්ගේ සිතට දරාගත නොහැකි කෝපයක් පිවිසුනි. ආදරයෙන් හදාවඩා ගත් දරුවන් තමාගේය.

''එහෙම එක්ක යන්න දෙන්න බෑ.''

''එයා අපේ සාමාජිකාවක්.''

''සාමාජිකාව වෙන්න කලින් මේ මගේ දූව. මට හිතුණොත් මෙයාගෙ ඉගෙනීමත් නතර කරනවා. අවිවෙ ඉඳල ලෙඩ වෙලා. තවම හිසේ කැක්කුම.''

උදයන් නැගිට්ටේ කෝපයෙන් යුතුවය.

''චේතා මට අප්පාගෙ කතා වැඩක් නෑ. නාවොත් පවුලටම වගකියන්න වෙයි.''

ඔහු අසුනින් නැගිට ගියේ උදිත් දෙස රවා බලමිනි.



# 16

උදයන් ගිය නොබෝ වේලාවකින් නිවසේ අය දෙමළ බසින් කතා කරනු උදිත්ට ඇසුණි. මේ හැම දෙයක්ම සිදුවූයේ උදයන් පැමිණීමෙන් පසුවය. උදිත් නිහඬව ඉගැන්වීම් කටයුතු නිම කළේය.

''එහෙනම් මම යනවා.''

''අප්පා සර් යන්ට හදනවා.''

''යන්ට එපා කියන්ට.''

වෛතාලිංගම් මැතිනිය දමිළ බසින් කියනු ඇසුණි.

''සර් අම්මා ඉන්න කියනවා.''

''මොකක්ද හේතුව..?''

''ඒක මම දන්නෙ නෑ.''

ඒ සිතාවේ තිබුණේ දඟකාර බවකි. ඔහු අසුනෙන් නැගිට්ටේය. සැඳෑ අඳුර වෙනදාටත් වඩා ඉක්මනින් පරිසරය වෙලාගෙන තිබුණි. කොයි මොහොතක හෝ වැසි ඇද වැටෙන සලකුණු සුළඟ විසින් කියා පෑවේය.

වෙනදා නැටුම් පුහුණු කර අවසානයේ මුහුණ සෝදා වෙනත් ඇඳුමකින් සැරසී යාම සිරිත වේ. එකවරම අහෝරා වැස්සක් ගරාජයේ ටකරං වහලයට ඇද වැටෙනු ඇසුණි. රාත්‍රී අහර ගැනීමට අක්කාගෙන් ආරාධනා ලැබී තිබුණි.

''කුඩයක් නැද්ද?''

උදිත් උමාගෙන් ඇසුවේය.

''මගේ කුඩේ තියෙනවා. ඒත් ඒක දෙන්නෙ නෑ.''

ඇය යටැසින් සිනාසුනාය.

''උමා ගිහින් අක්කට සනීපද බලලා එන්න.''

''මහු මට බෑ.''

''අක්කට සනීපද කියලා අහල බලන්න.''

''මට බෑ. මට බෑ. මට බෑ..''

ඇය නිවස තුළට දුවමින් කීවාය. ඒ දඟකාර යෞවනය ඔහු ප්‍රිය කළේය.

උමා කෙළින්ම දුව ගියේ සොයුරිය සිටින කාමරය වෙතය.

''කොහොමද දූන් ඔළුවෙ කැක්කුම හොඳද?''

ඇය චේතා දෙස බලා සිටියාය. සැබැවින්ම ඇය පසුවූයේ සුව කළ නොහැකි අසනීපයකිනි. නොගත් බෙහෙතක් නැත. නොගිය ස්නායු වෛද්‍යවරයෙක් නැත. වැඩිහිටියෙකුගේ කතාවක් පිළිනොගන්නා දුෂ්ය ගැහැනියෙක් වී ඇත්තේ මේ රෝගී භාවය නිසා විය යුතුය. හිසේ කැක්කුම හැදුනු විට කිසිවෙක් පිළිගන්නේ නැත.

''මට නින්ද ගියා. සැහෙන කාලෙකින් මට හොඳ නින්දක් ගියේ අදයි.''

ඇය සොයුරියගේ අත තරයේ අල්වාගෙන කීවාය.

''ඔයාගෙ සර්ට තැන්ක්යූ කියන්න.''

''මම කියන්නෙ මොටද? ඔයාම කියන්න. ඇත්තටම සනීපද?''

''ඔව් නංගී. මම හිතුවෙ නිකම් රස්තියාදුකාරයෙක් කියලයි. බලපුවහම හරි දක්ෂ වෛද්‍යවරයෙක්නෙ.''

''මාත් ඉස්සෙල්ලම හිතුවෙ ඔයා වගේමයි. අරුම පුදුම කෙනෙක්. ගේට්ටුව ළඟට ඇවිදින් හයියෙන් ගේට්ටුවට ගැහුවා. අප්පා ගෙදර නෑ කිව්වම අප්පා එනකල් පැය තුනක් හිටගෙන හිටියා. මාත් හිතුවෙ අප්පාගෙන් මොනවත් ඉල්ල ගන්න ආව කෙනෙක් කියලයි.''



''මාත් දැක්කෙ එහෙමයි. ඒත් මෙච්චර දක්ෂයෙක් බව දැනන් හිටියෙ නෑ.''

''සර් මොකද කළේ.. කොහොමද සනීප කළේ.''

''බෙල්ලෙ නහරයක් අල්ලලා මොකක්ද කළා. ඊට පස්සෙ ගාථා කියලා ඔළුව අතගෑවා. පව් කියලා හිතුණා නංගී.''

''කරල තියෙන්නෙ තාවකාලික පිළියමක්. සනීප වෙන්න බෙහෙත් ගන්න වෙයි.''

''ඒත් මම කොහොමද කතා කරන්නෙ. මම හරකට සලකපු බව උදිත් දන්නවා. උදිත්ට යන්න දෙන්න එපා. අම්මා ඊට කෑම ලෑස්ති කරනවා කිව්වා.''

''කෑමට තියාගන්න බෑ. ඔයා කියන්න.''

''මට පව් කියලා හිතෙනවා. තනියම උයාගෙන කන්නෙ.''

''ඔයා කොහොමද දන්නෙ...?''

උමා ඕනෑකමකින් ඇසුවාය.

''අද අම්මයි මායි මාකට් ගිය වෙලේ උදිත් මාකට් ඇවිදින් හිටියා බඩුගන්න. තනියම උයාගෙන කනවලු.''

මේ අනපේක්ෂිත කතාවෙන් උමාගේ සිතට දුකක් පිවිසුනි.

''අම්මා කිව්වා අද කෑම දෙනවා කියලා. ඔයා කොහොම හරි උදිත්ව කෑමට නතර කරගන්ට ඕනෑ.''

''මට බෑ.''

''මම ඉන්න තත්ත්වය තේරුම් ගන්න. මට මූණ දෙන්ට බෑ. සනීපද ඇහුවොත් නෑ කියන්න.''

චේතාගේ කතා බහෙදි කලින් දිස්වුණු තදබලකම් නැත.

''යන්න කුඩයක් ඉල්ලනවා.''

"දෙන්න එපා."

අම්මා එනු දුටු සැණෙවාම නිහඬ වූහ.

"උදිත් යන්න හදනවද?"

"ඔව් අම්මා. කූඩයක් ඉල්ලනවා."

"ඒ දරුවට කෑම කන්න තැනක් නෑ. තනියම උයා ගන්නවා. කෑම ටිකක් දෙමු. මම මේ උය උයා ඉන්නෙ."

"අපි කිව්වට ඉන්න එකක් නෑ. අප්පට කියන්න."

"ඒ දරුවා තනියම උයාගෙන කනවා කිව්වම මට හිතුණා මෙහෙ එන දවසට කෑම දෙන්න."

"ඒක පුරුද්දකට තියා ගන්ට එපා. ඒක අනවශ්‍ය කරදරයක්. අද උදයන් ගියේ තරහින්. මගෙන් පලි ගන්ට බැරි නෑ."

මේ ප්‍රශ්නය පිළිබඳව තවත් වැඩිදුර කතා කිරීමට ඇය කැමති වූයේ නැත. වර්ධනය වෙමින් පවතින්නේ සුබවාදී පසුබිමක් නොවේ.

"උදිත් දූවට සනීපද අහනවා."

"තාවකාලිකව නම් සුවයක් තියෙනවා. ආයෙත් වේදනාව මතු වෙන්නෙ නෑ කියලා කොහොමද කියන්නෙ.

"ලෙඩා ගාවට වෙද මහත්තයා එන සිරිතක් නෑ. ලෙඩා වෙදමහත්තයා ළඟට යන්න ඕනෑ."

"ඒකට නීතියක් නෑ. ඕනෑම විදිහකට වෙන්න පුළුවන්."

ඇය ඇඳෙන් නැගිට නාන කාමරය වෙතට ගියාය. උදයන් සමඟ ඇසුරු කිරීමට පෙළඹුණේ විද්‍යාලයේ ඉගෙන ගත් හෙයිනි. එහි ඊට වඩා පුළුල් ලෙස විහිද ගිය හෘදයාංගම බැඳීමක් නොවේ. හදවතක් තුළ සෙනෙහසක් වර්ධනය වීමට නම් පැහැදිලිවම සංසාරගත පෙළඹවීමක් තිබිය යුතු වේ. දුටු පුරම දසුනින් සිත්



ඇදී යනවා කියන කතාව බොළඳ වූවකැයි සිතුන මුත් දැන් එය සත්‍යයකැයි සිතේ. ඒ පෞරුෂය තම සිත සසල කළ හැටි. හිස හා නළල පිරිමද්දී බොහෝ කලක් එම ස්පර්ශයට තමා හිමිකම් කී බවක් මතකය. නාන කාමරයේ වූ කණ්නාඩිය දෙස ඇය කරමක් වේලා බලා සිටියාය. ලස්සන නැද්ද? කැතද? උඩරට සිංහල බෞද්ධයෙක් යාපනේ දමිළ හින්දු තරුණියක හා බැඳෙයිද? මම හිතන්නේ පිස්සු දේවල්.

ආයුධ දැරීමට පුහුණු වෙද්දී පැවරුණ වගකීම් රැසක් වෙයි. තම පෞද්ගලික ජීවිතය සංවිධානය වෙනුවෙන් කැප කිරීමට පොරොන්දු වූ හැටි සිහිවෙයි. එහෙත් ඒ සියල්ල කණපිට හැරවීමට මොහුට හැකි වූ හැටි. අප අතර කවදාවත් කිසිම සංවාදයක් සිදුව නෑ. එහෙත් හෙතෙම තමාව අත්අඩංගුවට ගෙන ඇතැයි සිතේ.

ගෙදරට අඳින සුදු රෙදි කලිසමකින් හා කොලරය නැති අත් රහිත කමිසය හැඳ ගත් ඇ දෙකම් පෙතිවල සුවඳ පැන් පොදක් තවරා ගත්තාය. සංවිධානයේ නීතිය පරිදි රත්තරන් පැළඳීම තහනම්ය. හිස්වූ කන්පෙති වෙතින් මුහුණට අමුතු හැඩයක් පිවිස තිබුණි.

උමා හැඩවෙමින් සිටින සොයුරිය අසලට ගියාය. ඇයව පිරිමියෙක් හිමිකර ගන්න වාසනාවක් ඇත්තියෙකි. මේ සුන්දර ගැහැනුකම හැම ගැහැනියෙකුටම පිරිනමන්නේ නැත. හැම ගැහැනියකටම මොනවා හෝ අඩුවක් දීමට නිර්මාකරු අකාරුණික වෙයි. එහෙත් ඇයට කිසිම අඩුවක් නැති ගැහැනුකම බාරදී තිබුණි.

"ම්.. ම්.. ඔය ඇති. රූප රාජිණී තරඟයකට හරි පැමෙන් පෙරේඩ් එකකට හරි යන්න නෙමෙයිනෙ. ඉස්කෝප්පුවට යන්නනෙ."

උමා සිනාසුනාය.

"මේ එන්න එපා දන්නවද?"

ඇය මඳ සිනාවෙන් යුතුව කීවාය. ඇය සෙමෙන් සෙමෙන් ඉස්තෝප්පුව දෙසට පියමැන්නාය. ඔහු ඉදිරියට එද්දී තමා වෙතත්

ගැහැනියෙක් බවට පෙන්වන බවක් දුනේ.

කළ බොහෝ නපුරුකම් සිහිවෙයි. ඔහුට තව නිවසට ඒම කහනම් කරන මෙන් දෙමාපියන්ට පැවසූ හැටි මතකය. ඔහු ගෙනා රස කැවිලි ප්‍රතික්ෂේප කළ හැටි, ඔහු පිරිනැමූ සිසිල් බීම පානය නොකළ හැටි ඇයට නැවත සිහියට නැගුණි. කොපමණ විරුද්ධතා දක්වූවත් තමා ඔහුට අවනත වන්නේ කිසිදු පෙළඹවීමක් නැතිවය. අප්පා සමග සිංහලෙන් කතා කරමින් සිටින උදිත් අසලට ඇය ගියාය.

"දුව.. දූත් අමාරුවක් තියෙනවද කියලා මේ පුතා අහනවා."

ඇය හිස වනා පිළිතුරු දුන්නාය.

"ඔළුව වනල හරියන්නෙ නෑ. එන්න මේ පුටුවට."

ඔහු අසුනින් නැගී සිට කීවේය.

"පුතා ඊට බොන්න මම රසම් එකක් හදන්න යනවා."

"අන්කල් මට නම් කෑම හදන්න එපා. මම යනවා."

"එහෙම කරන්න බෑ. ඊට කාල යන්න ඉන්න ඕනෑ."

"පිස්සුද...? මට කෑම තියෙනවා. වැස්ස පායපු ගමන් යනවා."

මේ ආඩම්බර සිංහල කොල්ලා පිළිබඳව ඇය මේ දිනවල අධ්‍යයනය කර ඇත. ඉකුත් සති දෙක පුරාවට සැහෙන වතාවක් මුණ ගැසෙන්ට ඇත. නිකම් මනුස්සකමට මුහුණ නොබැලූ හැටි සිහිවෙයි.

"දූන් කොහොමද?"

එකවරම තමාගෙන් විමසන විට ඈ තිගැස්සුනාය. කිසිවෙක් පෙනෙන තෙක් මානයක නැත. පුදුම වැඩක් තමා වෙලා තියෙන්නෙ. සිංහල හමුදාවට විරුද්ධම කිසිම චකිතයක් නැතිව නැගී සිටියත් මෙම තරුණයාට එරෙහිව කිසිවක් කිරීමට පුළුවන් කමක් නැත.



"දෙන්න අත.."

ඇය කිසිදු චකිතයක් නැතිව අත දිගු කළාය. ඔහු මෘදු ලෙස ඇගේ සියුමැලි අත අල්වා ගත්තේය. මෙතරම් පහසුවෙන් හිතේ ලැගුම් ගත් කෙනෙකුගේ අතින් අල්ලා ගැනීමට ලැබේ යැයි ඔහු සිතුවේ නැත. තාත්තාගෙන් ඉගෙන ගත් පාරම්පරික සිංහල වෙදකමට පින් සිද්ධ වෙන්න හැම දෙයක්ම හිමි වුණි. කිසිවෙක් විරුද්ධ නූනේ වෛද්‍ය ක්ෂේත්‍රයට අත තැබිය නොහැකි නිදහස නිසාය. නාඩි ස්පන්දනය හොඳ තත්ත්වයෙන් පවතී. ඔහු ඇගේ දෙනෙත් දෙස බලා සිටියේය. දෙනෙත් ප්‍රාණවත්ය. පිටි අල්ල නළලට තබා බැලුවේය.

"ඔළුව ටිකක් රස්නෙයි නේද?"

ඇය හිස වැනුවාය.

"තෙල් ටිකක් දාන්න ඕනෑ."

ඔහු යෝජනා කළේය. ඇය හිස වැනුවාය.

"අම්මට කියල හරි, නංගිට කියල හරි තෙල් ටිකක් දමා ගන්ට. මොකද මේ කතා කරන්ට බැරි."

"ගාථා, ශ්ලෝක කියලා තෙල් ගෑවොත් සනීප වෙයි. අම්මලා ගාථා දන්නෙ නෑ."

උදිත් ඇගේ හිසට තෙල් ගැල්ලුවේ සෙත් පිරිත් ගායනා කරමිනි. එහි අර්ථය නොතේරුනත් ශබ්ද රසයට ඇය සතුටු වන්නට ඇත. පිරිත් සජ්ජායනය අවසන් වන තෙක් අඩවන් දෑසින් ප්‍රහුව සවන් දුන් හැටි සිහිවෙයි.

පන්සිල් සමාදන්ව පිරිත් ගයද්දී නිවසේ අය ඒ අවට රොක් වූහ. සෙත් පිරිත පිළිබඳව සැවොම සතුටට පත් වූහ.

මිනිසෙකුට තවත් කෙනෙක් වෙනුවෙන් අධිකාරී බලයක් පැවැත්විය නොහැක. අපි කවුරුත් දුක, වේදනාව, පීඩාව තමාට

ගෞරව කිරීම පැහැදිලිව දනෙන මිනිසුන්ය. හිංසා නොකරන, තෙරුවන් සරණ යන තැනැත්තන් සුවපත් වෙන බව ඔහුගේ ආශිංසනයේ අදහස්ය. චේතා අමුතුම තැනැත්තියක බවට පත්වූයේ දෙවෙනි වරට පිරිත ගයද්දීය.

රාත්‍රී ආහාර ගැනීමට කරන ලද ආරාධනය පිළිගත්තේ සැම දෙනාම එක හඬින් කරන ලද ආරාධනය නිසාය.

"අපරාදෙ මට කෑම ලෑස්ති කළේ. මගෙ රෑ කෑම පංගුව තියෙනවා."

"සර් දවසක අපි සර්ලගෙ ගෙදර කෑමකට එන්නද?"

උමා ඇසුවාය.

"කොහොමටත් මෙ ලෙඩාට බේත් ගන්න අපේ ගෙදර එන්ට වෙනවා."

චේතා එක්වරම උදිත් දෙස බැලුවාය.

"සර්ගේ ගෙදර කිච්චෙ බෝඩිමට.."

උමා කීවාය.

"මම චේතාට කළේ තාවකාලික බේතක් විතරයි. කසාය බොන්න වෙයි. හිස කුඩිච්චියක් දමන්න වෙයි."

උදිත් කීවේය.

රාත්‍රී ආහාර ගත් සැණින් ඔහුට යාමට ලැබුණේ නැත.

"සර් අපි වේල් පෙරහැර බලන්ට යනවා."

ඔහු කිසිවක් කීවේ නැත.

"කොහොමටත් මම දන් යනවා."

ඔහු අසුනෙන් නැගී සිටිමින් කීවේය.

"අම්මා මම අක්කත් එක්ක පාර ගාවට යනවා."



රෝගයෙන් පසුවන චේතා නොඑතැයි උදිත් සිතුවේය. නිවසේ අයගෙන් සමුගෙන ගේට්ටුව අසලට එද්දී තොප්පියක් පැළඳ එන තැනැත්තිය උදිත් දුටුවේය.

# 17

වසරක් පාසා පැවැත්වෙන වේල් උත්සවයට දමිළ, සිංහල, මුස්ලිම් වැනි බහුවිධ ජාතිකයන් රැස්වෙති. මංමාවත් ජනී ජනයාගෙන් පිරීතිරී ගොස්ය. ඇතැම්හු යාපනේ සිටියත් වේල් උත්සවයට සහභාගී වීමට ඒම වරද්දන්නේ නැත. උමා වියේ හා යෞවනයේ එක් කාල පරිච්ඡේදයක සතුටු වූ හැටි චේතාට මතකය. මෙම සංවිධානයට බැඳුනු දිනයේ සිට පෞද්ගලික ජීවිතය ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවුණි. මංගල්‍යයක්, මරණයක් වැනි සමාජ ජීවිතයේ ඇති කිසිම උත්සවයකට සහභාගී වීමට ඇයට ලැබුණේ නැත.

මේ උත්සව දිනයේ මිතුරියන් හමුවූ හැටි, කතුරු මංචිල්ලා. මැරිගෝ රවුන් ගිය හැටි, වළලු මිලදී ගත් හැටි සිහිවෙයි. අද ඒ කිසිවක් නැත. මඳ දුරක් ගිය පසු අතුරු මාර්ගයෙන් ප්‍රධාන මාර්ගයට ගලන ජන ගඟ චේතා දුටුවාය. වේල් කරත්තය මේ වන විට ගමන ආරම්භ කර තිබෙන්නට පුළුවන. දන් එය එන්නේ බම්බලපිටිය දෙසටය. ඇයගේ නෙත එකවරම යොමු වුණේ උමා අසලින් ගමන් කරන උදිත් වෙතය. දෙදෙනා සමීපව කතා කරමින් සිටිනු චේතාට පෙනෙයි. කලක් සමීපව ඇසුරු කර ඇති නිසා දෙදෙනා අතර හිතවත්කමක් ගොඩ නැගී ඇතැයි ඇයට සිතේ. නැටුම් පුහුණු වෙද්දී ඔහු ඇගේ අතින් අල්ලා සිටි හැටි ඇය දක ඇත.

"සර් අපි කතුරු ඔංචිල්ලා තියෙන පැත්තට යමුද? මට වළලු ජෝඩුවක් ගන්න ඕනෑ."

උමා කීවාය.

"උමා සෙනඟ අස්සෙ මග හැරෙයි. මට බෑ ගෑණු ළමයි පරිස්සම් කරන්න.

එහෙම බෑ. අපිව පරිස්සම් කරන්ට වෙයි."

උමා දඟකාර ලෙස සිනාසුනාය. තමාට මදක් තුඩුරින් ගමන් කළා විනා චේතා වචනයකුදු දෙඩුවේ නැත. මේ උත්සවයේ සතුට බෙදාගත්තේ දමිළ හින්දු බැතිමතුන් පමණක් නොවේ. බහු ජාතික, බහු වාර්ගික බහු ආගමික හා සංස්කෘතික ජනයා වෙසෙන ශ්‍රී ලංකාවේ ජනයා බෙදී වෙන්වී ජීවත්ව නැත. සිංහල, දෙමළ බැතිමතුන් ජීවිතයේ උදාවන දුක්ඛ දෝමනස්සයන් වෙනුවෙන් එකම දෙවියෙක්ගේ පිහිට පතති. කතරගම, ගණදෙවි, පුල්ලෙයාර් දෙවිවරුන් මෙන්ම මාතෘ දෙව ගනන්ද ලංකිකයන් ජාති ආගම් භේදයෙන් තොරව වන්දනා කරති. උදාව ඇති සටන් විරාම කාලයේදී ජනතාව සැකයෙන් හා බියෙන් තොරව හැසිරෙනු පෙනේ. රට තුළ යුද්ධයක් පවතින බවක් සැමටම අමතකව ගොස්ය.

ලෝකයේ හැම රටක්ම යුද්ධය නමැති සාහසික අත්දැකීමට මුහුණ දී ඇත. පළවෙනි ලෝක යුද්ධය, දෙවන ලෝක යුද්ධය, වියට්නාම යුද්ධය, ඉරාක යුද්ධය වශයෙන් ලෝකය අමිහිරි අත්දැකීම් ලබා ඇත. මේ යුද්ධවලට අද ජනතාව හුරුවී ඇත. මෙම කුරිරු යුද්ධවලින් අවතැන්වී සරණාගත කඳවුරුවල ජීවත් වන තරුණ තරුණියන් පෙමින් වෙලෙති. විවාහ වෙති. දරුවන් බිහි කරති. ගැහැණු දරුවන් වැඩිවියට පත්වෙති. යොවුන් වියට පත්වෙති. එහිම වියපත් වෙති. මරණය කියන අත්දැකීමට මුහුණ දෙති. මේවා අද සාමාන්‍ය දේවල් බවට පත්ව ඇත.

මේ රැස්ව සිටින්නේ මරණය නිමේෂයකට අමතක කළ පිරිසකි. පිරිස අතරින් ඉදිරියට යද්දී යුවතියන් දෙදෙනා ස්පර්ශ



විම වළක්වනු නොහැකි වුණි. ඉදිරියෙන් පැමිණි තල්ලුවකින් සම්බන්ධතාවය ගිලිහී ගියේ අනපේක්ෂිත පරිද්දෙනි. එම තල්ලුවට තමා අසල සිටි උමා තල්ලු වී යනු දුටු උදිත් චේතාගේ අත තරයේ අල්වා ගත්තේය.

"උමා.."

උදිත් චේතාගේ අත අල්වාගෙන උස් හඬින් කෑ ගැසුවේය.

ඒ වන විට ඇය තල්ලුවේ ඈතට ගොස් තිබුණි. චේතාගේ අත අල්වා සිටීමට තදබල ඕනෑකමක් නොතිබුණත් අත හැරීමට ද සිතුනේ නැත. තමා සමග අනවශ්‍ය අමනාපයක් පවත්වාගෙන ගියත් අත ඇල්ම පිළිබඳව අකමැත්තක් දැක්වූයේ නැත.

"එයා පාර දන්නවා."

ඇය පහත් හඬින් කෙඳිරුවාය.

"ඒ වුණාට දෙන්නම මාත් එක්කනෙ ආවෙ."

චේතා කිසිවක් කීවේ නැත. තමා ඇසුරු කරන පිරිස එකම අරමුණක් සඳහා හික්මවන ලද්දවුන්ය. මේ යොවුන් දිවියේ කිසිදාක මෙවන් ස්පර්ශයක් ලැබී නැත. එම වේදයිතය සමස්ත දේහයට පමණක් නොව හදවතට දැනීම අපූර්ව අත්දැකීමකි. ඔහු පිළිබඳව සිතා සිටි අයුරු වෙනස්ය. මේ රැස්ව සිටින මහා ජනකාය අතර සමීප බවක් ඇත. ඒත් අපි දෙන්නා අතර ලොකු වෙනසක් තිබේ. ජාතිය විදිහට, භාෂාව විදිහට, ආගම විදිහට ජාතිය ආගම් භාෂාවට ආවේනික වූ සංස්කෘතිය විදිහට අපි වෙනස්. මොන මවා පෑම් කළත් උතුර, දකුණ යුද්ධයක පැටලිලා. මෙහි සිටින සැවොම දමිළ පිරිස්ය. ඒත් කතා බහෙන් හැර අපි දෙන්නා කවුද කියල කාටවත් අඳුනා ගන්ට බෑ. තදබල ලෙස හික්මවූ සිතක් වෙනස් වූ ඉක්මන. තමාට සෙත් පැතුවේ පිරිත් සජ්ජායනා කරමිනි. "සබ්බීති රෝග ග්‍රහ දෝෂ මසේස නින්දා" එසේ ගයද්දී දෙනෙත් කඳුළෙන් තෙත්ව ගිය හැටි මතකය. ඔහු කෙරෙහි කොහේදෝ තැති හිමිකමක් ඇතැයි

හැගේ.

ජනාකීර්ණ නොවූ පෙදෙසකට ගිය ද ඔහු ඇගේ අත අතැරියේ නැත. තෙරපීම්වලින් වෙහෙසී සිටි උදිත් තරුණිය සමඟ සිසිල් බීම හලකට ගියේ ඇගේ කැමැත්ත ද නොවිමසාය. මෙවන් මොහොතක සිසිල් බීම බෝතලයක් බිව්වොත් මැනවයි ඇය ද සිතුවාය. ඉකුත් දිනෙක අම්මා සමඟ වෙළඳ පළට ගිය හැටි මතකය. එදින අම්මාට හා තමාට පිරිනැමූ හිම කිරම මුසු රසවත් සිසිල් බීම කෝප්පය ප්‍රතික්ෂේප කළේ ඇයි දැයි ඇයට කීමට නොපුළුවන. එහෙත් ඔහු එම මොහොතේ පවා එය උපේක්ෂාවෙන් ඉසිලූ හැටි. නැවත වරක් එම වරද සිදු නොවන බවට සහතිකය. මෙම අමනාපකම් තුරන් වීම සඳහා ඔහු සිසිල් බීම දෙකක් ඇනවුම් කරතැයි ඇය සිතුවාය.

උදිත් හමුවට පැමිණි අවන්හලේ සේවකයාට පහත් හඬින් කිසිවක් පවසනු දුටුව ද ඇයට එය පැහැදිලිව ඇසුණේ නැත. රසකැවිලි කිසිවක් ගෙනෙන්නට කියන්නට ඇත. එක එල්ලේ උදිත් දෙස බැලීමට පුළුවන් කමක් නැත. කෙදවත් බව, අහංකාර මුහුණ දෙස කෙලින් බැලීමට පුළුවන් කමක් නැත.

අවන්හලේ සේවකයා රැගෙන ආවේ එක් සිසිල් බීමකි. ඔහු නිහඬව එය තනිව පානය කරන්නට පටන් ගත්තේ කිසිදු ආචාරශීලී බවක් නොදක්වමිනි.

මේ තමාට දෙන්නේ දඬුවමක් බව ඇයට හැඟුණේ තමාට නොදී තනිවම පානය කරන විටය.

ඔහු විසින් ගෙනෙන ලද පැණි වළළු නොකෑම පිළිබඳව ඔහු සිතන්නට ඇත. එසේම පිළිගන්වන ලද සිසිල් බීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඔහු තමා සමඟ අමනාප වී ඇති බව චේතා දනී.

එහෙත් තමාට සංග්‍රහ නොකරතැයි ඇය සිතුවේ නැත. හරි නීති කාරයෙක්, පළිගන්න කොල්ලෙක්, නපුරෙක්. තමා ඉදිරිපස තබාගෙන තමාට නොදී බීමට තරම් කුරිරු වීම පිළිබඳව සිතේ



ඇති වුණේ කෝපයකි. රස කරමින් පානය කළේ තමා රිදවීමටය. මඳ වෙලාවකට පසු හෙතෙම අසුනෙන් නැගිට්ටේ කිසිවෙක් පැමිණ කතා කළ හෙයිනි. ඒ ඔහුගේ මිතුරෙක් විය හැක. මිතුරා සමඟ වූ සංවාදය මඳ වේලාවක් පැවතුණි. ඔහු රිදවීමට ඇය මඳ වේලාවක් කල්පනා කළාය.

ඔහු ඉතිරි කළ බීම වීදුරුව ඉතා ඉක්මනට පානය කළ චේතා එය පසෙක තබා මුව පිස දමා ගත්තාය. මඳ වේලාවකට පසු උදිත් එනු දුටු ඇ කිසිවක් නොදත්තියක මෙන් සිටියාය. උදිත් බිල ගෙවා දමා එළියට ආවේය.

සංචාරක වෙළඳුන් තැනින් තැන වෙළඳ භාණ්ඩ තබාගෙන වෙළඳාම් කරනු දුටු ඔහු තොප්පියක් මිලදී ගෙන නිහඬව ඇගේ හිසේ පැළඳුවේය. සෙනඟ අතරට පිවිසි ඇය කිසිම ආරාධනයකින් තොරව උදිත්ගේ අත අල්වා ගත්තාය.

"තරහද මා එක්ක."

"ඔව්."

හෙතෙම ඍජුව කීවේය.

"මට සමාවෙන්න."

"නංගිව හොයමු. නැතිනම් අපිට ගෙදර යන්ට වෙන එකක් නෑ."

"නංගි පාරවල් දන්නවා."

"ඒත් මේ තියෙන්නෙ ගෑණු ළමයෙක් තනිව පාරක අරින්ට පුළුවන් කාලයක් නෙමේ."

ඔහු කතා කළේ වගකීමෙන් යුතුවය. සැබෑවින්ම අද ගැහැණුන්ට සිදුවන ආපදා වැඩිය. ජාති, ආගම්, භාෂා භේදයකින් තොරව ගැහැනියකට ගෞරව කිරීම, ආරක්ෂා කිරීම හා ආදරය කිරීමට විවෘත අයිතියක් පිරිමියාට ඇත. ඇත්තටම ගැහැනිය දුල්වෙන්නේ

ප්‍රභාමත් වන්නේ පිරිමියා ඉදිරියේ පමණි. ගැහැනිය නිර්මාණය වන්නේ පිරිමියා වෙනුවෙනි. කිසිම ගැහැනියකට පිරිමියෙක් නැතිව ගැහැනුකම ප්‍රදර්ශනය කිරීමට නොපුළුවන.

මෙතරම් ඉක්මනින් තම හදවත ඔහුට කියා පෑමට ලැබුනේ කොහොමද? අපි ආදරයෙන් බැඳෙන්ට කලින් සිට සූදානම් වූ දෙදෙනෙක් නොවේ. ඒත් අපිට වැඩියෙන් තියෙන්නෙ එක් නොවීමට ඇති අවස්ථා පමණයි. සෑහෙන කලක් අසුරු කළ උමා සමඟ මෙතරම් බැඳී ඇතැයි කිව නොහැක. ඇය ගෞරව පෙරදැරිව ගුරු භක්තියෙන් ඔහුට අභිවාදනය කරන බව දනී. වෙන ඕනෑම දෙයකට මුහුණ දිය යුතුය. වෙන ඕනෑම දෙයකට නිර්මාණ හැලහුම් කළ හැක. එහෙත් ආදරයට නිත්‍ය පදයක් නැත. ඕනෑම තැනක සිට සිතකට සම්ප්‍රේෂණය විය හැක. මෙය සම්ප්‍රදායික නොවන ආදරයකි. බොහෝ ආදර කතාවලට වැලිකෙළියේ පටන් එසේත් නැතිනම් පාසල් දිවියේ, විශ්වවිද්‍යාලයේ, කාර්යාල ඇසුර වැනි හේතු ප්‍රත්‍ය ඇත.

අපිට එහෙම නොවේ. දැල්වීමට තිබූ පහනකට ආලෝකය දුන්නා වාගේ. කුසුමකට හිරු එළිය වැටුණා වගේ. එසේ නැතිනම් උදයන්ට වසර ගණනාවක් තිස්සේ තම සිත ගන්ට බැරි වුණු තැටි. මගේ හිත ඇදී ගියේ පළමු දැක්මෙදීමයි. නයි, මුගටි වගේ හිටියට අප ආදරයෙන් බැඳිලා හිටීය.

''කතා කරන්න. කතා කරන්න. නැත්නම් මම ගෙදර යනවා.''

ඇය ඉවසනු බැරිම තැන කීවාය.

''මට කතා කරන්ට දෙයක් නෑ.''

''උමා එක්ක නම් ඕනෑ තරම් කතා කරනව. කවි කියනවා.''

''එයා හොඳ ළමයෙක්.''

චේතා ඔහුගේ අතින් මිදී ඉදිරියට ගියාය. තරක අය ආශ්‍රය කරන්න ඕන නෑ.



ඔහු පසුපස දුවගොස් චේතාගේ අතින් ඇල්ලීමට වෙර දැරුවේය. ඇය අත ගසා දැමුවේ තෙත් වූ දෑසින් යුතුවය. සිත පිළිසිඳ ගත් ආදරයට දීර්ඝ ඉතිහාසයක් නැත. සිත ඇත්තේ ආලෝක වර්ෂ ගණනාවක් දුරින් නොවේ. හුස්ම එකිනෙකාට වැටෙන දුරින්.

''ප්ලීස් ලිසින්ටු මී''

ඔහු ඇගේ අතැඟිලි සියතට යා කර ගනිමින් කීවේය.

ජනයාගෙන් හිස් වූ මාවත යොමුව තිබුණේ මහ සයුර දෙසටය. නිහඬ රාත්‍රියේ රළ බිඳෙන හඬ පැහැදිලිව ඇසෙයි. සමුද්‍රාසන්න නිවෙස්වලින් හා වීථි ලාම්පුවලින් ගලන ආලෝකය ගල් තලයක අලුත්ගෙන සිටින ඔවුන් වෙත වැටී තිබුනි. ඊටත් වඩා තමන් සුවිශේෂ සිද්ධියක් වූයේ තවත් එළියක් සඳ පරදවා තිබීමය.

''උදිත් හරි. යථාර්ථය සැබෑවින්ම කටුක තමා.''

ඔහු නිහඬව අත අල්වාගෙන සිටියා විනා කිසිවක් කීවේ නැත.

''ඇත්ත කියන්නම් මගේ හිත කවදාවත් මේ විදිහට දුර්වල වෙලා නෑ.''

''මාත් දෙයක් කියන්නද?''

ඔහු ඇගේ සඳවත දෙස බලමින් කීවේය.

''හා කියන්න..''

අමනාපකම් පහව ගොස් යෞවනයේ බොළඳ බව මතුවුණි.

''මම ඉන්දියාවෙ අවුරුදු පහක් හිටියා. ඒ අතර තවත් රටවල් කීපයකට ගිහින් තියෙනවා. ඒත් මගෙ හිතට මේ වගේ දෙයක් වෙලා නෑ.''

''ඒ කිව්වෙ ලස්සන කෙල්ලො හිටියා කියන එකද?''

''අපිට සමාන කේරල, බෙංගාලි, පන්ජාබි, හින්දුස්තානි කෙල්ලො හිටියා. ඒත් මගෙ දුර්වල හිත අල්ලා ගන්න කාටවත්

බැරි වුණා."

"නපුරු දෙමළ කෙල්ලෙක් හිත උදුර ගත්තද?"

ඇය සිනා සෙමින් ඇසුවාය.

"කෙල්ලෙක් මගෙ හිත උදුරා ගත්තා. එයා මගෙ හිත දිනා ගන්න හැකියෙක් වුණා හැර මොන ජාතියට අයිති ද දන්නෙ නෑ. මේ ලෝකෙ තියෙන්නෙ ස්ත්‍රී පුරුෂ ලිංග භේදය විතරයි."

මෙවන් අනාරක්ෂිත පෙදෙසක වැඩි වෙලාවක් සිටීම සුදුසු නැති බව හැඟී ගිය හෙයින් ඔවුහු උත්සව භූමිය දෙසට ගමන් ගත්හ. ඒ වන විට සිත්වලින් ප්‍රශ්න නිරාකරණය වී තිබුණි.

"මට මොනවා හරි බොන්න ඕනෑ."

ඇය කෙළින්ම යෝජනා කළාය.

"මම දෙන දේවල් කන්නෙ නෑ නේද?"

"මට සමාවෙන්න කිව්වනේ.. ඒ වැරදි නැවත මා අතින් සිද්ධ වෙන්නෙ නෑ."

ඔහු සිනාසුනා විනා කිසිවක් කීවේ නැත.

"හරියට පළිගන්නවා."

ඇය ඍජු චෝදනාවක් කීවාය.

"මේ මම.. මම පළිගන්නෙ නෑ."

"මට තොඳී කූල් ඩ්‍රින්ක් එක තනියම බිව්වෙ මගෙන් පළිගන්න නේද?"

ඇය යටැසින් බලා සිනාසෙමින් ඇසුවාය. ඇත්තටම පිරිමින්ගේ දියාරු කමට ඇය කැමති නැත.

"මම නොදුන්නට මගෙ වීදුරුවෙන් බිව්වා නේද?"

"ඔව් බිව්වා."



"සිසිල් බීම නොදුන්නෙ සීතල බීම මේ රෑ බොන එක අගුණ හින්දයි. හැම දේකටම කලින් මේ ඔළුව සනීප කරගන්ට ඕනෑ. නව බෙහෙත් කරන්ට තියෙනවා."

"දැන් මට බයක් නෑ. මගෙ ගත විතරක් නෙවේ හිතත් සනීප කරන්න දක්ෂ වෛද්‍යවරයෙක් මට හම්බ වුණා."

"මම නාඩි ශාස්ත්‍රය තරමක් දන්නවා තමයි. ඒ වුණාට නස්නයක් කරලා, කසායක් බීලා මේ ලෙඩේ හොඳටම සනීප කරන්න ඕනෑ. අප්පච්චිට කියල බෙහෙතක් බොන්න වෙයි."

"දැන් මට සනීපයි."

ඔහු නළලට අත තබද්දී ඇය මෘදු ලෙස අත අල්වා ගනිමින් කීවාය.

යාබද අසුනෙහි සිටි කිසිවෙක් සමච්චලයට මෙන් උගුර පාදනු ඇසී චේතා ආපසු හැරුණේ කෝපයෙන් යුතුවය.

"තංගී.."

චේතා උස් හඬින් කෑ ගැසුවේ උදිත්ගේ අත අල්වාගෙන සිටියදීමය.

# 18

උමා සොයුරිය දෙස බලා සිනාසුනා විනා කිසිවක් කීවේ නැත. එක් අතකට මෙවන් දෙයක් සිදුවීම හොඳය. මේ ජාතියාජාතිවාදී කණ්ඩායම්වලට බලහත්කාරයෙන් තරුණ තරුණියන් බඳවා ගැනීම නිසා බරපතල අපරාධයක් සිදුව ඇත. බාල වයස්කාර දරුවන් හමුදා සේවයට බඳවා ගැනීම බලවත් අපරාධයකි. බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගන්නා දරුවන්ට

ඉන් මිදීමට පුළුවන් කමක් නැත. හමුදාව තුළම සිරකරුවන් බවට පත්වන දරුවන්ට තරුණ වියට පත්විමේදී ඒ තුළට යුද භටයන් වීමට ලැබෙයි. මෙම දරුවන් යෙදවීම තුළින් බලාපොරොත්තු වන්නේ අනාගත ආයෝජනයකි. ගැහැනු දරුවන් පැහැරගෙන යාම මීට වඩා භයානකය. ගැහැනු ළමුන් බලහත්කාරයෙන් බඳවා ගැනීම පිළිබඳව මෙවන් කණ්ඩායම් කෙරෙහි තදබල විරෝධතා දැක්වූහ. මේ මෑතක හෙළිදරව් වූ කරුණු අනුව මරාගෙන මැරෙන හමුදාවේ සෙබලුන්ගේ ලිංගික අවශ්‍යතා සපුරාලීම සඳහා පැහැර ගෙනයනු ලබන තරුණියන් යොදවන බවය. උදයන් අක්කා සමඟ පෙමින් වෙලීමට දරන ප්‍රයත්නය සැක සහිතය. සැබවින්ම ඕනෑ කෙනෙකුගේ සිත උදුරා ගැනීමට සමත් වූ චේතා කාගේ හෝ බිල්ලකට ගනීවි යන බිය නිරතුරුවම උමාගේ සිතේ තිබුණි. අද මේ මොහොතේ පවා ඔවුන් වෙර දරන්නේ ඇය පැහැරගෙන යාමටය. විකෘති මනසකින් සිටි ඇගේ සිතේ මෙසේ වෙනස් වෙතැයි උමා කිසිසේත් සිතා සිටියේ නැත. පිරිස අතරින් වෙන්ව ගියේ සිතාමතාය. හරි කට්ට කෙල්ල. ඇය සොයුරියගේ අතින් අල්වා ගත්තාය.

''ලෙඩ බලනවද?''

උමා සිනාසුනාය.

වෙනදා නම් කට ගහගෙන ගොස් හමාරය. තරහ වීමට පුළුවන් කමක් නැත. ඇය තම සිත මැනවින් හඳුනාගෙන සිටි නිසා නිහඬව සිටියා විනා කිසිවක් කීවේ නැත.

උමා සමඟ සිටියේ හින්දු විද්‍යාලයේ ඇය සමඟ ඉගෙනුම ලබන සිසුවියන්ය. ඔවුන් බලා සිටියේ මේ නව යෞවන යුවල දෙසය. මේ සැම චෛත්‍යාලිංගම් මහතාගේ කලායතනයේ සිසුවියන්ය. රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරන ශිල්පියෙක් නිසා දුටු සැණින් යුවතියන් උදිස් හඳුනා ගත්හ.

''මේ ඉන්නෙ මගෙ සර් උදිස්..''



යුවතියන් එකිනෙකාගේ අත් අල්ලා ගෞරව පෙරදැරිව බලා උන්න.

''උමා මොනවත් බිව්වද?''

''තවම නෑ.''

''එහෙනම් යාළුවො තුන් දෙනයි ඔයා හතරයි. මායි පහයි. ෆලූඩා විත් අයිස්ක්‍රීම්''

''එතකොට චේතාට.''

''එයා මම දෙන ඒවා කන්නෙ බොන්නෙ නෑ.''

ඇය හිස සසවා සිනා මුසු මුහුණින් යුතුව උදිස් දෙස බැලුවාය.

''හරියට පළිගන්නවා.''

චේතා යටැසින් බලා සිනාසෙමින් කීවාය.

''පව් අක්කා සර් පළිගන්න කෙනෙක් නෙමේ..''

''අද මට නොදී තනියම බිව්වා. මා ළඟ තියාගෙන බිව්වෙ.''

ඇගේ කතාවට උමා උස් හඬින් සිනාසුනාය.

''අම්මා එක්ක ගිය දවසෙ අරන් දුන්න ඒව නොබිව්ව එකට පළිගත්තා.''

''සර් මම කාටත් නොකිව්ව රහසක් කියන්නද?''

''හා කියන්න.''

''අපිට පෙනෙන්ට නොකැවට සර් ගමෙන් ගෙනාපු උඳු වළලු අපිට හොරෙන් කනවා මට අහු වුණා.''

ඔව්හු එකවර සිනාසෙන්නට වූහ.

ඇණවුම් කරන ලද රසකැවිලි පිළිගැනීමට උමා හා චේතා මැලිකමක් දැක්වූයේ උදිස්ට වියදම් යන හෙයිනි.

"කන්න ඕනෑ නෑ සර්.. මොනව හරි බොන්නම්."

"කන්න ඕනැත් නෑ.. බොන්න ඕනැත් නෑ.. වේටර් මෙවා අරන් යන්න."

ඔහු වේටර්වරයා කැඳවූවේය.

"හානේ.. මෙහෙම වස කෙනෙක්. එපා..එපා. ඔයා යන්න."

චේතා වේටර් ආපසු යැව්වේය.

මේ බැඳීමට දිගු ඉතිහාසයක් නැත. ප්‍රශ්න තිබෙන්නට පුළුවන්. නැති ප්‍රශ්න ඇතිවෙන්ට පුළුවන්. තියෙන ප්‍රශ්න සංවර්ධනය වෙන්න පුළුවන්. මේ සොඳුරු නිමේෂයට මා කැමතියි. ඇය අත් පටලවා ගනිමින් සිනාසුනා.

"ඉතින් මට බොන්න දෙන්නෙ නැද්ද?"

"ඕනැ දෙයක් ගන්න. මේ රෑ සීතල බොන්න දෙන්ටයෑ."

"අනේ.. පොඩි උගුරක්."

"කියන දේ අහන්න. චේතාට තාම බේත් බොන්න තියෙනවා. නස්නයක් කරන්ට තියෙනවා."

උමා මේ කතාවට සවන් දුන්නේ හැඟුම්බරවය. චේතා යාපනයේ සිට කොළඹට ආවේ රෝගී තත්ත්වයෙනි. සුවපත් කළේ උදිත් විසිනි. එක් දිනක් තුළ සැමදෙයක් වීම අස්වාභාවික යැයි සිතන්නට පුළුවන. අද පවතින ජීවන සැලැස්ම අනුව කෙනෙකුට ඇතිවන්නට හෝ නැතිවන්නට ගත වන්නේ නිමේෂයකි.

"සර්ගෙන් උඩරට නැටුම් ඉගෙන ගන්න මේ කට්ටියත් කැමතිලු."

"මට ඒවට වෙලාවක් නෑ."

"නැනට උගන්වනවා. අපිට උගන්වන්ට බෑ"

යළි සැමෝම එක්ව සිනාසුනහ.



"මම ආවෙ උගන්වන්න නෙමේ. මිස්ට වෛත්‍යලිංගම්ගෙන් කර්නාටක සංගීතය ඉගෙන ගන්නයි."

"හොඳට ඉගෙන ගත්තාම ගුරුවරයාගෙ ලොකු දුව තෑග්ගක් විදියට දෙනවා."

යළි සැමෝම සිනාසුනහ.

එය අතිශයින් සුන්දර රාත්‍රියක් වුණි. චේතා නම් මේ ජීවිතයේ මෙවන් අත්දැකීමක් ලබා නැත. මෙවන් උත්සවයන්හි තනිව නිවසින් පිටවීමට අවස්ථාවක් ලැබී නැත. එසේ විනෝද වීමට ද උවමනාවක් නොතිබුණි. දෙමාපියන්ගේ උණුසුම යටතේ ජීවත් වෙද්දී දෙපාර්ශවයේම ගෞරවය රැකීම යුතුකමය. කෝවිල් භූමියේ වෙළඳසැල්වල සැරිසරද්දී ඔහු තිළිණ කළ කදාවළලු ජෝඩුව පිළිගත්තේ අකමැත්තෙනි. ඔහු නංගීව හා තමාව ගේට්ටුව අසලට ඇරලා නතර වුණි.

"මම යන්නම්."

ඔහු පහත් හඬින් කීවේය.

"ආයෙ එන්නෙ..?"

"කියන්න බෑ."

"ඇයි බැරි.."

"මම ටී.වී. ප්‍රෝග්‍රෑම් එකකට පිට යනවා."

"තමුන්ගෙ වැඩ පාඩු කරගන්ට එපා. කවද්ද එන්නෙ කියන්න."

"යන්න විනාඩියකට හරි මම ඇවිදින් යනවා. ඔළුවට තෙල් ටිකක් ගෙනැවිත් දෙන්න."

"ඇවිදින් ගාරා කියල මගෙ ඔළුව අතගානවද?"

නංගී සංවාදයට සහභාගී නොවී ඈතට වී සිටිනු ඔහු දුටුවේය.

''අම්මට කියලා ඔළුවට තෙල් ටික දමා ගන්න. එහෙමත් නැත්නම් නංගිට කියලා.''

''එහෙම නම් ඕනෑ නෑ. ලැබිච්ච වෙලාවක එන්න.''

ඇය නිවස තුළට ගියේ තරමක අමනාපයෙනි.

''සර් මේ රෑ තනියම යන්නෙ කොහොමද?''

උමා ඇසුවේය.

''ගානක් නෑ. අක්කට තරහ ගියාද?''

''අනේ සර් මම මෙයා ගැන සර්ට කියන්නම් පස්සෙ. අප්පයි අපි ඔක්කොම ඉන්නෙ හරි දුකින්. අපි මෙයා ගැන බයෙන් ඉන්නෙ.''

ඔහු පිළිතුරක් නොදී නිහඬව සිටියේය.

''ඔකේ.. දෙන්. මම යන්නම්. අප්පට කියන්න ගේ ගාවට ඇරලුවා කියලා.''

''සර් පුළුවනි නම් හෙට උදේ එන්න. මෙයා අමුතුම ජාතියෙ ළමයෙක්.''

''ඕකේ.. දෙන්. ගුඩ් නයිට්.''

චේතා නිවසට පිවිස සිය කාමරයට වැදී ඇඳුම් පිටින්ම ඇඳේ වැතිරුණාය. අද අසිරිමත් දිනයකැයි චේතාට සිතෙයි. මේ සිදුවීම තුළ පිළිගත නොහෙන බොළඳ බවක් ඇතැයි චේතාට සිතෙයි. බොහෝ කාලයක් හිස්වූ සිතට පිවිසෙන්නට වෙර දරූ තරුණයන් බොහෝ දෙනෙක් ඇත. තම සිතට බලහත්කාරයෙන් උරුමකම කීමට සූදානම් වූ උදයන් ගැන ද සිහිවෙයි.

එහෙත් ඒ කිසිවෙකුට තම හදවතට පිවිසීමට නොහැකි වූ බව ඇය දනී. ඊටත් වඩා සංවිධානය තුළ ආදරයට තැනක් තිබුණේ නැත. එහෙත් රුවැත්තියක වූ චේතාට මේ ප්‍රශ්නයෙන් මිදී සිටීමට



පුළුවන් වූයේ නැත.

මෙහි පැමිණී ඉතා කෙටි කාලයක් තුළදී උදිත් හදවතට ප්‍රවිසි හැටි පුදුම සහගතය. සිතින් පිටමං කිරීමට විවිධ උපක්‍රම යෙදුවත් තම සිතේ දුර්වල තැනින්ම ඔහු අල්ලාගෙන ඇතැයි සිතුණි. ගෙවී ගිය හෝරාවේ අප මුකුලිත හදවත් විකසිත වන්නට ඒ සිතේ උණුහුම ලැබුණි.

නංගිගෙන් මිදුණු නිමේෂයේ තම අත තරයේ අල්ලා ගත්තේ අනපේක්ෂිත අයුරිනි. කවදා හෝ එවන් දෙයක් සිදුවෙතැයි ඇය විශ්වාස කළේ නැත. උතුර, දකුණ සිංහල දෙමළ යුද්ධයක් නැතැයි කිසිවෙකුට කිව නොහැක.

සිංහල දෙමළ කවුරුත් මිනිසුන්ය. බල්ලන්, බළලුන් පරිදි මේ වටිනා මිනිස් ජීවිත විනාශ වී ගොස් ඇත. මිනිස් වටිනාකම් සාර ධර්ම විනාශ වී ගොස්ය. එකිනෙකා දෙස බලන්නේ සැකයෙනි. මෙවන් වාතාවරණයකදී සිංහල දෙමළ හිතවත්කම් ඇතිවිය නොහැක. ඉතුත් හෝරාවේ හැසිරුණේ සැබෑ යෞවනියන් ලෙසය. ඒ ආදරයට ජාති කුල වශයෙන් සම්බාධක පැනවිය නොහැක. එම සැබෑ ආදරයේ සීමාවන් නැත.

එහෙත් තමාට එවන් ආදරයක පැටලීමට නොපුළුවන. ඒ සඳහා වූ වාරණ නියෝග හා සීමාවන් ඇත. තම ජාතියේ අයෙක් සමග වත් ආදරයෙන් බැඳීමට නොහැකිව සිටියදී පිටස්තර ජාතියක අයෙක් සමග ආදරයෙන් බැඳෙන්නේ කෙසේද? කොළඹ රැඳී සිටින උදයන් මේ පිළිබඳව උසස් නිලධාරීන්ට වාර්තා කරනු ඇත. එවෙන් ඛේදනීය ඉරණම්වලට මුහුණ දුන් යෙහෙළියන් ගැන ඇය අසා ඇත. නේවාසිකාගාරයෙන් පිටව ගියාට පසු තාම ඔවුන් ගැන ආරංචියක් නැත. වින්ද සතුට සමස්ත ජීවිතයටම ප්‍රමාණවත්ය. ප්‍රධාන ප්‍රශ්නයව පවතින්නේ එම ආදරය මුළු ජීවිතයටම ලබා ගැනීමට තරම් පින් නොකර තිබීමය.

නංගී එන හඬින් හිස එසවූ ඇය දෙනෙතේ කඳුළු පිසදමා

ගත්තාය.

''මොකද මේ ඔයාට එකපාරටම වුණේ..?''

උමා කටයුතු කරන්නේ තම ජීවිතය පිළිබඳව අවබෝධයෙන් යුතුවය.

''සිද්ධ වෙච්ච කිසිවක් නැවත වෙන්න ඉඩ නෑ.''

''ඒ කිව්වේ මොකක්ද?''

''අපි අතර එහෙම සම්බන්ධකමක් ඇති විය යුතු නෑ.''

''ඇයි එහෙම නම් උදිත්ගෙ හිතට බලාපොරොත්තු දුන්නෙ..''

''අපේ හිතවත්කමට එච්චර කාලයක් නෑ. මේ හැම දෙයක්ම වෙන්න විනාඩි 180 කට වඩා ගියේ නෑ. වසර ගණන් හිතවත්ව හිටි අයත් වෙන්වෙන්නේ.''

''ඔයා මීට වඩා හොඳින් කතා කරයි කියලා මම හිතුවා. සිතක ආදරය ප්‍රතිසන්ධි වී ලබන්න කල්පයක් කල් ඕන නෑ. එක් නිමේෂයක් ඇති.''

නංගි සියල්ල හද තුළට දන්වූ පසු යළි දෙනෙත් කඳුළෙන් පිරී ගියේය. මෙය සම්ප්‍රදායික ආදර කතාවක් නොවේ. යම් ලෙසකින් මේ කතාව දිගින් දිගට ගෙන ගියහොත් දෙදෙනාටම ජීවිතවලින් වන්දි ගෙවන්නට සිදුවන බව චේතා දනී. මේ සංවිධානයට බැඳුනු වරදට තමා මරා දැමීමට කමක් නැත. එනිසා තවත් අයෙකුට ජීවිතය අහිමි කිරීම සුදුසු නැත. හොඳම දේ වන්නේ අකමැත්තෙන් හෝ මෙවන් සිද්ධියකට අනුබල නොදී සිටීමය.

චේතා වෙත නින්ද ලඟා වූයේ පාන්දර යාමයේ පමණය. පිබිදෙන විට හිසට වේදනාවක් පිවිස තිබුණේ තරමක් වෙලාවක් නිදිමරව සිටි නිසා විය හැක.

පිබිදුනු සැණින් ඇයට උදිත් සිහියට නැගුණි. ඉකුත් රැයේ තමා ආරක්ෂා කිරීමට වෙහෙසුනු හැටි මතකයට නැගෙයි. හිසට



පිනි බාවිය යන සැකයෙන් තම හිසට පත් තොප්පියක් දැමූ හැටි, අඟුණ වේ යැයි සිතා සිසිල් බීම නොදුන් හැටි..

සැබෑ පිරිමියෙක් තුළ තම බිරිඳ හෝ පෙම්වතිය රක්ෂා කිරීමේ දයාව තිබිය යුතුය. සොයුරිය ගෙනාවික් දුන් වතුර කෝප්පයෙන් මුව සෝදා තේ පානය කළ නොබෝ වේලාවකින් ගේට්ටුවට ගසන හඬ ඇසී නැගී සිටියාය.

''කවුද දොරට ගහන්නේ..?''

චේතා ඇසුවාය.

## 19

දොරට ගසන ශබ්දය නොනවත්වාම ඇසුණි. උදිත් පැමිණ ගේට්ටුවට ශබ්ද කරන්නේ වෙනත් අයුරකිනි. කාලයකට ශබ්ද කිරීමට දන්නා කෙනෙකු මෙසේ අවිනීත අයුරින් පහර දෙන්නේ නැත.

''සර්ද?''

චේතා උනන්දුවෙන් ඇසුවාය.

''නෑ.. නෑ.. කවදාවත් මෙහෙම කම්මල්කාරයෙක් වගේ ගහන්නෙ නෑ. අනික මේ තරම් උදෙන් එන්නෙත් නෑ.''

''එහෙනම් ඔයා යන්න එපා. අප්පාඩ යවන්න. එළවළු කරන්නයද දන්නෙ නෑ.''

උමා ගිය පසු චේතා නාන කාමරයට වැදුනාය. ප්‍රවනියක ලෙස ගත කළ ජීවිතයේදී ගැහැනියකට වැදගත් දවස් ඕනෑ තරම් තිබෙන්නට ඇත. ඉකුත් දින රාත්‍රිය තරම් වැදගත් අවස්ථාවක් ගත

වූ විසි එක් වසර තුළ තිබුණේ නැත. මෙවා නිකම්ම සිදුවන්නේ නෑ. එකිනෙකාට ආදරයක් නැති බව කිව්වත් අපි හිත්වලින් එකට බැඳිලා තියෙනවා. ගොඩක් හිතේ තියාගෙන ටිකක් කිව්වා නෙවෙයි. කියන්න තියෙන දේ කිව්වා. මා මුකුත්ම ඉල්ලා හිටියේ නෑ. අවුරුදු විසි එකක් මා ළඟ තිබ්බ්ච දේ ගන්නම ගන්න ඉල්ලා ගත්තේ ඔබයි.

අප ඉදිරියේ පිළිතුරු සැපයිය නොහැකි බොහෝ ප්‍රශ්න තියෙනවා. අපි ඉකුත් දින රැයේ බැඳුනේ ප්‍රශ්න තියෙන බව නොදන නොවේ. අපිට නොයෙක් ගැටළු තිබියදී ආදරයෙන් බැඳුනේ ජාති, ආගම්, කුලමල ගැන හිතල නෙවේ.

ඉක්මනින් නිවී යන පහනක් දීප්තිමත්ව බබලනවා. ඒත් නිබඳව දල්වෙන පහනක් සිතේ ඇත. කොයි මොහොතක හෝ කණ්ඩායම තමා මරා දමනු ඇත. තමාගෙන් පළිගැනීම සඳහා යොදවන්නන් වෙතින් ඔහුට ද කරදරයක් වන්ට බැරි නැත. මෙහි මූලික අවස්ථාවේදීම හිතවත්කම නතර කිරීම පිළිබඳව නංගී සමඟ කතා කළ ද එය පැවසීම ලෙහෙසියෙන් කළ නොහැක. සූදානම් වූ ඇය කණ්නාඩිය දෙස මොහොතක් බැලුවාය.

"උදයන් ඇවිදින්.."

"මම හිතුවා. මට සනීප නෑ කියන්න."

"ඔයා උදිත් සර් එක්ක යනවා දකලා අම්මටයි අප්පටයි බණිනවා."

"එයා මොනවටද බණින්නෙ. ඉන්න මං එන්නම්."

චේතා ශාලයට ගියේ ඔවුන් කතා කරමින් සිටියදිය. චේතා දුටු උදයන් වියරු සිනාවක් පෑවේය.

"ලොකු දූව මේ උදයන් කියන්නෙ ඇත්තද?"

"මොනවද?"

"ඔයාට ඊයෙ ඒ උදිත් හම්බ වුණාද?"



"ඇයි අප්පා අමුතුවෙන් හම්බ වෙන්න දෙයක් තිබුණයැ. අපි එක්කමනෙ ගෙදරින් ගියේ."

"එහෙනම් ගෙදර ඔක්කොම දනගෙනයි සිද්ධ වෙලා තියෙන්නෙ."

උදයන් කිවේය.

"නැන්දා ඒකා සිංහලයෙක්."

"ඔව්. සිංහලයෙක් බව දන්නෙ අද ඊයෙ නෙමේ.. අවුරුදු ගන හතලිහක ඉඳල අපි ඒ බව දන්නවා."

"ඒ ඉස්සර හිතවත්කම් දැන් තියා ගන්න එපා. මාමා දැන් මේ යුද්ධයක් පවතින වෙලාවක්."

"ඔයගොල්ලො යුද්ධ කරගන්නට කමක් නෑ. අපිට බෑ අපේ අතීත හිතවත්කම් අමතක කරන්ට."

"අතීත හිතවත්කම්, නෑදෑකම් බවට පත් වෙයි වගේ."

"උදයන් මේ අනවශ්‍ය කතා කියන්ට එපා. උදිත්... ඒ දරුවා මා ළඟට එන්නෙ සංගීතය ඉගෙන ගන්නයි."

"ඉස්සර ඉන්දියාවෙ ගුරුවරු තමන්ගෙ හොඳම ගෝලයට තමුන්ගෙ දූවත් කසාද බන්දලා දෙනවලු."

"ඒවා අපේ පෞද්ගලික ප්‍රශ්න. මගෙ දූවරු කාට දෙනවද කියල තීරණය කරන්නෙ අපි දෙන්නා."

අප්පා කවදාවත් කිසිවෙකුගේ හිත රිදෙන විදිහට කතා කරන අයෙක් නොවේ. සිය පෞරුෂය රකිමින් මෙසේ කෙළින් කතා කිරීම පිළිබඳව චේතා සතුටු වූවාය. මෙම කතාව නිසා උදයන් පසුබෑමකට ලක් වුණි.

"චේතා කවද්ද එන්නෙ..?"

"මට සනීප නෑ."

"මම ආවෙ ඔයාව එක්ක යන්නයි. එතකොට මේ ප්‍රශ්න ඉවරයිනෙ."

"මේ වැකේෂන් එක ඉවර වුණාම එයි. මේ ළමයගෙ ඔළුව සනීප නෑ."

වෛත්‍යලිංගම් කීවේය.

"මෙහාට ආවට පස්සෙ තමා ඔළුව සනීප නැති වුණේ.."

චේතා මෙම සමාගමයෙන් මිදී එළියට ගියාය.

තමා එම කණ්ඩායම සමඟ හිතවත්කම් දැක්වුවද පුහුණුව ලද සෙබළියක බව අප්පා තවම දන්නේ නැත. එම පළාතේ ජීවත් වන විට ඔවුන්ගේ අණසක යට සිටිය යුතුය. පක්ෂපාතී බව දැක්විය යුතුය. සාමාන්‍ය ජනතාව පමණක් නොව, පාර්ලිමේන්තු මන්ත්‍රීන් පවා ඔවුන්ට පක්ෂපාතීව කතා කරති. උන්ගේ උද්ඝෝෂණ, හර්තාල්, ජාතික වීරයන් ලෙස සලකන අයගේ ජන්ම දිනයන් උත්සවාකාරයෙන් සැමරිය යුතුවේ.

යාපනයේ හෝ උතුරු නැගෙනහිර බල ප්‍රදේශවල ජීවත් වන විට පක්ෂපාතී බව දැක්විය යුතුය.

"චේතා ඔයා වැරදි අය එක්කයි සෙල්ලම් කරන්නෙ."

චේතා පිළිතුරක් දුන්නේ නැත. ඉකුත් දින රැයේ තමා උදිත්ගේ අත අල්වාගෙන වෙල් නැරඹූ හැටි ඔහු දකින්නට ඇත.

"මම දැක්කා ඊයෙ ජෝඩු දාලා ඉන්නවා."

"ඔව් හිටියා තමයි."

"මොකද අද ඊයේ වෙච්ච දෙයක් නෙමෙ. නිලන්ට අර කොල්ලා කියලා තියෙන්නේ ඇත්ත. දෙන්නා අතර හුගාක් කල් ඉඳලා සම්බන්දෙ තිබුණද?"

ඔහුගේ කතාව නිසා චේතාගේ මුවගට සිනාවක් නැගුණි. එදා උදිත් විහිළුවට කී දේ අද සත්‍යයකි.



"ඒ සිංහල කොල්ලට මා අතින් මැරෙන්ට ඉඩ තියන්න එපා. මේ සම්බන්ධය වහාම නතර කරන්න වෙයි."

"උදිත්ට එහෙම මොනවා හරි කරලා තිබ්බොත් බලාගෙනයි."

"ඔයා අයිති වෙන්න ඕනෑ දෙමළ මිනිහෙකුටයි. සිංහල සමාජය තුළ දෙමළ ගෑනියෙකුට ජීවත් වෙන්න බෑ. යථාර්ථය තේරුම් ගන්න."

"කරුණාකරල මට කරදර නොකර යන්න. මේ කතාව නිසා ආපහු ඔළුවෙ කැක්කුම පටන් ගත්තා."

"දැන් සිංහල වෙදෙක් ඉන්නෙ. ඒ ලෙඩ හරියන්නෙ නෑ... හෙට උදේ ඔයා මා එක්ක යන්න ඕනෑ. මම බස් එකේ සීට් බුක් කළා."

"මම එන්නෙ නෑ."

"ඔයා නිසා මුළු පවුලම නැතිවෙයි. ඉස්සෙල්ලා මරන්නෙ අර සිංහල එකාවයි. බඩු අරන් ඇවිදින් තියෙනවා."

ඔහු කමිසය ඔසවා ඉනේ ගසා සිටි ගිනි අවිය දැක්වූවේය.

උදයන් ශබ්ද වන සේ ගේට්ටුව වසා යන හැටි චේතා බලා සිටියාය.

ඔවුන් සංවිධානයේ මිනීමරු කල්ලිවලට අයත් වූවන්ය. මනුෂ්‍ය ඝාතනයක් එතරම් විශාල දෙයක් ලෙස ඔවුන් නොසලකති. තමා නිසා මේ අහිංසකයාගේ ජීවිතය නැති වුවහොත් එය බරපතල අපරාධයකි. කළ යුත්තේ කුමක්ද?

උදිත් චේතාගෙන් සමුගෙන නවාතැනට ගියේ සතුටින් යුතුවය. දුටු දිනයේදීම ඇය තම සිත දිනාගත් හැටි ඔහුට සිහිවුණි. මේ ඇසුරට දිගු ඉතිහාසයක් නැති වුණත් සිත් එකට යා වූයේ පෙර ජන්මයක පතාගෙන ආ පරිද්දෙනි.

අයියලා තිදෙනා හා අක්කා තම හිතුමට මුදල් දමන නිසා

ඔහුට කිසිදු මුදල් ප්‍රශ්නයක් නැත. හැමදාම සහෝදර සහෝදරියන්ගෙන් යැපෙන්නට බැරිය. සංගීත විද්‍යාලයේ පුරප්පාඩුවක් සඳහා අයදුම්පතක් දමා තිබුණත් එය ලැබෙන තුරු විශ්වාස කළ නොහැක. මිනිසුන්ට රැකියා ලැබෙන්නේ සුදුසුකම් මතම නොවේ. රූපවාහිනී නිවේදක තනතුර සමහරවිට ස්ථිර වීමට බැරි නැත.

තමා මෙම වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය නිසා කළමනාකාරිත්වයේ පැසසුමට හේතුවී තිබුණි. විශේෂයෙන් එය තමාගේ අදාල විෂය නිසා හොඳින් කළ හැකිව තිබුණි. වරින්වර ප්‍රවීණ කලාකරුවන් කැඳවා ඔවුන්ගේ නිර්මාණ අගය කිරීම ඒ සඳහා ප්‍රේක්ෂක සහෘදයන් කැඳවීම වශයෙන් මෙහෙතම එය අතිශයින් ජනප්‍රිය වැඩසටහනක් බවට පත් කළේය.

හදිසියෙන්ම තමා හමුවීමට එන මෙන් ජයනි අක්කා දන්වා එවූ නිසා ඔහු සොයුරිය හමුවීමට ගියේය.

"ඉන්දියාවෙ ඉන්නකොට නම් ටෙලිෆෝන් එකෙන් හරි කතා කරනවා. ඔයාට මේ ගංගොඩවිලට ඇවිදින් යන්න බෑ."

"මේ දවස්වල හරි වැඩ අක්කා."

"ඔයාට ඉතින් වැඩක් නොතිබුණේ කවද්ද? අන්න අප්පච්චි ගෙදර එනකල් බලන් ඉන්නවා."

"තෙල් ටිකක් මතුර ගන්නත් තියෙනවා. කෝ අයියා.."

"එයා අද කුක්. මේ එන්නෙ කෝකියා."

"ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා කුස්සියෙ."

"අද ඉතිහාසය කුස්සියට නෙවේ කහල ගොඩට ගිහින්. අද ඉතිහාසය විකෘති කරලා."

"මල්ලිට එන්න කිව්වෙ ඒකයි. මම මේ පොත පුස්තකාල සේවා මණ්ඩලයේදී නිකුත් කරනවා. ඒකට ප්‍රසිද්ධියක් ලබා ගන්න ඕනෑ."

"අද ඉන්නෙ ඉතිහාසයක් නොදන්න, ජාතිත්වයක් නැති නිවටයෝ."

බුද්ධික කීවේය.

"හැම රටකම ඉස්සෙල්ල තමුන්ගෙ ඉතිහාසය පිළිබඳව උගන්වනවා. එතකොට තමයි තම රටට, ජාතියට ආදරය කරන පුරවැසියො බිහිවෙන්නෙ."

උදිත් කීවේය.

"උතුරු නැගෙනහිර අපේ සිද්ධස්ථාන විනාශ වෙමින් පවතිනවා. අරුන් රට දෙකඩ කරන්න හදනවා."

බුද්ධික කීවේ කෝපයෙන් යුතුවයි.

"අපි පොත අවුට් වෙන දවස කිට්ටු කරලා ඉන්ටර්විව් එකක් කරමු."

"මල්ලිගෙ ප්‍රසන්ටේෂන් ලස්සනයි. ලබන සුමානෙ උදේට එන්නෙ කව්ද?"

"අක්කත් දන්න කෙනෙක්. මතකද යාපනේ හිටිය වෛතාලිංගම් කියලා..."

"හානේ මතකයි.... මතකයි.. අප්පච්චිගෙ හොඳම යාළුවා. දකින්නත් ආසයි. කොහෙද ඉන්නෙ..?"

"වැල්ලවත්තෙ ඉන්නෙ..."

"විශ්වාස කරන්ට එපා. ගේ අහලකටවත් ගන්ට එපා."

"එහෙම කියන්ට එපා බුද්ධික. හොඳ මිනිස්සු. හිර ගනුදෙනු කරන්ට නෙමෙයිනෙ."

"මල්ලි කොහොමද දන්නෙ...?"

"මම කර්නාටක සංගීතය ඉගෙන ගන්නෙ ඒ අංකල්ගෙන් තමයි. බලන්නකො ලබන සුමානෙ."

"ඔය නැගිට්ටෙ යන්නද?"

"වැඩ කෝටියක් තියෙද්දි ආවෙ."

"බත් ටිකක් කාල යනවා."

"මම උදෙන්ම නැගිටලා ඉව්වා. අපරාදෙ කෑම ටික නාස්ති වෙනවනෙ."

ජනනි සොයුරාට මුදල් දුන්නේ ඉගෙනීම සඳහාය.

"ලබන මාසෙ ඉඳලා මට සල්ලි එපා."

"ප්‍රශ්නයක් නෑ. තවම ඔයාට රස්සාවක් නෑනෙ."

"ඔගොල්ලන්ටත් ප්‍රශ්න තියෙනවනෙ අක්කා. අවශ්‍ය වුණොත් දඩයක් දාන්න එන්නම්."

සොයුරියගෙන් සමුගත් උදිත් නවාතැන වෙත ගියේය. ඊළඟ වැඩසටහන වෙනුවෙන් පිටපත ලියා අවශ්‍ය කටයුතු සංවිධානය කළ යුතුය. වාර්ගික අර්බුදයක් පවතින අවස්ථාවක මේ කලා පවුල රූපවාහිනී ආයතනය වෙත කැඳවීම හොඳ අදහසක් වීමට ඉඩ තිබේ. එසේම ප්‍රශ්න මතුවීමට ද ඉඩ ඇත.

හැන්ඩ් ෆෝනය නාද වුණි. චේතාගේ කටහඬ ඔහු එක්වරම අඳුනා ගත්තේය.

"චේතා. ඔයා කොහේ ඉඳන්ද කතා කරන්නෙ...?"

"ඔයාගෙ හොස්ටල් එක ගාව ඉඳන් කතා කරන්නෙ. මට ඔයාව හම්බ වෙන්න ඕන."

# 20

උදිත් හැන්ඩ් ෆෝනය කන තබාගෙන ඉහළ මාලයේ සඳළුතලය වෙත ගොස් මාවත දෙස බැලුවේය. ඔහු සිතා සිටියේ සරදමක් ලෙසය. උදිත් ඇයට අතවනා ආචාර කළේය.

"උඩට එනවද?"

උදිත් ගේට්ටුව අසල සිටි චේතාට කතා කළේ

"බෑ ඉක්මනට එන්න. මට මෙතන ඉන්ට බෑ."

කඩිනමින් සූදානම් වූ ඔහු පහළට ගියේය.

"ඇයි..?"

"අපි පාරෙ ඉන්න එක හොඳ නෑ. කොහාට හරි යමු."

"ඇයි මේ හදිස්සි..? ඇයි තනියම...?"

"මම කාටවත් කියන්නෙ නැතුව ආවෙ. ඔයාට කතාවක් කියන්ට තියෙනවා."

මාවතේ ගමන් කළ ත්‍රීවිලරයක් නතර කළ හෙතෙම චේතා සමග එයට ගොඩ වුණි. තරමක් දුර යනතෙක් ඔවුනතර කිසිදු කතාවක් වූයේ නැත. ඔහු මෘදු ලෙස චේතාගේ අතින් අල්වා ගත්තේය. ඇය ඔහුගේ අත තරයේ අල්වා සිටියා විනා කිසිවක් කීවේ නැත. මුහුණේ පැවතුනේ කලබලකාරී පෙනුමකි.

"ඇයි ප්‍රශ්නයක්ද?"

"අප්පා බැන්නද?"

"ම්හු.."

ඇය හිස වැනුවාය.

"අපි හෝටලයකට ගිහින් දවල්ට කාලා කතා කරමු."

"බෑ."

ඇය හිස වැනුවාය.

"එහෙනම් අපි බීච් එකට යමු."

ඇය හිස වනා එය අනුමත කළාය. චේතා උදීත්ගේ අතේ එල්ලී ගිය ද මුහුණ ප්‍රශ්නවලින් බරිතවී තිබුණි.

"මොකක්ද ප්‍රශ්නය."

"මාව හම්බ වෙන්න උදයන් ආවා."

"ඉතින් ඒකට බය වෙන්නෙ මොකටද? උදයන් ඊයෙ මුළු ද යේම අපි පස්සෙන් ආවෙ."

"මොනවා අපි පස්සෙන් ආවා. ඇයි මට කිව්වෙ නැත්තේ..?"

"ඒක කිවයුතු දෙයක් නෙමෙ.."

"අපි දෙන්නා අතර මෙහෙම සම්බන්ධයක් තිබුණොත් ඒක ඔයාට ප්‍රශ්නයක් වෙයි."

"ඒක කියන්නද මෙච්චර දුර ආවෙ...?"

"කියන දේ තේරුම් ගන්න උදීත්. අපේ සම්බන්ධය ඉදිරියට තිබුණොත් ඔයාට කරදරවලට මූණ දෙන්න වෙයි."

"ඔයා මොනවද මේ කියන්න හදන්නේ."

"මම ඒ අය කියන දේට කැමති නූනොත් මාව මරා දමාවි."

"ඔයා බයවෙන්න එපා. කාටවත් ඔයාට කරදර වෙන්න මම ඉඩදෙන්නෙ නෑ. අපි පිටරට මිනිස්සු නෙමෙ."

ඇය පිළිතුරක් නොදී ඔහුගේ නිදහස් වම් උරේ හිස තැබුවාය.

"ඔයාට මාව බේරගන්න බෑ. මම ඒ සමාජයට කලින් බැඳී හිටියා. ඒත් දැන් මම ඒ අය එක්ක යන්නෙ නෑ."



"ඉතින් ඔයාව මරන්න හේතුවක් නෑ."

"අපිට ඒ අයගේ නීතියෙන් පිට යන්න බෑ. පිට ගියොත් අපිව මරන්න බලයක් තියෙනවා."

"මට කොහොමටවත් ඔයාව අතාරින්න බෑ."

චේතා නිහඬව සයුර දෙසට ගියාය. ඈත දිගන්තයේ සිට දුව එන දිය රැළි ගල්පරවල වැදී සුනුවිසුණු වෙයි. එය තම හදවත මදාගේ දුක් ගින්දර මෙනැයි චේතාට සිතෙයි. පුහුණු කඳවුරුවලදී සන්ධානය සමඟ දිවි හිමියෙන් යටහත්ව සිටින බවට ගිවිසුනු හැටි සිහිවෙයි. එයට විරුද්ධ වුවහොත් ලැබෙන ප්‍රතිඵලය ද ගිවිසුමේ ඇත.

"ඔයා කිසි දේකට බයවෙන්න එපා."

"ඒත් කාටවත් බෑ මාව ආරක්ෂා කරන්න."

ඔහු එකවරම පිළිතුරක් දුන්නේ නැත. ඇගේ කතාව සත්‍යයකි. මේ රටේ වැදගත්, බුද්ධිමතුන් රැසක් මේ ඝාතන රැල්ලට හසුව ඇත. මේ රටට වැඩදායී පුද්ගලයන් රැසකට ජීවිතය අහිමි වූ බව දනී. ජාතිවාදයකින් තොරව එම උගතුන් රටට අවශ්‍ය වෙයි. රටට අත්‍යවශ්‍ය බුද්ධිමතුන් ඝාතනය කිරීම ද එක පරමාර්ථයකි. නීරූ වෙල්චම් වැනි බුද්ධිමතුන් අහිමි වීම ශ්‍රී ලංකාවටම පාඩුවකි. යම් ලෙසකින් චේතා ඝාතනය කළහොත් ඇගේ බිය සාධාරණය.

ඔහු මෘදු ලෙසින් ඇගේ අතින් අල්වා ගත්තේය.

"උදයන් ඇවිදින් ඉන්නේ මාව එක්ක යන්නයි."

"ඔයා උදයන් එක්ක යනවද?"

"හිතාගෙන ආවෙ යන්න තමයි. ඒත් ඒ හිත දැන් මට නෑ. මුළු ජීවිත කාලය තුළම ලබන්න බැරි සතුටක් මම ඔයා නිසා ලැබුවා. දැන් මට මළත් කමක් නෑ."

ඇය අත තරයේ අල්වාගෙන කීවාය.

"හිත කලබල කරගන්ට එපා. අපි මේකට විසඳුමක් හොයමු."

"මට බය මේ අය ඔයාගෙන් පළි ගනීවි කියලා. ඒ නිසා ඔයා හුඟාක් පරිස්සම වෙන්න ඕන."

"කී කාලයක් හැංගිලා ඉන්නද? ඔයා ආපහු කැම්පස් එකට යනවද?"

"යන්න පුළුවන්. එහෙම ගියොත් මට ආපහු එන්ට වෙන්නෙ නෑ."

"හරි දන් ඔක්කොම අමතක කරමු. දවල්ට කෑවද?"

දවල්ට පමණක් නොව, උදේටත් නොකෑ බව සිහිවුණි. ඒ සඳහා ප්‍රියමනාප බවක් තිබුණේ නැත.

"මරණය එන වෙලාවක ආවාවෙ. අපි මොනව හරි කමු."

චේතා ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කළේ නැත. තමා කොහේ කැඳවාගෙන යන්නේදැයි චේතා විමසුවේ නැත. මෙච්චර කෙටි කාලයක් තුළදී තදබල විශ්වාසයක් ගොඩ නැගුණ හැටි පුදුමය. මේ හැමටම වඩා ප්‍රධාන වී ඇත්තේ ඔවුනොවුන් කෙරෙහි ගොඩ නැගී ඇති විශ්වාසය වේ. ජාති දෙකක අය වුවද ඔවුනොවුන් ඇසුරු කර ඇත්තේ සමීප හිතවතුන් ලෙසය. ජීවිතයේ කවදාවත් තරුණයෙක් හා මෙසේ තනිවී සිට නැත. වසර ගණනාවක් තිස්සේ ඇසුරු කළත් උදයන් කෙරෙහි පැහැදීමක්, විශ්වාසයක් නැත. එහෙත් උදිත් හා බැඳුනේ දුටු ප්‍රථම දසුනේදීමය. කිසිවෙක් සමග මෙවන් ගමනක් ගොස් නැත.

"උදිත්ගෙ අම්මා වුටි කාලෙ මාව වඩාගෙන ඉඳලා තියෙනවා නේද?"

"ඇයි ඔයාව විතරද.... චේතගෙ අම්මයි අප්පයි මාව වඩාගෙන ඉඳලත් තියෙනවා."

"ඇයි අපි එක්වෙන්න මෙච්චර පරක්කු වුණේ."



ඇය ඔහුගේ අත සියතට මැදිකර ගනිමින් ඇසුවාය.

"අපි පිළිගත්තෙ නැතත් අපිව මෙහෙයවන කෙනෙක් අපි පසුපස ඉන්නවා."

"මේ ආඩම්බරකාරයා මට ලැබෙයි කියලා මං හිතුවෙ නෑ."

සවස් වනතෙක් ඇය උදිත් සමග සිටියා මිස වෙන්ව යාමට ඉඩ පහසුකම් නැත.

"ගෙදරට මොනවා කියලද ආවෙ...?"

ඇය ඔහු දෙස බලා සිනාසුනා විනා කිසිවක් පැවසුවේ නැත.

"නංගිට විතරක් යන දිහාව කිව්වා. එයා තමයි කිව්වෙ උදිත්ව හම්බ වෙන්න කියලා."

"අවවාදයක් දෙන්නම්. මීට පස්සෙ තනියම ඇවිදින්න එපා."

"මට ගෙට වෙලා ඉන්න බෑ. ඔයා මාව බලන්න එනව නේද?"

ඔහු මොහොතක් නිහඬව සිටියේය. මේ අනපේක්ෂිත බැඳීම පිළිබඳව චේතාගේ පියා කුමන ප්‍රතිචාරයක් දක්වාවිද? ඔහු චේතා සමගින් ගේට්ටුව ළඟට ගියේය.

"මම හවසට එන්නම්."

චේතා නිවසට පැමිණි දින සිට වෛතාලිංගම් පසුවන්නේ බියෙන් යුතුවය. කිනම් මොහොතක හෝ ඇයට කරදරයක් ඇතිවිය හැකි බැව් ඔහු දනී. දරුවන්ගේ දුරදිග නොබලා කරන වැඩ නිසා මෙවැනි බැරෑරුම් ප්‍රශ්න උද්ගත වෙයි. බලය ලබා ගැනීම සඳහා අද මිනිසුන් නොකරන දෙයක් නැත.

චේතා මෙවන් සංවිධානවලට බැඳෙන්න තරම් පටු අදහස් ඇත්තියක නොවේ. මේ ජීවත්වන පරිසරයේදී ඇය නොමග යාමට ඇත. ඔවුන්ගේ අදහස්වලට එකඟ නුනොත් ඇය මරා දමන බව

සහතිකය.

"මොකද අපි දැන් කරන්නෙ..?"

චෛත්‍යලිංගම් බිරිඳගෙන් ඇසුවේය.

"මට නම් කිසි දෙයක් හිතා ගන්ට බෑ. මේ දරුවට කරදරයක් වෙයි කියලා බයයි."

"පොඩි දුව.... අක්කා ආපහු කැම්පස් යනවා කිව්වද?"

"මම හිතන්නෙ නෑ යයි කියලා. ගියොත් ඉවරයි. ආපෙ එන්ට වෙන එකක් නෑ."

"අපි වෙන ගෙදරකට යමුද?"

බිරිඳ යෝජනා කළාය. එය ගැළපෙන්නේ කෙටි කාලයකටය. අගනුවර නතරවී සිටින තුවක්කු කල්ලියේ කෙනෙකුට සාමාන්‍ය දෙයකි.

"උදිත් සර්ට කතා කරල බලමු."

"ඒ ළමයා මොනවා කරන්නද?"

"එක්කො ඉම්මු. නැත්නම් කොහේ හරි යමු. නැත්නම් උන් මේ දරුවා මරයි."

චේතා එනවිට වුවද ඔවුන්ගේ කතාව නැවතී තිබුණේ නැත. කාමරයට පිවිස ඇඳේ වැතිරුණු ඇය මොහොතකට දෑස් පියා ගත්තාය.

"එන්න කෑමට."

"අපි කෑම කෑවා."

"ම.. දැන් හරි දියුණුයි වගේ. කියන දේ අහන්න. ඔයා නිසා අම්මා ඉන්නෙ බයෙන්."

"ඉතින් මම මොනාද කරන්නෙ නංගී..?"

"අපි ගෙවල් මාරු කරලා කොහේ හරි යමු කිව්වා."

"අපිට හැමදාම එහෙම කරන්ට බෑනෙ."

"ඒත් අක්කා අපිට වඩා ඔයා මේ ප්‍රශ්නෙ ගැන දන්නවනේ."

"ඒක තමා මම කියන්නෙ. මේ ගමන යාමේ තේරුමක් නෑ. උදයන් මාව මරා දමයි."

ඔව්හු කාමරයට පිවිස අසුන් ගත්හ.

"මම ගියේ උදිත් හමුවෙන්නයි."

ඇය පහත් හඬින් කීවාය. උමා සොයුරියගේ ස්වභාවය දනී. එහෙත් මේ තත්ත්වයට ඇය පත්ව සිටින්නේ ඇගේම වරදිනි.

"උදිත් සර් මොකද කිව්වේ..?"

"එයාට නම් ගානක්වත් නෑ. බය නැතුව ඉන් කිව්වා."

මෙය සරල සිද්ධියක් ලෙස සැලකිය නොහැකි බව උමා ද දනී. ඉකුත් දින රෑයේ මෙහි සිටින මිතුරියන් කීවේ ද මෙයමය. එහෙත් මෙහි සිටින ඇතැම් පිරිස් අතර ඔවුන්ගේ ඔත්තුකරුවන් ද සිටිති. එම රහස අදාල පුද්ගලයන් වෙත වාර්තා නොකරතැයි කිව නොහැක.

"හැම දෙනාම ඔයාටයි උදිත් සර්ටයි කැමතියි. ඔය දෙන්නා හුඟාක් ගැලපෙන දෙන්නෙක් කිව්වා. ඒත් මේක නතර කරන්න බැරි තරම් සම්බන්ධයක්ද කියලා ඇහුවා."

චේතා එක එල්ලේ බලා සිටියේ සොයුරිය දෙසය. ඇයත් ඔවුන්ගේ කතාව අනුමත කළා වන්ට බැරි නැත.

"ඔයා මොකද කිව්වේ...?"

"මට කියන්න දෙයක් ඉතිරි වෙලා තිබුණෙ නෑ."

උමා පහත් හඬින් කීවාය. ඇගේ කතාව සත්‍යයකි. මේ සම්බන්ධය කිසිවෙකුට නතර කිරීමට පුළුවන් කමක් නැත. අප ඒ

තරම් දැඩි ලෙස එකිනෙකාගේ හදවත්වලින් බැඳිලා. වැඩි කාලයක් ගියේ නෑ. මේ හිතවත්කම නතර කරන්න බැරි ඒකයි.

''ඔන් ඉතින් අඬන්න හදනවා. මොකද්ද මේ වෙලා තියෙන්නෙ.''

උමා සොයුරිය තමා දෙසට හරවා ගනිමින් කීවාය.

''ඔක්කොම අමතක කරන්න. හා.. හා.. විවේක ගන්න.''

සොයුරිය තමා අස්වැසීමට වෙර දරනු ඇයට දැනුණි. උමා කාමරයෙන් පිටව ගිය පසු චේතා කොට්ටයේ මුහුණ හොවා ගත්තාය. මෙච්චර හිත දුබල වූයේ ඇයි..

ටෙලිෆෝනය නාද වූ නොබෝ වේලාවකින් යළි උමා ආවාය.

''ඔයාට කෝල් එකක්.''

''අනේ නංගි මම නැහැයි කියන්න.''

''මට බැහැ බොරු කියන්න. ඔයා ඉන්නව කිව්වා.''

''ඇයි මගෙන් අහන්නෙ නැතුව කිව්වෙ..?''

''එහෙනම් උදිත් සර්ට ඔයා නැහැ කියනවා.''

ඇගෙන් ඇය රිසිවරය අතට ගත්තාය.

''හලෝ.. උදිත්.. මම චේතා.. ඉතින් කතා කරන්නකො..''



# 21

අද පැවැත්වෙන රූපවාහිනී වැඩසටහනට තම මිතුරා වන චෛත්‍යලිංගම් සහභාගි වෙන බව මුදියන්සේ දැනගත්තේ උදිත්ගෙනි.

උදේ වැඩසටහන් නැරඹීමට එතරම් උනන්දුවක් නොදක්කුවත් මෙය නැරඹීමට සිතුවේය. කාලෙකින් මිතුරා දුටු පසු මුදියන්සේගේ සිතට සතුටක් පිවිසුණි.

''මැණිකේ.. මැණිකේ.. පොඩ්ඩකට මෙහාට එන්න.''

ඔහු බිරිඳට කතා කළේ සිනහසෙමින්. බිරිඳ සැමියා අසල අසුන් ගත්තාය.

''හානේ.. මේ චෛත්‍යලිංගම් නේද?''

''ඔව්.. මේ ඉන්නෙ ඒ කාලේ පොඩියට හිටපු පොඩි කෙල්ලො දෙන්නා නේද?''

''මේ ඉන්නෙ ලොකු දුව වෙන්න ඕනැ. බලන්නකෝ හැඩ.. ආදරේ බෑ.''

''ම්.. ඔක්කොටම වඩා ලස්සනයි.''

''මට අපේ පුතයි ලොකු දුවයි ඒ දවස්වල එකට හිටිය හැටි මතක් වෙනවා.''

''ඇයි ඒ දරුව ලැබිච්ච දවස්වල චෛත්‍යලිංගම්ගෙ නෝනට කිරි නැතිව ඉඳලා ඔයා නේද කිරි දුන්නෙ..?''

''ඔව්.. ඔව්. ඔය දෙන්නම මගේ පපුවේ එල්ලිලා කිරි බිව්වා. බලන්නකො මේ කෙල්ලන්ගෙ හැඩ.''

මුදියන්සේ මෙම ලස්සන තරුණියන් දෙස බලා සිටියේ සතුටින් යුතුවය.

''අපි වෙන්නාලිංගම්ට කෝල් එකක් දීලා සිංදුවක් ඉල්ලමුද?''

බිරිඳ යෝජනා කළාය.

''ඔව් ඒක හොඳා.. මම සිංදුව ඉල්ලුවොත් අඳුන ගනීවි. මැණිකෙ උදිත් ටී.වී එකේ ඉන්නවා කියලා දුවටයි, ලොකු පුතාටයි, පොඩි පුතාටයි කතා කරල කියන්න.''

ජයනි රූපවාහිනිය බැලුවේ මල්ලී ඉදිරිපත් කරන වැඩසටහනක් බැවිනි. මල්ලී ව්‍යක්ත ලෙස වචන උච්චාරණය කරන හැටි මේ හැමටම වඩා වැදගත් වූයේ දන්නා හඳුනන පිරිසක් රූපවාහිනි මැදිරියේ සිටිනු දැකීමෙනි.

''සැමී එන්න බඩුවක් පෙන්නන්න.''

''මට බෑ... වෙළඳ දැන්වීම් බලන්න. මිල් කරල දාන්න.''

''මල්ලී ඉන්නවා. මේ බලන්න කෙල්ල දිහා''

''වැඩ සටහන්වලට වඩා තියෙන්නෙ වෙළඳ දැන්වීම්.''

ඔහතෙම උපැස් යුවල පැළඳ ආවේ එතරම් කැමැත්තෙන් නොවේ. අද රූපවාහිනිවලින් ප්‍රදර්ශනය වන නාට්‍ය ගුණාත්මක අතින් පහල තත්ත්වයක පවතී. පැහැදිලිවම අද ඒවා ප්‍රචාරක ආයතන බවට පත්ව ඇත.

විශ්ව විද්‍යාල ආචාර්යවරයෙක් වන ඔහු රූපවාහිනිය නරඹන්නේ නැත. ඔහු එය බැලුවේ බිරිඳගේ සොයුරා නිසාය.

''හත්.. කවුද අර ලස්සන කෙල්ල...?''

ඔහු ටෙලිවිෂනය දෙස බලා ගත්වනම සිට කීවේය. ජයනි පිළිතුරක් දිගත නොහැකිව දනුනේ සිටින යුවතියන් දෙස බලා සිටියාය. ඒ ගැහැනු අගපසඟවල තිසි අඩුවක් නැත. පිරිමියෙක් ඇද බැඳ තබන ආකර්ෂණීය ගැහැනුකමක් ඔවුනට හිමිව තිබුණි. දරුවන් සිටින විවාහකයෙක් වුවත් තරුණ ගැහැණියක් දුටුවහොත් පැමිණ අනිවාර්යයෙන්ම එදෙස බලන බව ජයනි දනී.



''නියමයි නේද..?''

''වැඩක් නෑ උන් දෙමළ කෙල්ලො...''

ජයනි සිනාසෙමින් කීවාය.

''ගැහැනු දෙමළ සිංහල ඉංග්‍රීසි කියල වෙනස් කරන්න බෑ. ආකෘති ලක්ෂණ අතින් ඔක්කොම සමානයි. පිරිමියෙකුට ඕනෑම ගැහැනියෙක් හරියනවා.''

මහුගේ කතාව නිසා ජයනිගේ සිතට කෝපයක් පිවිසුනත් ඇය කිසිවක් කීවේ නැත. පිරිමි ස්වභාවයෙන්ම සසල වන සිත් ඇත්තවුන්ය. විවාහයකින් සිර කරගෙන සිටියත් අතින් ගිලිහෙන්නට වැඩි වෙලා ගත වන්නේ නැත. දරුවන් සිටින ජීවිත ගත කළත් කියල්ල අතහැර වෙනත් සුන්දර තැනක බැඳීමට අවදානම වැඩිය. ගැහැනු පිරිමි බැඳෙන්නට ජාතියක් ජම්මයක් අවශ්‍ය නැත.

එහෙත් ඉතිහාසය විකෘති කිරීමට සූදානම් වන ජාතිවාදීන් පිළිබඳව විමසිලිමත් වන්නට කාලය පැමිණ ඇත. ජාතියට පමණක් නොව සියයට හැත්තෑ පහක් වෙසෙන බෞද්ධයන්ගේ බුදු දහමට ද අද තර්ජන එල්ල වෙමින් පවතී. මෙවන් අවස්ථාවක හැඟුම්බර විය යුතු නැත.

''ගැහැනු ලස්සන වුණත් විවාහයකදී අපේ ජාතිය ආගම සංස්කෘතිය ගැන හොයන්න ඕනෑ. රත්තරන් මාලයක් විදියෙන් හෝ වෙනත් ලෝභයකින් සම්බන්ධ කළොත් වෙනස පේනවා.''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි. හැම පුද්ගලයෙක්ම තම රටේ ඉතිහාසය දැන ගත යුතුය. රටක් අද මේ තත්ත්වය දක්වා සංවර්ධනය වීම එහි ඉතිහාසය වේ. ඒවා නිකම්ම නිකන් සිදුවන්නේ නැත. රට වෙනුවෙන් දිවි පිදූ වීරුවන් රණවිරුවන්, කවියන්, ගීත රචකයන්, නවකතා කරුවන් ජාතික සම්පත්ය.

හිතේ සැඟවුණු අමනාපයක් තිබුණත් යුවතියගේ ආංගන විලාසය ඇගේ සිත ගත්තේය. මෙම හෝරාව විචිත්‍ර වැඩසටහනක්

බවට පත්කර ගැනීමට තරම් උදිත් දක්ෂයෙක් විය. දූරකතනයෙන් සහභාගි වූ ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ද ඔවුහු ගායනා කළහ. චේතාගේ රංගනයට අමතරව උදිත් සමඟ ගැයූ ගසල්, කවාලි හා සිංහල ගීත ද වැඩසටහනට හොඳ ශක්තියක් ගෙන ඒමට සමත් වුණා. ඇය දූරකථනය ඔස්සේ පැමිණි ඇමතුම ගත්තාය.

"ආ.. අම්මාද? මල්ලිගෙ ප්‍රෝගෑම් එක බැලුවද?"

"ඔව් දුව.. ඒක මතක් කරන්ට තමයි කතා කළේ. අමුතුයි නේද?"

"අමුතුයි. ලස්සනයි. ඇයි මෙයා අප්පච්චි වගේ සිංහල ශිල්පියෙකුගෙන් වැඩසටහන පටන් ගත්තෙ නැත්තෙ..?"

"දුවට මතක නැද්ද යාපනේ හිටපු වෛතාලිංගම් අංකල්. එයා තමයි අද ඉන්නෙ.."

"හානේ.. ඇත්තද? ඒත් මම දැකල පුරුදු මූණක් නේද කියල හිතුවා. අර තැටුවෙ චේතාද?"

"ෆිල්ම් ස්ටාර් කෙනෙක් වගේ ලස්සනයි නේද?"

"ඒ දවස්වල මගෙ කරේ එල්ලිච්ච ගමන් මෙයා. අම්මගෙන් කිරි බිව්වෙ මෙයා නේද?"

"ඔව්.. සාවිත්‍රිට කිරි නැතුව හිටියනේ.."

"ඒ ඉස්සර.. ඒ වුණාට අම්මා ඒ අය එක්ක ඕනැවට වඩා ආශ්‍රය තියන්ට ඕන නෑ. කොච්චර හොඳ වුණත් බලු නගුට උණ පුරුකෙ දම්මත් දිග හරින්ට බැනෙ."

මව හා කළ සාකච්ඡාවෙන් පසු ඇය යළි දසුන දෙස බලා සිටියාය.

"මරු කසල් එක.."

හැමියා කළේ විහිළුවක් වුවද ඉන් සිහින් කෝපයක් සිතේ සටහන් වුණි.



ආචාර්ය උපාධිය සඳහා රචනා කරන ලද ඉතිහාස ග්‍රන්ථයේ මෙතෙක් ඉතිහාසඥයන් විසින් හෙළි නොකළ පුරා විද්‍යා තොරතුරු පිළිබඳව විශේෂ සටහන් කිහිපයක් ජයනි විසින් ඉදිරිපත් කර තිබුණි. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් තහවුරු නොකළද දීපවංශ, මහාවංශ වැනි වංශකතා පුරාවෘත්තවලින් ඒවා පැහැදිලි කිරීමට තදබල උත්සාහයක් ගෙන තිබුණි. මල්වතු ඔය, දැදුරු ඔය, මහවැලි, ගෝකණ්ණ ඔස්සේ පැතිර ගිය ජනාවාස අපගේ නිජබිම පිළිබඳව හොඳම නිදසුනකි. තම ඉතිහාස පොත පැහැදිලිවම අපගේ නිජබිම අයිතිය තහවුරු වීමට හේතුවනු ඇත.

බෙදුම් වාදය උච්ච අවස්ථාවකට පත්ව ඇති මෙවන් අවස්ථාවක සොඳුරා ඉදිරිපත් කර ඇති වැඩසටහනෙන් සිදුව ඇත්තේ සුළු හුණු ගෑමක් බඳු වූ දෙයකි. ප්‍රශ්න කෙසේ වුවත් එම වැඩසටහන විචිත්‍රව ඉදිරිපත් කිරීමට තරම් දක්ෂතාවයක් උදිත් වෙත තිබීම සතුටට කරුණකි. හොඳ ගායකයෙකු වූ වෛතාලිංගම්ට උත්තර හා දක්ෂිණ භාරතීය ගීත ගැයීමේ හොඳ දක්ෂතාවයක් තිබුණි. ඊටත් වඩා යුවතියන් ඉදිරිපත් කළ නැටුම් ද එම හෝරාව අලංකාර කිරීමට හේතු වූ බව අවංකව පිළිගත යුතුය.

වැඩසටහන නිම වූ සැණින් උදිත් වර්තමාන ගුරුවරයා වූ වෛතාලිංගම්ගේ දෙපතුල් අල්ලා බුහුමන් දැක්වූයේය. ඉන්පසු චේතා හා උමා උදිත්ගේ දෙපතුල් අල්වා ප්‍රණාම දැක්වීමට තරම් හොඳ සිසුන් වූහ.

"එපා.. එපා මට වඳින්න.."

උදිත් ඇගේ දෑවුර අල්වා කීවේය.

"ඉටිස් මයි ඩියුටි.."

"මම ඔයාට කිසි දෙයක් උගන්වන කෙනෙක් නොමෙයි.."

"නෑ.. නෑ.. එහෙම කියන්න එපා උදිත්. මට අනිත් අය උගන්නාපු නැති වටිනා දේ උගන්වපු විශේෂ කෙනෙක්. මට ඔයා

හඳුන්වන්න නමක් නෑ. අන්න ඔයාගෙ යාළුවො බලන් ඉන්නවා.

දෙමළ කලා පවුලක් ඉදිරිපත් කිරීමෙන් හානියක් සිදුවිය හැකි බවක් නිෂ්පාදකවරයා කලින් විශ්වාස කළේය. එහෙත් උදිත් මැනවින් එම වැඩසටහන ඉදිරිපත් කිරීම සතුටට කරුණකි. කලාකරුවෙකුට කිසිදාක ජාතිවාදියෙක් විය නොහැකි බව උදිත් කියා පෑවේය. වැඩසටහන විකාශනය වෙද්දී ජාති භේදයෙන් තොරව හැමදෙනාම තමාට ස්තුති කළ හැටි ඔහුට සිහිවෙයි.

"දාපං අත.. උඹ ලොකු වැඩක් කළා.."

ප්‍රවීණ නිෂ්පාදකවරයා උදිත්ගේ අත ගත්තේය.

"තෑන්ක්යූ. මට නෙවේ ස්තුති කරන්න ඕනෑ මේ පිරිසට."

කැමරා ශිල්පීන් ඇතුළු නිෂ්පාදක කණ්ඩායම ද ඔහුට සුබ පැතූහ. දිනේෂ් උදිත්ගේ අතින් අල්වාගෙන පසෙකට ගියේය.

"දිනේෂ්, මචං මේ කට්ටියට පොඩි සංග්‍රහයක් කරන්න තියෙනවා."

"දූට්ස් ඕකේ.. ඒව ඔක්කොම ලොක්කා ඇරේන්ජ් කළා. මචං පැහැදිලිවම මෙන්න මේ වගේ ප්‍රෝග්‍රෑම් තමයි කරන්න ඕනෑ."

උදිත් එම තුතිය නිහතමානී ලෙස පිළිගත්තේය.

"මට උඹ පොඩි උදව්වක් කරන්ට ඕනෑ. පොඩි නෙමේ.. ලොකු උදව්වක්... මචං මට මේ කෙල්ලව ඕනෑ.."

උදිත් මිතුරා දෙස බලා සිටියේය. දිනේෂ් සැබැවින්ම ප්‍රතිභාපූර්ණ කලාකරුවෙකි. දිනේෂ් විසින් හඳුන්වා දුන් කලාකරුවන් රැසකි. නිර්මාණ කරුවන් හඳුනා ගන්න සැබෑ ඉවක් ඔහු වෙත තිබුණි.

"අපි ටෙලි නාට්‍යයකට හොඳ නිළියක් හොයමින් ඉන්නෙ. නිළිය නැති නිසා අපි ඒක නතර කරලයි තියෙන්නෙ. මෙන්න මේ



වගේ ෆිගර් එක තමයි මගේ ඔළුවෙ ඉන්නෙ. මට මේ කෙල්ලව ඕනෑ."

"මේ දේ කරන්න මට පුළුවන් වෙයිද දන්නෙ නෑ."

"බැරිවෙන්න විදිහක් නෑ. මට තේරෙනවා මේ අය උදිත්ගෙ සම්පතම හිතවතුන් බව. ඔයා කිව්වොත් අර ඔයා එක්ක සින්දු කිව්ව ලස්සන ගර්ල් දෙයි."

"මම තරමක් දන්නවා විතරයි. ඒ වගේ ඉල්ලීමක් කරන්න බෑ. ඔයාම කියන්න."

"හරි.. හරි.. අපි ඒ ගැන පස්සෙ බලමු. යමු තේ බොන්න."

සිසිල් පැන් සංග්‍රහය පිළියෙල කර තිබුණේ වැඩසටහන් නිෂ්පාදක තැන විසිනි. වෛත්‍යලිංගම් මහතාට හැම දෙනාගෙන්ම පැසසුම් ලැබෙමින් තිබුණි. චේතා උමා හා මව සිටියේ අසමාන සතුටින් යුතුවය.

"මගේ ජීවිත කාලෙ කවදාවත් මේ තරම් සතුටුවෙලා නෑ."

වෛත්‍යලිංගම් අවංකව කීවේය.

"මේ හැම දෙයක්ම ලැබුණෙ පුතා නිසයි. මම ඔක්කොටම වඩා කැමති වුණේ මුදියන්සෙ මහත්තයා කතා කළ එකට."

"අප්පා අපි සර්ට තෑන්ක්ස් කරන්ට ඕනෑ."

චේතා පිළිතුරක් නොදී නිහඬව සිටියාය. ඇත්තටම තමා අද මුහුණ දුන්නේ අපූර්ව සිදුවීමකටය. කිසිදාක රූපවාහිනී මැදිරියකට ගොස් තිබුණේ නැත. එසේම මෙය සැබැවින්ම නව අත්දැකීමකි. මීට ඉහත මෙම සතුට ලබා නැත. උදිත් තමා සමඟ ගී ගැයූ හැටි මතකය.

වැඩසටහන නිම වූ පසු ඔවුහු නිවස බලා ගියහ. නිවසට පැමිණි සැණින් පිළිතුරු දුන් දුරකථන ඇමතුම් ඉමක් කොනක් නැත. උදිත් පැමිණ සිටීම නිසා සිතට පිවිස තිබුණේ සතුටකි.

"ලංකාවේ හැම දෙනාම ප්‍රෝග්‍රෑම් එක දැකලා."

වෛත්‍යාලිංගම් අසුන් ගනිමින් කීවේය.

අම්මට, අප්පට, නංගිට හා තමට අද අවිවේකී දවසකි. දස දෙසින් ස්තුති පූර්වක දුරකතන ඇමතුම් එයි.

"මම යන්නම්."

උදිත් අසුනින් නැගී සිටිමින් කීවේය.

"බෑ..බෑ.. අද දවල් කෑමට ඉඳල යන්න ඕන."

චේතා කීවාය. නාද වූ දුරකථනය චේතා අතට ගත්තාය. ඇයට උදයන්ගේ කටහඬ හඳුනා ගැනීමට ගත වූයේ මොහොතකි.

"කපල් එක ලස්සනට කිව්වා. ඒවායින් වැඩක් නෑ. යාපනේ යන්න ලෑස්ති වෙනවා.

# 22

එම ඇමතුම ලැබුණේ උදයන්ගෙනි. එම තැනැත්තාගේ කතාවෙන් පසු පෙරවරුවේ පැවැති සතුටට නැතිව ගියේය. කලාවට සමීප පවුලක් ලෙස සිටිය ද ජීවිතයේ කිසිදාක මෙවන් සතුටක් ලබා නැත. රූපවාහිනී වැඩසටහන ප්‍රචාරය වෙමින් තිබියදී ජාති භේදයකින් තොරව කලා ලැදි ප්‍රේක්ෂකයන්ගේ ප්‍රතිචාර ලැබුණු හැටි සිහි වෙයි. ඒවා කොතරම් ප්‍රිය ද හෘදයංගමද? ඉන් ලද සතුට මෙතෙකැයි කිව නොහැක. තමා පමණක් නොව, සැමෝම එකාවන්ව ඒ සතුට අත් විඳි හැටි සිහිවෙයි. එහෙත් එක් දුරකථන ඇමතුමකින් එම සතුට බිඳී ගිය හැටි පුදුමය. දිවා ආහාරයට



නොසිට ඔහු යන්නට ගියේය.

ඇය රිසීවරය තබා උදිත් සමඟ ගේට්ටුව අසලට ගියාය.

"මම යන්නම්."

"ආයෙ එන්නෙ..?"

ඔහු සිනාසුනා විනා පිළිතුරක් දුන්නේ නැත. ඇගේ මුහුණ අඳුරින් පිරී තිබෙනු ඔහු දුටුවේය. මීට විනාඩි කිහිපයකට ඉහත ඇය පසුවූයේ සැබෑ සතුටකින් යුතුවය. එහෙත් එය දැන් අතුරුදහන්ව ඇත. එයට මූලික වූ හේතුව දනී.

"උදයන් කතා කළා නේද?"

ඇය පිළිතුරක් නොදී මද වේලාවක් සිටියාය. දෙනෙතේ නැඟුනු කඳුළු දෙකම්මුල් ඔස්සේ රූ රා වැටෙන්ට විය. ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය. ගේට්ටුව අසල බිත්තියට පිටදී සිටගත් ඈ බිම බලා ගත්තාය.

"නාඩා ඉන්න."

"ඒ මනුස්සය කතා කරන දේවල්වලට බයත් හිතෙනවා. මාව එක්කගෙන යන්න හදනවා."

"ටික දවසකට මේ පරිසරයෙන් වෙන් වෙලා ඉන්න කැමතිද? අප්ප මොකද කියන්නෙ..?"

"එයා ඉන්නෙ බයවෙලා. අපේ ප්‍රශ්න පිට අයට කියන්න එපා කියනවා."

"කාටවත් හොයන්න බැරි තැනකට වෙලා ඉන්න. මම ඔයාට ආරක්ෂාව දෙන්නම්."

"අප්ප කියන්නෙත් ඒකයි. ඒත් හැමදාම ඒ දේ කරන්න පුළුවන්ද උදිත්..? මෙන්න අප්ප එනවා."

වෛත්‍යාලිංගම් ඔවුනකරට පැමිණ උදිත් දෙස බැලුවේය.

''පුතා මේ ප්‍රශ්නය ගැන දන්නවා ඇති. මේ ළමයින්ගෙ වැඩ නිසා පවුලම කරදරේ වැටිලා.''

ඔහු ප්‍රශ්නයට මැදිව කීවේය.

කතාව සත්‍යයකි. ත්‍රස්තවාදයට සම්මත ක්‍රමයක් නැත. අද දිවිනසා ගැනීම සඳහා ඉදිරිපත් කරන්නේ ගැහැනු හා දරුවන්ය. ඕනෑ කෙනෙක් නොමග යැවීම අපහසු නැත. පුනරුත්ථාපනය කිරීම පහසු නැත.

''පවුලටම මරණ තර්ජන ඇවිදින් තියෙනවා. උදයන් මටත් තර්ජනය කළා.''

''අපේ ගමට යමු.''

උදිත් යෝජනා කළේය.

''අපිට නම් දූන් ජීවත් වුණා ඇති. මට බය මේ දරුවො දෙන්න ගැනයි.''

''හිත දුර්වල කරගන්ට එපා.''

''ඒක තමා මම අප්පට කිව්වෙ. මාව මරා දම්මත් මේ නංගි ඉන්නෙ.''

''නවත්න ගන්නවා කතාව. ඔයාට මොනව හරි වෙලා අපි ජීවත් වෙලා ඇති වැඩේ මොකක්ද? උදිත් සර් කියන විදිහට අපි රහසෙ ඉන්න එක තමා හොඳ.''

''හැංගිලා ඉන්න පුළුවන්. ඒත් අපිව හොයාගෙන එයි.''

චේතා කීවාය.

''මම අපේ ගෙදර එක්කගෙන යන්නද?''

''බෑ.. බෑ.. මට බෑ.. මං නිසා ගෙදර අයටත් කරදර වෙයි.''

ඔවුන් හැම දෙනාම කැදබල ප්‍රශ්නයකට මැදිව ඇති බවක් ඔහු දනී. මිනීමරු කල්ලියක් රට තුළ ගැවසෙයි. වික දවසකට හෝ



සැඟවී සිටියොත් ප්‍රශ්නයේ මුහුණුවර වෙනස් විය හැක.

''එහෙම නම් මම දන්න හිතවත් ගැහැනු ළමයෙකුගේ කාමරයක නතර කරන්නද?''

''කොළඹද?''

''කොළඹ නෙවේ.. මිරිහානෙ. කැම්පස් යන ගර්ල් කෙනෙක්. අපේ නෑදෑයෙක්.''

චේතාලිංගම් පත්ව සිටියේ සැහෙන ප්‍රශ්නයකටය. විශේෂයෙන් ගැහැනු දරුවෙක් තමුන් නොදන්නා පිටස්තර තැනක නැවීමට පුළුවන් කමක් නැත. කවුරුත් නොදන්නා සිංහල පරිසරයක සිටීමේදී ප්‍රශ්න ඇතිවීමට පුළුවන. අවස්ථා ගණනාවක සිංහල දෙමළ කෝලාහල ඇති වූ හැටි චේතාලිංගම් දනී. මෙහි ප්‍රතිඵලය වූයේ කිසිම සම්බන්ධයක් නැති දමිළ වරුන්ගේ වටිනා ජීවිත නැතිවීමය. එම අත්දැකීම්වලට අනුව සැබැවින්ම සිතේ බියක් ඇතිවීම සාධාරණය. යම්කිසි ලෙසකින් සිංහල අය අසල සිටියදී ප්‍රශ්නයක් ඇතිවුවහොත් එය බරපතල ලෙස දරුවාට බලපෑමට පුළුවන.

''මට තේරෙනවා අංකල් හිතන දේ.''

''ඔව් පුතා. ප්‍රශ්න තියෙන එක ඇත්ත. ඒත් මෙයාව පිට කරන්නේ කොහොමද?''

''ඒ අයගේ අණට අකීකරු වෙන අයට දෙන දඬුවම් දන්නවා නේද?''

ඔහු හිස වැනුවේය.

''මේ ප්‍රශ්නය කාලයට බාර දෙමු. හැංගිලා ඉන්න කාලය ඇතුළත ප්‍රශ්නයේ මුහුණුවර වෙනස් වෙන්න බැරි නෑ.''

''අප්පා උදිත් සර් කියන කතාව ඇත්ත. අත්තං මෙහෙන් ගියොත් අපිට කවදාවත් දකින්න වෙන එකක් නෑ.

''මට මේ ගැන කිසිම දෙයක් කියන්න බෑ. මේවා අපි කරපු වැරදි නෙමෙයි.''

චේතා පිළිතුරක් නොදී බිම බලා සිටියාය. මෙම වැරදි චේතා හිතා මතාම ඕනෑකමින් කළ වැරදි නොවේ. වෙනත් පිරිස් ඔවුන්ගේ දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් අහිංසක පිරිස ඉත්තන් බවට පත්කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස සිදු කරන ලද ඒවාය.

''චේතාට දොස් කියන එක වැරදියි. එයා කිසිවක් තමුන්ගේ ඕනෑකමින් කළ දේවල් නොවන බව අපි කවුරුත් හිතන්න ඕනෑ.''

''දුව ඔයා මොනාද කියන්නෙ..?''

අම්මා ඇසුවාය.

''ගෙදර නැතිකම විතරයි වෙන්නෙ. පැයක් ඇතුළත හම්බ වෙන්න පුළුවන් දුරකට චේතාව එක්ක යන්නම්.''

''ඔව් අප්පා. යාපනේට ගිහින් නොදන්න ඉන්නවට වඩා මේ ඉඳීම හොඳයි. අක්කා ඔයාව බලන්න මම එන්නම්.''

ඇය බිම බලාගත්තේ දෙනෙත් කඳුළු පිරී තිබූ හෙයිනි. මීට ඉහත මේ සිතට සාහසිකව තිබූ හැටි මතකය. එක්තරා කාන්තා කණ්ඩායමක නායකත්වය දරූ තමා කිසි ලෙසකින් වත් දුර්වලව නොසිටි හැටි මතකය. අද තමාගේ සිත උමාගේ සිතටත් වඩා දුර්වලව ඇති සැටි සිහිවෙයි.

''ගෙදර හැම දෙනාම දුන් හොඳින් පරිස්සම් වෙන්න ඕනෑ.''

උදිත් අවවාදයක් වශයෙන් කීවේය.

ශෛලතාලිංගම් හිස වනා එය අනුමත කළේය.

''මම චේතාට ආරක්ෂාව ඇති තැනක් හොයන්නම්. හැබැයි ඉන්නෙ කොහේද කියන එක කාටවත් දන්වන්ට එපා.''

ඔහු වෙන්ව යන අවසන් මොහොත දක්වාම චේතා උදිත් සමඟ රැඳී සිටියාය.



''මාත් එක්ක යන්න එනවද?''

''ඔව්..''

''ඔයාට මාව විශ්වාසද?''

''ඔව්. මගෙ ජීවිතයටත් වඩා.''

ඇය කඳුළු පිරී දෙනෙතින් යුතුව කීවාය.

''මට මැරෙන්න ඉඩ දෙන්න. මා නිසා ඔයාටත් කරදර වෙන්න සිදුවෙයි.''

''ඔයා බයවෙන්නැතුව ඉන්න.''

''කියන දේ අහන්න. තවත් කෙනෙකුගෙ කටයුත්තක් ගැන වෙනත් කෙනෙක් සෙවිල්ලෙන් ඉන්නවා. ඒ බව එම තැනැත්තා දන්නෙ නෑ. මාව මරන්න මෙලහටත් එවලා ඇති.''

ඔහු චේතාගෙන් සමුගෙන මාවතට බැස්සේය. ඉතුන් යුගයේ සිදුවූ මනුෂ්‍ය ඝාතන පසුපස සිටින පිරිස අල්ලා ගැනීමට පොලිසිය අපොහොසත් වී ඇත. ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ ත්‍රස්තවාදයට තැනක් නොතැනක් නැතිකමය. කිසියම් මොහොතක ඇයට මාරාන්තික තර්ජන එල්ල විය හැක.

උදිත් බොහෝ දෙනෙකුගේ කතා බහට ලක්වූයේ ඉදිරිපත් කළ වැඩසටහන නිසාය. වඩාත් සතුටට පත්ව සිටියේ වැඩසටහන නිෂ්පාදකවරයාය. මේ හැම දෙයක්ම සිදුවූයේ ඔහුගේ දක්ෂතා නිසා යැයි හෙතෙම උදම් ඇනුවේය. උදිත් මේ පිළිබඳව කිසිවක් කීමට ගියේ නැත. මොන යම් විදිහකින් හෝ ඔහු දුන් සහාය අගේ කළ යුතුය. රැකියාව ආරක්ෂා කර ගැනීමට හැම උත්සාහයක්ම දැරිය යුතුය. ජනක තමා අසලට පැමිණි බව වත් උදිත් දැන සිටියේ නැත.

''ඉහළ ප්‍රතිචාර. දාපන් අත.''

ජනක උදිත්ගේ අත අල්වා ගනිමින් කීවේය.

''එක වැඩසටහනකින් අපිටවත් මෙ විදිහට ඉහළට එන්න බැරි වුණා. ඒත් ඔයා දිනුවා. මොකද දුකින් වගේ..''

''පොඩි ප්‍රශ්නයක් ජනක... බැරිද කෙල්ලෙකුට නතර වෙන්න තැනක් හොයාගන්න.''

''ප්‍රශ්නයක් නෑ.. දෙන්නම්.. හැබැයි මගේ කාමරේ.''

ඔහු උස් හඬින් සිනාසුනේය. නොබෝ වේලාවකින් උදිත් ජනකට සිය ප්‍රශ්නය කීවේය.

''කාමරයක් නෙමෙ.. හොඳ ගෙයක් හොයා දෙන්න පුළුවන්. ටවුමෙ නෙමෙයි. ගමට කිට්ටුව. හැබැයි පොඩි ප්‍රශ්නයක් තියෙනවා.''

''අපෙත් නම් කිසි ප්‍රශ්නයක් නෑ. වෙලාවට සල්ලි දෙන්නම්.''

ඔහු මද වේලාවක් නිහඬව සිටියේය.

''තනි කෙනෙකුට නම් දෙන්නෙ නෑ. කසාද බැඳපු ජෝඩුවකට නම් නියම තැනක් තියෙනවා.''

''කොහෙද?''

''පිට කෙනෙක්ගෙ නෙමේ.. ලොකු මාමගෙ ගෙදර. ලොකු මාමා ඕස්ට්‍රේලියාවෙ ගිහින්. ආච්චිගෙ තනියටත් එක්ක විශ්වාසවන්ත කෙනෙක් හොයන්නෙ. කාටද හොයන්නෙ..?''

''කාටවත් නෙමේ මට. හැබැයි තවම බැඳලා නෑ.''

''ආච්චිට බැන්ද නොබැන්ද එක ප්‍රශ්නයක් නෑ. බැඳපු ජෝඩුවක් බව පෙන්නන්න ඕනෑ. එහෙම නම් උඹට හැමදාම වුණත් ඉන්න පුළුවන්.''

''බැන්ද වගේ ඇක්ට් කරන්නනෙ. ඒක දනුත් කරනවනෙ..''

ඔහු සිනාසුනේය.

''ප්‍රශ්නය මේකයි. ආච්චි අම්මා ලව් කේස්වලට කැමති නෑ.



අපේ පළාත්වල ඕනෑ තරම් කාමර කුලියට දෙන්න පුළුවන්. උන්ට දූන්නොත් නාඩගම් නටන්න පටන් ගනීවි. කවද්ද එන්නෙ..?''

''කෙල්ලට ගිහින් කියන්නත් එපායැ.''

''හැබැයි පුතෝ කොලේ ඉරා ගන්න නම් එපා. මාමා මට කිව්වෙ කවුරුහරි ආච්චි අම්මගෙ ආරක්ෂාවට කෙනෙක් හොයල දෙන්න කියලයි.''

''කිසිදේකට බයවෙන්න එපා. මටත් ඕනෑ මේ වගේ හොඳ තැනක් තමයි. කෙල්ලගෙ පේරන්ට්ස්ලත් කැමති වෙයි.''

''මේ ප්‍රශ්නෙ මඟහැරිලා යනකල් හස්බන්ඩ් ඇන්ඩ් වයිෆ් විදිහට ඉන්න වෙයි කියල කිව්වම හරි.''

''ඒ කෙල්ලව ආරක්ෂා කර ගන්න ඕනෑ දෙයක් කරන්න කැමතියි.''

# 23

මේ හැම දෙයක්ම සිදුවූයේ අතිශයින් රහසිගතවය. පවුලෙන් පිට එම ප්‍රශ්නය දන්නා කෙනෙක් නැත. මිතුරා නැවතූ ලෙස ඔහුගේ අත්තම්මාගේ විශ්වාසය ආරක්ෂා කළ යුතුය. සියලු විස්තර ඔහු චේතාට දන්වා සිටියේ යන තැන, සැකය සහිතව ජීවත් වීමට නොහැකි බැවිනි.

''දැන් මම මොකද කරන්නේ..?''

''අපි සැක නොහිතෙන විදිහට ඉන්න ඕනි එච්චරයි.''

ඇය හිස සලා එය අනුමත කළාය.

"ඔයා එහෙ ඉන්න කොට මේ ඇඳුම ඇඳලා ඉන්න බෑ. ඔයා උඩරට සාරිය අඳින්න ඕනෑ.සිංහල කෙල්ලෙක් වෙන්න ඕන."

ඇය නිහඬව හිස වැනුවාය.

ගැහැනු මිනිසුන් වෙනස් වන්නේ ඇඳුමෙන් පැළඳුමෙන් පමණි හැඩරුව විසින් හා ආකෘතිය විසින් කවුරුත් එකය. භෞතික ලෙස සමානය.

සිංහල පිරිසක් මැද ජීවත් වෙද්දී ඒ සංස්කෘතික ලක්ෂණ අනුව ජීවත් විය යුතුය. සිංහල හා හින්දු සංස්කෘතික ලක්ෂණවලට අනුගත වීම එතරම් අසීරු කාර්යයක් නොවේ.

"මේ ළමයාට අනවශ්‍ය කරදරයක් තමා. අපි ළඟ හිටියොත් පැහැර ගෙන යනවා. එහෙම නැතිනම් මරලා දානවා."

වෛත්‍යාලිංගම් කීවේය.

ඔහු හිස වනා එය අනුමත කළේය.

"අංකල් මේ මම කරන්නෙ සදාචාර නොවන වැඩක්. ඒත් චේතාගේ ආරක්ෂාව වෙනුවෙන් අපිට මේ දේ කරන්න වෙනවා."

"පුතා පිළිබඳව අපට කිසි සැකයක් නැහැ. ටික දවසකට අපිට මේ දරුවා ආරක්ෂා කරල දුන්නොත් ඇති."

"චේතා පිළිබඳව සම්පූර්ණ ආරක්ෂාව සපයලා තියෙන්නේ. හැබැයි අංකල්ලට බලන්න වෙන්නෙ නෑ, අපි ගැන ඒ ගෙදර ඉන්න අම්මාට සැක හිතෙන්න පුළුවන්."

ඔවුනතර තරමක කසුකුසුවක් ඇති වුණි.

"ඔව්., අපි ගියොත් සැක හිතෙන්ට පුළුවන් තමා."

"අංකල් චේතා නැති වුණොත් මේ අය හොයනවා. ගෙදර අයගේ ගමන් බිමන් අපිට රහසින් හොයන්න ඔත්තුකාරයෝ ඉන්නවා. ඒ අයට මාවත් සැකයි. මම ඒ වගකීම බාර අරන් ඉන්නේ."

වෙන් වෙන මොහොත ළංවෙමින් පවතී. ඇය හැඳ සිටියේ සල්වාරියෙන් හෝ දෙමළ සාරියෙන් නොවේ. සුපුරුදු ලෙස දමිළ යුවතියක් ලෙස සැරසී සිටියේ නැත. එහෙත් ඇගේ පෙනුමේ තවත් වෙනස්කම් විය යුතුය. ඩෙනිමකින් සැරසී සිටි නිසා ඇගේ පුළුලුකුල මනාව පෙනුණි. හැඳ සිටි කාලවර්ණ ටීෂර්ටය නිසා ඇගේ ශ්වේත වර්ණ දේහය සිත් ගන්නා ලෙස මතුව තිබුණි.

නිහඬ රාත්‍රියේ ඇය දෙමාපියන් වැඳ සමුගන්නා හැටි ඔහු ඈතට වී බලා සිටියේය.

මේ වෙන්වන මොහොතේ ඇය මේ අයුරින් හඬාවි යැයි ඔහු සිතුවේ නැත.

ඇය විසින් මෙතෙක් කර තිබුණේ සාම්ප්‍රදායික ගැහැනියකට අයිති වූ කටයුත්තක් නොවේ. පැහැදිලිවම අවි දැරීමට සිදුවූයේ තම අවශ්‍යතාවයට නොවේ. මිනිසුන් විවිධ හේතූන් මත අවි දරති. පැහැදිලිවම අවි අතට ගත්තේ සිය අයගේ ආරක්ෂාව වෙනුවෙනි. රටක ජාතික ආපදාවන්හිදී අවි දරති. පාතාලයේ ගැටුම් උග්‍රවන්ම කිසි විචාරයක් නැතිව අවි දරති. ඇතැම්හු මෝඩ කමට සටන් කරති. අද මෙය ජාතික ආපදාවකි.

තවත් මෙහි රැඳී සිටීම පැහැදිලිවම ඇගේ ජීවිතයට තර්ජනයකි. මොන යම් බැරෑරුම් අවස්ථාවක වුවත් දෙමව්පියන් ගැහැනු දරුවෙක් පිරිමියෙක් සමග යවන්නේ නැත. සැබැවින්ම එය විශ්වාස කළ නොහැක්කකි.

උදිත් අත් ඔරලෝසුව දෙස බැලුවේය. හැම දෙයක්ම කර තිබුණේ සැලසුමක් අනුවය.

මිතුරාගේ මෝටර් රිය පැමිණීමට නියමිතව තිබුණේ රාත්‍රී දොළහටය. රථය පැමිණ සංඥාව ලැබුණු සැණින් ඇගේ බෑගය අතට ගත්තේය.

"යමු.."

ඇය ආපසු බලමින් දුවවිත් රථයේ පසුපස අසුනේ ඉඳගත්තාය.

මේ හැම දෙයක්ම සැලසුම් කර තිබුණේ රහසිගතවය. ඇය සිතා සිටියේ උදිත්ගේ කාමරයට කැඳවා ගෙන යතැයි කියාය. එම බෝඩිම ඇතුළේ සැඟවී සිටීමට පුළුවන. මෙහි සිටියහොත් පැයකට හෝ අම්මාට අප්පාට තමා හමුවීමට ඒමට පුළුවන. එසේත් නැතිනම් වරින්වර අම්මා අප්පා දකීමට හැකි වනු ඇත.

රථය ඉදිරියට ඇදී යයි. කිසිවක් වටහාගත නොහැකි වූයේ පරිසරය හොඳත් හෙයිනි. සෑහෙන වෙලාවකට පසු එක්තරා නිවසක් ඉදිරිපිට රථය නතර කරනු ඇය දුටුවාය.

''එන්න..''

ඔහු මෘදු ලෙස අල්වා ගනිමින් කීවේය.

ඇය ඔහුගේ අත අල්වාගෙන ගියේ මීට වඩා විශ්වාස කළ හැකි අයෙක් නැති හෙයිනි. නිවස අභ්‍යන්තරය විදුලි පහන් ආලෝකයෙන් තිබෙනු ඇය දුටුවාය. නිවස සිට යුවල ඔවුන් ආදරයෙන් පිළිගත්හ.

''මේ ඉන්නෙ චේතා..''

''හෙලෝ..'' චේතා ඇගේ අත ගත්තාය.

''එහෙනම් ඔහොම කාමරයට එන්න.''

උදිත්ගේ මිතුරිය ඇය කාමරයට කැඳවාගෙන ගියාය.

''මේ හැට්ටෙ හරි නේද බලන්න.''

''ඇයි මේ..?''

''ඔයාව උඩරට මනමාලියක් කරන්න.''

මිතුරිය කීවාය. ඇයගේ කතාව නිසා තරමක තැති ගැන්මක් සිතේ ඇති වුණි. ඔහු ඇත්තටම තමා විවාහ කර ගැනීමට සූදානම්



වෙනවාද? එවන් අදහසක් ඔහු වෙත තිබූ බවක් සිතා ගැනීමට අසීරුය.

මනමාලියක් වීමට අවශ්‍යව තිබුණි නම් එය තමාට පැවසිය යුතුව තිබුණා නේද? සියලුම ඇඳුම් පැළඳුම් සූදානම් කර තිබීම පුදුමය. යාපනේ උපන් චේතා වෙතාලිංගම් උඩරට මනාලියක් කිරීමට ගත වූයේ මොහොතකි. මාල හතක් පළඳවා නළල්පට බැඳ සම්ප්‍රදායික මනාලියක ලෙස සූදානම් කරද්දී ඇය නිහඬව සිටියාය. මේ තුහුරු රංගනයේ යෙදෙන විට කොහේදෝ නැති සතුටක් සිතට පිවිසුනි.

තමා මෙම කාමරයට ඇතුල් කර ගිය පසු උදිත් කවම නැත. මොහෝ පිරිමි මෙම උපක්‍රම මගින් කරන්නේ ගැහැනිය නිරුවත් කිරීමය. ඔහු කළේ තමාව වෙනත් සංස්කෘතියකට බද්ධ කර ගැනීමය. බලා සිටිද්දී තමා පැහැදිලිවම තමා නොවන බව පෙනේ.

දැන් තමා වෙතාලිංගම් හා සාවිත්‍රීට දාව වාවකච්චේරියේ උපන් චේතා වෙතාලිංගම් බව කිසිවෙකුට කිව නොහැක.

''වෙරි බියුටිෆුල්. උඩරට මනාලියක්ම තමා.''

මිතුරිය ඇගේ දෙකම්මුල් සිප ගත්තාය.

''මම අන්දවපු ලස්සනම මනමාලි.''

''තැන්ක්යූ වෙරිමච්.. කෝ..?''

''උදිත්ද? එන්න පෙන්නන්න.''

තමා සැබවින්ම අද මනාලියකැයි සිතේ. වෙස් තැලුමට බඳින උදාර වූ වෙස් තට්ටුව මෙන් මනාලියකට මේ මංගල ඇඳුම ජීවිතයේ එක්වරක් ඇඳිය හැකි වාසනාවන්ත භූෂණයකි. ජාති ආගම් කවර සංස්කෘතියක වුවද මෙය ගැහැනියකගේ ඇඳුමකි. වැදගත් ලෙස සැරසී ඉදිරියට යා නොහැකි බවක් ඇයට දැනුණි.

මිතුරිය සමඟ ඉදිරියට යද්දී වීඩියෝ කැමරා හා කැමරා කිහිපයක් දල්වෙනු දුටුවද ඇය කැලඹුනේ නැත.

සාලයට එන කැනැත්තා දකිමෙන් ඇය කිගැස්සී සිටියාය.

උඩරට නිලමේ ඇඳුමින් සැරසුණු උදිත් එතු දුටු ඇයට සතුට අදහාගත නොහැකි වුණි. එම පෞරුෂය සිත් ගන්නා සුළුය.

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය. ඒ වන විටත් කැමරා ක්‍රියාත්මක වෙමින් තිබුණි.

"මාව වරදවා තේරුම් ගන්න එපා. මේක රඟපෑමක් විතරයි."

ඇය සිනාසුනා මිස කිසිවක් කීවේ නැත.

මේ සිදුවීම ඇයට පහදා දිය යුතුය.

"අපි බැඳපු ජෝඩුවක් කියල මගෙ යාළුවගෙ අම්මට කියලා තියෙන නිසා මඟුල් ෆොටෝ එකක් අවශ්‍යයි."

ඇය කිසිත් පැවසුවේ නැත.

නිවසේ තැබීමට මංගල ඡායාරූප ගැනීමෙන් පසු දෙදෙනාගේ සාමාන්‍ය ඇඳුමින් ඡායාරූප ගැනුනි.

සුබ නැකතින් නිවසට පිවිසෙන යුවල දෙස උඩුරාවණ මැතිනිය බලා සිටියාය. දැන් හැදෙන තරුණියන් ඉහළටත් නැති පහළටත් නැති ඇඳුම් අඳින තරුණ ගැහැනුන්ට වඩා මේ කෙල්ල හොඳ යැයි එකවරම සිතුණි.

වතුර පිර වූ කලයක් හා මල්වට්ටියක් රැගෙන නිවසට පිවිසෙන යුවල ඇගේ සිත් ගත්තාය. දුටු සැණින් නෙත ගියේ ගැහැනියගේ අග පසඟ වෙතය. හරියට කහ අත්ත වගේ පාටයි. ඇගේ කිසි අඩුපාඩුවක් නෑ. රත්තරනින් වාත්තු කලා වගේ.

සැහෙන කාලෙකින් මෙච්චර ගැළපෙන ජෝඩුවක් ඇය දුටුවේ නැත. අපේ පුත්තු බැන්දේ හරියට ඇඟක් නැති ගෑනු. ලොකු පුතාගේ බාලයා ප්‍රංශයෙන් හෝ ඕලන්දයෙන් ගෑනියෙක් ගෙනා හැටි මතකය. හිටියතාක් කල් හිටියේ බාගෙට හෙලුවැල්ලෙනි. පුංචි දරුවො අඳින තරමෙ ජංගියක් ඇඳ පිරිමි සමඟ හරි හරියට අරක්කු බොන හැටි ඇය දුක ඇත. මෙත්තානන්දගේ පොඩි එකා දුම්වැටියක් උරන්නේ වත් නැත. සුද්දි එකක් නිවෙන්නට එකක් පත්තු කරගනී. කොතරම් අසංවරව



හිටියේ ද යත් ඉන්න කාලය ඇතුළත කවදාවත් යටට බොඩියක් හැඳ සංවරව ඉන්නවා දුක නැත.

බුදුන්ට දෙමව්පියන්ට මල් පහන් පුදා ප්‍රථමයෙන්ම කළේ උඩුරාවත මැතිනියට වැඳීමය. එසේ වඳිද්දී ඇගේ දෙනෙත් කඳුලෙන් පිරී ගියේ ඇය නොදැනුවත්වමය.

හැදූ දූ පුතුන් අද ලංකාවේ නැත. අවුරුද්දකට බුලත් අතක් දී වඳින්නට කෙනෙක් නැත. අවුරුද්දට ලොකු පුතාගෙන්, පොඩි පුතාගෙන් හා දූවගෙන් සුබ පැතුම් පත් ලැබෙයි. අවශ්‍ය මුදල් ලැබෙයි. ඒ කාගෙවත් මුදල් නැතත් මිය ගිය සැමියාගේ විශ්‍රාම වැටුප හා වත්තේ ආදායම ජීවත් වන්නට හොඳටම ප්‍රමාණවත්ය. පොල් කැඩීමට එන වික්ටරයා පොල් හොරකම් කරන බව ඇය දනී. යල කන්නයට කුඹුරු වගා කරන ගොවීන් අඳය ගෙනත් දෙන්නේ වංචා කරමිනි.

ගෙදර වැඩට එන සිරිමා මොනවා හෝ දෙයක් ඉණේ ගසාගෙන යන හැටි දකී. අවසානයේ කවුරුන් හෝ හිතවත් කෙනෙකුට ගෙයින් කොටසක් කුලියට දීමට සිතුවේ හදිසියෙන් රැයකට අමාරුවක් වුණොත් කෙනෙක් නැති හෙයිනි.

වේතා පහත් වී දෙපා වැන්ද පසු උඩුරාවත මැතිනිය ඇගේ දෙකම්මුල් සිප ගත්තාය.

"ආත්තම්මා අපි දෙන්නා රූපවාහිනියෙ එකට වැඩ කරනවා දකින්නත් ඇති."

"ඔය උදේට බණ ටිකක් අහනවා ඇරෙන්න අනිත් වැඩසටහන් බලන්නෙ නෑ. එතකොට මේ දූව.."

"ආත්තම්මා මෙයා කැම්පස් සිලෙක්ට් වෙලා ඉන්නෙ. ඒ වුණාට බැන්දයින් පස්සෙ යන්නෙ නැති වෙයි."

"මේ පුතා එපා කියන්න ඇති. අපේ රාළහාමිත් එහෙමයි. ගෙදරට ආපු ගුරු රස්සාවට ගියේනෑ. ඒ නොගිය කියලා වරදක් වුණේ නෑ. මම ගෙදර ඉඳන් දරුවො හදා ගත්තා."

''චේතා.. ඇතුළට ගිහින් ඔයාගෙ කාමරේ බලන්න.''

''මම මේ ගෙට කවුරුවත්ම ගන්නෙ නෑ. ඔයගොල්ලන්ගෙ ගෙදර කියලා හිතාගෙන හොඳින් ඉන්න. ඇතුළට යන්න.''

උඩුරාවණ මැතිනිය කීවාය.

චේතාගේ සිතේ වූ බිය තුරන්ව ඇත. සටන් බිමකදී සිදුවන හානිය තීරණාත්මකය. පිරිමියෙක් සමග පැමිණි මෙම ගමන අතිශයින් බියකරුය. අද බොහෝ තරුණියන්ගේ ගැහැනුන්ගේ ජීවිත විනාශ වන්නේ තමා විසින් ගන්නා ලද තීරණ අනුවය.

අප ඇසුරට දිගු ඉතිහාසයක් නෑ. අපි කලක් එකිනෙකට වෛර කරමින් ජීවත් වුණා. කිසිසේත් තදබල විශ්වාසයක් ගොඩනැගීමට පසුබිමක් තිබුණේ නෑ. දුක්ක නිමේෂයේදීම අප සිත් යාවුණු හැටි පුදුමයි. ආදරය එක් අතකින් ආත්මාර්ථකාමියි. මම අනුන්ට හිමි වෙන්න ගිය කෙනෙක් උදුරා ගත්ත කෙනෙක්. ඒකයි මගේ ආත්මාර්ථකාමීත්වය කියන්නේ. දෙසැම්බුල් මස්සේ කඳුළු ගලා ආවේ ඇය නොදැනුවත්මය. අඬන්නට හේතු නැතුවාම නොවේ.

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය.

''පොරොන්දු වෙන්නම් ඔයාට මගෙන් කිසි කරදරයක් වෙන්නෙ නෑ. නාඩා ඉන්න.''

''ඇයි මා වෙනුවෙන් මෙච්චර කරදර වෙන්නෙ. මම කිසිම වටිනාකමක් නැති කෙනෙක්.''

''කිසිම විදිහකින් අපි දෙන්න ගැන වැරදි වැටහීමක් ඇතිවෙන්න බෑ.''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''කවද්ද අපේ මගුල් ෆොටෝ එක හම්බ වෙන්නෙ.''

''ෆොටෝ ඇල්බම් එකක් හදන්න ඕන. එකක් රාමු කරන්න ඕන. නැතිනම් උඩුරාවණ නෝනා වරදවා තේරුම් ගනී.''

''උම්මාත් හිටියා නම් සන්තෝස වෙයි. දවසක එක්කරගෙන



එන්න බැරිවෙයිද?''

''මේක බොහොම රහසේ කරන්න ඕන දෙයක්. මේ අයගෙ බුද්ධි අංශය හරි ශූරයි. පොඩි ඉඩක් වැටුණොත් ජීවිතයෙන් වන්දි ගෙවන්න වෙයි.''

''මම කරල තියෙන්නෙ බලවත් වරදක්.''

'ඒ අය අද ප්‍රබලයි. ඒත් උතුරු නැගෙනහිර සියලුම දෙමළ අයගේ නියෝජිතයා ඒ අය නෙවේ. ඒ වගේම දෙමළ කතා කරන මිනිසුන් වෙනුවෙන් පෙනී ඉන්න කිසිම අයිතියක් නෑ.''

''නෑ මම කිව්වෙ මේවා අපි කැමැත්තෙන් ගත්ත තීරණ නෙවේ. මේ වගේ තීරණ ගන්න අපිව මෙහෙයෙව්වා.''

''හරි හරි ප්ලීස්. ඔය ඇඳුම මාරු කරගෙන එන්න.''

ඔහු කාමරයෙන් පිටත එමින් කීවේය.

චේතාගේ ආරක්ෂාවට වෙනත් තැනක් සොයා ගන්නා තෙක් මෙහි නතර වීමට සූදානම්. එය මීට ඉහත උඩුරාවන මැතිනියගේ මුනුබුරා කලක් නැවතී සිටි නිදන කාමරය වෙයි. යුවලකට අවැසි සියලු පහසුකම් කාමරයේ තිබුණි. යුගල ඇඳක් කණ්නාඩි මේසයක්, ඇඳුම් අල්මාරියක් වශයෙන් වූ මූලික අවශ්‍යතා සම්පාදනය වී තිබුණි. කාමරයෙන් එළියට එද්දී මිතුරා පත්‍රය බලමින් සිටිනු උදින් දුටුවේය.

''යමු පොඩ්ඩක් එළියට..''

ඔහු ජනකගේ අතින් අල්වාගෙන එළියට ගියේය. පරිසරය සැබෙවින්ම සිත්ගන්නා සුළුය. අක්කර තුනක් පමණ වූ පොල්වත්ත කෙළවර වන්නේ වෙල් යායකිනි.

ඔවුහු නිහඬව ඉඩම කෙළවර වූ නාන ළිඳ තෙක් ගමන් කළේය. කලක් තිස්සේ වැඩුණු පුවක් අරඹකින් ආවරණයවූ නාන ළිඳේ වතුර නිල් කැටියක් මෙන් බැබලෙමින් තිබුණි.

''ආත්තම්මට අහුවෙයිද?''

''එහෙම නොවීම තමා තමුන්ගේ දක්ෂතාවය. ආත්තම්මට හෙන සැටිස්.. චේතාව හෙනට හිතට අල්ලලා.දී

ඔහු පිළිතුරක් නොදී නිහඬව සිටියේය.

''කොහොමද මචං අපි එක කාමරේක නිදන්නෙ.''

''ඔය අලි ඩබල් බෙඩ් එකක් තියෙන්නෙ. ඒක මදිද?''

''ඈඳේ ප්‍රශ්නෙ නෙවේ කිසිම සම්බන්ධයක් නැතිව මම කොහොමද කෙල්ලෙක් එක්ක කාමරේ නිදන්නෙ.''

''මළකෙළියයි. මාත් ඒක එච්චර හිතුවෙ නෑ. හැබැයි පුතේ.. දෙන්න කාමර දෙකක නිදන්න නම් හිතන්න එපා. ආත්තම්මට සැක හිතුණොත් වැඩේ ජෝන් බාස්ට යයි.''

# 24

දිවා ආහාරය ප්‍රණීත ලෙස පිළියෙල වී තිබුණි. උදිත් සිතා සිටියේ යාබද නගරයේ හෝටලයකින් කෑම ගෙන්වා ගැනීමටය. එහෙත් ජනක සේවිකාව ලවා කෑම පිළියෙල කර තිබුණි.

චේතා සූදානම්ව සිටියේ පීතවර්ණ ගවුමකිනි. ලස්සන ගැහැනුකම තීව්‍ර ලෙස මතුව තිබෙන හැටි උඩුරාවන මැතිණිය දුටුවාය. ගැහැනු ඉපදෙන්න ඕනෑ මේ විදිහට තමා.

''ඔසරියට වඩා වීතරත් නෙමේ ගවුමටත් ලස්සනයි..''

දරුවන් නිවසේ ගැවසුනු කාලයේ වූ සතුට කලකට පසු ඇය වින්දාය.



දිවා ආහාරයෙන් පසු ඔවුහු එළියට ගියහ.

''අපි අත්තම්මාට දෙන්නෙ කීයද කියල කතාකරගත්තෙ නැතෙ..''

මාමලා කියල එව්වෙ ආච්චිට ආරක්ෂාවට හොඳ පවුලක් හොයා දෙන්න කියල විතරයි.

''ඒත් ඒක හරිනැහැ. අපි මෙහෙ නතර වෙලා ඉන්නවට කීයක්වත් ගෙවන්න ඕනෑ.. ජනකනෙ මේක කතා කරල දුන්නෙ.. ඔයාම අහන්න.''

''ආත්තම්මට සල්ලිවලින් ප්‍රශ්නයක් නැහැ. මාමල එවනවා, කීයගෙ පැන්ෂන් එක හම්බ වෙනවා, වත්තෙ පොල්, කුඹුරුවල හාල් තියෙනවා. අපිට වැඩිය සල්ලි අත්තම්ම ළඟ තියෙනවා..''

උඩුරාවණ මැතිණිය ඔවුන් කතාකරමින් සිටියදී එළියට ආවාය.

''මොකද මනමාලි කියන්නෙ..?''

''එයා කැමතියි ආත්තම්මා. අපිට මෙතන හොඳ වැඩියි කිව්වා.''

''සුද්දිට නම් මේ කාමරේ හොඳ මදිවෙලා යනකල්ම හිටියෙ නුවර එළියෙ, හික්කඩුව, ගාල්ල හෝටල්වල. මේ දූට්ටි හරි හොඳයි.. දක්කම ආදරේ බෑ..''

''ආත්තම්මෙ මේ උදිත් කාමරේට කීයද අහනවා..''

ඇය සිනාසුනා විනා කිසිවක් කීවේ නැත.

''මට උඹලගෙන් සතයක් වත් ඕන නෑ දරුවනේ.. ඔය තියෙන දෙයක් කාල හිටපල්ලා. මට ඕනෑ තරම් සල්ලි තියෙනවා.''

ඔහු සිනාමුසු මුහුණින් යුතුව එම ඉල්ලීම පිළිගත්තේය.

තවම උදිත්ගේ රැකියාව ස්ථිර නැත. සහන සේවා පදනම

යටතේ වැඩසටහනක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබී තිබුණි. ඉදිරිපත් කරන ලද වැඩසටහනේ නිපුණතාවය නිසා සිනමා උළෙලක නිවේදන කටයුතු පැවරී තිබුණි.

"අද ප්‍රෝග්‍රෑම් එකට යනව නේද..?"

ජනක ඇසුවේය.

"නොගිහින් බෑනේ.. ආත්තම්මට අදට දාල ගියොත් මොනව හිතයිද දන්නෙ නෑ.."

"අත්තම්මා මගේ රස්සාවෙ හැටි දන්නවා. මේක යා යුතුම ප්‍රෝග්‍රෑම් එකක්නෙ. බොරුවක් නෙමෙයිනෙ.. ලයිව් බලන්න පුලුවන්. දැන් කොහොමහරි යන්න ඕනෑ."

උදිත් නිහඬව කාමරය දෙසට ගියේය. තරුණියක් සිටින කාමරයකට එක්වරම පිවිසීමට පුලුවන් කමක් නැත.

"චේතා.. චේතා.. මම එන්නද..?"

ඇතුළින් ඇරයුම ලැබුණි. හෙතෙම කාමරයට පිවිසුනි. ඇය හිස ඔසවා උදිත් දෙස බැලුවාය. මෙය ජීවිතයේදී ගත් අභියෝගයකි. කවුරුත් නොදන්නා පරිසරයක සිටින චේතාට බියක් ඇත. එය පැහැදිලිවම සාධාරණ වූවකි. තම ජීවිතය ආරක්ෂාකර දීමට පිටස්තරයෙක් ඉදිරිපත්ව සිටී. තමා කරන ලද පව් පිට කෙනෙකුට බාරදීම යුතු නැත. එහෙත් ඔහු ඉදිරිපත් වූ හැටි..

"මෙහෙ හොඳයිද..?"

ඇය හිස වනා සිනාසුනාය.

"හොඳයි.."

"මට අද ප්‍රෝග්‍රෑම් එකක් තියෙනවා. ඒකට යන්නම වෙලා තියෙනවා. මම යන්නද.."

අයිති හැකි බලයක් ඇයට පවරා දීමෙන් කතා කිරීමට සිදුව ඇත.



"මාව ප්‍රශ්නයක් කරගන්න එපා. ඒ වැඩ කරගන්න.."

ඔහු ඇය අසලට ගියේය. පැහැදිලිව මතක්කර දිය යුතු කරුණක් ඇත. මිනිසුන් ජීවත්වීම සඳහා නොයෙක් වංචනික වැඩ කරති. මුලු රටම රජ කරන්නේ බොරු වෙති. දේශපාලනඥයන් ජනතාවට අනන්ත බොරු පොරොන්දු දෙති. විවිධාකාර වූ බොරු වංචා තිබුණත් ගැහැනු මිනිසුන් අතර සිදුවන අහිංසක ප්‍රයෝග ද වෙති. චේතාලිංගම් සිය දුව ආරක්ෂාකර ගැනීමට මෙසේ පිට කෙනෙකුට බාරදීම විශ්වාස කළ නොහැකි තරම්ය. අද මේ රටේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් වැනි ජාතීන් ත්‍රස්තවාදයට හසුව ජීවත්වෙති. ඇතැම්හු සරණාගත කඳවුරු වලය. බෙදුම්වාදී යුද්ධය නිසා අවතැන්ව සිටිති. කුරිරු යුද්ධය නිසා හැම මොහොතකම සැකෙන් හා බියෙන් ජීවත්වෙති. මේ වන විට කෝටි දෙකක ජනතාවක් සරණාගත කඳවුරුවල ජීවත් වෙති. කාම්බෝජය, ලාඕසය, වියට්නාමය, ලෙබනනය හා ගාසා තීරයේ බිම් බෝම්බ නිසා පාද අහිමිවූවන් දහස් ගණනකි. පොල්පොට් පාලන යුගයේ වූ සමූල ඝාතන මිනී වළවල් අද පොදු සිදුවීම බවට පත්වෙති.

වද හිංසා ගැහැනුන්ට සිදුවන ලිංගික අතවර මහා සිදුවීම ලෙස සැලකිය නොහැක. බාල වයස්කාර දරුවන් බලහත්කාරයෙන් යුද්ධයට බඳවා ගැනීම, තරුණ කාන්තාවන් නිවෙස් වලින් පැහැරගෙන යෑම් නිබඳවම සිදුවන්නකි. එසේ පැහැරගෙන ගිය එසේම කඳවුරු වලින් පලා ආ පිරිසට අනිවාර්යෙන්ම මරණය හිමිය. මිනීමරුවන් අතර සිටිනවාට වඩා තම හිතවතුන් අතර සිටීම දුවට ආරක්ෂාවකි.

චේතා වෙන්ව ගිය මොහොතේ සිට සැමවිටම පසුවන්නේ හැඬූ කඳුළෙනි.

"ඒ හමුදාවෙන් පැනල ආපු ඕන තරම් අය ඉන්නෙ.. බයවෙන්න එපා.."

උමා මව අස්වසනු රිසින් කීවාය. බාගෙදා ඒ කතාව සත්‍ය

විය හැකිය.

එම අය කණ්ඩායමවල එතරම් වැදගත් අය නොවන්නට නුපුලුවන. මෙහි භයානකම පක්ෂය වන්නේ චේතාට විරුද්ධව උදයන් සිටීමය. කිනම් මොහොතක හෝ පැහැරගෙන යාම ජීවිත හානි සිදුකිරීම වැනි කරදරයකට ඇයට සිදුවීමට ඉඩ ඇත.

''දැන් ඔස්ට්‍රේලියාවෙන් ලියුම එයිනෙ.. අපි වීසා අරන් සද්ද නැතිවය.''

උමා දෙමාපියන් සැනසීම සඳහා යළි යෝජනා කළාය. උදිත්ට මෙම වගකීම හැමදාටම භාරකළ නොහැකිය.

කෙසේ හෝ ඉක්මනින් ඔස්ට්‍රේලියාවට යැවීම සඳහා දැන්ම කටයුතු සූදානම් කළයුතුය.

''චේතා දැන්ම අපිට කතාකරන එකක් නැහැ. හැම තැනම මේ අය ඉන්න නිසා ටෙලිෆෝන් එක ටැප් කරයි කියලා සර් කිව්වා.''

සැඳෑ සමය වෙද්දී දැරිය නොහැකි තදබල පාලුවක් දැනුණි.

රාත්‍රී ආහාර පිළියෙලව තිබුණත් කෑමට තරම් ප්‍රිය බවක් නැත.

ටෙලිෆෝනය නාදවන හඬ ඇසුණු සැණින් උමා රිසීවරය අතට ගත්තාය.



# 25

''කවුද උමාද..?''

''ඔව් සර් උමාමයි..''

''මුකුත් විස්තර මගෙන් අහන්න එපා.. බබා සනීපෙන් ඉන්නවා.''

ප්‍රශ්න අතරෙදි වුවද ඇයට සිනාව වළකාගත නොහැකිවුණි.

''සර් බබා අඬනවද..?''

''මම බබාව නළවල කිරි පොවලයි ආවෙ..''

උමා බබෙක් පිළිබඳව කතාකරනු චේතාලිංගම්ට ඇසෙයි..

''සර් බබාව බලන්න මම ඉස්පිරිතාලෙට එන්නද..?''

''තවම මැනුම් කපල නෑ..''

යළි ඇය උස් හඬින් සිනාසුණාය.

''උමා මම දැන් ඉන්නෙ බී.එම්.අයි.සී.එච්. එකේ පිලිම් එවෝඩ් සෙරමනි එකක. ඒක බලන්න අම්මටයි අප්පටයි කියන්න..''

උදිත් සමුගත් පසු සාලයේ විදුලි පහන දැල්වූ උමා ටෙලිවිෂනය ක්‍රියාත්මක කිරීමට සූදානම් වුණි..

''එපා දුව.. ඕක ඕෆ් කරල දාන්න. අන්කන් නැතිව දුකින් ඉන්න එකේ දාන්න එපා..''

''උදිත් සර් දැන් බී.එම්.අයි.සී.එච්. එකේ එවෝඩ් සෙරමණි එකක ප්‍රසන්ටර් කෙනෙක් විදිහට ඉන්නවලු.''

ඒ පිළිබඳව දෙදෙනාගේම අනුමැතිය ලැබුණි. ඇගේ නෙත ගියේ නොබෝ වේලාවකට පසු ආරම්භ වූ උත්සවයත්

සිනමා පෙළහර වෙතය.

මල් කළඹකින් වර්ණවත් වූ පිධිකාවේ සිට සභා ගර්භයට අමතන ප්‍රතිභා සම්පන්න තාරුණ්‍ය ඇගේ සිත සසල කළාය.

මෙම සිදුවීම සිදුවුණේ අද නෙමේ. ගේට්ටුව අසල සිට දොරට ගැසූ හැටි මතකය. වේගයෙන් ගැසුවත් එයට තාලයක් තිබුණු හැටි සිහිවෙයි.

අප්පා එන තෙක් පුරා පැය තුනක් සිටි හැටි මතකය. කිසි අඩුවක් නැති පිරිමිකමක් දුටුවා නම් එය හිමි ඔහුටය. කාල, අරික්කාල පිරිමියෙක් නොවේ.. ගවුම් කලිසම හා ස්කිනිය හැඳ නටද්දී ඩාදියෙන් තෙත් වූ ශක්තිමත් බාහුව පෙනේ. දණ්ඩියමේ නටද්දී අප්පා තාලයට තැබීමට ගුරුහරුකම් දෙද්දී දැනුණු පිරිමි ස්පර්ශය මතකය.

නටද්දී නැටුමෙන් අනතුරුව විවේකයේදී තමා හා දොඩමලු වූ හැටි සිහිවෙයි. මුලදී අප අතර පැවතුනේ තදබල අමනාපයක්. පසුව අපි නොදන්නා කතාවක කොටස්කරුවන්ව සිටි හැටි උමාට සිහිවෙයි.

ප්‍රථමයෙන් ඔහු හැසිරුණේ මුහුත්ම නොදන්නා මැට්ටෙක් ලෙසය. ඉන්දියාවේ හාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලයේ ඉගෙන උපාධි ලැබ පාරම්පරික කලාකරුවෙක් බව ඇය දැන සිටියේ නැත. හිත උදුරා ගන්නා පිරිමිකම සිත මවිතයට පත්කළ බව නොකියාම බැරිය. සිත ඔහුගෙ දෙපා මුල තබා තිබියදී සිදු වූ විපත ඇයට සිහිවෙයි.

දමිළ විප්ලවවාදී සංගමයක සාමාජිකාවක් වූ චේතා මෙහි ආවේ බෙහෙත් ගැනීම සඳහාය. උදිත් නිවසට පැමිණීම පිළිබඳව චේතා දැඩි සේ විරුද්ධ වූ හැටි උමාට සිහිවෙයි.

උදිත් වැනි පූර්ණ කලාකරුවෙක් ජාතිවාදියෙක් නොවේ. තමා ඔහුගේ හොඳ ගතිගුණ පවසද්දී ඇය ඊට විරුද්ධ වූ හැටි ඇයට සිහිවෙයි.



මේ හැම දේකටම හේතු වූයේ ඇයට ඔහුගේ මනුස්සකමේ සුවඳ හඳුනා ගැනීමට ලැබීමෙන් පසුවය. විරුද්ධවාදිකම් දක්වද්දී වුවද ඇයට සෙත් පැතූ හැටි, පිරිත් සජ්ඣායනා කළ හැටි, ගමින් ගෙනා බෙහෙතට ඇය සුව වූ හැටි සිහිවෙයි.

චේතා නිවසට ආවේ මානසිකව ඇද වැටුණු කුරිරු ගැහැනියක ලෙසිනි. කුඩා දේකට පවා කෝපවන ඇය වරෙක හිත්දෙන් කෑගැසූ හැටි ඇය දනී. අප්පා හා අම්මා ඇය ගේ මානසික තත්වය හොඳින් දැන හැඳින සිටියාය. කොපමණ රණ්ඩු කළත් ඒ කිසිවක් නොසලකා ඇය සතුටින් තැබීමට සෑමවිටම උත්සාහ කළ හැටි සිහිවෙයි.

තමාට හිමිවන්නට තිබූ වටිනා සම්පත චේතා හිමිකර ගැනීම පිළිබඳව සිතට දැඩි දුකක් පිවිසෙයි. මානසික ලෙස මෙම සත්කාරය නොකළා නම් ඇය රෝගී වන්නට ඉඩ තිබුණි.

හැම දෙයක්ම සිදුවූයේ අනපේක්ෂිත ලෙසිනි. ගැහැනිය තම ජීවිත කාලය තුළ ද කළ නොහැකි පරිත්‍යාගය තමා විසින් කර ඇතැයි ඇයට සිතේ. හිතේ දරාගත නොහැකි දුකක් ඇත. එහෙත් කළ හැකි දෙයක් නැත.

කොහේදෝ නැති කඳුළක් දෙනෙත් වටකර ගත්තේය.

උදිත් නිවසට පිවිසි දිනයේම වෙන්ව යාම පිළිබඳව ඇගේ සිතේ තරමක් බියක් තිබුණි. මෙම නිවසේ නතර වීමට සිදුව ඇත්තේ විවාහක යුවළක් ලෙසිනි. උදිත් සරල ලෙස සැලකුවත් සැබැවින්ම මෙය බැරෑරුම් කටයුත්තකි. ජනකගේ අත්තම්මා ජීවත් වී පළපුරුදු ඇත්තියකි. විවාහක යුවලගේ නව විවාහක යුවලකගේ හැසිරීම් ඇගෙන් සඟවාලීමට පුලුවන්කමක් නැත. ඇය ඉදිරිපස වේවැල් හාන්සි පුටුවට වී මඟබලා සිටීම දිනචරියාවේ කොටසකි. ඔහු තමාව ගේට්ටුව අසලටම කැඳවාගෙන ගියේ ඇයිදැයි තේරුම් ගියේ පසුවය.

ආපසු එන තමා දෙස බලා ඇය සිනාසෙන හැටි චේතා

දුටුවාය.

චේතා ගේට්ටුව ගාවට ගියේ එය නොතකාය..

ඇය සිනාසුනා විනා පිළිතුරු දුන්නේ නැත.

''ඉස්සර රාළහාමි කච්චේරියට යනකොට මාත් හැමදාම මේ විදිහට ගේට්ටුව ගාවට යනවා.''

ඇය සිය අතීතය සැමරූ හැටි සිහිවුණි.

''පහයි හතලිහේ කෝච්චිය එනකොට මම ගේට්ටුව ගාවට යනවා එනකොට මම ගේට්ටුව ගාවට ගිහින් බෑග් එක ගන්නවා.''

ඇය කතා කරන්නේ අපට සිහිනෙන් පමණක් ස්පර්ශ කළ හැකි ජීවිතයක් ගැනය. ආදරයෙන් බැඳුනත් මෙවන් යුග දිවියක් ගැන සිහින මැවීමට නුපුලුවන. තමා වැනි දමිළ යුවතියකට උඩරට වලව්වක දොර විවෘත වෙතැයි කිව නොහැකිය. තමා අයිති නවත් දමිළ පුද්ගලයෙකුටය. ඉන් ඔබ්බට මේ සාම්ප්‍රදායික ජීවිතයෙන් මිදී ජීවත් වීමට පුලුවන්කමක් නැත. උඩරට මනාලියක් ලෙස සැරසෙද්දී සිතට අමුතු සතුටක් පිවිසුණි.

කාමරයට පිවිසි ඈ ඇඳේ වැතිරුණාය. කොපමණ සැඟව සිටියත් ඔවුන්ගෙන් මිදී සිටීමට නුපුලුවන.

අප්පා යෝජනා කළ පරිදි හැකි ඉක්මනින් ලංකාවෙන් පිටවිය යුතුය. පිටරට පදිංචියට ගියහොත් ඇතැම්විට උදිත්ව ද කැඳවාගෙන යාමට පුලුවන් වනු ඇත.

විදේශ රටක ඔහුට නතර වීමට හැකියාව තිබුණත් ඔහු වටින්නේ ලංකාවටය. තම පියා ද අයිති මේ රටටය. මේ යුගල ඇඳ හිමි දෙදෙනාටමය. එහෙත් එහි සැතපීමට දෙදෙනාටම අයිතියක් නැත.

රාත්‍රී ආහාර ගැනීමට සිටියේ ජනකගේ අත්තම්මා හා චේතා පමණි. චේතා කෑවේ රතු හාල් බත් කටවල් කිහිපයක් පමණි.



''ඇයි මහත්තයා නැති නිසාද..?''

ඇය පිළිතුරක් නොදී සිනාසුනාය.

''යමු.. දූන් පුතා ඉන්න වැඩ සටහනක් යනව නේද..?''

''ඔව්..''

ඇය පහත් හඬින් කෙඳිරුවාය.

උදිත් තමාගේ තුනත් අද තමාගේ බවට පත්ව ඇත. ඇය රූපවාහිනිය ඉදිරියේ සිටගත්තාය.

රූපවාහිනී වැඩ සටහන ක්‍රියාත්මක වූ සැණින් ඇගේ නෙත යොමුවූයේ උදිත් වෙතය.

මනාව සූදානම්ව වේදිකාවට පැමිණි උදිත් දුටු සැණින් හදවතට පිවිසුනේ දරාගත නොහැකි සතුටකි..

## 26

උදිත් පෙනී සිටි රූපවාහිනී වැඩසටහන අවසන් වූයේ රාත්‍රී දොළහට පමණි. මඳ වේලාවක් රූපවාහිනිය නැරඹූ ජනකගේ ආත්තම්මා නිදා ගැනීමට ගියාය. තමාගේ නින්ද යේන නොක් මානයක නැත. ඒ ප්‍රභාසම්පන්න පෞරුෂය දෙස ඔහු තරම් වේලාවක් බලා සිටීමට පුළුවන.

තම සිත සෙනෙහසක පැටලී නැතැයි කිව නොහැක. එම මකරන්දයේ සුවඳ හදවතට පිවිස හමාරය. තමා ආරක්ෂා කිරීමේ වගකීම ඔහු බාර ගත්තේ නිකමට නොවන බව කිව නොහැක. කොහේදෝ යන පිටස්තර දෙමළ කොල්ලෙකුට ආරක්ෂාව සැපයීමට ඔහුට කිසි අවශ්‍යතාවයක් නැත.

තමා මෙවන් විශ්වාසයකින් ඔහු හා රැඳී සිටීමට ආවේ කතු නොදන නොවේ. දෙමාපියන් මෙසේ එවා ඇත්තේ ද ඔහු වෙත තැබූ මහා විශ්වාසයකින් යුතුවය. වැඩ සටහන නිම වනතෙක් බලා සිටි ඈ එය නිවා දමා ඇඳට ගියාය. ඇය පසුදින පිබිදුනේ දොරට ගසන ශබ්දය නිසාවෙනි. තමා සිටින්නේ කොහේදැයි එක්වරම දැන ගැනීමට ඇයට පුළුවන් වූයේ නැත. එය තමා නිදා ගන්නා වැල්ලවත්තේ නිවස නොවේ. සියළු සිදුවීම් මතකයට ගලා ආවේ නතිව සිටිද්දීය. කිසිවෙක් දොරට ශබ්ද කරනු ඇසී ඇය නැගී සිටියාය.

"ළමයෝ තේ බොන්න එන්න..."

ඇය නිහඬව නාන කාමරයට ගොස් මුහුණ සෝදාගෙන ආවාය.

"නින්ද ගියාද..?"

"ඔව් හොඳට නින්ද ගියා..."

ඇය මේසය මත වූ වීදුරුව අතට ගනිමින් කීවාය. සැබවින්ම මේ පරිසරය සුවදායකය. අගනුවර හෝ යාපනය මෙන් නොවේ වෙල්යාය මැදින් දුම්රිය මගත් ඉන් ඔබ්බෙන් නැගී ගත් පහත රට කඳු පෙළත් මැනවින් පෙනේ. හැන්දෑවට ගම්මානය දෙසින් හමා එන සුළං රැළි සුවදායකය.

"මහත්තයා බොහොම අපූරුවට වැඩ සටහන කළා නේද...?"

ඇය හිස වනා සිනාසුනාය.

'මේ ඉතින් කලා රස්සාවල හැටි.. අපේ පොඩි එකා ඔය රූපවාහිනී වැඩවලට ගියාම අවස් පහලොවෙ විස්සෙ එන්නෙ නෑ...."

ඇය කීතරම සූදානම් වන්නේ තමාම කතාවට මැදිකරගැනීමටය. තේ පානයෙන් පසු ඇය නිවසින් පිටතට ආවේ



අරමුණකින් තොරවය.

මෙම රහස එළිවුණොත් තමාට වඩා එය බලපාන්නේ උදිත් වෙතය.

අහස අඳුරු පැහැයෙන් යුතුය. නගරයට නොව ගමට ද මෙවර නියගය දැඩිසේ බලපා ඇත. චේතා හදිසියෙන් ආවා විනා උදිත් ගැන හරි අවබෝධයක් නැත.

ආත්තම්මාට මේ ජීවිතය හොඳට හුරුය. හැඳූ වැඩූ දරුවන් කිසිවෙක් දන් මේ රටේ නැත. දූ පුතුන් රට හැරයාම පිළිබඳව ඇයට විරුද්ධ වීමට උවමනාවක් තිබුණේ නැත. මේ ඒකාකාරී ජීවිතය තුළ ඇය උපේක්ෂාවෙන් ජීවත් වෙන්නීය.

දිවා ආහාරයෙන් පසු ඇඳට ගියේ හිසේ බර ගතිය දැනුණු හෙයිනි. අම්මාගේ හෝ අප්පාගේ තොරතුරක් දැන ගැනීමේ තද අවශ්‍යතාවයක් තිබුණාය. එසේ කිරීමට පුළුවන් කමක් නැත. උදයන් ලෙහෙසියෙන් පසු බසින අයෙක් නොවේ.

හෙතෙම තමාගෙන් පළි නොගනිතැයි කිව නොහැක. ඔවුන්ගේ බුද්ධිමය අංශය අතිශයින් සැළසුම් සහගතය. නිවසට එන හෝ බැහැර වන දුරකථන ඇමතුම් පිළිබඳව ඔව්හු පරීක්ෂාකාරී වන්නට බැරි නැත. උදිත් කල්සිටම මේ පිළිබඳව උපදෙස් දුන්නේ එනිසා විය හැක. උදිත් මේ හැම දෙයක්ම කරන්නේ තම ආරක්ෂාව වෙනුවෙන් බව චේතා දනී.

දින දෙකක් ගෙවී ගියේ උදිත්ගේ ආරංචියක් නැතිවය. සමහරවිට ඔහු මෙය සිතාමතාම සැලසුම් කරන්නක් විය හැක. තමා හා උදිත් අතර සබඳ කමක් ඇතිවීම දත් උදයන්ට රහසක් නොවේ. සමහර විට ඔහු ආරක්ෂක හේතු මත මෙහි නොඑනවා විය හැක. ප්‍රථම දිනයේ ඔහු නොදැකීම එතරම් ප්‍රශ්නයක් ලෙස සිතුවේ නැත.

පිරිමියෙකුගේ පෙරලා පැමිණීම පිළිබඳ නිබඳව සිතද්දී ඔහු පිළිබඳව විවිධ වූ සිතුවිලි මතකයට නැගෙනා හැටි.

ඔහු වෙනුවෙන් පිළිසිඳ ගත් බලාපොරොත්තු හදවතේ තිබුණත් ඒවා මෙතරම් උණුසුම් සහගත ඒවා යැයි ඇය කිසිවිටක සිතුවේ නැත. එම දිනවල හැමදාම හැන්දෑවට සූදානම්ව ගේට්ටුව අසලට වී සිටින්නේ උදිත් එනතෙක්ය. බිරිඳ දරුවන් බැලීමට හැන්දෑවට නිවසට එන පිරිමියා වෙනුවෙන් මඟ බලා සිටීම සම්ප්‍රදායික ගැහැනියගේ සිරිත වෙයි. නොදැනුවත්වම තමාත් එවැන්නියක් බවට පත්ව ඇත.

මෙහි ජීවත් වන්නවුන්ගේ ප්‍රධාන ගමන්මග වන්නේ දුම්රියයි. දුම්රියෙන් බැස යන මගීන් අතර උදිත් ඇද්දැයි ඇය බැලුවාය. ඊළඟ ඩීසල් දුම්රිය එන්නේ රාත්‍රියටය.

''එන්න දරුවො දැන් රෑ වුණා..''

ආත්තම්මා කීවේ ඇගේ සිත හඳුනා ගෙනය. ඇය පහත් කරගත් හිසින් යුතුව ආත්තම්මා පසුපස ගියේ දුකින් යුතුවය.

රාත්‍රී ආහාර වශයෙන් කෑ බත් කටවල් කිහිපයක් පමණි. මාස ගණනාවක් තිස්සේ පැවති නියඟය අවසන් කරමින් වහලයට වැහි බිඳු වැටෙන හඬ වේතාට ඇසුණි. දැන් ඉතින් එන එකක් නෑ. දවසක් ද දෙකක් ද දවස් හයක් පමා වීමට හේතුවක් නැත. එකම සතුටකට ඇත්තේ ඔහු සහභාගි වන වැඩ සටහන් දැකීමට ලැබීමය.

වැස්ස තුරල්ව නැත. නිදියහනක තනිව සිටිනවිට ඇයට අප්පා අම්මා සිහිවෙයි. වර්තමාන සමාජයේ ජීවත්වන තරුණියකට මෙම සම්ප්‍රදායික ජීවිතය තුළ සිරව සිටිය නොහැක. ඇගේ කය ආවරණය වී තිබුණේ සැහැල්ලු නිදන ගවුමකිනි.

එක් වරම මෙවන් සීතලක් දැනේවියැයි ඇය සිතුවේ නැත. නින්දට පිවිසි නොබෝ වේලාවකින් දොරට කිසිවෙක් තට්ටු කරනු ඇසුණි. වේතා එක්වරම නැගට්ටාය.

''වේතා මම උදිත්..''

ඇයට එම කටහඬ හඳුනාගැනීමට ගත වූයේ මොහොතකි.



පුරා සතියක් මඟ බලා සිටියේ ඔහුගේ පැමිණීමය. දොර විවෘත කළ සැණින් ඇය දුටුවේ තෙත බරිතව සිටින උදිත්ය.

''දෙයියනේ තෙමිලා...''

ඇය ඔහුගේ අතින් අල්වා ගනිමින් කීවාය.

''පුදුම වැස්සක්.. මම මෙච්චර වෙලා හිටියෙ ඉස්ටේෂන් එකේ.. පායන පාටක් නෑ වැස්සෙම ආවා...''

ඔහු කමිසය ගැලෙව්වේය. වේතා කඩිනමින් සිය තුවාය රැගෙන ආවාය.

''කෝ එන්න ඔළුව පිහදාන්න..''

වේතා එම වගකීම තමා වෙත පවරා ගත්තාය. හරියට දින හයක් මඟ බලා සිටීම කොතරම් හැඟුම් බර එකක්ද? අපි සාමාන්‍ය අය නෙවේ. අපි නිකම්ම නිකං හිතවතුන් ද නොවේ. අපි භවයෙන් භවය එකට ඉන්න පතාගෙන ආපු පෙම්වතුන්.

'මේ මහ රෑ එන්නෙ නැතිව උදේ ආවානම් ඉවරනෙ උදිත්.. මේ නන්නාඳුනන පළාතක...''

''එහෙම නම් මම ගිහින් උදේ එන්නම්....''

එකවරම ඇගේ දෙනෙතේ කඳුළු මතුවුණි.

''දවස් හතක් මම තනිවෙලා හිටියා..''

''ඉතින් නාඩා ඉන්න.. නොඑන්න හේතුවක් තිබුණා...''

''ඇඟ සීතල වෙයි ඇඳුම් මාරු කරගෙන එන්න..''

ආදරයක් පවතින බව සැබෑය. එහෙත් මෙය බැරෑරුම් කතාවකි. තමා ඇයගේ වගකීම බාරගත්තේ ආරක්ෂා කරදීමටය. එක කාමරයක රැඳී සිටින්නට තරම් දිගු සම්බන්ධතාවක් නැත. ඇය සිටියදී නිවසේදී මෙන් ඇඳුම් මාරුකිරීමට නොහැක.

''බාත්රූම් එකට යන්න තනිනම් මාත් එන්නම්..''

ඇත්තටම එය තමා පවුල් ජීවිතය. එහෙත් අප එවන් බැඳීමකින් බැඳී නැත.

පවුලේ හැමදෙනාම බලා ඉන්නේ තමාට හොඳ සිංහල පවුලකින් විවාහයක් කරදීමටය. පැහැදිලිවම මේ අසම්මත ජීවිතයකි. ගැහැනු පිරිමි සිත් යාවීමකට ප්‍රභේද නැත. ජාති ආගම් කුල වගයෙන් ඇති ප්‍රභේද ආදරයකට ප්‍රශ්න නොවේ.

''සීතල නිසා වතුර ටිකක් උණුකරල දෙන්නද...?''

''එපා දරුවෝ එපා...''

ඔහු මෘදු ලෙස ඇගේ හිස පිරිමැද්දේය. මෙවන් ආදරයකට හිමිකම් කීමට ලැබීමෙන් තමා පින්වන්තියකැයි ඇයට සිතේ. එහෙත් මේ අසම්මත ජීවිතයකි. එහෙත් ජීවිතයට ප්‍රවේශ වීමට ආදරය රන් දොරකි. තුවාය අතට ගත් ඇය ඔහු සමඟ නිවසේ නාන කාමරය අසලට ගොස් දොර ළඟ සිට ගත්තාය.

''මට නනි නෑ..''

ඔහු පහත් හඬින් කීවේය.

## 27

මෙම නොහෙට්ටු ගතිය දින කිහිපයක් තිස්සේම පැවතුණි. රූ ගත කරන ලද වාර්තා වැඩසටහන සංස්කරණය කිරීමට සහාය වීම සඳහා වායු සමීකරණය කරන ලද කුටියේ සිටීම නිසා සෙම් ගතිය වැඩි වූණි. දිගින් දිගට වැඩ කරන්නට සිදුවූයේ අධ්‍යක්ෂවරයාගේ නිවසේ අවමඟුලක් සිදුවූ හෙයිනි. තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙනුවෙන් අනිවාර්යෙන්ම මෙයට සහභාගී විය යුතුය. එම සතියම වෙහෙසීමට සිදුවිය.



සිටියේ ඇය අමතක කර නොවේ. මේ දුරස්ව සිටීම ඇයට තදබල වේදනාවක් බව ඔහු දැන සිටියේය.

නාන කාමරයට ගියේ දිය නාගැනීමට සිතාය. ඇඟ පුරා පැවතුණු සීතලක් දැනුණ දෙයින් මුහුණ සෝදා ගත් ඔහු එළියට ආවේය.

ඔහුගේ නෙත යොමු වූයේ සැහැල්ලු නිදන ගවුමකින් සැරසී සිටි චේතා වෙතය. ඇය මෙච්චර ලස්සනට සිටිනවා ඔහු දැක සිටියේ නැත. රාත්‍රී ආහාරය පිළියෙල වී තිබුණි. සෙම්ප්‍රතිශ්‍යා ගතිය මතුව තිබූ නිසා කිසි කැමත ප්‍රියතාවයක් ඔහුට තිබුණේ නැත.

''කෝපි එක්ක හදන්නද එහෙනම්..''

''එපා මහන්සි වෙන්න..''

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේ

''ඇයි මේ.. ඇඟ රස්නෙයි නේද...?''

එම ස්පර්ශය සමඟ ඔහුගේ කයේ වෙනස ඇය හඳුනා ගත්තාය.

''දෙවියනේ ඇගේ රස්නෙ තියාගෙන ඇඟ සේදුවේ ඇයි...?''

ඔහු පිළිතුරක් නොදී නිහඬව සිටියේය. ඇගේ කතාව සත්‍ය හෙයිනි. මේ ගතිය උත්සන්න වූයේ ඇඟ සෝදා ගැනීමෙන් පසුවය.

''බෙහෙත් ටිකක් ගේන්න තැනක් නැද්ද..?''

''පොඩ්ඩක් ඇඟ රත්වෙලා.. ඕකට බෙහෙත් මොනවා.. අනික මේ වෙලාවට දොස්තරල නෑ... සනීපවෙයි...''

, ඇය දීර්ඝ ලෙස සාකච්ඡා කළේ මිනු රෝගාතුරවීම

පිළිබඳවය. බෙහෙත් පෙත්තක් බීවේ ඇගේ තද බල වූ ඉල්ලීම නිසාය. ප්‍රශ්නය වූයේ දෙදෙනා එක සයනයක නිදා ගැනීමය. කොතරම් අපහසුකම් තිබුණත් ඇය හා එකම ඇඳක නිදා ගැනීමට පුළුවන් කමක් නැත.

''එන්න නිදා ගන්න...''

''ඔයා නිදා ගන්න...''

ඔහු කමිසය හැඳ සාලයට ආවේය.

ඔහු සාලයේ සැටියට වී දෑස් පියා ගත්තේය. එකම ඇඳේ නිදා ගැනීමට ගියහොත් ඇය ඒ පිළිබඳව වරදවා සිතීමට වුවද බැරි නැත. දෑස් පියාගත් නොබෝ වේලාවකින් ඔහු පිබිදුණේ උඩුරාවණ මැතිණියගේ හඬිනි. මුවගට සිනාවක් නැගුණු මුත් එක්වරම කිසිවක් පැවසුවේ නැත. පවුල් ජීවිතය ගත කරද්දී කුඩා ආරවුල් ප්‍රශ්න ඇතිවීම සාමාන්‍ය දෙයකි. රාළහාමි ජීවත්ව සිටියදී කිසි කලෙක වරද කාගේ වුවත් තමාට බැණ නොවදින බව ඇය දනී.

අමනාපයක් ඇතිවූ විට ඔහු කරන්නේ කොට්ටය හා පොරවන රෙද්ද ගෙන මේ අසුරින්ම සැටියේ නිදා ගැනීමය. උදිත් විසින් කර ඇත්තේ ද එවැන්නකි. එහෙත් යොවුන් යුවලකට වැඩිහිටියන් ලෙස අවවාද කළ යුතුය. උඩුරාවණ මැතිණිය කාමරයට යනවිට ඇය හඬමින් සිටිනු දුටුවාය.

''මොකද දරුවෝ මේ කරන්නෙ.. දෙන්නා අතර රණ්ඩුවක් ගියාද...?''

ඇය කොර ගසමින් කාමරයට පිවිස කීවාය.

චේතා කෙත් වූ දෑසින් සිටියා මිස කතා කළේ නැත.

''ඔවගේ පොඩි පොඩි ප්‍රශ්න ඇතිවෙනවා තමයි.. හා හා ගිහින් කතා කරමු...''



''මම කිව්වට එන්නෙ නෑ අත්තම්මෙ...''

''ඒවගේ වෙලාවල විතරක් පරාජය බාරගන්න ඕනෑ.. ඉස්සර අපේ රාළහාමිත් මා එක්ක තොරොක් වෙලා ඔය පුටුවට වෙලා ඉන්නව... යමු මම කතාකරන්නම්..''

උඩුරාවණ මැතිණිය කුට්ය අසලට ගොස් උදිත්ට ගතා කළේය.

''හා හා ඉලන්දාරිය.. මොකද මේ එළියට වෙලා. යන්න යන්න ඇතුළට...''

''පොඩ්ඩක් රස්නෙ තියෙනවා.. එනිසා සැටියට ආවා...''

''එහෙනම් දෙන්නම එළියට යන්න එපායැ.. හා හා ඇතුළට ගිහින් නිදාගන්න...''

ඔහු තවදුරටත් ඇය හා වාද කිරීමට ගියේ නැත.

''ගෑනු දරුවෙක් තනිකරලා මේ ඒ එළියට වෙලා ඉන්නවද..? මේ දරුවා මේ දවස් ටිකේ පුතා එනකල් පාර බලන් හිටියා..''

කුමන ප්‍රශ්න තිබුණත් නිවසේ හිමිකාරියට ඒවා පැවසීමට පුළුවන් කමක් නැත. ඔහු පහත් කරගත් හිසින් යුතුව කාමරය තුළට ගියේය. කාමරයේ දොරකඩ ළඟ සිටි චේතා ඔහුගේ අතින් අල්වා ගත්තාය.

''දෙවියනේ හොඳටම උණ.. එන්න ඇඳට..''

ඇය ඔහුව ඇඳේ සතපවමින් කීවාය.

නිවසේ සිට ගෙනෙන ලද මඩිකොළොන් බෝතලයක් තිබුණා මතකය. උදිත් සිටියේ හිස පුපුරා යන තරම් වේදනාවෙනි. කුඩා කළ අම්මා හිස පිරිමැද්ද හැටි මතකය. ඉන්පසු ගැහැනියක් තම හිස පිරි මැද්දේ අදය.

''හුඟාක් අමාරුද...?''

''එච්චර නෑ.. මට බිමට බෙඩ්ෂීට් එකක් දමලා දෙන්න...''

''බෑ බෑ.. ඔයා ඇඳේ ඉන්න.. මම බිමට යන්නම්... ඇයි මේ එකට ඉන්න බය...''

ඇය ඔහුගේ ළය මත හිස තබා ගනිමින් ඇසුවාය.

''මේක වෛරස් උණක්... බෝ වෙනවා.. අයින්වෙන්න...''

''ඒකට කමක් නෑ... බෝවෙද්දෙන්..''

ඇය විදුලි පහන නිවා දමා ඔහු අසලින් වැතිරුණාය.

අප විසින් කර ඇත්තේ සම්ප්‍රදායික නොවන කටයුත්තකි. හදවත්වල ආදරය පිළිබඳ තෙතමනයක් ඇති වුණත් පිටස්තර ගැහැනියක් සමඟ එකට සැතපීම වැනි සම්ප්‍රදායක විරෝධී දෙයක් ගැන ඔහු සිතා සිටියේ නැත. ඇය මෙහි ආවේ ආරක්ෂාව පතාය. එවන් තත්වයක් යටතේ නරක දෙයකට ඇය පොළඹවා ගැනීම හෝ එවන් තත්වයකට පත්කිරීම සාධාරණ නැත. කල්පනාවේ ගැලී සිටියදීම ඔහු වෙත නින්ද ගලා ආවේ බොහෝ වේලාවකට පසුවය. උදින් පිබිදුනේ හොඳටම ප්‍රමාදවීය. හිසේ වේදනාව එපරිද්දෙන්ම තිබුණි. වෙනදාට වඩා ගත සිසිල් බවින් යුතුය. එසේ වන්නට ඇත්තේ තවමත් උණ ගතිය ඇති බැවිනි. කට තිත්තය. තම ඇඳේ පසෙක සිටින ගැහැනු රුව දුටු සැණින් තමා සිටින්නේ කොහේදැයි ඔහුට තේරුම් ගැනීමට හැකි වුණි.

මෙහි වඩා වැදගත් වන්නේ තමාගේ නොවන පිරිමියෙක් සමඟ ගැහැනියෙක් එකම ඇඳක සිටීමට සිත හදා ගැනීමය. මෙය එක අයුරකින් සිතා ගැනීමට බැරි තරම්ය. එහෙත් මෙසේ සැඟව සිටින්නේ සිය ජීවිත ආරක්ෂාව වෙනුවෙනි.

මෙවන් සුන්දර ගැහැනියක් තමා ළඟ සැතපෙතැයි ඔහු විශ්වාස කළේ නැත. මේ හැමටම වඩා ප්‍රධාන වන්නේ ඇය තමා කෙරෙහි තැබූ විශ්වාසය. ඇය නොපිබිදෙන පරිදි කාමරයෙන් පිටව ගොස් මුහුණ සෝදා පැමිණ ඔහු වෙතා සොයා බැලුවේය.



තමා කාමරයෙන් පිටව සිටි අතරවාරේ වෙතා ඇඳ සකස් කර කාමරයෙන් පිටව ගොස් තිබුණි.

දෑස් පියා සිටියදී කිසිවෙක් තමා ළඟ දුවටෙනවා දැනුණ හෙයින් දෑස් විවර කළේය. රෝස මලක් බඳු වූ ගැහැනු පෙනුම සිත් ගන්නා සුළුය.

''තේ බොන්න...''

ඇය බඳුන් දෙක පසෙක තබමින් සිනාසුනාය. ඉන් පසු ඇය මෘදු ලෙස නළලට, ගෙලට අත තැබුවාය.

''උණ තියෙනවා...''

ඇය දුකින් කීවාය.

''සනීප වෙයි...''

ඔහු කෝප්පය අතට ගත්තේය. ඇය ඔහු අසලින් ඉඳගත්තේය.

''එපා ළඟට එන්න.. බෝවෙයි...''

''ඊයේ රෑ ඇඳේ හිටියේ මීටත් වඩා ළඟින්.. ඔයා උණෙත් දෙඩෙව්වා...''

''මොනවද කියෙව්වෙ...?''

''බෑ කියන්නෙ නෑ..''

ඇය ඔහුගේ උරෙහි හිස හොවා ගනිමින් කීවාය.

ඒ දිගු රෑයේ කළ කී දෑ ඇයට මතකය. අද පිරිමින් නිසා ගැහැනුන්ට සිදුවන අතවර වැඩි වෙමින් පවතී. ඒවායේ සම්මතයක් නැත. තම අවයවයන් පිළිබඳව කිසිම දෙයක් නොදන්නා ගැහැනු දරුවන්ට හැට හැත්තෑවේ මහල්ලන්ගෙන් අතවර සිදුවෙයි. දුම්රියේ බසයේ ගමන් කරද්දී ඇතැමුන් විකෘති ලෙස කසුටු දීමට වෙර දරති. ගැහැනුන්ට ගැහැනු වීමේ ව්‍යසනයට නිතරම මුහුණ දීමට සිදුවෙයි. මව්වරුන් විසින් නිබඳව ගැහැනු දරුවන්ට ආරක්ෂා වීමේ ක්‍රියා විධි පිළිබඳව දැනුවත් කළ යුතුය.

සමස්ත පිරිමි වර්ගයාටම මේ චෝදනාව කළ නොහැක. කුඩා කල අප්පා තමා සෝදා පිරිසිදු කර රෙද්දෙන් ඔතා වඩාගෙන ගිය හැටි මතකය. තරුණ විය වෙද්දී ඒ ආරක්ෂා කිරීම කළත් කිසිම මොහොතක නිදන කාමරයට පැමිණ නැත.

එහෙත් මෙම තැනැත්තා එසේ නොවේ. ගැහැනියකුගේ ජීවිතයේ පැතුම් අතර පිරිමියෙක් සමඟ සැනපී හොඳ දිවියකට පිවිසීම ද වෙයි. මා පිරිමියෙක් සමඟ සැතපුනේ සම්ප්‍රදායික ගැහැනියෙක් විදියට නොවේ. ප්‍රථමයෙන් ජීවිත ආරක්ෂාවට.

"කිච්චහම අයින් වෙන්න.. ලෙඩ බෝවෙයි..."

"මම කැමතියි ඔයාගෙන් බෝවෙන ඕනෑම දේකට..."

ඇය ඔහුගේ අතැඟිලි අතර සිය ඇඟිලි සිර කර ගනිමින් කීවාය.

"තව ටිකකින් බෙත් ටිකක් ගේමු.."

"කියන්න බැරි වුණා.. අර බෑග්වල කෑම වගයක් ඇති.. ආත්තම්මටත් දෙන්න... තවත් ඔයත් කැමති ඇතිනේ කන්න..."

# 28

වෙනා අසුනෙහි නැඟී සිටියාය. ඔහු වක්‍රාකාරයෙන් තමාට හිමිව සිටියත් තනිකරම තමාගේම නොවේ. අප සැබෑවින්ම මේ ජීවිත කාලය තුළදී කරන්නේ පාත්‍ර වර්ගයා වී ජීවිතේ කොටසක් රඟපෑමය. ආදරය කිරීමෙහි හෝ වෙනස් අයුරකින් විවාහ වී ජීවිතයට මුහුණ දීම තුළ එක් කතා වස්තුවක් ඇත. එම පුද්ගලයන්ට මේ ආර්ථික, දේශපාලන චක්‍රයෙන් ගැලවීමට පුළුවන් කමක් නැත.

අද විසි වර්ෂයක් තිස්සේ පවතින යුද්ධයෙන් සමස්ත ශ්‍රී



ලාංකිකයන්ම දුකට පත්ව ඇත. තමාද එවැන්නියක් බව වෙනා දනී. තම ජීවිතය අනින් අයට වඩා සුවිශේෂය. ආසන්න ගම්මානවල සිටින සිංහල, දෙමළ, මුස්ලිම්වරුන් සරණාගතයන් බවට පත්ව ඇත. ඔවුන්ගේ ගේ දොර ඉඩ කඩම් අතැර පැමිණ ඇත. විවාහවී ඇත්තේ, මධුසමය ගෙව්වේ, දරුවන් බිහි කළේ සරණාගත කඳවුරුවලය.

සහල් සලාකය, වියළි ආහාර ලැබුණේ මේ කඳවුරුවලය. මෙහි මූලික දේ වන්නේ ජීවිතාරක්ෂාවය. අද තම පිටස්තර, තමාගේ ජාතියේ නොවන පිරිමියෙක් සමඟ අසම්මතයේ ඇඳක සැතපීමේ අභියෝගය දැරුවේ මෝඩ තරුණියක් ලෙස නොවේ. එම අවදානම නොදැන නොවේ. පැහැදිලිව තමා මරණයේ තර්ජනයෙන් ගැලවීමට පැමිණි සරණාගතයෙකි.

කෑම පාර්සලය තබා ඉතිරි පාර්සලය ලිහද්දී උඩරට මනමාලියකගේ ඡායාරූපය දැකීමෙන් ඈ තිගැස්සී සිටියාය. ආඩවනේ මේ කවුද..? මනාලියක ලෙස සැරසී සිටින්නේ තමා නොවේද..?

යාබද අසුනේ සිට තමා දෙස බලා සිටින තැනැත්තා දෙස බැලුවාය.

"ලස්සන මනමාලියෙක්. අනික් එක බලන්න."

වෙනා අනික් ඡායාරූපය දෙස බැලුවේ සතුටිනි. හොඳින් රාමු කරන ලද මංගල ඡායාරූපයේ ඇගේ නෙත ගැටුණි. එම ඡායා රූපයේ උඩරට මනාල යුවලක් සිටිනු දැකීමෙන් ඈ තැති ගත්තාය. උඩින් උඩරට මානලයෙක්ව සිටිනු දැකීමෙන් ඕනට පිවිසුනේ අමනාපයකි. ඔහු උත්සාහ කරන්නේ තමා ආරක්ෂා කිරීමට බව ඇය පැහැදිලිව දනී.

"ලස්සනයිද"

ඔහු ඡායාරූප බලන වෙනාගෙන් ඇසුවේය. තම ජීවිතයේ මෙවන් අපූර්ව බවක් ඇතැයි ඇය කිසි විටෙක සිතුවේ නැත.

සංස්කෘතික ලක්ෂණ කෙසේ වුවත් කවදා හෝ ගැහැනියට පිරිමියෙක් සමඟ දිවි ඇරඹීමට නියමිත එම ස්වභාවයට විරුද්ධ වීමට පුළුවන්කමක් නැත.

"මෙහෙ ඉන්න කල් මේ රහස රැක ගන්ඩ ඕනෑ. ඔහු අමාරුවෙන් කීවේය."

"ආත්තම්මා අපේ වෙඩින් ෆොටෝ ඇහුවා."

"ඒ ගැනුකෙනාටත් ඕන්නැති දෙයක් නෑ. ඔයා මොනවද කිව්වෙ?"

"පින්තූර තවම හම්බ වුණේ නෑ කිව්වා"

"දැන් ඉතින් ඇත්ත කියයි"

ඔහු කාමරයෙන් පිටතට එමින් කීවේය.

"එන්න නිදා ගන්න"

"මම එළියෙ නිදා ගන්නම්"

"එන්න නිදා ගන්න"

ඇය උදින් කැඳවාගෙන ගියේ අත්හලයුතු දෙයක් නැති හෙයිනි. තවදුරටත් තර්ක කිරීමට නොසිතුනේ හිතේ වේදනාව නිසාය. ඇඳේ වැතිරී නොබෝ වේලාවකින් ඔහු වෙත නින්ද ළඟා වූයේය.

වෙනා මෙසේ පිරිමියෙක් සමග කිසිදාක තනිව් සිට නැත. කුඩා කල අම්මා හා අප්පා මැදට වී ඔවුන්ගේ සෙනෙහස ලබන්නට වාසනාවන්ත වූ හැටි මතකය. ඒ හැර නංගී සමඟ පමණක් නිදා සිටි හැටි මතකය.

එහෙත් අද නිදා සිටින්නේ පිරිමියෙක් සිටින මැදිරියකය. ඔහු සම්ප්‍රදායික පිරිමියෙක් නොවේ. නෙතෙම තම ජීවිතය ආරක්ෂා කරන නැනැත්තාය.



මුළු රාත්‍රියම ඔහු උණ වේදනාවෙන් කෙඳිරි ගෑ හැටිත් තමා එම පිරිමියාට උවටැන් කළ හැටිත් මතකය. තද නිදිමත පවතිද්දීම ඔහුගේ සයනයේ සැතපුණ හැටි මතකය.

අම්මා සමඟ නිදා ගන්නා යුගයේ ඇයට තුරුළුව ඇගට උඩින් පාදයක් දමා නිදා ගැනීමට පුරුදුව සිටියාය. මව් තුරුලේ සැතපීමට හැම තරුණ දුවකට උරුමව ඇති අයිතියකි. ගැහැනු දරුවන් සතු නිදහස විඳින්නේ මව සමඟය.

ගැහැනියෙකුට මේ උරුමය ලබන්නේ විවාහයෙන් පසුවය.

ඉතුත් රැයේ නිදා ගත් හැටි මතකය. ඇය පිබිදුනේ හොඳටම ප්‍රමාදවය. එහෙත් තමා කා සමඟ හෝ උණුසුම්ව නිදන බවක් හැඟුණි. තුරුල්ව නිදන්නේ කා සමඟ ද යන්න ඇය එතරම් සිතුවේ නැත.

ඇය පිබිදී තමා ඉන්නේ කොහේදැයි සිතුවාය. නින්දේදී තමාට කැමති ආකාරයකින් නිදා සිටීම එතරම් පුදුම නැත. පිබිදෙද්දී ඇයට සිතුණේ අම්මාගේ උණුසුමේ සිටින බවය. එහෙත් තමා සිටින්නේ කා සමඟද යන්න දැනුණේ තරමක් වේලා ගතවූ පසුවය. තමා නිදා සිටින්නේ නොදන්නා පිරිමියෙක් සමඟ බව හැඟී ගියේ පසුවය.

ඇඳුම සකස් කරගනිද්දී තරමක් ලැජ්ජා සහගත වූවාය. කාමරයෙන් පිටව ගියේ ඈ මුහුණ සෝදා ගන්නටය. ඉතුත් රැය මුළුල්ලේම ඔහු කෙඳිරි ගෑ හැටි මතකය. හිසේ ඕඩිකොලොන් තැවරූ හැටි මතකය.

දෙවියනේ වෙච්ච දෙයක්.

උදේ තේ සූදානම් කරද්දී ආත්තම්මා පිබිදී එන හැටි දුටුවාය.

"කොහොමද මහත්තයාට සනීපද?"

"හොඳටම උණ එළිවෙනකල් කෙඳිරි ගෑව්"

''මම ඇහැරල බලනකොටත් දුව ඇහැරලා කරදර කරන්ට ආවේ නෑ. මම ගිහින් නිදා ගත්තා.''

ඇය තම ජීවිතය සියුම් ලෙස හදාරමින් සිටී. ඇය විසින් මෙවන් පිටස්තර මහලු කාන්තාවට වංචා කර ඇති බවක් හැඟේ.

''අතට පයට වැඩකාරයො හිටියත් තමුන්ගෙ පිරිමියාගෙ උවමනාවලදී ගැහැනිය ළඟින් ඉන්න ඕනෑ. අපේ රාළහාමිත් එහෙමයි. මට පොඩි හෙම්බිරිස්සාවක් හැදුණත් මා ළඟින් හෙල්ලෙන්නෙ නෑ. මාත් එහෙමයි.''

''අත්තම්මෙ තේ එක''

''මම බොන්නම් දුවේ. ගිහින් මහත්තයාගෙ දුක සැප බලන්න.''

''බෙත් ටිකක් ගේන්න වෙයි වගේ දොස්තර කෙනෙක් ඉන්නවද?'

''ඉන්නවා ලෑස්ති කරගන්නකො''

ආත්තම්මාට උදේ තේ සූදානම් කර දුන් ඇය එසැනින් කාමරයට ගියාය.

''උදිත්''

ඇය තේ කෝප්පය පසෙක තබමින් කතා කළාය.

''දැන් කොහොමද?''

''මා ළඟින් අයින් වෙන්න මේ උණ බෝවෙනවා අපේ ඔෆිස් එකේ කෙනෙකුට හැදිලා හිටියා.''

''බොන්නකො තේ එක අපි නවයට විතර බෙත් ටිකක් ගේන්ට යමු''

මුව සෝදාගත් ඔහු තේ පානය කර යළි ඇඳේ වැතිරුණි.

''ඇත්තමයි කිව්වේ අයින් වෙලා ඉන්න''



''එහෙම ඉඳීමේ තේරුමක් නෑ එළි වෙනකල් මා හිටියේ ඔයා ළඟ'' ඈ සිනාසුනාය.

''එලි වෙනකල් හිසේ වේදනාව ගියේ නෑ. නින්ද ගියේ පාන්දර.හැමදාම නිදාගන්නෙ මේ විදිහටද?''

''ඒ කිව්වේ''

ඔහු විමසූ දේ ඇයට හැඟුණි''

''මට සමාවෙන්න ඒ ඕනෑකමින් කළ දෙයක් නෙමේ.''

ඇය වරද තමා වෙත පවරා ගනිමින් පැවසුවාය.''

තමා මේ ස්පර්ශ කරන්නේ තමාට හිමි නැති අයිතිවාසිකමකි. ගැහැනියෙකුට පිරිමියෙක් සමග සැතපීමට ස්වාභාවික අයිතියට කිසිවෙකුට සම්බාධක පැමිණිය නොහැක.

කිසිවෙක් දොරට ශබ්ද කරනු ඇසී ඇය එකවරම නැගී සිටියාය. ඒ එන්නෙ කවුරුන්දැයි ඇය දනී.

''එන්න ආත්තම්මා ඇතුළට''

ඇය දොර විවෘත කරමින් පැවසුවාය.

''දැන් කොහොමද දරුවා''

උඩුරාවණ මැතිණිය ඔහුගේ උණ පරීක්ෂා කරමින් ඇසුවා.

තවම කියන්න තරම් ගුණයක් නෑ. සනීපවෙයි ඇගේ නෙත ගැටුණේ කන්ණාඩි මේසය මත තමා තිබූ මංගල ඡායාරූපය වෙතය.

''බොහොම අපූරුයි. අපේ පුතා දන්න පත්තරේ වැඩකරන ළමයි ඉන්නවා මේ පත්තර පිට කවරෙකටහොඳයි.''

ආත්තම්මා යෝජනා කළාය.

# 29

ජනකගේ අත්තම්මා කතා කළේ තමාගේ හා චේතාගේ මංගල ඡායාරූප අගේ කරමිනි.

''මෙන්න නියම මඟුල් පින්තූර.. මෙන්න නියම උඩරට මනමාලි.. අපේ පුතාගේ කොලුව බැන්දෙ සුද්දියෙක්.. යාන්තම් පපුව විතරයි වැහිල තිබුණෙ... එහෙමද ගෑනු ඇඳුම් අඳින්නෙ..''

ඇය කතා කළේ චේතාගේ හිස අතගාමිනි.

''හනිමූන් යනවා කිව්වට අපේ කොල්ලන්ට වාගේ ඒ පිරිසිදු ගෑනු කමක් උන්ට නෑ. කසාද බඳින්ට කලින් සල්ලං වෙලා තව හනිමූන් යනවා.. අපේ පුත්තු නාගෙ නැතිනම් මොනවද කත එවුන්ගෙ ජාතිය...''

ඇය චේතාගේ දෙකම්මුල් සිප ගනිමින් කීවාය.

''සිංහල විතරක් නෙමේ.. දෙමළ අයටත් හොඳ චාරිත්‍රවාරිත්‍ර තියෙනවා.. ගැහැනියකගේ පවිත්‍රකම, තමුන්ගේ ස්වාමියාට ගරු කිරීම ඒ අයගෙත් තියෙනවා...''

''ආත්තම්මෙ මම දවසක මෙයාව දෙමළ විදිහට අන්දවනවා..''

''මේ දුව නම් කොයි ඇඳුමටත් ලස්සනයි.. අපේ මුණුබුරන්ගෙ ගෑනු ඉස්සරහත් පස්සත් නැති බට පොතු වාගේ එවුන්...''

දමිළ යුවතියක් නිසා අත්තම්මා ගේ උපහැරත චේතා නොදන්නා බව උදිත් දනී. උදිත්ගේ උණ ගතිය කෙමෙන් උග්‍ර අතට හැරෙන්නට පටන් ගත්තේය. ජනක ආවේ චේතාට කර කියා ගත හැකි දෙයක් නැතිව සිටියදීය.

''අයියේ උදිත්ට ඊයේ රෑ ඉඳල හොඳටම උණ..''



''අපේ රෙකෝඩිස්ට් කෙනෙක්ව ඉස්පිරිතාලෙ නතර කළා එයා තමා මේ තැග්ග ගෙනාවෙ...''

ජනක නිවසේ ඇති රථය සතියකට දෙවරක් පමණ පණ ගන්වා කිලෝමීටර් කීපයක් ගෙනගොස් නැවත තබයි. ඔහු උදිත්ව කඩිනමින් සූදානම් කරවාගෙන පෞද්ගලික වෛද්‍යවරයෙක් වෙත කැඳවාගෙන ගියේය.

බෙහෙත් ගැනීමට පැමිණි හැම දෙනාගේම නෙත් යොමුව තිබුණේ මේ නව යුවල වෙතය. චේතා ඔහුගේ අතින් අල්වා ගෙන උරෙහි හිස තැබීමට අවසර දී තිබුණාය. රූපවාහිනියේ පෙනී සිට ඇති මේ යුවල සැවොම හඳුනාගෙන තිබුණි. දමිළ වර්ගයාට ආවේණික දමිළ ලක්ෂණ මේ රුවෙහි සුන්දර තැන් උස්ව තිබුණි.

කලා පලස නම් වූ අතිශයින් ජනප්‍රිය වැඩසටහන මෙහෙයවනු ලබන්නේ උදිත් විසිනි. ගායනය, වාදනය, නර්තනය චතුර කථාව වැනි බොහෝ දේ එකම පුද්ගලයෙක් වෙත පිහිටන්නේ කලාතුරකිනි.

උදිත් මෙහෙයවූ කලා පලසේදී සහභාගී වූ දමිළ කලා පවුල පිළිබඳ හොඳ මතකයක් බෙහෙත් ශාලාවේ රැඳී සිටි යුවතියකට තිබුණි. උත්තර හා දක්ෂිණ භාරතීය සරල හා රාගධාරී සංගීතය ද මුසුකරමින් ඉදිරිපත් කළ මෙම වැඩසටහන අලංකාර කිරීමට මේ යුවල රාධා හා ක්‍රිෂ්ණා මෙන් රඟපෑ හැටි මතකය.

''සමාවෙන්න කරදර කළාට උදිත් නේද...?''

''ඔව්...'' උදිත් කීවේය.

''මේ ඉන්නෙ චෛත්‍යලිංගම් නේද..?''

''ඔව් කොහොමද මගෙ නම දන්නෙ..?''

චේතා තමා හඳුනා ගැනීම පිළිබඳව පියට පත්ව නැගුණාය.

''ඇයි මතක නැද්ද.. ඔය දෙන්නා රූපවාහිනියෙ සින්දු

කිව්වෙ.. නැවුවෙ..''

චේතාගේ සිතට තරමක සහනයක් ගලා ආවේ ඉන් පසුවය. මෙය සරල දෙයක් නොවේ.

''දෙන්නා කවද හරි කසාද බඳීවි කියල මම කිව්වා... අම්මත් කිව්වා...''

චේතා සිනාසුනා විනා කිසිවක් කීවේ නැත.

''රටේ කොච්චර ජාතිවාදී, වර්ගවාදී ප්‍රශ්න තිබුණත් නියම කලාකරුවන්ට ඒවා ප්‍රශ්න නෙමෙ නේද..?''

සැබවින්ම එය යුගයේ ප්‍රශ්නයකි. දේශපාලඥයන් උතුර නැගෙනහිර හා කඳුකරයේ දමිළ මිනිසුන් හා මුස්ලිම්වරු හා සන්ධාන ගනුවන්නේ අවස්ථාවාදීන් ලෙසය. ඔවුන්ට ඇත්තේ පටු පරමාර්ථයන්ය. කලාකරුවන් බැඳෙන්නේ හෘදයාංගමය.

රාග, තාල සප්තස්වර ලෝකයටම පොදුය. අභිනය විලාශයන් එකය. සෙනෙහසින් බැඳෙන්නෙකුට ඒවා බන්ධන නැත. එම සුවඳ මකරන්දය සමස්ත වර්ගයාටම පොදුය.

වෛද්‍යවරයාගෙන් බෙහෙත් ගෙන එද්දී ඔහු ආවේ චේතාගේ අතේ එල්ලීගෙනය. රථයේ එද්දී තම උරට හිස තබා ඒමට ඇය පහසුකම් සලසා තිබුණි. පැමිණි හැටියේ ඇඳට වැටුණු බව පමණක් තම ඔහුට මතකය.

❋ ❋ ❋ ❋ ❋ ❋

වෛතාලිංගම් සිටියේ දැඩි ප්‍රශ්නයකට මැදිවය. චේතාගේ ජීවිතයට තදබල ප්‍රශ්නයක් පවතින බව පිළිගත යුතුය. පෙර මෙන් ප්‍රශ්නවලට කලින් සිට සූදානම් විය නොහැක. නිවසින් පිටතට බසින මිනිසාගේ ජීවිතය වුවද විශ්වාසයක් නැත. කුමන හිතවත් කමක් තිබුණත් පිරිමියෙක් සමග යැවිය යුතු නැත. මේ හැමට වඩා එම මොහොතේ චේතාගේ ජීවිතය ආරක්ෂා කළ යුතුය.

''චේතාගෙන් ආරංචියක් නෑ.. ඉන්න තැනකින් කතා



කරන්නට බලමුද..?''

මව කීවාය.

''දුව කතා කලොත් ඉන්න තැන හොයාගන්ට පුලුවන්..''

උමා දෙමාපියන්ගේ කතාවට සවන් දුන්නාය. ලංකාවෙන් යවනතෙක් අක්කාට විශ්වාස තැනක ආරක්ෂාව තිබිය යුතුය.

''අක්කාට කිසි කරදරයක් නැහැයි කිව්වා.. හොඳින් ඉන්නවා.. ඉන්න තැනත් කීවා...''

''ගිහින් බලලා එන්ට බැරිද..? නැතිනම් අපි ඒ ගැන උනන්දුවක් නැහැයි කියල හිතාවි...''

''සර් ඒවගේ පටු තීරණයක් ගන්න කෙනෙක් නෙවී.... උදයන් අපි ගැන හොයන්න රහස් පරීක්ෂකයො යොදල ඇති..''

මෙය ඇත්තටම ලෙහෙසියෙන් විසඳිය හැකි ප්‍රශ්නයක් නොවේ.

''පොඩි දුවට බැරිද අක්කා ඉන්න තැනකට ගිහින් බලන්න...''

'නිකම්ම යන්න බෑනෙ අම්මා.. සර් මේ හැම දෙයක්ම කරන්නෙ අක්කගෙ ආරක්ෂාවටයි...''

සැඳෑව ගෙවී ගියේ ප්‍රශ්න අතරය. සැමොම තිගැස්සී සිටියේ සැඳෑවරුවේ උදයන් එනවා දකීමෙනි. ඔහුගේ මුහුණ රතුළු වෙසක් ගෙන තිබුණි.

''අංකල් කෝ.. චේතා ආවාද...?''

වෛතාලිංගම් පිළිතුරක් නොදී නිහඬව සිටියේය.

''චේතාව හංගාගෙන හිටියොත් ඒවයේ ප්‍රතිඵල විඳින්ට වෙයි....''

''උදයන් මම මෙච්චර කල් ඉවසාගෙන හිටියා.. මගෙ

දරුවට අනවශ්‍ය බලපෑම් කරන්ට එන්න එපා.. තවම මම ඉන්නවා...."

"නරක මිනිහ කියල මට චෝදනා කරන්න එන්න එපා.. අපේ නායකයාට විරුද්ධ වෙච්චි මිට වඩා ලොකු අය දඬුවම් විඳලා තියෙනවා.."

"මගේ දුව දඬුවම් විඳින්න තරම් වැරදි කරල නෑ...."

වෛත්‍යලිංගම් කීවේය.

"අංකල් මේ නිසා ඔයත් දඬුවම් විඳිනවා. ඒ නියෝගය වළක්වන්න කිසිකෙනෙකුට බෑ.."

ඔහු නිවසින් පිටවුණේ ප්‍රශ්න රැසක් හිසදරාගෙනය.

"ලංකාවෙන් පනින්නද හදන්නේ..? ලෝකෙ කොයි තැනක හිටියත් හොයනවා.. එයාපෝර්ට් එකේ ඉන්නෙ අපේ මිනිස්සු.."

ඔහු පිටවුණේ තර්ජනයක් ඉදිරිපත් කරමිනි. මිනිසුන් මේ ජීවිතයේදී මෙතරම් දරුණු වන්නේ ඇයි? තමා මේ ජීවිත කාලය තුළදී කිසිවෙකුට වරදක් කර නැත. පිටස්තරයෙකුට පවා ආදරයක් දැක්වූ තමාට සිදු වූයේ කුමක්ද? තමාගේ ජාතියේ අය පවා අද තමාට විරුද්ධව ඇත.

"පොඩි දුව මෙහාට එන්න..."

"ඇයි අප්පා.."

උමා අසලට එමින් කීවාය.

"අපි මේ ගෙදරින් යමුද..?"

ගෙදර අතහැර යාමෙන් මේ ප්‍රශ්නයෙන් මිදෙන්නට පුළුවන් නම් එය හොඳ උපක්‍රමයකි. නමුත් ත්‍රස්තවාදීන්ට එය ප්‍රශ්නයක් නොවේ. ඔවුන්ට විරුද්ධ නම් ප්‍රතිවාදීන් හොයා මරා දැමීම සාමාන්‍ය සිරිත වේ.



"හියා කියලා මේ ප්‍රශ්නෙ විසඳන්න බෑ අප්පා.. අපි කොහෙ යන්නද..?"

"අපි ටික දවසක් නුවර ගිහින් ඉමු..."

"නුවර කවුද ඉන්නෙ..?"

"මගේ යාළුවෙක් ඉන්නවා.. ඔයාල දන්නෙ නෑ.. හැමදාම එන්න කියනවා.. ටික දවසකට ගිහින් ඉමුද..?"

"ඉන්න නම් පුළුවන්.. එතකොට අක්කගෙ ප්‍රශ්නය...."

"ඔක්කෝටම වීසා ඉල්ලලයි තියෙන්නෙ.. අපිට කොයි වෙලාවෙ හරි යන්ට වෙයි.. ඊට කලින් ගිහින් එමු..."

කෙසේ හෝ නිවසින් පිටවයාම හොඳ යැයි ඇයට සිතුණි. කීපවරක් ටෙලිෆෝනය නාද වූවද ඇය එය ගත්තේ නැත.

කටහඬ ශ්‍රවනය වූ සැණින් ඇයට දරාගත නොහැක සතුටක් ඇතිවිය.

"අක්කා මං උමා... ඔයාට කොහොමද...?"

"නංගි මං මුලදී උදිත්ට වෛර කළා.. ඒත් අද මම ඒ ගැන දුක් වෙනවා.. එයා උතුම් මිනිහෙක්..."

"ඔයා කොහෙද කොහොමද ඉන්නෙ...?"

"මේ උදිත්ගෙ යාළුවෙක්ගෙ ගෙදරයි ඉන්නෙ.. නැතියෙක් තනිව තියන්න බැරි නිසා අපි දෙන්නා බැඳපු දෙන්නෙක් වගේ ඉන්නෙ..."

"එතකොට ඉන්නෙ..."

"ඉන්නෙ එක කාමරේක.. ඒ අස්සෙ උදිත්ට උණ ගත්තා.. මම මේ කතා කරන්නෙ බෙහෙත් ගන්න ඇවිදින්..."

# 30

උදිත් රෝගාතුරව සිටින බව ඇසූ මොහොතේ සිතට පිවිසුනේ දුකකි. වරෙක ඔහු කෙරෙහි ඇගේ සිතේ අමනාපයක් ද ඇතිවෙයි. ඕනෑවට වඩා හිත හොඳ මිනිසුන්ට මේ සමාජය තුළ ජීවත් වීම පහසු නැත. කතිකර මේ වරද උදිත් මතම පැවරිය නොහැක. චේතාගේ ආරක්ෂාව උදිත් වැනි පිටස්තරයෙකුට පැවරීම තර්කානුකූල නැත. කාගේ හෝ කවුද ඇත්තේ මොන හිතවත් කමක්ද? ඇය පිරිමියෙකුට බාරදී නිහඬව සිටිය යුතු නැත.

චේතා තමා නියෝජනය කළ කණ්ඩායමේ ශක්තිය හා ස්වභාවය දනී. එසේම නීති කැඩුවොත් අත්වන ඉරණම ද දනී. වර්තමාන ස්වභාවය අනුව සැඟවී සිටීමට තරම් විශ්වාසවන්ත කෙනෙකු නැත. ඇයට සිටි එකම විශ්වාසවන්තයා උදිත් පමණි.

දැන් සියල්ල සිඳුව හමාරය. කෙසේ හෝ ඇය ලංකාවෙන් පිටමං නොකළොත් පැහැදිලිවම ඇය මරා දමනු ඇත. නීති කැඩීමේ ප්‍රශ්නයක් ලෙස නොව අද ඔහු සූදානම්ව සිටින්නේ චේතාගෙන් පළි ගැනීමටය. ජීවිත හානි කිරීම තුළ පැහැරගෙන යාම වැනි ඕනෑම දඬුවමකට ඇය යටත්ය. ඇගේ ආරක්ෂාවට සිටි උදිත් රෝගාතුරවීම තදබල ප්‍රශ්නයකි.

''මම බලන්න එන්නද?''

''ඒක උදිත්ගෙන් අහන්න ඕනෑ නංගී.. මක්කොම එයාගෙ සැලසුම්නෙ.. පොඩ්ඩක් හරි වැරදුනොත් ප්‍රශ්න ඇතිවෙයි.''

''අක්කා මෙහෙමත් ප්‍රශ්නයක් තියෙනවා. මහත්තයා ලෙඩ වුණු වෙලාවක නැඳෑයෙක්වත් නාවොත් වරදවා හිතන්නත් පුළුවන්.''

සොයුරියගේ ගැහැනු හුවණ පිළිබඳව ඇය සිතා බැලුවාය.



''දෙමළ විදිහට ඇඳල පොට්ටු තියාගෙන නම් එන්න එපා.''

''ගැහැනු වෙනස් වෙන්නෙ ඇඳුමින්.. ඇඳුම් ගැලෙව්වම කොයි ගෑනිත් එක වගේ.''

චේතාට එකවරම සිනා ගියේ උමාගේ කතාව ඇසීමෙනි. ඕනෑම දෙයක් කෙලින් පවසන අමුතු මුකුරි කමක් ඇය වෙත විය.

''ඔවගේ කතා කියන එක නිසා තමයි මේ වගේ ගෙදරකට ගෙන්වන්ට බැරි. මේ ගෙදර අයිති උඩරට සිංහල බෞද්ධ ගැහැනියෙකුට. ඒ අම්මා හරිම හොඳයි. අප දෙමළ බව තේරෙන්න ඉඩ දෙන්න බෑ.

''කෝකටත් ඔයා ඉන්න තැන කියන්නකෝ.''

''අනේ නංගි අපි උදිත්ව ආරක්ෂා කරන්න ඕනෑ. මේ හැම දෙයක්ම කරන්නෙ මා වෙනුවෙන්. මට ඇඳ දීලා එයා එළියෙ නිදා ගන්න ගියා.''

ඒ පිළිබඳ අමුතුවෙන් කිව යුතු නැත. නුදුරු දිනෙක සොයුරිය බැලීමට යාමට ඇය සිතා ගත්තාය.

මේ ප්‍රශ්නය ඇවිස්සීමට අවශ්‍ය ඇත්තේ උදයන්ටය. ඔහුගේ අවශ්‍යතා ඉටුකරවා ගැනීම වෙනුවෙන් ඕනෑම බාල වැඩක් කිරීමට ඔහු පෙළඹවීමට පුළුවන. ආරක්ෂාව සඳහා විදේශ රටකට ගොස් පදිංචි වීමට පුළුවන. තම හිතවතුන් නෑදැයින් සහෝදයන් නැති රටකට ගොස් ජීවත් වුණත් එහි ඵලක් නැත.

පාසල් නිවාඩුව ආරම්භ වී ඇති නිසා නැට්ටුම් පන්ති නතර කර ඇත. අප්පාගේ ඉල්ලීමට අනුව නුවර සිටින මිතුරාගේ නිවසට යාමට ඇය සිතා සිටියාය.

''කවුද කතා කළේ..?''

''අක්කා..''

"මොකද කිව්වෙ..? ඇයි මට කතා කළේ නැත්තෙ..?"

"එයා කතා කළේ බොක්ස් එකකින්. චේතා ඉන්න තැන හොයන්න ටෙලිෆෝන් එක ටැප් කරන්න බොහෝ දුරට ඉඩ තියෙනවා."

"අනේ දෙවියනේ වෙච්ච දෙයක්. චේතා සනීපෙන්ද?"

"එයාට ප්‍රශ්නයක් නෑ.. නමුත් උදිත් සර්ට සනීප නැහැල්ලු. බෙත් ගන්න ආපු ගමන් කතා කළා."

ඉකුත් යුගයේ ප්‍රශ්න නොතිබුණාම නොවේ. එහෙත් මෙතරම් කරදර වූ කාලයක් මතක නැත. දුව පිටස්තර තැනක ආරක්ෂාවට තැබුවේ කැමැත්තෙන් නොවේ. හිතවත් දමිළ නිවසක දරුවා තිබිය නොහැක. උසස් අධ්‍යාපනය ලබන දක්ෂ ගැහැනු දරුවන් දෙදෙනෙක් සිටීම අනිත් අයගේ ඇස්වලට කටු අනින්නාක් බඳුය. අනිත් අතට දැන් දමිළ පිරිස් විවිධ හේතු මත භේද භින්න වී ඇත.

අප්පා නිවසට ආවේ හොඳටම අඳුරු වැටුණ පසුවය. රාත්‍රී අහර ගත්තේ උඩින් පල්ලෙනි. නින්දට ගියේ වෙන කළ යුතු දෙයක් නැති හෙයිනි. මේ රටේ ජීවත්වන හැම පුද්ගලයෙකුගේම අපේක්ෂාව වන්නේ සාමයෙන් ජීවත්වීමය. එම අයිතිය සහතික කිරීමට කෙනෙක් නැත. පැහැදිලිව ඇය තවත් කලක් ජීවත් විය යුතුය. පරපුරක් බිහි කිරීමට ගැහැනියක් ලෙස දායක විය යුතුය. එසේම පරපුර සමාජගත කළ යුතුය.

"තවම නිදි නැද්ද?"

කිරිඳ දොර විවෘත කර කාමරයට පිවිසෙමින් ඇසුවාය.

"හ්ම්.. නිදිමත නෑ.. පොඩ්ඩුව නිදිද?"

"නිදි නෑ ඔහේ කල්පනා කර කර ඉන්නවා. හෙට චේතාව බලන්න යන්න අහනවා."

"ගියාට කමක් නෑ. ඒත් ඔයා යන්ට එපා. අපේ දෙන්නා



සිංහල ද දෙමළ ද කියලා හොයන්න බෑ. ඔයා දෙමළ ගෑනියෙක් බව ජේනවා.

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

නිවසට පැමිණි වහාම උදිත් ඉදිරිපස සැටියේ ඉඳ ගත්තේය.

"ජනක මට කාමරයක් හොයා ගන්න පුළුවන්ද බලපං.."

"ඇයි මම ආවම නතරවෙන කාමරය.. ඒක තියෙනවා ඇයි කාටද?"

"මචං මේ කෙල්ල වීසා හදාගන්නකල් විතරයි මෙහෙ ඉන්නෙ. බැරිවෙලාවත් මේ ජරා උනේ බෝ වුණොත්.."

"ඒකත් ඇත්ත."

"මේ හැමදේටම වඩා මට මේ කෙල්ල එක්ක එක කාමරේක ඉන්න බෑ.. උඹ මට උඹේ කාමරේ ලෑස්ති කරලා දීපං."

නිවසට පැමිණි වහාම දීමට නියමිතව තිබූ බෙහෙත දීම සඳහා වතුර ගැනීමට චේතා මුළුතැන්ගෙය දෙසට ගියාය.

"හව් ඉස් යුවර් හස්බන්ඩ්.."

චේතා පිළිතුරු දීගත නොහැකිව නිහඬව සිටියාය. මේ රෝගාතුරව සිටින්නේ තම ජීවිතයෙන් කොටසක් බඳු වූ හිතවතා වෙයි.

"නාඩා ඉන්න මගෙ දුව. එයාට සනීප වෙයි."

උඩුරාවණ මැතිනිය ඇගේ අත අල්ලාගෙන උදිත් දෙසට ගියාය.

"පොඩි පුතා මේ දරුවට දැන් කොහොමද?"

"මෙක බෝවෙන උණක්. වෙන් කරල තියන්න කිව්වා. සනීප වෙනකල් උදිත් මගේ කාමරේ නිදාගන්නාවෙ."

"බෑ. බෑ.. එහෙම කරන්න බෑ. මගේ කාමරේ හිටියාවෙ."

"කියන දේ අහන්න මේක බෝවෙන උණක්."

"බෝවුණාදෙන්... එන්න ඇඳට ඇවිදින් නිදාගන්න."

ඔහු පහත් කරගත් හිසින් යුතුව සිටියේය.

"උදිත් කෙල්ල අඩනව බං. ඇවිදින් නිදාගනින්."

"එන්නකො.. එන්නකො.."

ඇය උදිත්ගේ අතින් අල්වා ගනිමින් කීවාය.

"එහෙමනම් උදිත් මම යනවා. මට හදිසි වැඩකට යන්න තියෙනවා. නැතිනම් මම තව ටිකක් ඉඳලා යනවා."

"ආවට තැන්ක්යූ.."

"අනේ අයියා මා එක්ක ඉන්න කියන්න."

"හරි හරි ඉඳිව්. වෙලාවට බේත් ටික දෙන්න... මම යනවා."

මිතුරා යනතෙක් බලා සිටි ඔහු අසුනෙන් නැගිට්ටේය.

"යමු ඇතුළට."

ඇය මෘදු ලෙස ඔහුගේ අතින් අල්වා ගත්තාය. හිස පුපුරා යාමට තරම් වේදනාවක් දැනෙයි. කාමරයට පිවිසි සැනින් ඇඳේ වැතිරුණේ දරාගත නොහෙන වේදනාවක් ගතට පිවිසි හෙයිනි. තමා සිටින්නේ කොහේද කා සමගද යන්න පිළිබඳවවත් සෙවීමට සිතුනේ නැත.

ඔහු පිබිදුනේ කිසිවෙක් සිය හිස පිරිමදිනු දැනීමෙනි. තමා ළඟ ගැවසෙන්නේ කවුදැයි එක්වරම තේරුම් ගැනීම අසීරු වුණි. ඇඳ අසල පුටුවක් තබාගෙන සිටින තැනැත්තිය හිසේ වේදනාව පවතිද්දීම හඳුනා ගත්තේය.

"ඇයි මේ ඇහැරගෙන. නිදා ගන්න."

"මම නිදාගන්නම්. මේ බේත් වේල බොන්න. පැය භාගෙන් භාගයට දෙන බේත් වරද්දවන්න එපා කිව්වා. හා බොන්න."



උදිත් ඇය දුන් බේත් පෙති මුවට දමා වතුර බිව්වේය.

"ඇයි නැගිට්ටෙ.. ටොයිලට් යන්න ඕනද?"

"මම කාමරේ ඇඳට යන්නම්."

"යන්න දෙන්න බෑ. මම නිදාගන්නෙ ඔයා එක්කයි."

"ලෙඩ බෝවෙයි."

"මම කොහොමටත් මරණයට කැපවෙලා ඉන්න කෙනෙක්. ඔයා එක්ක ඉඳලා ඔයාගෙ ලෙඩ බෝවෙලා හරි මැරෙනවා නම් ඒක සැපක්."

ඇය හඬමින් ඔහුගේ ගෙල බදා ගත්තාය.

## 31

උදිත් පාන්දර පිබිදුනේ ගතේ උණගතිය පවතිද්දීය. අතින් අතට හැරී සූදානම් වුවත් සිරුරට බරක් දැනුණු නිසා මොහොතක් කල්පනා කළේය. හිම්දිරියේ දැඩි නින්දක පසුවන චේතා එක අතක් තම ළයටත් එක් පාදයක් ඇඟට උඩින් දමා නිදා සිටින අයුරු දුටු විට ඔහුගේ මුවගට සිනාවක් නැගිණ. සමහරවිට මේ ඇය නිදන සුපුරුදු ස්වරූපය විය යුතුය.

මෙහිදී වඩාත් වැදගත් වන්නේ එකිනෙකා පිළිබඳ වූ විශ්වාසය වේ. සමහර විට කෙනෙකුට මෙය අනවශ්‍ය වූ ද පිළිගත නොහැකිවූ ද කල්පිත කතාවක් ලෙස සිතාගන්නට බැරි නැත. ඇය මෙහි ආවේ ජීවිත ආරක්ෂාව පතාය. මිනිසා මේ ජීවිත කාලය තුළ ද හැමවිටම වෙර දරන්නේ මේ ජීවිතය ආරක්ෂා කරගැනීම සඳහාය. නිරෝගී මනුෂ්‍යයෙක් ලොව නැත. ඉන් විය හැකි ආපදා නැතිකර ගැනීමට වෛද්‍යවරුන් වෙත යති. වැස්සෙන්

පින්නෙත් සොරුන්ගෙන් ආරක්ෂා වීමට නිවාස සදා ගතිති.

එහෙත් වාර්තමාන යුගයේ මිනිසාට ත්‍රස්තවාදීන් ගෙන් එල්ලවන තර්ජනවලට මුහුණ දීමට සිදුව ඇත. අද ඇය තම උණුසුමේ ගුලි වී සිටින්නේ ආරක්ෂාව පතාය. ගැහැනු මිනිසුන් පතන්නේ මෙවන් ජීවිතය. තමා ජීවිතයේ කිසිදාක මෙවන් යොවුන් ගැහැනියකගේ උණුසුමේ ස්පර්ශය ලබා නැත.

ඇය තම කැමැත්තෙන්ම ඉරියව් වෙනස් කරන තෙක් ඔහු ඇගේ නින්දට බාධා නොකර සිටියාය. සෑහෙන වෙලාවකට පසු ඉරියව් වෙනස්කර තරමක් වෙලා සිටි ඇය ඇඳෙන් නැඟිට ගොස් පැමිණි තම ගෙලට නළලට අත තබා රෝග පරීක්ෂා කරනු ඔහු බලා සිටියේය. උදින් මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය.

"සනීපද..?"

"සීතලයි..."

ඔහු පහත් හඬින් කීවේය.

"අපි තේ එකක් බීලා බෙත් බොමු..."

ඇය ඔහුගේ හිස ආදරයෙන් පිරිමදිමින් කීවාය. අම්මා තරම් තමාට ළංවූ වෙනත් ගැහැනු කෙනෙක් නැත. එහෙත් මැය තම සිත තුළට පිවිසුනේ අමුතු ලතාවකටය. මුහුණ සේදීමට උණු වතුර සපයා තිබෙනු දුටු ඔහුගේ සිතේ ඇය කෙරෙහි දැඩි ආදරයක් පිවිසුණි.

ටූත් පේස්ට් දමන ලද බුරුසුවෙන් දත් මදිද්දී ඇය තුවාය කරලාගෙන ළඟට වී සිටිනු උදින් දුටුවේය.

"වැඩිය ඇඟ තෙමන්න එපා.. ඔය ඇති...."

ඇය ඔහුගේ අත අල්වාගෙන එළියට කැඳවාගෙන ආවේය. ඇය ඔහුට ඇඳුම් මාරු කිරීමට සහාය වූවාය. ළැම පුරා ගැවසීගත් ලෝමයන් ඔහුගේ පිරිමිකම විදහා පෑවේය. දින කිහිපයකින් නොකැපීම නිසා රැවුල වැවී තිබුණි.



"මොනවද කන්නෙ.. පාන් පෙත්තක් රෝස්ට් කරල දෙන්නද..?"

"කන්ට ප්‍රියක් නෑ චේතා..."

"අනේ එහෙම බෑ.... හිස් බඩට බෙත් බොන්න බෑ.. පෙත්තක් කමු මම කවන්නම්.."

චේතාගෙන් අවසරගත් උඩුරාවන මැතිනිය කාමරයට හිස යොමු කළාය. ඒ මොහොත වන විට චේතා සිටියේ ඔහුට කෑම කවමිනි. ඇය කවදත් මේ හොඳ පවුල් ජීවිතවලට ආදරය කළාය. පවුල් ජීවිතය වූ කලී එකිනෙකාගේ රුචි අරුචිකම් අනුව සකස් කරගත යුත්තකි. එම ජීවිතයේ සීමා බන්ධන නැත. පවුල් ජීවිතය පවතින්නේ දෙදෙනෙක් අතර පවතින රුචි අරුචිකම් අනුවය. එක් අයෙක් ලෙඩ වූ විට සැබවින්ම මෙවැනි දේ බෙදාගත යුතුය.

"කිසි දෙයක් කන්නෙ නෑ අම්මා..."

චේතා චෝදනාවක් පරිදි කීවාය.

"එහෙම බෑනේ පුතා.. දුව කවන්නෙ ආදරේට නේද..? ඒවා කන්න ඕනෑ..."

"කන්න ප්‍රියක් නෑ ආත්තම්මා...."

"පොඩ්ඩක් හරි කන්න.. නැත්නම් මේ ලස්සන කෙල්ල දුක් වෙයි..."

චේතාගේ දෙනෙත් කඳුළෙන් තෙත්ව තිබුණි. ආත්තම්මා ගිය පසු තමා නිකම්ම නිකං හුදු ගැහැනියක් ලෙස හිතුනේ නැත. මම මරණයට කැප වෙච්ච සතෙක් වාගේ. ඒත් ඔබ හමුවීමෙන් ජනිත ආදරයට සීමාවක් නෑ. මම ඔබේ හදවතට වෙනකාටවත් ළං වෙන්න බැරි තරම් කිට්ටු වෙලයි ඉන්නෙ. ජාතීන් විදිහට අපි වෙනස්. ආගම් විදිහට හා සංස්කෘතික විදිහට එච්චරම සමාන

නෑ. ඔබ හා මා අතර කවදාවත් වෙන් නොවන බැඳීමක් ඇතිවෙලා.

"ඔන්න අඬන්න එපා.. දූන් මට සනීපයිනෙ..."

ඔවුනතර කෙටි නිහඬ බවක් ඇතිවුණි.

"එහාට වෙන්න මේක බෝවෙනව.."

"බෑ එහාට වෙන්න බෑ..."

ඇය හඬමින් දෙවුරේ හිස හොවා ගත්තාය. ඔහු නිහඬව ඇගේ හිස පිරමැද්දේය. මේ අපේ ජීවිතය තීන්දු කළ විදිහ මේක නම් ඊට විරුද්ධ විය යුතු නෑ. මේ නිවස තුළ විවාහක යුවලක් ලෙස ජීවත් වීමට කිසිම ප්‍රශ්නයක් නැත. එහෙත් ඇය මෙහි ගෙනාවේ ඔස්ට්‍රේලියාවට යනතෙක් ආරක්ෂා කරදීමටය.

"කෝ නැගිටින්න ඉඩ දෙන්න.."

"බෑ මට මෙහෙම ඉන්න ඕනෑ..."

ඇය කෙඳිරුවාය.

"කියන දේ අහන්න.. මට එළියෙ කාමරේට යන්න ඕනෑ..."

ඔහු ඇගේ අතින් අල්වාගෙන නැගී සිටියේය. කාමරය පිරිසිදු කිරීමට වූ අවශ්‍යතාවය නිසා ඇය උදින්ම ඉදිරිපස කාමරයට කැඳවාගෙන ගියේය.

❋ ❋ ❋ ❋ ❋ ❋

අක්කා බැලීමට යාමට නිවසින් අවසරය ලැබුණි.

"දූව තනියම නම් යන්න එපා. වෙන යාළුවෙක් එක්කාගෙන යන්න...."

සාවිස්ත්‍රී කීවාය.

"බෑ අම්මා වෙන කෙනෙක් එක්ක ගියොත් ආරංචි වෙන්න



පුලුවන්...."

"ඉතින් තනියම යන්නෙ කොහොමද...?"

"චේතා වරදින්නෙ නැතිව පාර කිව්වා...."

ඩෙනිමකින් හා ටීෂර්ටයකින් සැරසී සිටි ඇගේ රුව මනා ලෙස මතුව තිබුණි. චේතා ගේ මෙන් නොව උමාගේ දෙනෙත්වල සිත් ගන්නා අමුතු ලස්සනක් වැකිරී තිබුණි.

මොන ඇඳුම ඇන්දත් තමා සිංහල නොවන බැව් ඕනෑ කෙනෙකුට තේරුම් ගැනීමට පුළුවන. දූරු දෙදෙනා එසේ නොවේ. අඳින ඇඳුම අනුව ඔවුන් වෙනස් වේ.

"මෙහෙ ඉඳල ත්‍රීවීලර් එකක් කතා කරගෙන ගියොත් නරකද..?"

"එතකොට අක්කා ඉන්න තැන හඳුන ගන්නට ලේසියි. අද ඉන්නෙ රුපියල් පනහටත් මිනිසුන් පවා දෙන අය..."

දූවගේ කතාව සත්‍යයකි. මිනිසුන් හුදු පටු දේශපාලන පරමාර්ථ උදෙසා දහස් සංඛ්‍යාත ගැහැනු පිරිමි අනාථයන් බවට පත් කර ඇත. අහිංසක ජනතාව සරණාගතයන් ලෙස කඳවුරුවල ජීවත් වෙති. පොදු පහසුකමක් නැත. ජීවත් වීමට ලැබෙන වියළි සලාක ප්‍රමාණවත් නැත. යල මහ කන්න වැඩ කළ ගොවි බිම් හේන් ගොවිතැන් අල ඇනු වගා කළ සාරවත් බිම අතහැර හිගමනේ යාමට සිදුව ඇත. දරුවන්ට අධ්‍යාපනයක් නැත. ඇතැම් පාඨශාලා හමුදා කඳවුරු බවට පත්ව ඇත. එසේත් නැතිනම් ඒවා යුද්ධයෙන් විනාශ වී ගොස්ය. පූරුවේ වාසනාවකට තම පවුලට එම ආපදාවට මුහුණ දීමට සිදු නොවූයේ සැමියා නිසාය. උසස් අධ්‍යාපනය ලබද්දී වැරදි තීරණයක් ගත් ලොකු දූව නිසා මුළු පවුලම දුකට පත්ව සිටී.

"එහෙනම් පරිස්සමින්..."

සාවිත්‍රී දූවගේ දෙකම්මුල සිප ගනිමින් කීවාය. මෙම ගමනේ යෙදීමට ප්‍රථම ඒ පිළිබඳව සියුම් අධ්‍යාපනයක යෙදුනාය. වැල්ලවත්තේ සිට කොළඹට එන්නේ දුම්රියෙනි. තම ගමන පිළිබඳව පරීක්ෂා කරන්නෙකු ඇත්නම් ඔහු හෝ ඇය නොමඟ යැවීමට උපක්‍රම යොදා ගත්තේය. කැලේ කොටි නැතැයි නොසිතිය යුතුය. අපි අපේ ආරක්ෂාව සලසා ගත යුතුය.

මීට ඉහත ගමේ ගියේ දුම්රියෙනි. විසි වසරක යුද්ධය නිසා ඒ අතීතයේ මතක සටහන් ඇත්තේ ස්වල්ප වශයෙනි. හැම ගැහැනු දරුවෙකුටම සිය බාල කාලයේ ස්පර්ශයන්ට වැඩිහිටියන්ගේ ලිංගික පෙළඹීම්වලට පොළඹවා ගැනීමට ඇති ඉඩ කඩ වැඩිය. සැබැවින්ම කෑම බීම දීම අධ්‍යාපනය අනාගත පෝෂණය කිරීම දෙමාපියන්ගේ වගකීමකි. අද මේ දියුණු යැයි කියා ගන්නා සමාජය තුළ ළමයින්ට එරෙහිව තිබූ අපරාධ තිබූ ඒ සක් නීතියේ රැහැනට ඇත. කිසිකෙනෙකුට තමාගේ කැමැත්තෙන් තොරව ස්පර්ශ කිරීමේ අයිතියක් කාටවත් නැත. තනිව ගමන් කිරීමට ඇති නිදහස හැම ස්ත්‍රියකටම තිබිය යුතුය.

අදාල දුම්රිය පලෙන් බැස ඉතිරි දුර ගමන් කළේ ත්‍රිවිලරයකිනි. ප්‍රධාන මාර්ගයෙන් පටු මාර්ගයට පිවිස වෙල් යායක් මැදින් යද්දී ඇයට තමා නැරඹූ කේරල චිත්‍රපටියක් සිහිවුණි. නිල්ල වැදුනු බන්ඩි ගොයම් සුළඟ සමඟ ලතාවකට රඟ දෙනු පෙනේ. වෙළ මැද කමතකි. අතින් පස වැටකොලු, පතෝල, කරවිල වැනි ගොඩවගාවත් දිස් වුණි.

''තෝනා මය කිව්වෙ රූපවාහිනියෙ වැඩ කරන මහත්තයා ඉන්න ගෙදරද...?''

''ඔව් ඔව්...''

උමා කෙටියෙන් කීවා.

''අයුමතත් ටෙලිනාට්‍යයක් හදන්න සෙනග ගන්නවද



දන්නෙ නෑ.... තෝනත් රඟපානවා නේද...?''

කරුණයාගේ එම කතාවට ඈ සිනාව නවතාගත්තේ අසීරුවෙනි. තමා රූපවාහිනී නිළියක් ලෙස ඔහු තීරණය කර තමාරය.

''මෙන්න මේකයි ගෙදර.. තෝනා එනකල් ඉන්නද...?''

''නෑ මම ටිකක් පරක්කුවෙයි....''

''එහෙමනම් මෙන්න මගෙ කාඩ් එක.. අවශ්‍ය වෙලාවක් ඉඳලා මට කතා කරන්න...''

රියදුරා ගිය පසු උමා නිවස දෙසට ගියාය. කොට කලිසමක් හැඳ වැලක රෙදි වනමින් සිටි තැනැත්තිය හඳුනා ගැනීමට ගතවූයේ මොහොතකි.

# 32

චේතා කිසි විටෙක උමාගේ පැමිණීම බලාපොරොත්තු වූයේ නෑ. Blood is thicker than water ලේ වතුර වලට වඩා ඝනයි. සහෝදර කමත් එහෙමයි. චේතා සොයුරියගේ ගෙල බදා ගත්තාය.

''නාඩා ඉන්න නාඩා ඉන්න....''

''මාව හොයාගෙන එයි කියල හිතුවා....''

ඇය සොයුරියගේ හිස පිරිමදිමින් කීවාය.

''අම්මා තාත්තා සනීපෙන්ද..?''

''තාත්තා පරණ විදිහටම දුකින් ඉන්නවා.. අදත් ටිකා එක හදන්න එම්බසි එකට ගියා...''

''උදිත්ට සෑහෙන්න අමාරු වුණා. නංගි... උණ හැදිලා දොඩවන්නට වුණා.. පස්සෙ තමා බෙත් ගෙනාවෙ...''

''එයා හොඳ කෙනෙක් අක්කා...''

''මේ කරදර දුක් විඳින්නෙ අපනිසයි.. මාව බලන්න ගෙදර එද්දි තෙම්ලයි ලෙඩ හැදුනෙ... දවස් ගානක් රෙදි හෝදලානෑ පච්චෙ හෝදලා දැම්මා....''

මේ කර ඇත්තේ තමාට අයිති නැති කටයුත්තකි. කෙසේ හෝ එවන් තැනැත්තෙකුට ඒ උපකාරය කළ යුතුමය.

''ජනකගෙ ආත්තම්මා හිතාගෙන ඉන්නෙ මම උඩරට සිංහල බෞද්ධ කෙල්ලෙක් කියලයි...''

''ඔයා ඉතින් දෙමළ හින්දු කෙල්ලක්නෙ..''

''උදිත් කියන්නෙ එහෙම නෙමේ.. ගවුම ගැලෙව්වම කොයි ගෑනිත් එකලු.. ජාතියක් හොයන්න බැරිලු....''

ඇගේ කතාවට උමා උස් හඬින් සිනාසුනාය. ගැහැනිය පිළිබඳව වූ ඔහුගේ නිර්වචනය අතිශයින් නිවැරදිය. ගැහැනු වෙනස් වන්නේ සංස්කෘතිය විසිනි.

''මා එක්ක ඔවගේ කතා කියන්නෙ නෑ.. ඇයි මම ගෝලයනෙ...''

''අනේ නංගි ටිකක් නෙමෙ හරි හොඳයි.. ජරා දූෂ්‍ය මිනිස්සු දැකපු මට ඇත්තටම මේ ඉන්නෙ දෙවියන්ගේ මැවුමක්ද කියල හිතෙනව.''

''ඇයි මේ දරුවා එළියෙ කියාගෙන කතා කරන්නෙ...''

''මේ ආත්තම්මා මයි සිස්ටර්...''

උමා කාන්තාවගේ දෙපා වැඳ දෙකම්මුල් සිප ගත්තාය.



''මේ නංගි කියලා අමුතුවෙන් කියන්ට ඕන් නෑ.. දෙමාපියන්ගෙ හොඳ ගතිගුණ තියෙනවා....''

''කෝ ලෙඩා මට බලන්ට ඕනෑ...''

''අපි ඉන්න කාමරේ රස්නෙ වැඩියි කියලා ඉස්සරහ කාමරේට නිදාගන්ට ගියා..... දැන් නිදි පස්සෙ කතා කරමු... එන්න අපේ කාමරේ පෙන්වන්න...''

වේතා සොයුරියගේ අතින් අල්වා ගෙන ඇගේ කාමරයට ගියාය. කාමරයට පිවිසි සැනින් එහෙ ක්‍රමානුකූල බව ඇගේ සිත් ගත්තේය. යුගල ඇඳ ඇඳුම් අල්මාරිය කුඩා මේසය කණ්නාඩි මේසය, කැබිනෙට්ටුව වශයෙන් සෑහෙන ගෘහභාණ්ඩ රැසක් තිබුණි. එකවරම ඇගේ නෙත් ගියේ කැබිනෙට්ටුව මත වූ ඡායාරූප වෙතය. ඈ එදෙස බලා සිටියේ අදහාගත නොහැකිවය. කැලිපිලි පළඳා සිටින උඩරට මනමාලිය කවුද? ඒ සමීපයේ සිටින උඩරට මනාලයා කවුද?

''හානේ ඉවිස් අත් බිලිව්බල් අක්කා මේ ඔයා නේද.?''

''මේ උදිත් මුදියන්සේ දිසානායක... ඇන්ඩ් හිස් බ්‍රයිඩ් වේතා වෛතාලිංගම්...''

ඇය සිනාසුනාය.

''ඇත්තටම ඔය දෙන්නා මැරි කරලද...?''

තවදුරටත් මෙහි සිටින තාක්කල් ප්‍රශ්නය ආරක්ෂා කරගත යුතුය. ඇය අතින් තදකර මුව වැසුවාය. මෙහෙකාර කාන්තාව නේ සූදානම් කරනතෙක් උමා මංගල උත්සවයේ ඡායාරූප නැරඹුවාය. තේ පානයෙන් පසු ඔවුහු නිවසින් පිටතට ගියහ. වත්ත කෙළවර වන්නේ වෙල් යායකිනි. වෙල්යාය මැදින් දුම්රිය මග වැටී තිබුණි.

''මෙහාට ආවේ අපි ගත කරන රහස් ජීවිතය ගැන කාටවත් දැන ගන්න හොඳ නැති නිසයි. අපි බැන්දා කියලා ඔයා හිතුවා

නේද...?''

''ඔව් ඉතින් දෙන්නගෙ මඟුල් පින්තූර තියෙන්න කවුරුත් කසාද සහතික අහන්නෙ නැහෙ...''

''අපි විවාහක ජෝඩුවක් නිසා තමයි මේ කාමරේ දුන්නෙ.. ඒක තහවුරු කරන්නට තමයි මේ ෆොටෝ ගත්තෙ...''

''හාමෙන් ඕනෑ කෙනෙක් රැවටෙනවා.. එතකොට දෙන්නා එකට ඉන්නෙ කොහොමද..?''

''උදිත් සුමානෙකට සැරයක් එනවා..''

''එක අතකට උදිත් ගැන පව් කියලත් හිතෙනවා....''

''ඔව් නංගි ඇත්තටම හරිම හොඳයි.. වෙන කොල්ලෙක් එක්ක හිටියා නම් දන්නවනේ රවටී හැටි...''

''අම්මයි අප්පයි ඔයා ගැන දුකින් ඉන්නෙ.. අපි තුන් දෙනාටම ඕස්ට්‍රේලියා යන්නයි හදන්නෙ.. ඔයාට නම් ටික දවසක් මේ දුක ඉවසන්න වෙයි...''

''මට අම්මයි අප්පච්චියි බලන්න ඕනෑ..''

''තව ටික දවසක් ඉවසන්නකො... උදයන් ඇවිදිත් අම්මාට තර්ජනය කරලා ගියා... ඔයාට දූන් තේරෙනව නේද ඒ අයගෙ හැටි..''

දෙනෙතේ කඳුළු ඇය ඉවතට හැරී පිස දමා ගත්තාය.

'දූන් බෙත් දෙන වෙලාව නංගී.. යමු දූන් ඔයා දක්ක හැටියෙ පුදුම වෙයි....''

උදිත් පිළිදෙන විට හොඳටම ආඩිය දමා උණු බැස ගොස් තිබුණි. චේතා තමා ළඟට වී නියමිත වෙලාවට බෙහෙත් දුන් හැටිත් තමා සුවපත් කළ හැටිත් ඔහුට සිහිවුණි. ඉකුත් දින තමාට



තුරුල්ව තම ගෙල වටා අතක් දමා නිදා සිටි හැටි සිහිවෙයි. චේතා පිළිබඳව සිතමින් සිටියදී කාමරයට පිවිසි කැනැස්සිය උදිත් හඳුනා ගත්තේය.

''අයිසෙ උමා කොහොමද දූනගත්තෙ...''

''චේතා ගෙදරට කතා කළා.. දූන් සනීපද..?''

''දූන්නම් හොඳයි...''

චේතා බෙහෙත් පෙති හා වතුර රැගෙන ඒමට ගොස්ය. තමාට ප්‍රථමයෙන් මුණ ගැසුනේ උමාය. තමා සමඟ මුලදී තදබල ඇසුරක් නොතිබුණත් පසුව තමා සමඟ තද හිතවත්කමක් ඇති කරගත් හැටි සිහිවෙයි. ඇගේ හැසිරීම් රටාවේ වෙනසක් නොදුටුවා නොවේ. අප්පච්චි තමා වෙත එව්වේ එක්තරා වගකීමක් පවරාය. තාත්තාගේ මිත්‍රකම ගුරු ගෞරවය ද ආරක්ෂා කිරීමේ වගකීම උදිත් වෙත පැවරී තිබුණි. විශේෂයෙන් ගැහැනු ළමුන් සිටින ගෙදරකට ඒමේදී තමා වෙතට වාරණ පවරා ගත යුතුය. තර්ජන කරමින් කියා දෙන ඇතැම් අවස්ථාවල ඇය තම අතේ එල්ලී සිටි හැටි මතකය. චේතා පැමිණීමෙන් පසු ඇයට ඒ නිදහස අහිමි වී ගියේය. තමාට හිමිවිය යුතු දෙයක් පිටස්තරින් පැමිණි කෙනෙක් පැහැර ගත්තා වැනිය. ජීවිතයේ භයානක අත්දැකීමකට මුහුණ දී සිටින චේතාගේ සිත සැනසීම වෙනුවෙන් කළ පරිත්‍යාගය නිසා තම සිතට ලොකු දුකක් පිවිසි හැටි. අද මේ තත්වයට හැම දෙයක්ම පත්වීම පිළිබඳව දුකක් නැත. ඇය ලංකාවෙන් පිටව යනතෙක් ආරක්ෂා කිරීමට ඔහු යෙදූ අහිංසක උපායන් පිළිබඳ දොසක් කිව යුතු නැත. වෙන පිරිමියෙක් ළඟ තරුණියක් නොව කුඩා දැරියක් තැබුවා නම් ලිංගික අපචාරයකට පොළඹවා ගන්නවා ඇත. හදිසියෙන් නොදන්වා පැමිණි මෙම ගමනේදී ඔවුන් දෙදෙනා අවබෝධයෙන් ජීවත්වනු දකීමෙන් සිත ශක්තිමත් වුණි.

''සර් මේ දවස්වල හුගාක් මහන්සි වුණා කියල අක්කා

කිව්වා.."

"කද බල මහන්සියක් නෑ..."

"අක්කා කිව්ව දේ ඇත්ත තරමක් මුරණ්ඩුයි...."

ඔහු සිනාසුනා විනා කිසිවක් කීවේ නැත. ඇය උදිත් ගේ හැටි දනී. ප්‍රථම හමුවීමේ සිට මේ දක්වා සිදු වූ හැමදේම සිහියට නැගේ. තමා යමක් ඉල්ලා සිටියත් ඔහු එය ප්‍රදානය කළේ නැත.

"බෙත් බොන්න.."

චේතා බෙත් පෙති හා වතුර රැගෙන එමින් කීවාය.

"දැන් සනීපයිනේ.. බෙත් ඕන්නෑ..."

"එහෙම කියල හරියන්නෙ නෑ.. මේ බෙත් දවස් පහක් බොන්න ඕනෑ.. නැතිව වෛරස් එක නැතිවෙන්නෙ නෑ..."

"බෑ චේතා බෙත් බීලා උගුර දනවා..."

"කරන්න දෙයක් නෑ.. බෙත් ටික බොන්න ඕනෑ..."

"මොන කරදරයක්ද දන්නෙ නෑ.. ආයෙනම් එපා.."

"ඒක මං බලා ගන්නම්...."

චේතා සිනාමුසු මුහුණින් යුතුව කීවාය. චේතා සොයුරියට කතා කිරීමට ඉඩදී කෑම සූදානම් කිරීමට යාමට සූදානම් වූවාය.

"අක්කා ඔහොම ඉන්න..."

"ඔයා උදිත් එක්ක කතා කර කර ඉන්න... මම කෑම ටික හදනවා.."

"මේ කරදර වෙන්ට එපා... මම කෑමට ඉන්නෙ නෑ.. ඉක්මනින් යනවා..."



"වෙල පල්លෙහා ලිඳක් තියෙනවා.. ඒකෙන් නාලා දවල්ට කාලා හැන්දෑවෙලා යන්න.."

"එහෙම නම් මටත් මෙහෙම ඉන්න වෙයි..."

"නෝ ප්‍රොබ්ලම් ඔයත් ඉන්න..."

"අගේට හිටිවී.. අම්මාටයි අප්පාටයි පිස්සු හැදෙයි...."

පවුල් ජීවිතයක ආකෘතික ලක්ෂණ මෙසේය. සමාජය ඉදිරියේ මවා නොපෑවත් හොඳ ජීවිතයක් යනු හොඳින් එකට ජීවත් වීමය. අක්කා යෝජනා කළ පරිදි වත්ත පහළ ලිඳට ගොස් දිය නෑමට ඇය කැමති වූවාය. සම්ප්‍රදායික ගැමිලියන් මෙන් දිය රෙද්ද හැඳ දිය නෑමට ඇඳුම් නොතිබුණි. බාල්දියෙන් දිය නෑවෙ කොට කලිසමින් සැරසිය.

"අක්කා තනියට නාන්න එනවද..?"

"නෑ කවදාවත් එන්නෙ නෑ... අද ඔයා නිසා එන්න හිතුණා..."

"මේ වගේ පාළු තැනකට තනියම නම් එන්න එපා... මට බයත් හිතෙනවා.."

"මේ වත්තට කවුරුත් එන්නෙ නෑ..."

ඔවුනතර නිහඬ බවක් මතුවුණි. වතුරට තෙත්වූ නිසා ඇගේ සුන්දර ගැහැණු දේහය මතුව තිබුණි. ඇතින් එන රෑව දුටු ඈ දුවගොස් තුවායෙන් කය වසා ගත්තාය.

"දැන්ම එන්න එපා..."

ඇය සිනාසෙමින් උදිත්ට කීවාය.

# 33

සැහෙන කලෙකින් සිතට සතුටක් ලඟා වූයේ අදය. නංගී ද දිවා ආහාරයට සිටියේ කැමැත්තෙනි. ආත්තම්මා පසුවන්නේ කොයි කාටත් වඩා සතුටිනි. වෙනදා උන්දෑට නොයෙක් ලෙඩ රෝග තිබූ හැටි චේතා දනී. එහෙත් දූන් ඇය පසුවන්නේ හොඳ සුවයෙනි. චේතා නිතරම ඇගේ ලෙඩ රෝග පිළිබඳව විමසා බලයි. ඇය පන්සලේ විහාරස්ථදායක සභාවේ සභාපතිනිය ලෙස කටයුතු කළාය. රෝගී බව නිසා නිලතලවලින් බැහැරව සිටියත් ඉඳහිට සමිති කටයුතුවලට ද යයි. එදින උමාව දුම්රිය පළට ඇරලා එන අතර උඩුරාවණ මැතිණිය පන්සලට කැඳවාගෙන යාමට සිදුවුණි.

රථය ධාවනය කරන ලද්දේ චේතා විසිනි. දුම්රියට නැඟීමට පෙර උමා උඩුරාවණ මැතිණියට වැඳ ආචාර කළාය. ඉන් අනතුරුව සොයුරියගේ කර බදා ගත්තාය.

''මේක ගෙදරටත් වඩා ආරක්ෂා තැනක්... අම්මාට බයවෙන්න එපා කියන්න...''

චේතා කීවාය

''ආරක්ෂාව තියෙන බව ඇත්ත.. ඒ වුණාට කොහෙටත් ඇවිදින්න යන්නෙපා..... සර්වක් හොඳින් බලාගන්න...''

ඇය හිස වනා සිනාසුනාය. දුම්රිය නොපෙනී යනතෙක් බලා සිටි ඔවුහු රථයට පිවිසුනාහ. රජමහ විහාරය පිහිටා තිබුණේ කිලෝමීටරයක් පමණ ඈතිනි. උඩුරාවණ මැතිණිය කුලඟන සමිතියට ගවා ඔවුහු තුඳුරින් වූ පන්සල තුළට ගියහ. විහාර නිර්මාණාදියෙන් දිස්වන්නේ රජමහා විහාරයක් බවය. අෂ්ඨඵල බෝධි ශාඛාවකින් රෝපනය කරන ලද මෙය මහානුභාව සම්පන්න බෝරුකක් බව විශ්වාසයේ පවතී. මල්පහන් පිදීම හා වන්දනා



කටයුතු පිළිබඳව චේතාට අවබෝධයක් නොතිබුණත් චේතා නිහඬව උදිත්ව අනුගමනය කළාය. සිලිසිලියේ තද දෙන බෝමලුවේ සිටියදී සිතට අමුතු සතුටක් දැනේ. අඩ එළියකල පැරණි චිත්‍ර සහිත පිළිම ගෙයි පහන් දල්වීමට ඇය ද සහාය වූවාය. දීපයෙන් දීපය දල්වෙද්දී එම පීත වර්ණ ආලෝකය ඇගේ මුහුණේ තැවරී තිබුණි. බෝධි පූජාවක් පැවැත්වූයේ චේතා වෙනුවෙනි. යුද ගිනි නිමේවා, රටට ශාන්තියක් ලැබේවා. මේ කරදරයට මැදිව සිටින චේතාට යහපත්ම වේවා. මෙසේ මුවින් සෙත් පතද්දී ඇයට ඉකි ගැසී හැඬුම් ආවේය.

''තාඩා ඉන්න.. තව ටික දවසකින්...''

ඔවුහු බෝ මළුවේ නිහඬව ඉඳගත්හ. ඇය කුඩා ලේන්සුවෙන් කඳුළු පිස දමා ගත්තාය.

''එක ප්‍රශ්නයක් අහන්නද...?''

ඔහු හිස ඔසවා චේතා දෙස බැලුවේය. බෝපත් සිප හමන සුළඟට මුහුණට වැටුණ කෙස් රොදක් ලතාවකට පැද්දෙමින් තිබුණි.

''හා අහන්ට..''

ඇය වැලි පොළවේ දෙපා හකුලවා ඉඳගනිමින් ඇසුවාය.

''එක්කො ඔත් නෑ...''

''අනේ තරහම තරහයි මගෙන් මොනවා හරි අහන්න...''

''අද නෙමේ වෙනින් දවසක අහන්නම්...''

''මම දන්නව හිතේ තියෙන ප්‍රශ්නය... ලංකාවේ හිටියොත් මාව මරා දමනවා... කලින් නම් මම යන්නයි හිටියෙ.. ඒත් දැන් යන්න බෑ...''

''ඇයි ඒ.. අප්පා මේ හැම දෙයක්ම කරන්නෙ ඒ

වෙනුවෙන් නේද..?''

''මට උදිත්ව දාල යන්න බෑ....''

ආත්තම්මා වන්දනා කරමින් චෛත්‍ය පැදකුණු කරන ආකාරය පෙනේ. මෙ පිළිබඳව තවත් යමක් පැවසුවහොත් ඇය හඬන්නට බැරි නැත.

''අපි පස්සෙ කතා කරමු..''

ඔහු සෙමින් නැගී සිට කීවාය.

''කෝ මාව නැගිට්ටවන්න..''

ඇය දෑත පෑවාය.

ඔහු දිගු කළ දෑතේ එල්ලී ඇය නැගී සිටියාය. නිවසට එනවිට ජනක පැමිණ සිටිනු දැකීමෙන් උදිත්ගේ සිතට ඇතිවූයේ සතුටකි.

''කොහොමද සනීපද..?''

''දූන්නම් හොඳයි.. සාත්තු සේවිකාව හිටියානේ.. වෙලාවට බෙත් දූන්නා...''

''ගොඩින් බේරගත්ත එක හොඳා.. මේක ජරා උණයක්...''

''ජනක පුතාව හම්බ වෙන්න අද දායක සභාවේ කණ්ඩායමකුයි දහම් පාසලේ ප්‍රින්සිපල් හාමුදුරුවොයි එනවා කිව්වා..''

''මාව හම්බ වෙන්න...! ආත්තම්මා මොනව හරි ලෙඩක් දාන්න ඇති...''

''දහම් පාසැලේ උත්සවයට රූපවාහිනියෙන් කවුරු හරි ප්‍රසිද්ධ කෙනෙකුයි නැටුමක් පුරුදු කරගන්න කෙනෙකුයි හොයා දෙන්න කියන්න...''



''ඒවා කරදර වැඩ අම්මා.. යන එන අයට ට්‍රාන්ස්පෝට් දෙන්න ඕනෑ.. ඒවා නිකං කරන්ට බෑ ගානක් දෙන්න වෙනවා...''

''නිකම්ම කරන්ට බැනේ.. ගානක් ගෙවයි....''

''වෙන කෙනෙක් හොයා ගන්න කියන්න.. ගිය සැරේ මගේ අතින් ගෙව්වෙ...''

''උඹලට සංගීත කණ්ඩායම්වලට ගෙන්වන්න පුළුවන් පිනක් සිද්ධ වෙන වැඩක් කරන්ට බෑ....''

උඩුරාවන මැතිණිය කතා කළේ කෝපයෙන් යුතුවය.

''මොකක්ද ජනක ප්‍රශ්නෙ..''

අතින් කයිට් වැඩ මචං.. ගිය සැරෙත් දහම් පාසලට උදව් කළා.. මේ සැරෙත් ඔය එනවා...''.

ආත්තම්මා කෝපයට පත්ව ඇති බව හැඟුණි.

''කවුරු හරි හොයා දෙමු...''.

උදිත් කීවේය.

''මයිගෝඩ් ආත්තම්මා කවුරුවත් පිටින් ගේන්න ඕන නෑ.. මේ ඉන්නේ දෙන්නෙක්...''

''ඔය බොරු ආත්තම්මා.. මම එච්චර දන්නෑ...''

''ආත්තම්මා උදිත් හාත්බණ්ඩ විශ්වවිද්‍යාලයේ ග්‍රැජුවේට් කෙනෙක්.. මෙයත් කතක් මනිපුර උත්තර, දක්ෂිණ භාරත නාට්‍ය සම්ප්‍රදායන් ඔක්කෝම දන්නවා...''

''එහෙම තමා පිරුණු කළේ දිය නොසැලේ කියන්නෙ... දූවට ඔළිඳ නැටුමත් පුළුවන්ද...?''

''මම එච්චර දන්නෙ නෑ ආත්තම්මා.. නංගී තමා හොඳට

දන්නෙ...."

මුළු පවුලටම හොඳ රංගන හැකියාවන් ඇති බව උදිත් දැන සිටියේය.

අඳුර වැටුණු නොබෝ වේලාවකින් චේතා නැටුමට සූදානම් වූවාය. කතක් සම්ප්‍රදායට අභිනය රංගනයේ ඉදිරිපත් කිරීමට ඇය සූදානම් වූයේ ගීත කැසට් පටයත් ළඟ තිබූ බැවිනි. ඇය ප්‍රිය කළ 'භෛරවි රාගය' වෙනුවෙන් නැටුම ඉදිරිපත් කරන අයුරු ඔහු බලා සිටියේය. ඒ ලස්සන ගැහැණුකම ඇයට හරියටම පිහිටා තිබුණි. ගීත රිද්මය අනුව පා නටද්දී උඩුරාවක මැතිණිය සමාධියට සම වැදුනාක් මෙන් බලා සිටියාය. මේ සොඳුරු යුවල තම නිවසට එළිය පහළ කළේ යැයි සිතිනි. ඔවුන්ගේ ඇවතුම් පැවතුම් ද අමුතුය. ඇය නැටීමට ප්‍රථම සැමියාගේ දෙපා වැන්ද හැටිත්, ඔහු ඇගේ දෙකම්මුල් සිප ආචාර කළ හැටිත් බලා සිටියාය. මෙච්චර සුන්දර යුවලක් සිය පවුල් රටාව තුළ නැත.

පිරිමියා රෝගී වූ විට ඔහු වෙනුවෙන් වෙහෙසුනු හැටි මතකය. තම දරු මුණුබුරන්ගේ පවුල්වල මෙවන් අවබෝධයක් නැත. සතියකට වරක් පැමිණි පසු හැන්දෑ වනතෙක් වෙල් එළියට වී කතා කරන හැටි දැක ඇත.

❁ ❁ ❁ ❁ ❁ ❁ ❁

උමා නිවසට ගියේ හොඳටම හවස් විය. අම්මා හා අප්පා ගේට්ටුව අසලට වී මග බලා සිටිනු උමා ඈතට දුටුවාය.

"ඇයි පරක්කු වුණේ...?"

"කෝච්චිය පරක්කුයි...."

ඇය ගේට්ටුව වසමින් කීවාය.

"අක්කාට කොහොමද..?"

චේතාලිංගම් ඇසුවේය.

"අක්කා හොඳින් ඉන්නවා.."

"දෙන්නා ඉන්නේ එකටද..?"

අම්මා සිතේ පැසවන ප්‍රශ්නයක් ඇසුවාය.

"උදිත් සර් ඉන්නෙ වෙනම කාමරයක.."

කාමරයට පිවිසි ඈ මවගේ සහායෙන් ගවුම ගලවා ගත්තාය.

"මූකුත් හිතන්නෙ නැතිනම් බඩුවක් පෙන්වන්නම්..."

මව සිනාසෙනු ඈ බලා සිටියාය. ගෙනෙන ලද ෆයිල් කවරයේ තිබූ චේතාගේ තනි ඡායාරූපයක් උමා මවට දුන්නාය.

"අඳුරනවද බලන්න...."

"උඩරට කස්ටියුම් ඇඳගත්ත බ්‍රයිඩ් කෙනෙක්... ලස්සනයි.. කාගෙද වෙඩින් එක...?"

"අඳුනන්ට පුලුවන්ද..?"

"මයිගෝඩ්.. මේ චේතා නේද...?"

ඇය දෑස් ලොකු කරගත්තාය.

"කොහොමද ඇත්මද...?"

"මේකත් බලන්න..."

ඇය උඩරට මනාල යුවලකගේ ඡායාරූපය දෙමින් කීවාය. උඩරට මනාල යුවල දැක පුරුදුය. මෙච්චර ලස්සන යුවලක් සැගෙන දවසකින් දැක නැත.

"මේ උදිතුයි චේතායි නේද.. දෙන්නා බැඳලද....?"

ඇය පිළිතුරක් දුන්නේ නැත. චෛත්‍යලිංගම් ආවේ ඔවුන් කතා කරමින් සිටියදීය.

"මේ මොකක්ද බලන්න...."

චෛත්‍ය ලිංගම් උපැස් යුවල සකස් කරගෙන යුගල ඡායාරූපය දෙස බැලුවේය.

"මගෙ දෙවියනේ මේ චේතා නේද...?"

"අක්කා මැරිකරලද...?"

"බැන්දත් ඇති වරදක් නෑ නේද...?"

උමා ඇසුවාය.

"එයාව ඇරියෙ ආරක්ෂාවටනේ.. වැඩිහිටියන්ගෙන් අහන්නෙ නැතිව එහෙම කරන එක සදාචාර සම්පන්න නෑ...."

"උදිත් එහෙම කෙනෙක් නෙමේ අප්පා.. මේක රඟපෑමක් විතරයි...."

"ඒ කිව්වේ....?"

"උදිත්ගෙ යාළුවගෙ ගෙදර කුලියට දෙන්නෙ බැඳපු කපල් එකකට විතරයි කිව්වා.. මේ විදිහට ෆොටෝ එකක් අරන් තියෙන්නෙ ඒ හෝනට පෙන්නයි..."

ඔහු හිස වනා පිළිගත්තද යුවල පිළිබඳ කිසිවක් කීවේ නැත.

"මොන දේ වුණත් ජෝඩුව ලස්සනයි..."

චෛත්‍යලිංගම් කීවේය.

"ඉක්මනට ගෙන්නලා රට යවමු..... එතකොට මේ ප්‍රශ්න ඉවරයි..."



# 34

චේතාට මේ ජීවිතයේ හිස්තැනක් ඇති බැව් හැඟී ගියේ මේ මෑතකය. ගෙවී ගිය මාසය තරම් තම සිතට සතුට ගෙනා වෙනත් කාලයක් නැති තරම්ය. ගැහැනියට ආදරය සෙනෙහස හිමිය. තමාට අඳුරින් මැකී ගිය අතීතයක් තිබූ බව සැබෑය. දියෙන් කිරි වෙන්කර ගන්නා හංස දෙනක් පරිදි තමාට සතුට වෙන්කර ගැනීමට හැකිවූ හැටි. සැමවිටම සිටින්නේ සතුටිනි. තමා සතුටින් පසුවන්නේ නැතැයි කිසිවෙකුට කිව නොහැක. උදිත් එන්නේ සතියකට වරකි. ඔහු එනතෙක් සතියක් බලා ඉන්නේ කොතරම් උද්යෝගිමත් සිතින් යුතුවද? වෙනදා හිස් අතින් නිවසින් පිටව ගියත් අද එසේ නොවේ. පාන්දරින් නැගිට කෑම පිළියෙල කිරීම කිසිම අවශ්‍යතාවක් ඇයට තිබුනේ නැත. පුරුදු ලෙස කෑම පිසීමට මෙහෙකාරිය එන්නේ දවල්වය.

ගැහැනියට නිරායාසයෙන් පැවරී නොතිබුණත් ඇය විසින් කැමැත්තෙන් පවරාගත් කටයුතු කීපයක් වෙයි.

සිය සැමියාට ආදරය කිරීම, උවටැන් කිරීම, දුකේදීත් සැපේදීත් සමව දුක සැප බෙදා ගැනීම ඇය සතුය. ජීවිතයෙන් කොටසක් නෙමේ ඔබේ මුලු ජීවිතයම මට ඕනෑ. අන්න ඒකටයි ආදරය කියන්නෙ.

නිම්දිරියෙන් පිබිදුනත් එකවරම ඇඳෙන් නැගී සිටීමට සිතක් නැත. ඒ ප්‍රියකරු උදාසීන කමේ ගැලී සිටීමට ඇය කැමතිය. අම්මා හා නංගි සමග එක සයනයක නිදා ගන්නා හැර නේවාසිකාගාරයේදී මිතුරියන් සමග වත් නිදාගෙන නැත.

උදිත් රෝගාතුරව කාමරයේ සිටි දින දෙක ඇයට හොඳින් මතකය. උණ විකාරයෙන් දොඩවමින් සිටි නිසා ඔහු දමා යාමට නොහැකිව ඇඳට හිස තබා නිදාගත් හැටි මතකය. පාන්දර පිබිදුනේ

කිසිවෙකුගේ ගතට සිරව සිටියදීය. මෙසේ කිසිදාක නිදාගෙන නැත. ඇත්තටම මේ සැබෑ ජීවිතයේදී පිළිගත නොහැකි කතාය.

අපට සම්ප්‍රදායික පිළිගත් විදිහටම වැඩ කරන්නට බෑ. ජීවිතයේ හැම අවස්ථාවක්ම පෙළගසා පවත්වාගෙන යන්ට බෑ. උතුර නැගෙනහිර පවතින යුද්ධය නිසා දමිළ මුස්ලිම්, සිංහල මිනිසුන්ට නිජබිම් අහිමිවෙලා. යුද්ධ නිසා සමස්ත කෘෂි ආර්ථිකයම බිඳ වැටිලා. බොහෝ දෙනෙක් සරණාගත කඳවුරුවලට වෙලා.

සාමකාමී ජීවිත ගත කරන්නෙකුට මේ ප්‍රශ්න නැත. අද තමා මෙහි පැමිණ සිටින්නේ තම ජාතියේ නොවන පිරිමියෙක් හා ජීවිත පටන් ගැනීමේ ඇති කැමැත්තෙන් නොව ජීවිතය ආරක්ෂා කරගැනීමටය. කුමන අවදානමක් දුරුවත් ඔහු හා ගෙවන මේ ජීවිතය ප්‍රියකරුය. වැඩ නිමවා එනවිට හොඳටම රෑ බෝවෙයි. සතියට අවශ්‍ය කෑම බීම ඔහු රැගෙන එයි. එතෙක් මග බලා සිටින්නේ ඔහු එනතෙක්ය. සම්ප්‍රදායික යහපත් පවුල් ජීවිතයක අංග ලක්ෂණ මීට හුරුය. හැම ගැහැණියකගේම අභිප්‍රාය විය යුත්තේ නිවසින් පිටව ගිය සැමියා නිරුපද්‍රිතව එනු දැක්මය. ඔහු තම සැමියා නොවේ. ඔහු කවුද. අම්මා හා තාත්තා ගෙවන දිවියෙන් හොඳ දූවරු අත්දැකීම් ලබති. පතිකුලයකට යන දුවට මුළු ජීවත්වීමම දෙමාපියන්ට කියා දීමට නොපුළුවන. එසේම ගුරුහරුකම් ලබාදීමට ඒ සඳහා ලියවුණු අත්පොත් නැත.

ඔවුන් යුගදිවිය පිළිබඳව කතිකාවක යෙදී නැත. හැන්දෑවේ තේ පානයෙන් පසු ගෙවත්තේ ඉඳගෙන අල්ලාප සල්ලාපයේ යෙදීම සිරිතකි. ඉඳහිට කොට කලිසමකින් හා ටීෂර්ටයකින් සැරසී ඇය කොණ්ඩය මුදාහැර සුන්දරව සිටින්නීය. තරුණ ගැහැණියෙක් පිරිමියෙකුට ප්‍රිය මනාප ලෙස සුන්දරව සිටීම පිළිබඳව උඩුරාවන මැහිණියගේ කිසිම අකමැත්තක් නැත. සොඳුරු යෞවනය කුසුමක් මෙන් පවිත්‍ර විය යුතුය.

''ඉතින්...''



ඔහු ඇගේ දීප්තිමත් නෙතු සඟල දෙස බලමින් ඇසුවේය.

''ඉතින්...''

ඇ මෘදුලෙස අතැඟිලි පටලවා ගනිමින් සිනාසුනාය.

යාන්තමින් අඳුර ලොව ගිල ගනිමින් තිබුණි. සිතේ හැඟීමක් නැතිවාම නොවේ. ආදරයක් නොතිබුණාම නොවේ. තමාගේ ජාතියේ තමාගේ ආගමේ නොවන පිරිමියෙක් හා මෙලෙස තදබල ලෙස බැඳෙන්නට තරම් වූ සම්භාවිතාවය කුමක්ද? ඒ නිගඩ බව සැබැවින්ම ගැඹුරු වූවකි. දෙමාපියන් ගැන නංගි ගැන තමා නිසා ඔවුන් මුහුණ පා සිටින ප්‍රශ්න ගැන ඇයට පැහැදිලිව දැන ගැනීමට අවශ්‍යව ඇති බව ඔහු දනී. මෙහි පැමිණි පසු ඔහු විසින් කරන්නේ නිවසේ තොරතුරු වාර්තා කිරීමය.

''මම අප්පාට කතා කළා.. කවුරුත් හොඳින් සනීපෙන් ඉන්නවා..''

ඇය ඉවතට හැරී කඳුළු පිසදමා ගත්තාය.

''නෑඩා ඉන්න...''

ඇය පිළිතුරක් නොදී උදිත්ගේ ළයෙහි හිස හොවා ගත්තාය. කිවයුතු බොහෝ දේ තිබුණත් ඒ හැම දෙයක්ම හදවතේ ගල්ව ඇත. මෙවා යුද්ධයේ අතුරු ඵලයන්ය. පළමුවෙනි හා දෙවන ලෝක යුද්ධවලදී මිය ගිය, අබ්බගාතයන් වූ පිරිස මෙන්ම දෙමාපියන්ට දරුවන් මග හැරුණ අවතැන් වූ පිරිසගේ ශෝකාන්තයන් ලොව ඇත. මේ සිද්ධියේදී බාහිර පුද්ගලයෙක් ලෙස තමා මැදිහත් වුණත් එහි අතුරු ඵලයන්ට තමාට මුහුණ දීමට සිදුව තිබුණිත් උදිත් ඒවා වෙතාට කීවේ නැත. උදයන්ට තවම වෙතා සැඟව සිටින තැනක් සොයා ගැනීමට නොහැකි වී ඇත. තිප වරක්ම සේවා ස්ථානයට තර්ජනාත්මක දුරකථන ඇමතුම් දී තිබුණි. ඔහු ඒ බවක් ඇයට පැවසුවේ නැත.

''බය වෙන්න එපා ළඟදීම වීසා ලැබෙයි...''

''මට යන්න බෑ...''

ඇය තරයේ ළයෙහි හිස හොවා කීවාය. උදිත් පිළිතුරක් දුන්නේ නැත. යුවතියන් දන හැඳින සිටියත් මෙතරම් සමීපව ජීවත් වූ තවත් කෙනෙක් නැත. ඇගේ ආදරය මතුපිටින් මතුවූවක් නොවේ. මේ ඇසුරට දිගු ඉතිහාසයක් නෑ. හිතට සමීපව අත්දැකීම බෙදා ගනිද්දී අප අතර පරස්පර බවක් නෑ. එකම සයනයක, එක්සිත්ව කයෙන් දෙදෙනෙක් වෙන් සිටීම කොතරම් අසීරු බැරෑරුම් කටයුත්තක්ද? එහෙත් අප දැන් ඒ ජීවිතයට හුරුව සිටිමු.

''නාගන්න ඕනෑ.. අපි යමු...''

''මේ රෑ නාන්ට එපා... ඇඟ හෝදගන්ට...''

''හුඟ දවසකින් නෑවෙ නෑ.. අපි පල්ලෙහා ළිඳට ගිහින් නාගම්මු...''

ඇය ඔහුගේ මේ සැහැල්ලු දිවියට කැමතිය. සිකුරාදා දිනට ඔහු ළිඳෙන් දිය නෑමට පුරුදුව සිටියේය. වෙනා නාන බාල්දිය හා ඔහුගේ තුවාය ගත්තාය. මෙම සොඳුරු යුවල කෙරෙහි මැහිණිය පැහැදී සිටියාය. ඔවුන්ගේ කතා බහ හැසිරීම් ද නව ජීවිතයට සමීපය. රාළහාමිගේ හැසිරීම් ද මෙසේය. ඔහු තමා සමඟ වත්ත පහළ ළිඳ ළඟට ගොස් දිය නෑ හැටි මතකය. ගෙදර සියළු පෞද්ගලික තොරතුරු කතා කරන්නේ ළිඳ ළඟදීය. දරුවන්ගේ ඉගෙනීම, පවුලේ ප්‍රශ්න රැකියා ස්ථානයේ ප්‍රශ්න, පන්සලේ දායක සභාවේ ප්‍රශ්න හැම දෙයක්ම කතා කරන්නේ මෙහි සිටිය.

පුන්සඳ දියරක් සේ තුරු අතරින් පොළවට පතිත වෙමින් තිබුණි. පොල්රුප්පාව අතරින් බේරෙන සඳරැස් තවත් සඳක් වෙත පතිත වී තිබුණි.

''හරියට දවල් වාගෙ හඳ පායලා..''

ඇය අහස දෙස බලා කීවාය.

''මෙකට තව හේතුවක් තියෙනවා.. හඳවල් දෙකක් පායලා..''

''ඇයි මට මේ විදිහට කියන්නෙ..?''

ඇය උරට හේත්තු වෙමින් ඇසුවාය.

''මගෙ ඇස්වලින් දකින හැම දෙයක්ම ඇත්ත..

''ඇයි මං වාගෙ දෙමළ කෙල්ලෙකුට මෙච්චර ආදරේ කියන්න...''

''මම කියල තියෙනවනෙ.. අංග ලක්ෂණ විදිහට කොයි ගෑනිත් එකයි.. මීටත් වඩා සහතිකයක් ඕනෑද..?''

''ගෙදර ගිහින් කතා කරමු.. දැන් නාගන්න..''

ඇය සිනාසුනාය.

උදිත් හැඳ සිටි කලිසම පිටින් ළිං පඩියට ගියේය.

''අනේ නාන්ඩ එපා...''

''ඉතින් කතා කරන්න... දුර වැඩියි එන්න ළඟට...''

''මම ළඟින්ම ඉන්න ඕනැද...?''

ඇය සෙමින් ඔහු අසලට ගියාය.

''බැරි වෙලාවත් කවුරුහරි අරන් ගියොත්.. ඒ නිසා මා ළඟටම එන්න...''

ඇය ළිංපඩිය මතට ආවාය.

''නාවන්ටද..?''

''ඔයාගෙ කැමැත්තක්....''

''නාවන්ට බෑ.. එන්න ඇඟ හෝදවන්න.. ඉඳගන්න...''

ඇය සෙමින් ඔහුගේ පාදය අසල ඉඳගත්තාය. ඔහු නාන ළිඳෙන් ජලය ගෙන ඇගේ කයට දැම්මාය.

''සබන් ගා ගන්න..''

චේතාගේ හදවතට පිවිසුනේ අපමණ සතුටකි. කුඩා කල අම්මා හෝ තාත්තා දිය නැව්ව' හැටි චේතාට මතකය. ඒ කලේ දාරක සෙනෙහස නිසාය. මේ තමා නාවා පිරිසිදු කරන්නේ කොතරම් ලෙන්ගතුවද?

''මේ තුවාය පොරවා ගන්න...''

''එපා.... මම ගෙදර ගිහින් ඇඳුම් මාරු කරගන්නම්..''

''කකුල් දෙකේ කුණු ගෑවෙයි...''

ඔහු පහත්වී ඇය දෑතට වඩා ගත්තේය. ඇය කර බදා ගත්තේ කුඩා දූරියක ලෙසිනි.

# 35

මේ ලොවේ ගස් වැල් ගංගා ඇල දොල නිර්මාණය වී ඇත්තේ ජීවීන් වෙනුවෙනි. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික හැම සතෙකුට ජීවන රටාවක් ඇත. වර්ගයා බෝකිරීම, සතුරන් ගෙන් ආරක්ෂාවීම, ආහාර සපයා ගැනීම සඳහා හැම සතාටම ඔවුන්ට ආවේනික වූ චර්යාවන් ඇත. මිනිසා මේ හැම සතාටම වඩා බුද්ධිමත්ය. මිනිසා හැසිරෙන කවර නම් නිමේෂයක් වුව එකිනෙකට සමාන නැත.

සමාන සංසිද්ධිය වන්නේ ආදරය පමණි. මේ සමස්ත ලෝකයම රඳා පවතින්නේ ආදරය නම්වූ සුවිශේෂී මනෝමය අවස්ථාව නිසාය.

චේතා සිටියේ ඒ උත්තරීතර ජීවිතයේ එක් අවස්ථාවකය. ජීවිතයේ කිසිදාක මෙවන් තදබල පිරිමි ස්පර්ශයක් ලැබී නැත.



කුඩා කල තමාට අම්මා හා තාත්තා වඩාගෙන ගිය හැටි මතකය. දෙමාපියන්ගෙන් පසු හිමිවිය යුතු තැනැත්තාගේ ස්පර්ශය අද තමාව හිමිවී ඇත. මේ හැම යොවනියකගේම පැතුමයි. හැම ගැහැණියක්ම ජීවිතයේ ඉතා සිහින් පතන සුන්දර අවස්ථාවක තමා පසුවන්නේ යැයි චේතා සිතේ.

''සීතලයිද...?''

''මහ්.. මාව තුවායෙන් ඔතාගෙනනෙ ඉන්නෙ..''

ඇය ගෙල බදා කීවාය. එකවරම කුස්සිය පැත්තෙන් විදුලි පහන් දැල්වූයේ අනපේක්ෂිත පරිද්දෙනි. ඇගේ නෙත ගියේ මිදුල දෙසට එහා උඩුරාවණ මැහිණිය වෙතය. එහෙත් ඇය එම ඉරියව්වෙම රැඳී සිටියාය.

''මට බය හිතුනා මේ ළමයි එළියක්වත් ගෙනිච්චෙ නැද්ද...?''

''කළුවර නෑ අත්තම්මා මුළු වත්තම විලක්කු දාහක් පත්තු කළා වගේ එළියයි...''

''එපා එපා කතා කියන්න.. කියන්න මාව බිම...''

''බෑ.. බෑ.. මේ සුදු පතුල්වල කුණු ගෑවෙයි...''

''ආත්තම්මා මොනව හරි හිතයි...''

''ඩිම්ෂන් හැඩිබින් ටෝකන්... දැන් අමුතුවෙන් හිතන්න දෙයක් නෑ...''

ආත්තම්මාට ඔවුන් පසුවන ජීවිතය පිළිබඳව ගැහී කියාට කිසිම සැකයක් නැත. විදුලිපහන නිවා දැමූ ආත්තම්මා සිනාමුසු මුහුණින් යුතුව නිවස තුළට වැදුණාය.

''මට බයයි වගේ...''

ඇය ඔහුගේ කර බදා සිටියදීම මිමිණුවාය.

"ඇයි බය වෙන්නේ..?"

"ආත්තම්මා අපි දෙන්නා ගැන මොනවා හිතාවිද දන්නෙ නෑ...."

"ඒ ඉන්නෙ කෲර වැඩිහිටියෙක් නෙමෙ.. අපි වාගේ දෙන්නෙකුගේ හිත තේරෙන කෙනෙක්.. ඒකටයි වියපත්වීම කියන්නෙ..."

"ඉකින් තියන්න මාව බිම... මහන්සි ඇතිනෙ..."

"ඔහ්.. ඉට්ස් ලයික පෙදර්.. මේ චක්‍රාවාටේ වටා සැරයක් ගිහින් තවත් ටිකක් යන්න පුළුවන්.. මටම හිමියැයි මේ විදිහට ඉන්න බව හදවතටම කියාවී..."

"මා දන්නව මුළු ජීවිතය පුරාවටම ගැහැනියගේ යුතුකමක් තියෙනවා.. පිරිමියෙකුට ඉවසන්න පුළුවන් බරක් දෙන්න.. ඕකේ දෙන්... මම ගිහින් ඇඳුම් මාරු කරගෙන එන්නම්..."

ඇය ඔහුගේ අතින් මිදී නාන කාමර දෙසට දුව ගියාය.

තමා චේතා සමඟ සිටී ඉරියව්වට අත්තම්මා විරුද්ධ වෙතැයි සිතිය නොහැක. හැම අත්තම්මා කෙනෙක්ම යොවුන් ජීවිතයේ සුන්දරකම හඳුනයි. වැඩිහිටියන් වයස්ගත වූ පසු ජීවිතය දෙස බැලිය යුත්තේ ද්වේෂයෙන් නොවේ. තැන්දම්මා සිය ලේලිය දෙස බැලිය යුත්තේ වෛරයෙන් නොවේ. ආදරයෙනි. යුද්ධ කරද්දී හෝ ආදරය කරද්දී කරන කිසිවක් වැරදි නැත. එසේම පාර්ලිමේන්තුව තුළ ද පැවරෙන වරප්‍රසාද මත කරන කිසිවක් වැරදි නැත.

කාමරයට ගොස් සූදානම් වෙද්දී සිතට පිවිසුනේ අමුතුම සතුටකි.

තමා සූදානම් විය යුත්තේ තවත් අයෙක් වෙනුවෙනි. සැබැවින්ම ගැහැනිය ජේවිය යුත්තේ තමා වෙනුවෙන් නොවේ. පිරිමියා වෙනුවෙනි. ගැහැනියගේ ස්වභාවික හිමිකරු පිරිමියා වෙයි.



පිරිමියා සිය ආකර්ෂණයට ගැනීමට ගැහැනියට ස්වභාවික අයිතියක් ඇත. සුසැට හරණින් සැරසීමෙන් කරන්නේ පිරිමියාගේ සිත උදුරා ගැනීමය.

පිරිමින් ද වඩා කැමති එම සෙයියාවෙන් ගැහැණු සමග සිටීමටය. අපට ස්වභාවික රීතිය පාලනය කිරීමට නොපුළුවන. පිටුපසින් පැමිණ ගෙල බදාගත්තේ කවුදැයි නෙතෙම පැහැදිලිව දනී

"කෑම කනවද තේ බොනවද...?"

ඇය හිසට මුහුණ කැද කරමින් ඇසුවාය.

"කන්න බොන්න මොකුත් ඕන්නෑ.. මං ලඟට වෙලා හිටියාම ඇති..."

"එහෙම බෑ.. ඔෆිස් ඇරිලා ආවට පස්සේ මොනවත් බිව්වෙ නෑ.. දැන් කෝපි එකක් බීලා රෑට කෑම කමු..."

"ඕයා කැමති දේ කරන්න..."

රාත්‍රී ආහාරයට ප්‍රථම ඔහු කෝපි පානය කළේය.

"අම්ට තව ටික දවසයි මේ විදිහට ඉන්න වෙන්නෙ..."

ඇය එකවර පිළිතුරක් දුන්නේ නැත. තව ටික දිනෙකින් මේ පරිසරය අතැර යා යුතුවෙයි. ලංකාවේ ජනවාර්ගික අර්බුදයක් පවතින බව සානාපති කාර්යාලයට ඒත්තු ගන්වා එංගලන්තය, ප්‍රංශය, කැනඩාව, ජර්මනිය, ඕස්ට්‍රේලියාව වැනි රටවල සරණාගත පදිංචිය ලැබූ ද්‍රවිඩ ජාතිකයන් රැසකි.

මේ හැමටම කලින් අප්පාට කැනඩාවට හෝ ඕස්ට්‍රේලියාවට යාමට හැකිකම තිබුණි. නමුත් ඔහු කිසිවිටෙක ශ්‍රීලංකාව අතැර යාමට කැමති වූයේ නැත. ඔහු නිබඳව සුසාදී සිටියේ සමස්ත කලාවෙන්ම රසිකයන් පිනවීමටය.

"මට මගේ ජීවිතය දාල යන්න බෑ..."

"ආදරෙයි තමයි.. ඒත් මෙච්චර හැඟුම්බරව මේ ප්‍රශ්නය විසඳන්න බෑ... හැමටම කලින් චේතා ආරක්ෂා වෙන්න ඕනෑ..."

ඇය පිළිතුරක් දුන්නේ නැත. මේ සැඟව සිටීමට වෙර දැරීම කෙතෙක් දුරට සාර්ථකද? මොවුන්ගෙන් ආරක්ෂාවීම ලෙහෙසි කටයුත්තක් නොවේ. හමුදාවේ බුද්ධි අංශයේ රැසක් ඝාතනය වූයේ ඔවුන්ගේ සංවිධාන ශක්තිය නිසාය. සංවිධානය හැර ගිය කිසි කෙනෙකුට සමාවක් නැත. මේ බව උදිත් පැවසුවත් ඔහු එය දැඩි සේ බිය ගත්තේ නැත. සන්නද්ධ වූ ත්‍රස්ත කල්ලි ඒ ඒ රටවල රටවලද ක්‍රියාත්මක වෙති. උදිත් මේ ප්‍රශ්න ගැන හරියට දන්නේ නැත.

"ලංකාවෙන් ගියත් මගෙ ජීවිතේ ආරක්ෂා වෙන්නෙ නෑ...."

ඇය පහත් හඬින් කීවාය.

"තාඩා ඉන්න චේතා නැතිව මට ඉන්න පුළුවන් කියලද හිතන්නෙ..."

ඔහු ඇය ළයට තද කර ගනිමින් ඇසුවේය.

"මම ජීවත් වෙන්නෙ හුස්ම ගන්නේ ඔයා ප්‍රාශ්වාස කරන ජීව වායුවෙන්. ඒත් රත්තරනේ මට බයත් දැනෙනවා..."

"කියන්න කියන්න.. කොයි වගේ බයක්ද...?"

"ඔයා මට නැතිවෙයි කියන බය..."

ඇය හඬමින් කීවාය.

ඔයාගේ ජාතියේ නොවන ඔයාගේ භාෂාවේ ආගමේ සංස්කෘතියේ නොවන ගැහැණියක්ට ආදරේ කරන්නේ කොහොමද....?"

"කියලා ඉවරද...?"

"නෑ මම ඉවර නෑ.. මම වගේ දෙමළ ගැහැනියෙක් ගත්තොත් පරපුරම ඔයාව කොන් කරාවි..."



"මම වාගේ සිංහල මිනිහෙක් බැන්දොත් ඔයාගෙ පරපුරත් ඔයාට විරුද්ධ වෙයි.."

"මම බැන්දොත් ඔයා කනවැන්දුම් මිනිහෙක් වෙයි.. උන් මාව මරයි..."

"ජීවිතයේ අනාගතය දක්වාම අපිට හිතන්න බෑ.. අපේ අනාගතය කවර ආකාරයකින් විසඳේද කියල කාටද කියන්නට පුළුවන්.. එන්න කෑම කමු..."

"කන්න නම් බෑ.. මං ළඟට වෙලා ඉන්නම්..."

"එහෙම කරන්න තරකයි.. යමු ආත්තම්මත් බලන් ඇති..."

ඔහු නිහඬව කෑම මේසයට ගියේය. ආත්තම්මා මොන අයුරකින් හෝ සතුටින් සිටිනු පෙනේ.

"මොකද ළමයිනේ අද කෑම කන්නේ නැද්ද...?"

"කනවා ආත්තම්මා..."

උදිත් අසුන් ගනිමින් කීවේය. චේතා පිඟාන ගෙන උදිත්ට කෑම බෙදන්නට වූවාය.

"එතකොට චේතා..."

මට කන්න බෑ..."

"ඇයි දරුවෝ කෑම අප්පිරියක්ද...?"

"ඔව් ආත්තම්මා.. කන්න ආස නෑ.."

උඩුරාවන මැකිණිය ප්‍රශ්නයේ අග මුල සොයා ගත්තාය. මෙම යුවල විවාහ වී මෙනි පැමිණ මාසයකටත් වඩා වැඩිය. දරුවෙක් ඇතිවීමට මේ කාලය හොඳටම ප්‍රමාණවත්ය. තමාගේ කුසේ එවැනි වෙනසක් දැනගැනීමටත් අවබෝධයක් මේ නව යුවලට නැත.

උඩුරාවන මැතිතිය සෙමින් අසුනෙන් නැගිට චේතා වෙත ආවාය. ඇය සිනාමුසු මුහුණින් පැමිණ චේතාගේ දෙකම්මුල් සිපගත්තාය.

"මයි කන්ග්‍රැජුලේෂන්.. මේ පණිවිඩේ ලැබෙන්න මෙච්චර පරක්කු වුණේ මොකද බැලුවා..."

ඇය චේතාගේ හිස අතගෑවාය.

"උප්පත්ති පාලනය කරන්නෙ නැතිව ඉක්මනින් දරුවෙක් හදාගන්න එක හොඳා...."

චේතා උදිත් දෙස එක එල්ලේ බලා සිටියාය.

# 36

බත් කටක් කෑවේ උදිත්ගේ පෙරැත්තය නිසාය.

"කියන්න අසනීපයක්ද..?"

"නෑ නෑ.. මට අසනීපයක් නෑ.."

ඇය කාමරයට ගියේ ඔහුගේ අතේ එල්ලීය. මෙය පැහැදිලිවම සම්ප්‍රදායික නොවන ඇසුරකි. විවාහයක් බව අවට ලෝකයාට පෙනෙන්නට ජීවත් වූවද මෙම ආත්ම වංචාවට දෙදෙනාටම මානසික වදයකි. ඇය ඔහුගේ උරෙහි හිස හොවා තරමක් වෙලා සිටියේය. දෙනෙත් කඳුළෙන් පිරී ගියේ හදවත අසරණ වූ හෙයිනි.

"ඇයි මේ අඬන්නේ..?"

ඔහු ඇයගේ නිකටින් අල්ලා තමා දෙසට හරවා ගනිමින්



ඇසුවේය. ගැහැනියකට පිරිමියෙක් සමග හුරතල් වීමට විවෘත අයිතියක් ඇත. ලෝකයේ සත්ව වර්ගයා නිර්මාණය වී ඇත්තේ එක් රිතියකට අනුවය. පිරිමියා ප්‍රිය කරන හැම ප්‍රිය ඇසුරක්ම ස්වභාව ධර්මය ගැහැනියට දායාද කර ඇත. එහෙත් ජාති කුල ආගම් වශයෙන් වූ බාධා ඔවුනට ගැඹුරු ඒවා වී නැත.

"ඇයි මට මේ විදිහට ආදරේ කරන්නේ..?"

"ඒක නිකම්ම නිකං හදිසියෙන් සිද්ද වෙච්ච දෙයක් නෙමේ...."

ඇය ඔහුගේ ඇකයේ නිහඬව හිස තබා ගත්තාය.

"ඔබ ළගට එන්න.. ඉස් දෙයාර් එ කොයින්සිඩන්.."

"ඔව් අපි ආත්ම ගානක් මේ විදියට ඉපදෙන්න ඇති... එකට ඉන්න ඇති.."

"කොයි විදිහටද එකට ඉන්න ඇත්තෙ...?"

ඇය විමසුවේ වගකිව යුතු පැනයකි. රාත්‍රිය අතිශයින් නිහඬය. යාන්තමින් ඇරුණු ජනෙල් පලින් සීතල සුළං රැළි කාමරයට පිවිසෙමින් තිබුණි.

"මම දන්නවා මගේ හිතට පිළිසරණක් නෑ...."

"හැම නිමේෂයකම ඔයා ළඟ ඉන්නවා නම් පිළිසරණක් නැතැයි කියන්නේ ඇයි...?"

ඇගේ හැසිරීම් මෑතක සිට වෙනස්ය. ගැහැණු පිරිමි කවුරුත් ජීවත් වන්නේ හැඟීම් ඇසුරෙනි. එක්කෝ වෙන්විය යුතුය. නැත්නම් එකට ජීවත් විය යුතුය.

"මට ඔබෙන් තැකිවීම ගැන ආත්තම්මා දුකින් හිටියා... ඒක ඇත්ත කතාවක් වෙන්න ඕනෑ..."

ආත්තම්මා පැවසූ දෙයින් ඇය කරදරයට පත්ව ඇත. මෙය වගකීමෙන් කරන කතාවකි. චේතා තමා සමඟ මෙහි එව්වේ ලොකු වගකීමක් බාර දෙමිනි. නිවසේ ඔවුන් සමඟ සිටියදී චේතන් සබඳතාවයන් පැවැත්වීමට පුළුවන. එසේත් නැත්නම් දෙදෙනාගේ කැමැත්ත මත දෙමාපියන් එකඟ කරවා ගැනීමට පුළුවන. මේ ගමන එව්වේ තමා කෙරෙහි තැබූ තදබල විශ්වාසයකිනි.

අපිට අපිව පාලනය කරගත හැකි සීමාවක් තියෙනවා. ඒවා ඉක්මවා ගියහොත් හදවතින් දඬුවම් ලැබීම වළක්වන්න බෑ. තමා චෛත්‍යලිංගම් ආශ්‍රමයට ආවේ අයාලේ යන තැනැත්තෙක් ලෙස නොවේ. සංගීත පරම්පරාවක් නියෝජනය කරන වගකිවයුතු ශිෂ්‍යයෙක් ලෙසය.

ගැහැනියකට සිදුවිය හැකි බරපතලම අපරාධය සිදුවුවහොත්. එක ඇඳේ සැතපෙන මෙම නව යොවුන් තරුණිය පොළඹවා ගැනීමේ කිසිම ප්‍රශ්නයක් නැත. වඩාත් වැදගත් වන්නේ එවන් තත්වයකට ගැහැනියක් පත් නොකර තබා ගැනීමය.

"මට වරයක් ඉල්ලන්න ඉඩ දෙන්න..."

"රජවරුන්ගෙන් කුමාරිකාවෝ වර ඉල්ලා ගත්තා."

"ඔව් ඔයා තමා මට ඉන්න රජ්ජුරුවෝ.."

"අද සිට අපේ ජීවිතය පටන් ගන්න ඉඩ දෙන්න ඕනෑ..."

ඇය පවසන්නේ කුමක්දැයි ඔහුට හැඟෙයි.

"මා අයිති ඔයාට විසක වෙන කාටවත් නෙවේ..."

ඔහු නිහඬව ඇය සිය ළයට තද කරගත්තේය. දීර්ඝ ලෙස කළ හැකි සාකච්ඡාවක් නැත.

"එහෙනම් මම හෙට අප්පා හම්බවෙලා මේ බව කියන්නම්..."



"මත්.. එපා.. ඔයා දුක්වෙන්න එපා.. මගේ ජීවිතයට මොනවා වෙයිද ඒ දේ කොයි මොහොතක වෙයිද කියන එක මට කියන්ට බෑ.. ඒ නිසා නීත්‍යානුකූලව විවාහ වෙලා ඔයාව ප්‍රශ්නෙකට මැදිකරල මැරෙන්නට මට කිසිම ඕනෑ කමක් නෑ..."

"ඔයාට කිසි දෙයක් වෙන්නෙ නෑ. වීසා ලැබුණ ගමන් ඔයාට යන්ට පුළුවන්..."

ගොඩක් පිරිමින්ට වඩා ඔයා වෙනස් මගේ ජීවිතය කුසුමක් ලෙස පූජා කරන්නට කැමති ඒකයි.."

❁ ❁ ❁ ❁ ❁ ❁

උමා නිවසට වී සිටියේ දැඩි කල්පනාවෙන් යුතුවය. කොයියම් මොහොතක හෝ චේතාට කරදරයක් සිදුවනු ඇත. එය කිසිම අයුරකින් වැළැක්විය නොහැක. ජීවිත හානියක් පැහැර හැරීමක් වැනි දෙයක අවදානම් ඇත. චේතා උදිත් සමඟ කරන රඟපෑම හුදු රඟපෑමක් පමණක්ම වේවායි පැතුවාය.

"අප්පා අක්කාගේ වීසා කන්ෆර්ම්ද...?"

"ලබන සුමානෙ ලැබෙන්ට ඉඩ තියෙනවා..."

"ඉස්සෙල්ලා චේතාට අරින්න.. ඊට පස්සේ අප්පයි අම්මයි යන්න..."

"එතකොට උමා.."

"මම ලංකාව දාල යන්නෙ නෑ..."

ඇය කෙළින්ම කීවාය. මිනිසුන් ලංකාව හැර යන්නේ විවිධ හේතු මතය. ආරක්ෂාවට, ධනවත්වීමට, ඉගෙනීමට කොයියම් හෝ හේතුවක් මත ගියත් සතුට ඇත්තේ ඇතිනි. කොතැනක සිටියත් මුණ ගැසුණු දිනයක ඇගේ ජීවිතයට තර්ජනයක් වීම වළක්වනු බැරිය.

ලංකාවෙන් ගියහොත් මෙ ප්‍රශ්නයෙන් මිදීමට බැරි නැත. උදයන් සූදානම් වන්නේ කෙසේ හෝ චේතා යළි කැඳවාගෙන යාමටය. අම්මා හා අප්පා පසුවන්නෙ හැඬූ කඳුළෙනි.

"කොයි මොහොතක හරි අපි ඉපදිච්ච රට දාල යන්ට වෙනවා.."

වෙතාලිංගම් කීවේය.

"මට නම් මෙ රට එපා වෙලා.. අපේ නෑදෑයො දැන් ඉන්නෙ ඕස්ට්‍රේලියාවෙ... එහෙ කිසි කරදරයක් නෑ එහෙට යමු.."

"කොහේ ගියත් අපි ආපහු ලංකාවට එන්නට ඕනෑ. කොයි වෙලේ වීසා එක ලැබෙයිද දන්නෙ නෑ.. අක්කාගෙ පෙට්ටිකඩ හෙට ලෑස්ති කරගන්ට ඕනෑ..."

"පොඩි දුව යන්න කලින් අපිට අක්කා ඉන්න තැනට යන්න බැරිවෙයිද...?"

"යන්න නම් පුළුවන්... ඒ ගෙදර අයිතිකාර ගෑනු කෙනා අමුතු ජාතියෙ කෙනෙක්... අක්කා දෙමළ කෙනෙක් බව දැනගත්තොත් හොඳ නෑ.. තාත්තයි අම්මයි දෙමළ බව ඕනෑ කෙනෙක්ට තේරෙනවා..."

"එහෙම නම් අපි කොහාට හරි තැනකට දෙන්නාට එන්න කියලා හමුව වෙමුද..?"

"උදිත් හැමදාම ගෙදර යන්නෙ නෑ.. වැඩ නොතිබුණොත් තමයි ඉන්නෙ.... හොටෙල් එකට ගියොත් හම්බ වෙයි.... හැබැයි අප්පා උදිත් ටවුම පැත්තට නම් චේතාව එක්කගෙන එන එකක් නෑ..."

"ඒ දරුව ආරක්ෂා නොකළා නම් උදයන් අරන් ගිහින්..."

ගේට්ටුවට පහර දෙන හඬින් පැමිණ ඇත්තේ කවුදැයි



උමා තේරුම් ගත්තාය.

"උදයන් වෙන්නැති අරින්න එපා දොර..."

ප්‍රශ්න ඇසී නොඇසීමට කටයුතු කරන වෙතාලිංගම් කවදත් උපේක්ෂාවෙන් කටයුතු කරන්නෙකි.

"දුව ඕස්ට්‍රේලියාවට ගියා කියන්න.."

වෙතාලිංගම් නිහඬව ගොස් ගේට්ටුව විවෘත කළේය. උදයන් සමග තරුණ හැඩි සිප දෙදෙනෙක් රැඳී සිටිනු වෙතාලිංගම් දුටුවේය. උදයන්ගේ මුහුණේ සිනාවක සේයාවක්වත් නැත.

"කෝ චේතා.."

ඔහු සැරෙන් ඇසුවේය.

"එමු ඇතුළට.."

"හිතවත්කම් තිබුණ කාලයක් තිබුණා.. දැන් ඒවා ඉවරයි.. චේතා සඟවා තැබීම, සඟවා තැබීමට අනුබල දීම වැනි හේතු මත පවුලටම වගකියන්න වෙයි.. කෝ චේතා..?"

"චේතා ලංකාවෙන් ගියා.."

එකවරම ඉදිරියට පැනගත් උදයන් වෙතාලිංගම්ගේ කමිසයේ කොලරයෙන් අල්වා ගත්තේය.

"මම උඹට සමාව දුන්නා වැඩියි.. කෝ චේතා..?"

නිවස තුළ සිට පැමිණි උමා උදයන් වෙතට දුව ගියේය.

"අතෑරපං අප්පාව..."

ඇය අතේ එල්ලී කෑගැසුවාය. උදයන් වෙතාලිංගම් අතෑරියේය.

"කොහෙ හිටියත් එයාට හැංගෙන්න බෑ... හැබැයි ජීවතුන් අතර ඉන්දෙද්දී ආයෙ දකින්ට වෙන එකක් නෑ.. අන්න ඒකත් මතක තියාගන්නවා..."

උදයන් ගියේ මෙ ප්‍රශ්නය තවත් බැරෑරුම් තත්වයකට පත්කරවමිනි. නන්පර සීපයක් ඉහත ඇති වූ සන්ත්‍රාසය තවම පහව නැත. වඩාත් වේදනාකාරී සිදුවීම වූයේ එම දුෂ්ඨ මිනිහා පියාට හිරිහැර කිරීමට සූදානම් වීමය. ඔහුගේ දෙනෙත් කඳුළෙන් පිරී තිබුනේ අසරණකම නිසාය.

"අප්පා නාඩා ඉන්න... අපි දුර්වල වෙලා බෑ.. අපිට මේ යුගයේ මේ වගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට වෙනවා..."

"බැරි විමසින්වත් මුන්ට වෙනාව හම්බ වුණොත් මරා දමාවි..."

"අප්පා ඒ නිසා අක්කාව බලන්න යන්න එපැයි කිව්වෙ ඒකයි..."

ඔහු හිස වනා එය අනුමත කළේය.

"අක්කා ලංකාවෙන් යන්ට ඉස්සෙල්ලා හම්බ වෙන්න පුළුවන්ද කියල මම අහල බලන්නම්.."



# 37

පරිසරය තුළ පැතිර ඇත්තේ නිහඬ බවකි. ස්වභාව වර්ණ ඇඳ රෙද්ද මතට ජනෙල් කවුළුව අතරින් සඳ එළිය වැටී ඇත. කාමරය තුළට එබිකම් කරන සඳ කිරණ දෝරේ ගලායන සේ විටාර ගලා ගොස් තිබුණි. ස්වභාව ධර්මයේ තවත් සජීවී නිර්මාණයක් ඉදිරියේ ඇය ලැජ්ජාවට පත්වූවා සේය.

මුතුන්ම හැකිව වැතිර සිටින්නේ ඇය සතු සාජු අයිතියක් ලෙසය. තමා පිට කෙනෙක් ලෙස නොසලකා ඇගේ ජීවිතයේ කොටසක් ලෙස දිදී දෙන ගැහැනිය දෙස ඔහු බලා සිටියේය. මෙතරම් විචිත්‍ර ඇගේ රූපකාය දකීමට හැකිවේවි යැයි ඔහු කිසිසේත් සිතුවේ නැත. කිසිදේකින් අඩු නැති මැය අපූර්ව නිර්මාණයකි. දෙවියො හරි පරිස්සමින් කළ නිර්මාණයක් වගේ.

"ඇයි කතා කරන්නෙ නැත්තේ.."

ඇය නිදකසේ ළය මත හිස තබමින් ඇසුවාය.

"මම ඉන්නෙ ගොළුවෙලා වාගෙ. කතා නොකර ඉන්න කැමතියි.."

"ඇයි ඒ...?"

විවාහ අයිතියේ කොටස් කාරිය ප්‍රශ්නයක් නැඟුවාය.

"ප්‍රශ්නයක් අහන්නද...?"

"හා අහන්න.."

චේතා කීවාය.

"මේ ඇස් දෙක.. මේ මල්පෙති.. මෙන්න මේවාගේ තරම් හැකාක නොපිපුණු මලක් වෙලා ලස්සනට ඉපදුනේ ඇයි.. මල් කලඹක් වගේ පුංචි රතු, කහ නැම වර්ණයෙන්ම එකම මලක.."

හිතූ තරම් ඉක්මනින් පිළිතුරක් සැපයුනේ නැත.

"ඇයි කතා නැත්තේ.."

"මාත් ඉන්නෙ ගොළු වෙලා..."

ඇය පහත් හඬින් කීවාය.

"මෙච්චර ලස්සන වෙලා ඉපදුනේ ඇයි...?"

"ඒකට විශේෂ වූ හේතුවක් තියෙනවා.."

ඇය කෙඳිරුවාය.

"ඒ මොකක්ද...?"

"මා විශේෂයෙන් ඉපදුනේ පිට කෙනෙක් වෙනුවෙන් නෙමේ.. ඔයා වෙනුවෙන්.. මෙක අහඹු සිදුවීමක් නොවේ. සංසාරගත බැඳීමක්..."

යළි ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි. ලෝකයේ සිහිවන හැම ගැහැනියක් වෙතම විශේෂයෙන් දායාද කළ ලස්සනක් ඇත. මේ බැඳීම මත පෙළඹවීමක්, බලකිරීමක් බලහත්කාරකමක් නොතිබුණි.

"මේ බලන්න.. මෙහෙ බලන්න..."

ඇය උදිත්ගේ මුහුණ තමා දෙසට හරවා ගනිමින් කීවාය.

"අනේ කතා නොකරනම් ඉන්න එපා.. මාව තනිවෙයි..."

හැම දෙයක්ම එක සිතකින් කරන්ට වෙලා. ඇයි මේ විදිහට මගේ හිතට අනවශ්‍ය බලපෑම් කරන්නේ. ඇත්තටම මගේ හිතට පිවිසිලා මගේ ගමන සමාධිය වෙනස්. හදිසියෙන්ම මගේ හිතට පිවිසිලා මගේ ගමන වෙනස් කළා. නොවිවර පිරිමි සිටියත් ඔබ සිපගන්නට ස්පර්ශ කරන්නට ලැබුණේ මට පමණයි. එක් අතකින් මා දුර්වලයි. කවියෙක් වුණි නම් මේ සුන්දරකම කවියකට ගීතයකට නගන්නට



තිබුණි. ලේඛකයෙක් වුණා නම් මේ රුව ගැන කියන්න භාෂාවේ මධුර්ය වචන යොදා ගන්නට තිබුණි. මා මේ සුන්දරකමට වශී වෙලා.

"ඇයි දුකින් ඉන්නේ..."

ඇය මෘදු ලෙස ඔහුගේ හිස පිරි මැද්දාය.

"අද සිද්ධ වුණේ වරදක් කියල නම් හිතන්නට එපා. ඔබට මෙන්ම මටත් මට මෙන්ම ඔබටත් ආදරය වෙනුවෙන් වූ පොදු චේතනාවක් තිබුණා. මම නම් හිතන්නෙ මේ විදිහටයි. ගැහැණු අයිති ගැහැණුන්ට නෙමේ පිරිමින්ටය. මේ හැම අංගයක්ම ඒව විද්‍යාත්මකම නිර්මාණය වෙලා තියෙන්නෙ ඒ වෙනුවෙන්මයි. ගැහැනියෙක් විඳිවිඳ දකින්නට පුළුවන් වෙන්නේත් පිරිමියෙකුටයි. ඔබට ප්‍රශංසා කරන්න ඕනෑ. නැත්නම් ශූ වෙරි මච්..."

ඇගේ කතාව සත්‍යයකි.

රූපය හා විඥානය එක්වූ විට රූපය හඳුනා ගැනෙයි. ඇය ස්ත්‍රියකට හිමි භූමිකාව රඟපෑ හැටි. චේතනාව හටගන්නේ ස්පර්ශයෙනි. එවන් චේතනාවක් සංවර්ධනය කිරීමට සහාය වූ හැටි. හිතට චේතනාව පිවිසි පසු දෙනෙතින් රූපකාය බලයි. නාසයෙන් සුවඳ මනසට අරමුණුද, කයෙන් පහසද ලබමු.

සසර පුරා දිව යන මේ සංසාරගත බැඳීම වල කැපී පෙනෙන හරයක් ඇද්දැයි කෙනෙකුට සිතෙන්නට බැරි නැත. ඔහු පසු දින පිබිදුනේ කිසිවෙක් මෘදු ලෙස හිස පිරිමදිනු දකිමෙනි.

"නැගිටින්න.."

ඒ කණට හුරු මිහිරි හඬ මනසේ තැන්පත්ව ඇත. ඔහු එකවරම ඇය තමා වෙතට ඇද ගත්තේය. මෙච්චර සතුටක් ජීවිතය තුළ සැඟව සිටි බවක් ඇය දැන සිටියේ නැත. ඉතුරු දින රැයේ ගුවි ගැහැණිය දකිමට ඔහු යළි ඒ දෑස් හරයේ පියා ගත්තේය.

''තේ හැදුවා එන්න...''

ඇඳෙන් නැගිට මුහුණ සෝදා ගත්තේ නව ජීවයක් ලද්දෙක් මෙනි. මේ හිතාමතා කලින් සැලසුම් කළ දෙයක් නොවේ. ඔහු මුහුණ සෝදාගෙන එද්දී ඇය ඇඳේ වැතිර සිටිනු දුටුවේය.

''එන්න තේ බොන්න..''

ඔහු ඇගේ අතින් අල්වා, මුවට තේ කෝප්පය ළං කළේය. යොවුන් වියට පිවිසෙන්නාට නිතැතින්ම ජීවිතයේ බස තේරෙයි. ජීවිතයේ බස තෝරා ගත්තේ මෙම පිරිමියාගෙනි.

ඔහු හැසුරුණේ නියම පිරිමියෙක් ලෙසිනි. එහි කිසි අඩුවක් නැත. ඔහු ප්‍රථමයෙන් තේ පානය කිරීමට උදව් කළේ තමාටය. තේ පානයෙන් පසු ඇය ඔහුගේ උරෙහි හිස හොවා ගත්තේය. මහතෙම සිත් තැවුලෙන් පසුවන බව ඇයට හැඟෙයි.

''එපා දුක්වෙන්න..''

''ඇයි මා දුක්වෙන්නෙ.. හීනෙන්වත් ලබාගන්න බැරි කෙනෙක් දැන් මා ළඟ ඉන්නවා...''

''සම්ප්‍රදායික මංගලයක් නුතා කියල දුක්වෙන්න එපා.. ඔබ මට ලැබීමත් මංගල කරුණක්... ඔබ මගේ කරගන්න හිතුවේ ඔබ මට වඩා හුඟාක් උසස් කෙනෙක් නිසයි...''

චේතා කීවා.

''ඇයි මෙච්චර වර්ණනාවක්...''

''අපි දෙන්නා කොච්චරකල් මේ ඇඳේ නිදා ගත්තාද..? ඒවගේ සිත් පාලනයක් ඔයාට තිබුණේ කොහොමද..? ලංකාවෙන් හදිසියෙන් පිට වෙන්න වුණොත් මා ළඟ ඉතිරි වෙලා තිබුණ වටිනා සම්පත ඔයාට දෙන්න බැරිවෙනවා... නම් අයිම සැවිස්පයිඩ...''



උදාවී තිබුණේ පොහෝ දිනයකි. අපි අද ජීවිතය ආරම්භ කරමු.

''ඇත්තමයි.. හොඳ දවසක්නෙ අපිත් පන්සල් යමු...''

''කොහොමද අඳින්නෙ...''

''කැමති ඇඳුමක්.. හැබැයි සුදු ඇඳුමක් වෙන්න ඕනා..''

පාන්දරින් දිය නා සුදු ඇඳුමින් සැරසුණේ ආත්තම්මා හා පන්සලට යාම සඳහාය. වාහනයේ තෙල් වතුර බලා පණ ගන්වා පෝටිකෝව යටට ගනිද්දී ඔහුගේ නෙත ගියේ නිවස තුළ සිට එන දෙදෙනා වෙතය. උඩරට ලෙසට ඔසරියෙන් සැරසුණු චේතා දෙස ඔහු බලා සිටියේය.

අත්තම්මා සිල් සමාදන් වීමට ගිය පසු ඔවුහු බුදුගෙය දෙසට ගියහ. චේතාට මේ පන්සල හොඳටම හුරුයි. ආත්තම්මා සමග කීප අවස්ථාවකම මෙහි පැමිණි හැටි මතකය. දහම් පාසලේ ප්‍රසංගය සඳහා නාට්‍ය පුහුණු කිරීම නිසාද පන්සලට සම්බන්ධව සිටියාය.

හැම ආගමකම මිනිසා යහමග යැවීමට ශික්ෂා අනුදැන වදාරා ඇත. ත්‍රස්තවාදීන් සමග සටන් කරද්දී ආයුධ දුරු අත්වලින් සුදු මල්වට්ටියක් තබා පියවර මනින චේතා දෙස ඔහු බැලුවේ නැත. මේ සමාජයේ හොඳ හෝ නරක වැඩ කරන්නේ පුහුදුන් මිනිසුන් වෙති. ආයුධ අතට ගැනීමට චේතා පොළඹවීමට හේතුවූ කාරුණු පිළිබඳව සොයා බැලීම වඩා වැදගත්වේ.

නිදහසින් පසු ජනතාව මුලා කළ පාලකයන් නිසා අනවබෝධය වර්ධනය වී ඇත. එකම රටක සිටියත් භාෂාව සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් නැත. සිංහල මිනිසුන් දමිළයන්ගේ විරුද්ධවාදීන්ය, සතුරන්ය යන ආකල්ප වර්ධනය වී ඇත.

තමා හා චේතාට මේ තත්වයට මැදෙන්නට සිදු

සම්භාවිතාවයක් ඇත. සැබැවින්ම ඇය පැවතෙන්නේ කලා පරපුරකිනි. කලාවට සම්බන්ධ වීමට සම්බාධක නැත. වන්දනීය වූ ගාථා පිළිබඳව දැන නොසිටියත් ඇය තමා පසුපස එන හැටි පෙනේ. පුරාණ රජමහා විහාරයේ අභය මුද්‍රාවෙන් වූ හිඳි පිළිම වහන්සේ ඉදිරියේ ඔවුහු සිට ගත්හ. දකුණු අත ඉදිපසට කර ඇති මෙම අභය මුද්‍රාවෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්ම සාරථී ගුණය වේ.

නිර්භය තීරණයක් ගැනීමට මෙතරම් සුදුසු තැනක් නැත.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් දායාද ක්‍රමයට වඩා අපේ හෙළයන් ජීවිත ඇරඹුවේ පන්සල ඇසුරෙනි. ජීවිතයේ හැම තීරණයක්ම ගත්තේ පොදු තීරණයක් අනුවය. ඔහු කරන්නේ කුමක්දැයි දැන ගැනීමට ඇයට විශේෂ මග පෙන්වමින් අවශ්‍ය වූයේ නැත. හිටි පිළිමයට මල් පුදා අවසන්වූ පසු වෙහා උඩින් දෙස බැලුවාය. ජීවිතය තණ අග පිනි බිඳුවක් වැන්න. එය අප වෙතින් කොයි මොහොතක ගිලිහේදැයි කිව නොහැක. මේ නිමේෂයේ ඇසුර මට මගේ ජීවිතයට ආශිර්වාදයක් ලංකාවෙන් පිටව යාමට ප්‍රථම ඔවුන්ගේ වෙඩි පහරින් මියයාමට ඇති ඉඩ කඩ වැඩිය. එම සංවිධානයේ පුහුණුව ලැබූ තමාට අත්වන ඉරණම ඇය දැන සිටියාය.

ගැහැණියක් ලෙස තම ජීවිතය පරිපූර්ණත්වයට පත්ව ඇත. ඉඩ ලැබුනොත් මේ සසර පුරා එක්ව ඔබ හා ඒමට ප්‍රාර්ථනා කරමි. ඇය පහත්වී ඔහුගේ දෙකතුල් අල්ලා හිස තැබුවාය. ඔහු එකවරම පහත්වී ඇගේ දෙව්රෙන් එසෙව්වාය.

''ඇයි මේ.. ඇයි මේ අපි දෙන්නා එක සමාන දෙන්නෙක්..''

''නෑ.. ඔබ මගේ දෙවියො විදිහටයි මම හිතන්නේ.. කවුරු දනගස්සෙ නැතත් ඔබ මගේ ජීවිතය බේදා ගත්ත මගේ සැමියා..''

ඇය දෙනෙත් පිරී කඳුළෙන් යුතුව කීවාය. ඇත්තටම



ඇගේ සිතුවිලිවලට සම්බාධක පැමිණිවිය යුතු නැත.

''මේ අභය මුද්‍රාව සහිත බුදු පිළිමය ඉදිරියේ මම සහතික වෙන්නම් ඔබ මගේ බවට.. ඔයාගේ දෙවියො ඉන්න තැනකදිත් සපථ වෙන්නම්....''

''ලෝකේ දෙවිවරු ඉන්න බව ඇත්ත.. මට දැනට ඉන්න ජීවමාන දෙවියා ඔයයි...''

එම භාව පූර්ණ වදන පැවසීමට ඇති නිදහස පිළිබඳව ඔහු කිසිවක් පැවසුවේ නැත. නිහඬ පරිසරයේ බොදු ගීතයක් වාදනය වෙමින් තිබුණි. ආචාර්ය අනුරාධ සෙනෙවි රත්නයන්ගේ ගීතය සිතට කොතරම් සහනයක් ලැබුණාද.

බුදු කරුණා දැස තෙමී - නෙත් සිහිලැල් ඇදවැටිලා...

නිවා තාප ලෝකතලේ අමාවතුර ගලා ගියා....

ජාතීන් අතර බැඳීමක් ඇතිවීමට නම් දහම් මග වැදගත් කාර්ය භාර්යයක් ඉටුකළ යුතුවේ. ඔවුහු නිහඬව රථය අසලට ගොස් අත් තරයේ අල්වා ගත්හ.

''බැරි වෙලාවත් මම ඔයාව දාලා යයිද කියා බය නැද්ද..?''

''ඊට කලින් මම ඔයාව දාලා යයි කියල හිතුවෙ නැද්ද...?''

''මාව දාල යන්න එපා...''

ඔහු ඇගේ දෑත් තරයේ අල්වා ගත්තේය.

# 38

සැදෑවරුවේ පන්සල් ගොස් ආත්තම්මා කැඳවාගෙන ඒමට ගිය ගමනට චේතා සහභාගි වූයේ නැත. අද මේ ජීවිතයේ සුවිශේෂී බවක් ඇත. තමා මනාලියක්, බිරිඳක් බව දැනගත්තේ එක් අයෙකි. තමා කන්‍යාවියක්ව සිටි බවට, චරිතවත්ව සිටි බවේ සහතිකය ලද්දේ ද ඉකුත් දිනයේය. මේ වැදගත් අවස්ථාවේ සතුට විඳගැනීමට නම් දෙපාර්ශවයේම දෙමාපියන් සිටිය යුතුය. මෙය හිතුවක්කාර තීරණයක් ලෙස සලකා බැහැර කිරීමක්ද කළ නොහැක. යථාර්ථය කොතරම් අනාවශ්‍ය වුවද එය හා කටයුතු කිරීමට පුළුවන් කමක් නැත. තමා මුහුණ දී ඇති ප්‍රශ්නය වෙනස් සිදුවීමක් හා සම කිරීමට පුළුවන් කමක් නැත.

යම් ලෙසකින් ලංකාවෙන් යාමට වීසා ලැබුණොත් කෙසේ හෝ ඔහු ගෙන්වා ගත හැක. එය සැමැවින්ම කාටත් සතුටුදායක අවස්ථාවක් විය හැක. එහෙත් අප සිතන පතන දේ ඒ අයුරින්ම ඉටුනොවන්නට බොහෝ විට ඉඩ ඇත. කිසිම ආකාරයකින් නොසිතන පරිදි තමා මරා දැමීමට පුළුවන.

ගත හැකි හොඳම තීරණය මෙය පමණි. තමා ලද තත්වය ගැහැනියකට සිය ජීවිත කාලය තුළ ලද හැකි උසස්ම තනතුරවේ. උදිත් පන්සල් ගොස් එනතෙක් රාත්‍රී ආහාර පිළියෙල කිරීම ආදී වැඩ නිමකර එළියටවී සිටියාය. පොල් රුප්පාව අතරින් සඳකිරණ පොළවට වැස්සෙමින් තිබුණි. ඇත්තටම ජීවිතය කොතරම් විචිත්‍රද සුන්දරදැයි සිතෙන්නේ දැන්ය. ගැහැණිය ඉපදී සිටින්නේ තනිව ජීවත්වීමට නොවේ. ඒ ස්වභාවික අයිතියට ඉකුත් දින අවසර ලැබුණු හැටි. කලින් පුරුද්දක් නොතිබුණත් හැඟීයන පරිදි තමාත් ඒ සතුටේ කොටස් කාරියකවීමට සෘජුව සහාය වූ හැටි සිහිවෙයි. ඒ අපිට අයිති අපේ ලෝකයයි.



ගේට්ටුවෙන් හරවන රථයේ ආලෝකය නිවස දෙසට වැටුණි. ඔහු රථය නවතා ආත්තම්මා නිවසට ඇරලනවා ඔ දුටුවාය. ඉන්පසු ඔහු කෙසේ හැසිරෙනවාදැයි දැන ගැනීමට තදබල ඕනෑකමක් වුණි. නිවසට නුදුරු උද්‍යානයේ අසුන්ගෙන සිටි චේතාගේ නෙත යොමු වූයේ කලබලයෙන් ඒ මේ අත දුවන උදිත් වෙතය. දෙවියනේ මම නැතිවුණොත් මොනවා කරගනීද.

"චේතා.. චේතා...."

ඔහු කෑගසමින් ඒ මේ අත දුවන්නට පටන්ගත්තේය. තව දුරටත් ඒ දුක දුරීමට පුළුවන් කමක් නැත.

"උදිත්... උදිත්..."

ඇය කෑගැසුවාය. ඔහු කිසිත් නොදොඩා ඇය ළයට තදකරගෙන මොහොතක් නිහඬව සිටියේය. ඒ හෘද ස්පන්දනය ඇයට දැනුණි.

"ඇයි මගේ හිත බය කළේ.."

"සමාවෙන්න මේ වගේ මොහොතක නොදැනීම ඔයාට ලොකු දුකක් වෙයි කියල මම හිතුවෙ නෑ.."

ඔහු කිසිවක් කිව්වේ නැත. ගැහැනියක් ජීවිතයක ප්‍රබල සාධකයක් ලෙස මුලින් හිතුවේ නැත. මේ ස්ත්‍රිය ඇසුරෙන් පසු තවත් කෙනෙකුගේ නොවන බව ඔහුට හැඟී ගියේය. කිසිවෙකුට විවෘත නොවූ හදවතේ දොර ඇයටම විවෘත කළ හැටි. ඔහු ඇගේ අත අල්වාගෙන සෙමින් ඉදිරියට ගියේය. කොතෙක් කතා කළත් මේ ආදර කතාවේ නිමක් නැත.

"මම ගියා කියල බය වුණාද..?"

"මාව දාලා යන්නට බැරි බව මම දන්නවා..."

ඇයට උරහිසේ හිස තබාගැනීමට ඉඩ දෙමින් කීවේය.

හඳේ පැහැය තවත් සුන්දරව වැටී තිබුණි.

''මම හෙට ඔෆිස් යනවා...''

''ඔයාගෙන් වෙන් වෙලා ඉන්නෙ කොහොමද..?''

''හැමදාමම නෙමෙ.. එක සතියකට...''

''ඒ හුඟාක් දිග කාලයක් වෙයි..''

''මම මේ ගමන් ගෙදරට යනවා.. ගිහින් අම්මයි අප්පච්චියි හම්බ වෙනවා..''

ඇය පිළිතුරක් දුන්නේ නැත.

''එපා යන්න...''

ඇය පහත් හඬින් කීවාය.

''අපේ මේ හමුවීම සරල සිද්ධියක් නෙමේ.... ජීවිත ගමනක ආරම්භය විතරයි.. අපි හිත්වලින් විතර නෙමේ දෙන්නෙක් විදිහටත් එක්වුණා.. ඒ බව දෙමාපියන්ට දන්වීම තමා යුතුකම...''

''අපේ මේ හමුවීම මේ ආත්මයේ විතරක් සිද්ධ වුණු දෙයක් නෙමේ...''

''ඒ හැම අත් භවයකම අම්මලා තාත්තලා ඔක්කෝම එකට ඉන්න ඇති. ඔයාට මගේ අම්මටයි අප්පච්චිට අඳුන්වල දෙන්න ඕනෑ...''

''අම්මා මාව වඩාගෙන ඉඳලා තියෙනවා කිව්වා නේද..?''

''ඒ නිසා ඔයාට ආදරේ වෙයි.. ඒත් අද වඩාගෙන ඉන්නෙ මම..''

නිරවුල් සිනාවකින් මුව සරසා සිටියා විනා පිළිතුරක් දුන්නේ නැත.



රාත්‍රී ආහාරයෙන් පසුව වුවද මේ කතාවට විසඳුමක් ලැබ තිබුණේ නැත.

''නාඬා ඉන්න...''

''මේ කඳුළු කොහොමටත් මගේ ඇස්වලින් වැගිරෙනවනේ...''

ඉන්පසු ඇය කිසිවක් කතා කළේ නැත. ඇය මදින ලද ඇඳුම් බෑගයට දැම්මේය.

''නාඬා ඉන්න..''

ඔහු ඇගේ කරවටා අතක් දැම්මේය. සාගරයටත් වඩා අනන්ත වූ ආදරයෙන් අපි අභිසෙස් ලබා සිටිමු. ජාති ආගම් භාෂා විවිධත්වයක් නැතිව ඔබ මගේ විය.

මේ ආකර්ශණීය ගැහැනිය ළඟ හිතේ ගතේ දුරස් බවක් නැත. අපට ඇත්තේ එකම ජීවිතයකි. නිදාගත්තේ සුළු වෙලාවකි. ඒ වෙන්වන අවසන් මොහොතේ ඇයට දහසක් අවවාද කීවේ ආරක්ෂාව වෙනුවෙනි.

''ගෙදරින් පිට යන්ට එපා..''

ඇය හිසවනා එය අනුමත කළාය.

''මගේ බෝඩිමට කතා කරන්ට එපා..''

''කියන හැම අවවාදයක්ම පිළිගන්නම්.. ඒත් කොහොම හරි මට කතා කරන්නට ඕන..''

''මට ඔයාට කතා නොකර ඉන්ට පුළුවන්ද... කොහේ හිටියත් මං ඔයාට කතාකරනවා... අත්තම්මා එක්ක වුණත් වත්තට යන්ට එපා..''

''රත්කරණේ මට හැමදාම මෙහෙම හැංගිලා ඉන්න

පුළුවන්ද..?''

''නෑ නෑ මම ඔයාට හැංගිලා ඉන්ට ඉඩ කියන්නෙ නෑ.. මම ගෙවල් දෙකටම යනවා.. ගිහින් අප්පච්චිටයි අප්පාටයි කියනවා..''

''මොනවද කියන්නෙ..''

ඇය උරෙහි හිස හොවා ඇසුවාය.

''මට මේ ලොකු දුව ඕනෑ කියනවා...''

''දෙන්න බැහැයි කිව්වොත්...''

සෝ තැවුල් අමතක කර ඇය සිනාසුනාය.

''ඒ ඉන්නෙ මා වෙනුවෙන් නිර්මාණය කළ මගේම ජීවිතයේ කොටසක් කියල තියෙනවා..''

''ඇත්තටම අප්පාට කියනවද...?''

'ඔයාගෙ අම්මාට අප්පට විතර නෙමේ.. මගේ අම්මාටයි අප්පච්චිටයි කියනවා...''

''මට බයයි.. අප්පච්චියි අම්මයි අකමැති වෙයිද..? මම දෙමළ කෙල්ලෙක්...''

''මම සිංහල කොල්ලෙක්.. අපිට අපේ හිත ගත යාවෙලා එක්කෙනෙක් බවට පත්වෙලා ඉන්නවා නම් ජාති ප්‍රශ්නයක් මතුවෙන්නෙ නෑ..''

ඇය මොහොතකට නතර වූණාය.

''ඇයි නතර වුණේ..?''

''මට ඇවිදින්නට බෑ...''

ජීවිතය තුළ මෙවන් චමත්කාරයක් රැඳී ඇති බවක් ඔහු



දැන සිටියේ නැත. බැගය කරලා ගත් ඔහු ඇය දෑතට වඩාගෙන ගේට්ටුව දක්වා ගියේය.

''ඉක්මනින් එනවා නේද...?''

''ඔව් එනවා...''

''කෝච්චිය එනවා දූන් යන්න... සෝ දෙන්න...''

ඇය මුහුණ පෑවාය. ප්‍රතිචාරය ප්‍රබල වූවකි.

''මෙතෙන්ට මෙතෙන්ට මෙතෙන්ටත් ඕනෑ..''

ඇය දෑස් පියා ගත්තාය. අඩ අඳුරේ නොපෙනී යනතෙක් බලා සිට ආපසු නිවස දෙසට පියවර මැන්නාය. දෙවියනේ මගේ ජීවිතයම අරන් ගියා වගේ. දෙනෙත් කඳුළෙන් තෙත්වුණි.

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

නිවසේ සැමොම පසුවන්නේ දුකින් යුතුවය. චේතන නිවසින් පිටව ගොස් මසක් ඉක්ම ගොස් ඇත. එතැන් සිට නිවසේ හරියට කෑම ටිකක් රත් වුණාදැයි මතක නැත. ගැහැනු දරුවෙක් නිවසින් පිට කර ආරක්ෂාව සැපයීම පිළිබඳව සිතා ගැනීම අසීරුය. උදයන්ට අසුවූවහොත් පැහැදිලිවම ඇයට විපතක් කිරීම වැලැක්විය නොහැක. කිසි විටක උදිත් දුවට කරදරයක් නොකරන බව ඇය දනී. සිතූ ලෙස පහසුවෙන් ඕස්ට්‍රේලියාවට වීසා ලබාගැනීමට නොලැබීම ගැන සැමියා දුකට පත්ව ඇත.

''චේතාට එම්බසි එකට එක්ක එන්න කිව්වා...''

''මම මේ කල්පනා කරන්නේ ගෙනියන්නේ කොහොමද කියලයි....''

''අම්මා මේක උදිත් සර්ට කියන්ට ඕනෑ...''

''ඒ ළමයා බෝඩිමට කතා කරන්ට එපා කිව්වා නේද...?''

''ඒ කවුරු හරි ටෙලිෆෝන් එක ටැප් කරයි කියන බයටයි...''

''අපේ ප්ලෑන් එක මෙලහකටත් උදයන්ට ආරංචි වෙලා ඇති....''

චෛත්‍යලිංගම් නිහඬව ඒ මේ අත ඇවිද්දේය. ප්‍රශ්න නොතිබුණා නොවේ. මුල් යුගයේදී කවුරුත් සමාදානයෙන් ජීවත් වෙද්දී ප්‍රශ්න පැමිණ නැත්තේ නැත. මේ දරුවන් ඒ සහනශීලී ජීවිතය දුක නැත. ජීවිතයේ අවසාන භාගය ප්‍රශ්නවලට මැදිව පසු කිරීමට සිදුවීම දුකකි. සිතට දුකක් දනෙන්නේ චේතා විඳි දුක දකීමෙනි. ගේට්ටුවේ දොරට ශබ්ද කරනු ඇසී උමා නැඟී සිටියාය.

''පොඩි දුව කවුද බලන්න...''

''ඔන් කිව්ව උදයන් නම් දොර අරින්නෙ නෑ...''

මේ නිවස මිණී පහනක් කළේ චේතා යන අදහස ඇගේ සිතින් පහව නැත. මුල් යුගයේ පක්ෂයේ කටයුතු වෙන ජීවිත පරිත්‍යාගයෙන් බැඳී සිටි චේතා උදිත් හමුවූ සැණින් වෙනස් වූ හැටි පුදුම සහගතය. තමාට හිමිවීමට තිබූ සම්පතක් අහිමි වීමේ දුක තවම සිතින් පහව නැත. මේ ජයග්‍රහණය ඇයට තුදුන්නා නම් ඇගේ මරණය ඉක්මන් විය හැකිව තිබුණි. කෙසේ හෝ ඇය රටින් පිට යැව්වහොත් මේ සියළු ප්‍රශ්න හොඳින් විසඳෙනු ඇත. ගේට්ටුව විවෘත කළේ දහසක් ප්‍රශ්න හිතේ තබාගෙනය.

දුටු අසුනින් ඇය තිගැස්සී සිටියාය.

''කොහොමද උමා...''

''අපි දන් මේ මතක් කළා විතරයි... කොහොමද චේතාට...?''

''ඕ ඊස් ෆයින්..''

ඔවුහු නිහඬව සාලයට පිවිසුනහ.

''ඉඳගන්ට පුතා...''

''ඉක්මනින් යන්ට ඕනෑ.. ඔෆිස් යන ගමන් ආවේ..''



''තේ එකක් බීලා යමු...''

මව යෝජනා කළාය.

''මම ආවේ අම්මටයි අප්පාටයි වැදගත් කාරණයක් කියන්නයි..''

''මොකක්ද ඒ තරමම වැදගත් කාරණය.. එන්නකො ඇතුළට...''

කතා කරමින් නිවස තුළට යද්දී චේතාගේ දෙමාපියන් මුණ ගැසුණි.

''එන්න පුතා ඉඳගන්න...''

චෛත්‍යලිංගම් කීවේය.

ඔහු නිහඬව සාලයේ අසුන් ගත්තේය. මේ කථාව ආරම්භ කළ යුත්තේ කෙසේද? කොපමණ ආදරය කළත් මෙම යෝජනාව කෙලින්ම ඇගේ පියාට ඉදිරිපත් කළ නොහැක.

''චේතාගේ වීසා එක තවම හදා ගන්ට බැරිව ගියා..''

චේතාගේ මව කීවාය.

''අම්මා චේතාව කොහේවත් ඇරලා බෑ... එයා මා එක්කම ඉන්න ඕනෑ...''

උදිත් මුවගට සිනාවක් තබා ගනිමින් කීවේය.

# 39

ඔවුනතර ඇතිවූයේ කෙටි නිහඬ බවකි. සාවිත්‍රී මද සිනාවෙන් යුතුව සැමියා දෙස බැලුවාය. ඔහුද එවන් සිනාවකින් මුව සරසා ගත්තා විනා කිසිවක් කිව්වේ නැත. මෙවා සිදුවිය නොහැකි අපූර්ව ඒවා නොවේ. ප්‍රශ්නය වන්නේ තමාගේ හොඳම මිතුරාවන මුදියන්සේ කෙසේ සිතාවිද යන්නය. පුතා තමා වෙත එවන ලද්දේ සංගීත ශාස්ත්‍රය ඉගැන්වීමටය.

පවුල් දෙක අතර හිර ගනුදෙනු කරදීමට තරම් හැකියාවක් කිසිසේත් නැත. තමා මෙන් එතුමා ද එසේ නොසිතනවා විය හැක. පෙර මෙන් නොව අද මේ මොහොත වෙද්දි ජාතීන් අතර වූ හිතවත්කම පලුදු වී ඇති බව පැහැදිලි කරුණකි.

තමා දන්නා පරිදි මුදියන්සේගේ පරපුර උඩරට බෞද්ධ සිංහලකම සිංහල වෙදකම හා කලාව වැනි ඔවුන්ගේ අනන්‍යතාවයන් පිළිබඳව ආඩම්බරයෙන් සිටින පිරිසකි. එහෙත් ඔහු ජාතියකින් ජාතියකට පරිහාස කරන තැනැත්තෙක් නොවේ. දෙදෙනා අතර හිතවත් කමක් තිබුණත් විවාහයක් දක්වා ගෙන යනැයි සිතුවේ නැත. තමාගේ දුවගේ ආරක්ෂාව වෙනත් පිරිමියෙකු ගෙන් පැතීම වැනි මෝඩ කටයුත්තකට තමා පෙළඹී ඇති බව ඔහු සිතයි. ඇත්තටම මෙය කවදාවත් දෙමාපියන් වෙතින් සිදුනොවන වර්ගයේ බොළඳ වැඩකි.

එහෙත් ඇයගේ ජීවිතය ආරක්ෂා කිරීමට වෙනත් විකල්පයක් නොතිබිණි.

"එතා මා එක්කම ඉන්න ඕන.."

එම ඉල්ලීම තුළ සැබෑ මනුස්සකම හැරුණවිට වෙන කිසිවක් තිබුණේ නැත. එය සෙනෙහසේ කතාව ප්‍රබල ලෙස විනාශය කිරීමට යොදාගත් විදහක්ද? එය කිසි පැල්ලමක් නැති



ධවල පත්‍රිකාවක් මෙන් පවිත්‍ර වූවකි.

එහෙත් අප පසුපස ගලා එන සැඩ පහරින් හා දේශපාලන නාය යාමෙන් සමස්ත ජන ජීවිතයට විනාශ වෙමින් පවතී. එම ප්‍රචණ්ඩ ප්‍රවාහයට පුද්ගලයෙකුගේ හොඳ පුරුෂාර්ථවලට බැම්මක් ලෙස නැඟී සිටීමට පුළුවන් වන්නේ නැත. ඒ සෝදාපාලුව නතර කිරීමට නොහැක.

දූන් ඉන්නා ළමයි ඉස්සර වගේ නොවේ. තමා හා සාවිත්‍රී අතර සිදුවූයේ ද ආදර විවාහයකි. ඉන්දියාවේ ඉගෙන ගනිද්දි බැඳුණු ප්‍රේමයට දහසකුත් එකක් ප්‍රශ්න තිබූ හැටි මතකය. ප්‍රධාන ප්‍රශ්නය වූයේ තමා අඩුකුලයේ තැනැත්තෙක් වීමය. සාවිත්‍රීගේ පියා දේවාලයේ කපුවෙකු වන අතර උසස් යැයි සම්මත කුලයකින් පැවත එන්නෙකි. ඇත්තටම සාවිත්‍රී හිමිවිය යුතුව තිබුණේ තමාට නොව එම පරපුරේම තවත් වංශවතෙකුටය. මව් පිය පරපුරේ මහා ධන සම්පත් අහිමිකර ගනිමින් තම පියසට ඒමට තරම් ආදරයට ඩිටිනාකමක් දුන් අයෙකි.

"අයි ලයික් හර්.. අයිවොන්ට් මැරී හර්..."

ඔහු වෙනත් අයුරකින් එම අදහසම කියා පෑවේය.

"පුතාගේ තාත්තා මගේ හොඳම යාළුවා.. අපි බැඳලා ඇවිදින් නතර වුණේ පුතාලගෙ ගෙදරක නේද...?"

"ඔව්..."

ඇය අතීතය ස්මරණය කරමින් සිනාසුණාය.

"අපිට කන්න බොන්න දුන්නා.. ගෙවල් කුලී ගත්තෙ නෑ.. අපි ඒ විදිහට අදත් හොඳින් බැඳිලා ඉන්න හොඳ යාළුවො..."

"යාළුකම මේනිසා නැතිවෙන්නෙ නෑ.. අපි නෑදෑයෝ වෙයි..."

මෙම ප්‍රශ්නයෙන් ලෙහෙසියෙන් මිදීමට නොහැකි බව දෙදෙනාම තේරුම් ගත්හ.

''අප්පච්චි පුතාව මා ළඟට එව්වෙ ඉගෙන ගන්නයි.. ඒ හැරෙන්න වෙන දේවල්වලට නෙමේ...''

වෛත්‍යලිංගම් කීවේය.

''අපිත් නුවර සැහෙන කාලයක් ජීවත් වෙලා තියෙනවා... කැන්ඩියන් ට්‍රැඩිෂන් හුඟාක් තදයි...''

සාවිත්‍රී කීවාය.

''මේ කියන දේවල් ඔක්කෝම ඇත්ත වෙන්න පුළුවන් අම්මා... අපි ඔය දෙගොල්ලන්ගෙම ආශිර්වාදය ඉල්ලා සිටිනවා...''

''පුතාල අපි කවුද කියල දැන දැනත් මේ ඉල්ලීමට කැමති වෙන්නෙ කොහොමද..? අර රත්තරන් මිනිස්සු අපි එක්ක තරහ වෙයි, අපි දෙන්නගෙ යාළුකම නැතිවෙයි...''

වෛත්‍යලිංගම් දැඩි කම්පාවට පත්ව කීවේය.

''මම අද මගේ අප්පච්චිටයි අම්මාටයි අයියලාටයි කියනවා...''

මේ වන විට තේ සූදානම්ව තිබුණි.

''යමු තේ බොන්න...''

උමා සිනහ මුසු මුහුණින් යුතුව ආරාධනා කළාය.

''මට ඉක්මනින් යන්ට ඕනෑ...''

''කිසි දෙයක් කලබල වෙලා කරන්නට බෑ.. තේ එකක් බීලා ට්‍රයි එකක් දෙමු...''

''යමු තේ එකක් බොන්න...''



සාවිත්‍රී යෝජනා කළාය.

''කන්ට බෑ...''

''කන්ට බෑ කියල හරියන්නෙ නෑ.. දැන් තෝසෙයි සම්බාරුයි කන්න පුරුදු වෙන්න ඕනෑ...''

ඇය සැවොම හිනස්සවමින් කීවාය. උමා දුම් දමන තෝසයක් පිඟානට දැමුවාය.

''අද අපි උදේට තෝසෙ හැදුව...''

ඔහු කඩිනමින් කෑම රස බැලුවේය.

''රසද...?''

ඇය තෝසෙ හොද්ද බෙදමින් කීවාය.

''රසයි...''

''චිතා තෝසෙ හදන්න දන්නෙ නැද්ද...?''

''දවසක් තෝසෙ හදනව කියල හැදුවා.. ඒ වුණාට හැදුනෙ වෙන කෑමක්....''

ඔහුගේ කතාවට ඇය උස්හඬින් සිනාසෙන්නට වූවාය.

''ඇයි දුව හිනාවෙන්නෙ....?''

''අම්මා අක්කි තෝසෙ හදන්ට ගිහින් වරද්දලා...''

''ඒ වුණාට වෙන කෑමක් හැදුනනෙ...''

''ලොකු දුව ඉගෙන ගත්තා මිසක් කෑම හදන්ට ඉගෙන ගත්තෙ නෑ..''.

''ඉස්සරහට කොකිස්, කැවුම්, හාරං කැවුම් උයන්ට ඉගෙන ගන්ට වෙයි...''

උමා සිනාසෙමින් කීවාය. හැම කතාවක් සිදුවූයේ බැරෑරුම් ලෙස නොවේ. පැහැදිලිවම බැරෑරුම් බවක් තිබුණ බවක් ඇත්තකි. එහෙත් එය පහදාදීම යුතුකමකි.

"මේ හැම දේටම කලින් චේතා ලංකාවෙන් පිට වෙන්න ඕනෑ.."

"නෑ චේතා ලංකාවෙ ඉන්න ඕනෑ..."

"පුතා කියන දේ අහන්න.. මේ හැම දේටම කලින් අපි දුවගෙ ජීවිතය ආරක්ෂා කරගන්න ඕනෑ.. ඒ හින්දා අනිවාර්යයෙන්ම ලංකාවෙන් යන්න ඕනෑ..."

"ඔව් සර් අක්කා ලංකාවෙන් යන්නට ඕනෑ... සර් දන්නෙ නෑ උදයන්ලගෙ හැටි.. අක්කාගෙ ජීවිතයට කරදරයක් කරයි.. ඒ අයට විරුද්ධ, දේශපාලනඥයන්, උගතුන්, කලාකරුවන්, පුවත්පත් කලාවේදීන් මරනවා..."

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"හැමදේකටම කලින් මෙයාව ලංකාවෙන් පිට කරන්න ඕනෑ..."

"ඊට පස්සෙ සර්ට අවශ්‍ය නම් ඒ රටට යන්න පුළුවන්.."

උමා කීවාය.

ඔවුන් පවසන්නේ සත්‍යයක් බව ඔහුට වැටහෙයි. සංවිධානයට විරුද්ධ වන හැම දෙනාම ඝාතන රැල්ලෙන් පෙනේ. හැමදේටම ප්‍රථම ඇය ආරක්ෂා කිරීමේ වැදගත්කම ඇයට ර. කවරණය දීම තම යුතුකම බැව් සිතුවේය.

"දූන් අංකල් අපි මොනවද කරන්ට ඕනෑ..."

"චේතාට වීසා ගන්න.. එච්චරයි. ඒකට එක්ක එන්න



ඕනෑ..."

ඔහු කෙටි කල්පනාවකට මැදිවුණි. චේතා ලංකාවෙන් පිට කිරීමට සූදානම් වන්නේ ඇගේ ආරක්ෂාව සඳහාය. එහි බැරෑරුම්කම වැටහුනේ දීර්ඝ ලෙස සාකච්ඡා කරද්දීය.

"මම උදේට එම්බසි එකට එක්කගෙන එන්නම්..."

උදිත් සියල්ලන්ගෙන්ම සමුගෙන මාවතට පිවිසුනේය. තමා පසුපස කවුරුන් හෝ එන බවක් හැඟී ගියේ ඕනෑ කමින් බැලීම නිසාම නොවේ.

චේතා පිළිබඳව සිතමින් පැමිණි නිසා ගැටළු අවුල් වී ඇති බවක් ඔහුට හැඟුණි. තමා පසුපස එන බවක් හැඟී ගියේ ඕනෑකමින් බලද්දීය. ඔහු මාවතේ පැමිණි රථයට අත දිගු කර එයට ගොඩ වී පසුපස පැමිණි තැනැත්තාගේ අවධානය වෙනස් කළේය.

අජිත්ට දුරකථන ඇමතුමක් දුන් ඔහු නිවස බලා යාම සඳහා නුවර බසයකට ගොඩ වැදුනේය.

තමා විවාහ වීමට යන බව දෙමාපියන්ට නිල වශයෙන් දන්වා සිටීමට යුතුකමකි. දෙමාපියන් මේ බලා සිටින්නේ එවැනි යෝජනාවක් එනතෙක්ය. එහෙත් මේ දමිළ තරුණිය හා විවාහ වන්නට යන බව දැනගතහොත් කුමන ප්‍රතිචාරයක් දක්වයිද?

දිවා ආහාරයට ප්‍රථම ඔහු නිවසට ගියේය. ඒ වනවිට උදිත් නිෂ්පාදනය කළ වැඩ සටහනක නැවත විකාශනයක් ප්‍රචාරයට පත් වෙමින් තිබුණි.

තම පැමිණීම පිළිබඳව අම්මා හා අප්පච්චි සතුටට පත්වන බව උදිත් දනී. පාසල් නිවාඩුව නිසා අක්කා හා අයියා පැමිණ සිටිනු ඔහු දුටුවේය. දිවා ආහාරයෙන් පසු ඔහු ප්‍රසිද්ධියේම මෙම ආරංචිය දන්වා සිටියේය.

"අම්මා මම මැරීකරන්නයි ඉන්නේ..."

''බොහොම හොඳා.. බොහොම හොඳා...''

''මනමාලි කවුද...?''

ජයනි ඇසුවාය.

## 40

''මනමාලි බලන්න කලින් හඳහන බලන්න ඕනෑ...''

''හඳහන්වල බලන්න දෙයක් නෑ අප්පච්චි.. ඔක්කෝම හරි...''

උදිත් සිනාසුණේය.

''එහෙනම් අප්පච්චි මනමාලිගෙ හඳහන බලවන්න ඇති...''

සොයුරිය කීවාය. විදෙස් සංචාර කීපයක යෙදුණු උදිත් මෙවන් යෝජනාවක් ගෙනාවේ නැත. ලක්නම් සරසවියේ මිශ්‍ර අධ්‍යාපනයක් ලැබුවත් ඔහු කිසිදාක ගැහැනු සමඟ විශේෂ ඇසුරක් පවත්වා නැත. කාෂ්මීර, කේරල, බංගලිදේශ, තමිල්නාඩු හා සීක් යුවතියන් ඉගෙනුම ලැබූ මෙම සංගීත විශ්වවිද්‍යාලයේ සුරූපියක් සිටියේම නැත. ලංකාවට පැමිණ පසුව වුවද ඔහු ගැහැනු පිළිබඳව එතරම් උනන්දුවකින් කතා කළේ නැත. ගැහැනුන්ගේ ඇඳකුඳ කීවා මිස කැමැත්තක් පවසා නැත.

මෙවැනි හදිසි පිබිදීමක් සිදුවූයේ කිමද? කොළඹ රැකියාවට ගිය කෙටි කාලය තුළ නිවේදිකාවකටවත් අහුවුණිද? මේ දිනවල වැඩ සටහන් ඉදිරිපත් කිරීම සඳහා යොවුන් ශිල්පීන් ශිල්පිනියන් කීපදෙනෙක් තෝරා ගෙන ඇත.



මේ අතර උදිත් සමඟ වැඩ සටහන් ඉදිරිපත් කරන යුවතිය ඔහුට හොඳටම ගැළපෙයි. සිනාසෙනවිට යාන්තම් මතුවන තල දත නැතිනම් ඇය සුන්දරය. එය තිබුණත් කම් නැත.

''මනමාලි කවුද කියල කියන්නද..?''

සොයුරිය පැවසුවාය. ගැහැනුන්ට සතුන්ට පමණක් ඇති සුවිශේෂ ඉරියව් දායාද කර ඇත. ඔවුන්ට බොහෝ අවස්ථාවල පිරිමින්ට නැති ඉවක් ඇත.

''ඔයා එක්ක ප්‍රෝග්‍රෑම් කරන නිර්මාලි මැදිවක නේද...?''

''එයා එන්ගේජ්.. ලබන මාසෙ බඳිනවත් එක්ක..''

''ආඩම්බර නැතිව කවුද කියන්නකො.. එහෙනම් පින්තූරයක් පෙන්වන්න.. ඔයා කැමති නම් අපිත් කැමතියි නේද අම්මා..?''

ලොකු දුව කීවාය. මව එය අනුමත කළාය.

කුඩා කල වඩාගෙන ආදරයෙන් සුරතල් කළත් මේ යොවුන් වියේ පසුවන වෙතා හඳුනා ගැනීමට පුලුවන් කමක් නැත. උඩරට ඇඳුමෙන් සැරසුනු වෙතාගේ ඡායාරූපය ඔහු අක්කාට දුන්නේය.

''හා.. හා ලස්සනයි.. කැන්ඩියන් ගර්ල් කෙනෙක් කොහෙන්ද මල්ලි..?''

මව ද පැමිණ එදෙස බලා සිටියේ සතුටින් පුදුමවය. ඡායාරූපයේ දිස්වන අන්දමට යුවතියගේ පැවසිය හැකි කිසිම වරදක් නැත. අපේ කෙනෙක්. කෝටි සංඛ්‍යාත වූ යෞවනයින් අතරින් ලස්සනම ගැහැනියක් තෝරා ගත් හැටි. කැමැත්තම එහි කිසිම වරදක් නැත. ඡායාරූපය රැගෙන පියා ළඟට ගොස් දක්වන අයුරු බලා සිටියේය. ගැහැනියකගේ වාසනාව හෝ අවාසනාව පිළිබඳව බැලූ බැල්මටම කිව නොහැක.

"හොඳයි ලස්සනයි.. හොඳ හුරු බුහුටි කෙල්ලක් වගෙයි.."

පියා අනුමත කළේය.

"අපිත් දැනගන්නට ඕනෑනෙ.. කාගෙ කවුද? දෙමව්පියො කවුද? මොකක්ද වාසගම? අපි දන්නා අයද?"

"දන්න අය තමා.. අම්මා චූටි කාලෙ වඩාගෙනත් ඇති ඉදලා තියෙනවා..."

අම්මා පුදුමයෙන් දෑස් අයා සිටිනු දුටුවේය. එකවරම පිළිතුරක් සැපයීම පහසු නැත. එසේම පවුලේ වැදගත් පිරිස සිටියදීම මෙය නිවේදනය කළ යුතුය.

"කවුද මල්ලි මේ අපි දන්න කට්ටිය..."

"අම්මා මේ ඉන්නෙ වෛත්‍යලිංගම් අංකල්ගෙ ලොකු දූව චේතා වෛත්‍යලිංගම්.."

එකවරම පරිසරය තුළ දැඩි නිහඬ බවක් ඇතිවුණි. අම්මගේ අප්පච්චිගේ අක්කාගේ මුහුණුවල පැවති සතුට පහව ගියා සේය. මෙම තත්වය ඔහු අපේක්ෂා කළේ නැත. අප මේ හැම වටව සිටින්නේ මිනෘවකිනි. මෙතෙක් මේ දේශපාලනයේ යෙදුණු රාජ රාජ මහාමාත්‍යාදීන් බලය රැකගැනීමට වෛර දුරුවේ ජාතිය ඉන්නා කරගෙනය. එසේත් නැති නම් ආගම මුල් කරගෙනය. සිවිල් සමාජයන් තුළ වඩා වැදගත් වන්නේ මිනිසුන්ය. මිනිසුන් ලෙස ජීවත් වන්නවුනට ඔවුන්ගේ සිවිල් අයිතීන් විනාශ වී ඇද්දැයි අධිකරණයේ පිහිට පැතීමට සිදුවන්නේ එබැවිනි. ව්‍යවස්ථාවේ මනුෂ්‍ය ජීවිත අර්ථ කථනය කිරීමට ඉඩ හැරීමෙන් කෙරෙන්නේ මිනිස් ජීවිත බාල්දු කිරීමකි.

රළු බොරළු, හිමෙන් වැසුණු, එසේත් නැතිනම් වාලුකා කාන්තාරවල වශයෙන් ජීවත්වන හැම මිනිහාටම ජීවත් වීමට ඇත්තේ එකම අයිතියකි. භාෂාව වූ කලී මිනිසාට අදහස් ප්‍රකාශ කිරීමට ඇති මාධ්‍යයක් විනා පූජනීයත්වයෙන් සැලකිය යුතු පූජා භාණ්ඩයක් නොවේ.



තාක්ෂණය අතින් විද්‍යාව අතින් විශ්වයේ ඉහළම දැනුම ලබා ගත්තත් ඔවුන් අධ්‍යාත්මික වශයෙන් පිරිහී ඇත.

තමා හා චේතා අතර වූ බැඳීම හුදු ආදර බැම්මක් පමණක් නොවේ. ජාති ආගම්, කුල වශයෙන් සියළු බැම්මවලින් මිදීමෙන් ලද්දේ කොතරම් නිදහසක්ද? ඒ ගැහැනිය ළඟ තමා පැතූ හැම දෙයක්ම තිබිණි.

"ලස්සනයි නේද අම්මා...?"

"ලස්සනයි තමා..."

"ඒත් මල්ලි මෙයා දෙමළ ගැහැනියෙක් නේද..?"

"මට නම් කිසිම වෙනසක් තේරෙන්නෙ නෑ..."

ජයනි මේ පිළිබඳව මල්ලි සමඟ වාද කිරීමට ගියේ නැත. මෙවන් සුන්දර ගැහැනියක් කෙරෙහි පිරිමියෙකුගේ සිත ඇදීයාම පිළිබඳ කිසිම වාදයක් නැත. එක එල්ලේ කැමති වීමට හෝ විරුද්ධ වීමට උවමනාවක් නැත. විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබද්දී එක්තරා දමිළ සිසුවෙකු හා පෙමින් බැඳී සිටි හැටි ජයනිට සිහිවෙයි. ජාතිවාදී කෝලාහල හේතුවෙන් ඒ සුන්දර තැනැත්තා තමාට අහිමි වූ හැටි සිහිවෙයි.

අද තමා ජාතියට, වංශයට ආගමට, සංස්කෘතියට ගැළපෙන තැනැත්තෙක් හා විවාහ වී සිටීම සැබෑවකි. සැබැවින්ම ඒ තමාගේ සිතේ සිටි පුරුෂයා නොවේ. ජාතිවාදී කෝලාහල ප්‍රශ්න මත වෙනත් රටක පදිංචිව සිටියත් ඔහු තමා අමතක කරන්නේ නැත. විවාහ වී සම්ප්‍රදායික ජීවිතයක් ගත කරන බව සැබෑවකි. මේ ගෙවන පවුල් දිවියේ ද ප්‍රශ්න නැත. තමාට හිමිවිය යුතුව තිබුණේ වෙනත් කෙනෙකුටය. තමාට හිමි වූ දුක මල්ලිට ද හිමි නොවිය යුතුය. මේ යුවතියට උඩරට ඇඳුමෙන් සැරසීමෙන්

අදහස් කරන්නට ඇති දේ ඇයට ද අවබෝධ වෙයි. ගැහැනු මිනිසුන් අඳින ඇඳුමෙන් ජාතිය, කුලය, රට හඳුනා ගැනීම පැහැදිලි මිත්‍යාවකි. මිනිස්කම අඳින ඇඳුමකින් තීරණය කළ නොහැක. මේ කතාවට දිරි දුන්හොත් අම්මා හා අප්පච්චි විරුද්ධ වන්නට බැරි නැත.

මුදියන්සේ අසුනෙන් නැගිට ඉස්තෝප්පුව දෙසට ගියේය. තමා වෛත්‍යාලිංගම් වෙත පුතා යැව්වේ ශාස්තෝද්ග්‍රහණය වෙනුවෙනි. ජීවිතය නිර්මාණය කරන්නා පිළිබඳව අපට පූර්වානුමාන කිරීමට නොහැක. කවර නම් විසඳුමක් දුන්නත් අපට එය ප්‍රතික්ෂේප කිරීමට නොපුළුවන. මේ සංසාර බැම්මෙන් බැඳෙන්නට සිටින්නෝ ගැහැනු පිරිමි වෙති. මැණිකේ තමා තුළුරින් සිටින්නේ උපදෙසක් පැතීමට විය හැක.

"වෛත්‍යාලිංගම් අමාරුවෙ දැම්මෙ අපියි.. ගැහැනු ළමයි ඉන්න ගෙදරකට පිරිමි ළමයෙක් යැවීමෙන් අපි කළේ වරදක්..".

"එහෙම නම් උපාධියට ඉගෙන ගන්න පිටරට ගිහින් ඉඳලා ආවෙ.. එහෙම නම් එහෙදී ගෑනු සම්බන්ධකම් ඇති කරන්නට තිබුණා නේද..?"

"ඒ ගෑනු ළමයා පුතාට ගැළපෙනවයි කියලා හිතන්න ඇති.."

"මේ ගැන වෛත්‍යාලිංගම්ලා මොනවා හිතනවා ඇද්ද...?"

❁ ❁ ❁ ❁ ❁ ❁ ❁ ❁

උමා චේතා හමුවීමට ගියේ හදිසි පණිවුඩයකුත් රැගෙනය. ඇත්තටම පුදුමවිය යුතුව තිබුණේ චේතා සම්බන්ධයෙන් යෝජනාවක් නොආවා නම් පමණි. ඇත්තටම එම යුවල කලින් පතාගෙන ආ යුවලක් පරිදිය. එහෙත් වෙනසකට ඇත්තේ දෙමාපියන්ගේ එතරම් කැමැත්තක් නොතිබීමය. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ දෙදෙනා නොගැළපීම නොවේ. අප්පා නිතරම



දුක්වූයේ මිතුරා තමා පිළිබඳව වරදවා තේරුම් ගනීවිය යන සැකයෙනි. ඉඳින් දෙමාපියන් හමුවීමට නොබෝ වේලාවකින් අම්මා සමඟ දිගු සාකච්ඡාවක යෙදුණු හැටි උමා දුටුවාය.

කාටත් හොරා උමා සොයුරිය හමුවීමට ගියේ යමක් පැහැදිලි කරදීමටය.

චේතා සොයුරිය ආදරයෙන් පිළිගත්තාය. ඇගේ මුහුණත මෙතරම් සතුටක් සැඟව තිබුණේ ද යන්නත් සැකයකි. ජීවිතයේ එකම පරමාර්ථය වන්නේ ප්‍රීතියෙන් ජීවත්වීමය. මේ මිනිස් ජීවිතවල පවතින එකම අඩුපාඩුව වන්නේ ද සතුටින් ජීවත්වීමට නොහැකිකමය.

හැම සම්පතකට වඩා ජීවිතය පුරාවට වෙන එකම ධනය ලෙස සලකන්නේද සතුටය.

සන්තුට්ඨි පරමං ධනං...

"ඇයි නොදන්වාම ආවෙ. අම්මා.. අප්පා සනීපෙන්ද..?"

"ඔව් සනීපෙන්..."

"උදිත් ආවාද...?"

ඇය පහත් හඬින් ඇසුවාය. එකවරම ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි.

"උදිත් මොනාද කිව්වෙ...?"

"චේතා මට ඕනෑ කිව්වා..."

උමා සිනාසුනාය.

"උදිත් සර්ගෙ ඒ පිරිමි ගතියට මම කැමතියි."

"දෙවියනේ අම්මාගෙන් මාව ඉල්ලන්න ආවද...?"

"දෙන්නා පුදුමයෙන් බලන් හිටියා.. ඊට පස්සෙ යන්ට ගියා.."

''කොහෙද ගියේ...?''

''නුවර ඉන්න අම්මටයි අප්පච්චිට කියන්න ගියා...''

බාධක ඇතිවීම සැබෑවකි. ඒ කිසිත් නොසලකමින් ඉදිරිපත්වීම පිළිබඳව ඇගේ සිතේ ඇත්තේ තදබල ආදරයකි.

''මට උදිත් නැතිව ජීවත්වෙන්න බෑ...''

ඇය පහත් හඬින් කෙඳිරුවාය.

## 41

''දවල් කෑමට ඉමු...''

''බෑ මම කාටවත් නොදන්වා ආවේ.. අම්මාට කීවා නම් මට එන්ට වෙන්නෑ.. මේ තියෙන හැම දෙයක්ම නීතියට සම්ප්‍රදායටම කරන්න බැරි වෙන්න ඉඩ තියෙනවා..''

ඔවුනතර නිහඬ බවක් ඇතිවුණි. තමාට මේ ජීවිතයේ හමු වූ සුවිශේෂී විශ්වාසවන්තයාට ජීවිතය බාරදී හමාරය. පැහැදිලිවම මෙතෙක් ඒ කිසිවකට තමා නොපෙළඹ වූ බව පැවසිය යුතුය. වෙනත් පිම්යෙක් සමඟ එක විනාඩියක්වත් තනිව සිටීමට පුළුවන් කමක් නැත. එසේ වුවහොත් ඇයට බලහත්කාරකමක් සිදුවීම වැළැක්වීමට බැරිය.

තම ජීවිත ආරක්ෂා කිරීමට අනවශ්‍ය වගකීමක් දරණ මේ තැනැත්තා පිළිබඳව දැඩි ආදරයක් ගෞරවයක් ඇගේ සිතේ ඇත. ඇත්තටම ඔහු මෙම තත්වයට පොළඹවා ගත්තේ තමා විසින් බව පිළිගත යුතුයි.

තම ජීවිතයට ඇති තර්ජනවලින් ආරක්ෂා කිරීමට



කිසිවෙකුටවත් පුළුවන් කමක් නැත. කොයි මොහොතක හෝ තමාව පැහැරගෙන යාමට ඇති ඉඩකඩ වැඩිය. එසේත් නැතිනම් තමාව මරා දැමීමට පුළුවන. එසේ නොවුවහොත් අප්පා සැලසුම් කර ඇති පරිදි ලංකාවෙන් යාමට සිදුවෙයි. ඒ කවර නම් ක්‍රියා මාර්ගයකදී වුව සිදුවන්නේ තමාට උදිත් අහිමි වීමය. මෙවන් සුන්දර තැනැත්තෙක් අහිමි වනවාට වඩා මිය යාම වඩා යහපත්ය. එහෙත් දැන් තමා ඔහුගේ වී හමාරය. මේ සැමෑ සතුට අයිති අපටය. නංගි පවසන්නේ මෙයට හුරු දෙයකි.

''අම්මලා කැමති කරවාගෙන ඕක කරගන්ට අමාරුවෙයි.. මිය දෙන්නා තීරණයක් අරන්ද තියෙන්නෙ..?

''මට උදිත් නැතිව ඉන්න බෑ.. එච්චරයි මම දන්නෙ...''

ඇය හඬමින් කීවාය.

''ඉතින් නංගා ඉන්න.. ඒ දේ දන්න නිසයි මේ ගමන ආවේ.. උදිත් සර් මොකද කියන්නේ...?''

''එයත් මාව ආරක්ෂා කරන්නයි හැම වෙලාවෙම උත්සාහ කරන්නෙ....''

''අක්කා කොයි කාටත් වඩා ඕගොල්ලන්ගෙ සංවිධානෙ ගැන දන්නවා නේද...?''

''මම දන් ඒ මිනීමරු සංවිධානෙ නෑ...''

''ප්‍රමාද වෙලා හරි තේරුම් ගියා නම් ඒක ලොකු දෙයක්.. ඒත් දැන් හුඟාක් ප්‍රමාද වැඩියි.. ඉක්මන් නුවොත් ප්‍රශ්න දිග්ගැස්සෙයි...''

''කියන්න නංගි මොනාද කරන්නෙ කියලා..''

''අපි ඔක්කෝටම ඔස්ට්‍රේලියාවට යන්න වීසා ලැබිලා තියෙනවා..''

''එතකොට උදිත්..

"උදිත්ට අපි එක්ක එන්න බෑ.. එයා අපේ පවුලෙ කෙනෙක් නෙමේ..."

"වයිනොට්.. වී ආ ලිවින් ටුගෙදර.. හිස් මයි හස්බන්ඩ්..."

"හරි හරි.. කලබල වෙන්ට එපා.. හැඟීම්බර වෙලා මේවා විසඳන්නට බෑ.. ඔයා එක්තරා සංවිධානයක කෙනෙක් වෙලා නොසිටියා නම් මේක බැරෑරුම් ප්‍රශ්නයක් නොවන්ට තිබුණා... අපි ඉස්සෙල්ලා ඕස්ට්‍රේලියාවට යමු..."

"උදිත් නැතිව..."

"ඔව්.. ඉස්සෙල්ලා අපි යමු. එතකොට මේ ප්‍රශ්නයෙන් කොටසක් විසඳිලා. ඔයාට ආරක්ෂාව ලැබිලා. ඊට පස්සෙ අපි උදිත්ව ගෙන්වා ගනිමු..."

"කොහොමද නංගි මම ඒ දේ කරන්නෙ...."

"අපි ලංකාවෙන් නොගියොත් අපි කාටහරි විපතක් වෙනවා. උදයන් අපි තුන්දෙනාගෙන් කාට හරි විපතක් කරනවා.."

ඇය සැබවින්ම පවසන්නේ සත්‍යයකි. ඉකුත් මාසයේ වූ ඝාතනය ගැන චේතා දනී. පරමාර්ථය කරා නොදින් යාමට බැරි බව පිළිගැනීමකි. ඉකුත් දශක දෙක තුළ ත්‍රස්තවාදී අරගල නිසා විනාශ වූ ජීවිත දහස් ගණකින් කපා කොටා මරා දමූ මායිම් ගම්මානවල අහිංසක ගැමියන් අති විශාලය. තම පරමාර්ථවලට විරුද්ධ වන තම වර්ගයා පවා විනාශ කර දමති. එවන් වාතාවරණයකදී චේතාට සිවිල් පුරවැසියෙක් ලෙස මේ සමාජය නියෝජනය කිරීමට ඇති අවකාශ කොහෙත්ම නැත.

තමා උදිත් සමඟ ජීවිතය ආරම්භ කළ බව සොයුරියට පැවසීමට පුළුවන් කමක් නැත. මීට වඩා තමාට ජීවිතයේදී කවත් ජයග්‍රහණයක් ලබාගත නොහැක. සුවිශේෂී අවස්ථාවකට මුහුණ දී සිටින තමා පූර්වාදර්ශයක් ලෙස සැලකීමට නංගීට ඉඩ දිය නොහැක.



මෙම ග්‍රහචාරයන් සමානව පිහිටන්නේ ඉහත ආත්ම භාවවල එකට ජීවත්වූවන්මය. මොනයම් හේතුවක් නිසා හෝ ජාතීන් දෙකක, සංස්කෘතියන් දෙකක ආගම් දෙකක අය ලෙස ඉපදුනත් අවසානයේ එකට මුණ ගැසුනු හැටි. දෙමළ මිනිහාගේ වෛරකාරයා සතුරා ලෙස සිංහලයන් අතැමුන් හැඳින්වූවත් ඔවුන් දෙදෙනාට එය ප්‍රශ්නයක් නොවූ හැටි පුදුමය.

නිවසේ තිබූ දෙදෙනාගේ හඳහන් දෙක යළි වෛතාලිංගම් නැවත පරීක්ෂා කර බැලුවේය. කිසිදාක දෙදෙනා වෙන්ව ජීවත් වී නැත.

"කාගෙද හඳහන බැලුවේ.. චේතාගේද...?"

"පුදුම හඳහනක්.. මේ දෙන්නා එක් වෙන්න ඉපදුනු දෙන්නෙක්. මොනවා කළත් දෙන්නව වෙන් කරන්න කාටවත් බෑ. ඒ තරම් ප්‍රබල ග්‍රහචාරයක් තියෙන්නෙ..."

"ඊක් අප්පා අපි මේක අනුමත කරන්නේ කොහොමද...?"

"මේ දරුවගෙ හීන මේ විදිහට හරි වෙනස් වුණ එක හොඳා.. එක්කො ආණ්ඩුවෙ හමුදාවෙන් වෙඩි කන්ට තිබුණා.. නැතිනම් උදයන්ල අතින් මැරෙන්න තිබුණා..."

කිසිම තීරණයකට එළඹීමට නොහැකිව ඔවුහු ලතැවූහ.

පෙරවරුවේ නිවසින් පිටව ගිය උමා තවම නැත. උදාවී ඇත්තේ නරක කාලයකි. ඉදිරි අනාගතයේ මොනාද වේදැයි කිසිවෙකුට පැවසිය නොහැක. මීට වසර ගණනකට ඉහත පැවති සාමය අන්‍යෝන්‍ය අවබෝධය සිංහල දෙමළ මිනිසුන් අතර නැත. හැම දෙනාම බැලීමට සූදානම් සිටින්නේ සැකයෙනි. සිංහලයන්ට සැබෑ දුක් සහගත අත්දැකීම්වලට මුහුණ දීමට සිදුව ඇත. දෙමළයන්ට ද එසේය. කුරිරු යුද්ධය නිසා අවතැන්වූ දහස් සංඛ්‍යාත වූ පිරිසක් අද සරණාගත කඳවුරුවල ජීවත්වෙති.

ගොවිතැන් බත් කරගෙන කුඹුරුවල බත් කෑ පිරිසට අද

සලාකය ලැමඛන තෙක් බලා සිටීමට සිදුව ඇත.

අවිශ්වාසය පදනම් වූ සමාජයක් තුළ ගෙදර අයෙක් උදේ ගොස් සවස එන තෙක් බියෙන් සිටීමට සිදුව ඇත. පොඩි දුව නිවස දෙසට එනු දුටු ඔහුගේ සිතේ වූ බිය පහවුණි.

''කොහෙද දුව ගියේ...?''

සාවිස්ත්‍රී දුවගෙන් ඇසුවාය. ඇය එකවරම පිළිතුරු දුන්නේ නැත. අම්මා ලවා ගවුමේ පිටට ගසා ඇති කටුව ඉවත් කරවා ගත් ඈ සැහැල්ලු ගවුමකින් සැරසුනාය.

''ගිහින් කෑම කන්න...''

''මහන්සි වගේ තව ටිකක් කන්නම් අම්මා.. මම අක්කා බලන්ට ගියා..''

''මට නිකමට හිතුණා සිංහල විදිහට ලැස්ති වෙනකොට.. කොහොමද ගෙවල් දැනගත්තෙ...''

''මම උදීන් සර්ගෙන් අහගත්තා...''

''යන බවක් දන්නවා නම් දරුවාට සල්ලි ටිකක් යවන්ට තිබුණා...''

''දැන් ඒ ගැන කීමෙන් වැඩක් නෑ.. මේ මංගල්ලෙ ඉක්මන් කරන්ට වෙයි.. නැතිනම් උදයන්ගෙන් කරදරයක් වෙනවා...''



# 42

කෝවිල් ගිය වෛත්‍ය ලිංගම් ආපසු එන ගමන් වෙළඳ පළට ද ගියේය. සිතට කිසි නිදහසක් නැත. උමා කාගෙන්වත් නොවිමසා සිංහල මිනිසුන් සිටින පෙදෙසට ගොස් ඇත. ළමුන් දෙදෙනාට චතුර ලෙස සිංහල කතා කිරීමට පුලුවන. ඔවුන්ට සිංහල භාෂාව ඉගැන්වීමෙන් කරන ලද්දේ මහත් සේවයක් බව වැටහෙන්නේ දැන්ය.

ආපසු නිවසට පැමිණ ගේට්ටුව වසා එද්දී එහි දොර ළඟ පිරිමි හා ගැහැනු සපත්තු දැකීමෙන් පුදුම වුණි. එළවළු බෑගය බිම තබා ඉදිරියට දුව ආවේ පැමිණ සිටින යුවල දැකීමෙනි.

මිස්ට මුදියන්සේ.. මුදියන්සේ...

ඔහු ඉදිරියට ගොස් ඔවුනොවුන් වැළඳ ගනිමින් කෑගැසුවේය.

''එල්පුඩි සුකම්.. කොහොමද වෛත්‍යා...''

''නල්ලම් දොරේ... මැණිකේ ඉඳගන්ට...''

වෛත්‍යලිංගම් සතුට අදහාගත නොහැකිව කෑගැසුවේය. සාවිස්ත්‍රී මැණිකේගේ දෑතින් අල්වා ගත්තාය. උමා කාමරයට වැදී සිටියේ මේ බැරෑරුම් ප්‍රශ්නය ගැන සිහි කරමිනි. විවාහ වුණත් නැතත් ඔවුන් දෙදෙනා එකට ජීවත්වන යුවලක් බව පැවසීමට වෙනත් සාක්ෂි අවශ්‍ය නොවුණි. නීතියෙන් අවශ්‍ය වෙන්නේ එකිනෙකා පිළිබඳව අවිශ්වාසයක් වේනම් පමණි. ඔවුන් පතන ජීවිතය එය නම් එය පූර්ණත්වය කරා ගෙන යාමට පැහැදිලිව ඉඩ දිය යුතුය. සැබවින්ම අක්කා පසුවූයේ අසාමාන්‍ය සතුටින් යුතුවය. ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ ප්‍රසිද්ධ ජීවිතයක් ගෙවීමට ඇයට ඉඩ

නැතිකමය. සිතේ කොහේ හෝ තැනක බලාපොරොත්තු බිඳ වැටීම පිළිබඳව දුකක් පළ වුණත් ඇය සිත සනසා ගැනීමට වෙර දරුවාය.

තමා අමතන හඬ ඇසුණ නිසා ඇය ඇඳෙන් නැගිට්ටාය. කවුරුන් හෝ අමුත්තන් පිරිසක් නිවසට පැමිණ ඇති බව හැඟී ගිය හෙයින් ඇය එකවරම පිටතට ගියේ නැත.

මුදියන්සේ මීට ඉහත මේ නිවසට පැමිණ තිබුණේ නැත. ගෘහ භාණ්ඩ ලෙස තිබුණේ අත්‍යාවශ්‍ය ඒවා පමණි. වරින්වර ඇතිවන ජාතිවාදී කල කෝලාහලවලදී පාරට බසින්නට සිදුවන්නේ ඇඳිවත පමණක් ඇතිවය. එක්රැස් කරගන්නා වටිනා දේ කවුරුන් හෝ පැහැරගෙන යති. එසේත් නැතිනම් ගින්නෙන් අළු වෙයි. ගැහැනු දරුවන් දෙදෙනා හා බිරිඳ කැටිව පොලීසියට හෝ හමුදා මුර පලක පිහිට පතනවා හැර වෙන විකල්පයක් නැත.

වටිනා සම්පත ලෙස සැලකෙන්නේ ජීවිත පමණි. උපන්දා සිටම දමිළ මිනිසුන් ලෙස මෙම දුක්ඛිත ජීවිතය ගෙවූ හැටි සිහිවෙයි. සිතට දුකක් කෝපයක් ඇතිවන බව සැබෑවකි. මිලේච්ඡ අවස්ථාවාදී සිංහලයන් ටික දෙනෙක් නිසා සමස්ත සිංහල වර්ගයාම ප්‍රතික්ෂේප කිරීමට පුළුවන් කමක් නැත. වරක් දෙකක් ජීවිතය බේරුණේ ඔවුන් නිසාය.

මුදියන්සේ කලාව ආත්ම කොට ජීවත්වන උතුම් මිනිසෙකි. ජාතිවාදී අරගල යුගයේ තමා ඇතුළු දරු පවුලට ආරක්ෂාව සැපයුවා පමණක් නොව කෑම බීමෙන් ද සංග්‍රහ කළේය. චේතා දුව උපත ලද්දේ ප්‍රශ්න උදාව පැවති යුගයේ දීය. බිරිඳට තනකිරි සිටියදී මුදියන්සේගේ බිරිඳගෙන් දුවට කිරි සපයා දුන් හැටි සිහිවෙයි.

''කෝ ලොකු දුව...?''

''ලොකු දුව ගෙදර නෑ... පොඩි දුව ඉන්නවා..''

උමා සාලයට ආවේ අමුත්තන් පිළිබඳව දන හැඳිනීමෙන් පසුවය. දෙවියනේ මේ දෙමළ අය නොවේ.



මෙච්චර ළඟින් හිතවත්කම් තියෙන සිංහල අය කව්ද? මේ උදිත්ගේ දෙමාපියන් බව කීමට කිසිම සාධකයක් අවශ්‍ය වූයේ නැත. ඇය පහන්වී මවගේ දෙපතුල් වැන්දාය. උදිත්ගේ මව ඇගේ දෙකොපුල් සිප ගත්තාය. සැබවින්ම මේ පූජාව වැඩීමට ඔවුන් සුදුස්සෝය.

''තෙරුවන් සරණයි...''

මුදියන්සේ උමාගේ අතින් අල්වා ගනිමින් කීවාය.

''මතකද දන්නවාද...?''

''ඔව් මතකයි.. මාව වඩාගෙන හැදුවේ...''

''අපි තෙමේ දුවවයි අක්කාවයි හැදුවේ..''

''අක්කා නම් අම්මාගෙන් කිරිත් බීලා තියෙනවා..''

සාවිත්‍රී කීවාය.

මෙය බොහෝ කලකට පසු සිදුවූ සුන්දර හමුවකි.

''කෝ ඒ දරුවා..?''

''අපිට ලොකු කරදයක් වෙලා මිස්ට මුදියන්සේ..''

චේතාලිංගම් කම්පාවට පත්වෙමින් කීවේය. මේ යුගයේ ජීවත්වන හැමටම මොනවා හෝ ප්‍රශ්නයක් ඇත. ඒවා කඳුබල ඒවා ලෙස සිතීමට ගිය හොත් ජීවත් විය නොහැක.

''අපිට හුග කලකින් හම්බ වෙන්න බැරිවුණේ මේ ප්‍රශ්න නිසයි...''

මුදියන්සේ හිසවනා එය අනුමත කළේය.

''පොඩි දුව හින්දු බාලිකාවේ ඉගෙන ගන්නා.. ලොකු දුව ජෆ්නා කැම්පස් එකට තේරුණා..''

''හොඳයි හොඳයි...''

ඔහු සතුට පළ කළේය.

''ලොකු දුව එහෙදී දෙමළ සංවිධානෙකට සම්බන්ධ කරගෙන...''

''ඔව්. දැන් බලහත්කාරයෙන් ළමයින්ව හමුදාවට බඳවා ගන්නවා.. ඒක දැන් ජාතික ප්‍රශ්නයක්.''

වෛතාලිංගම් වෙතාට සිදු වූ විපත පැහැදිලි කරද්දී හෙමතම කම්පාවට පත්වුණි.

''මේ කිසි දෙයක් අපි දැනගෙන හිටියේ නෑ. ඔලුව ආමරුව හැදිලා කොළඹට ආවා. උදිත් පුතා බෙහෙත් ගෙනැල්ලා සනීප කළා...''

මුදියන්සේට කතාවේ ඉතිරි ටික සකස් කරගැනීමට වෑඩිමයන් කරුණු. අවශ්‍ය වූයේ නැත.

''මේ සංගමයට සම්බන්ධ අය ආපහු වෙතාව පැහැරගෙන යාමට ආවා. නොගියොත් එයාව මරා දමාවි..''

ඔහු කම්පාවට පත්වෙමින් කීවේය.

''අපි දැන් ලෑස්ති වෙන්නේ දුවව ලංකාවෙන් යවන්නයි.. මේ දවස් ටිකක් විසා හම්බ වෙනකම් ඉන්නෙ..''

සාවිත්‍රී කීවාය....

''එහෙනම් ටික දවසකට දරුවා අපේ ගෙදර තියන්නට පුළුවන්...''

''උදිත් පුතා වෙතාව වෙන තැනක තියලා.''

මුදියන්සේ මඳ වෙලාවක් නිහඬව සිටියේය. උදිත් ඉකුත් දිනයේ පැමිණ කළ යෝජනාව පිළිබඳ මුදියන්සේ බිරිඳ සමඟ



දීර්ඝ සංවාදයක යෙදුනේය. ඔහු කිසි දිනක ගැහැනු පිළිබඳ එතරම් උනන්දුවක් දැක්වූ අයෙක් නොවේ. විදෙස් සංචාරයේදීවත් විවාහයක් කරගැනීම පිළිබඳව ඔවුහු සීමාවක් පනවා තිබුනේ නැත. ලංකාවෙන් විදෙස් රටවලට යන ඇතැම් අය එම රටවලදී විවාහ වෙති. ලංකාවේ දමිළ හෝ වෙනත් වාර්ගික කාන්තාවන් විවාහ කරගැනීම විශාල වරදක් කොට දකිති. මුදියන්සේ දරුවන්ගේ කැමැත්තට සම්බාධක පැන වූ අයෙක් නොවේ. පුතා කළ වෛතාලිංගම්ගේ දුව පිළිබඳ යෝජනාවට විරුද්ධ නොවූයේ එය ඔවුන්ගේ කැමැත්ත වූ හෙයිනි.

''පුතා ඇවිදින් වෙතා පිළිබඳව යෝජනාවක් කළා..''

මුදියන්සේ කීවේය.

''අනේ මහත්තයෝ සමාවෙන්න.. මේ ගැන අපේ අනුබලයක් නෙමෙ නෑ..''

වෛතා ලිංගම් කීවේය.

''මේවා අපේ කැමැත්තෙන් යෝජනා වුණු දේවල් නෙමෙ.. අපි කවුරුත් මේවාට අනුබල දීලා නෑ...''

''අපි දෙමළ මිනිස්සු.. මුදියන්සේ මහත්තයා උඩරට සිංහල මිනිහ... අනිත් නෑදෑයෝ මේකට කැමති වෙන එකක් නෑ...''

මුදියන්සේ මඳ සිනාවකින් මුව සරසා සිටියා විණා සිනිවක් කීවේ නැත. සතුන්ට විශේෂිත වූ හැසිරීම් රටාවක් ඇත. සතුන් බෝකරගන්නේ ඒ ඒ ඔවුන්ට ආවේණික ක්‍රමයන් අනුවය.

මිනිසා සතුන්ගෙන් වෙන් වන්නේ බුද්ධිමත් බව අනුවය. බුද්ධියෙන් දැනුමෙන් දියුණුවන්නට සිතුම් පැතුම් ද වෙනස් වේ.

විවාහයකදී රට, ජාතිය, ආගම සංස්කෘතිය වැනි වැට කඩා බිඳ දැමූ අවස්ථාවන් බහුලය. තම පුතා හා වෛතාලිංගම්ගේ දුව අතර ඇති බැඳීමට සම්බාධක පැනවීමට කිසිවෙකුත් පුළුවන් කමක්

නැත.

"ඒවට බයවෙලා බැහැනෙ චේතනා..."

"ඒ සංවිධානෙ ඉන්න උදයන් කියන කොල්ලෙක් දූව ගැන හිතාගෙන ඉන්නවා.. ඒත් දූව ඒ හාදයට කැමති නෑ..."

"උදයන්ල අපි කවුරුත් මේ රටේ මිනිස්සු.. ඒ අයට බය වෙලා බෑනේ චේතනා..."

ඔවුන් කතා කරමින් සිටියදී උමා තේ රැගෙන ආවාය.

නව අධ්‍යායන වාරය ආරම්භව තිබීම නිසා ශාලාවට සිසුවියන් පැමිණෙමින් සිටිනු මුදියන්සේ දුටුවේය. උමා සූදානම්ව සිටියේ ද නැටුම් පුහුණු කිරීමට උචිත ඇඳුමකිනි.

උමා උදිත්ගේ පියාගේ දෙපතුල් වැන්දාය. ඔහු ඇගේ හිස පිරිමැද සමාචාර දක්වූයේය.

උමාට තිබුණේ නර්තනයට උචිත වූ දේහයකි. සැබැවින්ම ඇය නවත් කලා නිර්මාණයක් බඳුය. නැටුම් පන්තිය ආරම්භ වූ පසු ඇය ශිෂ්‍යාවන්ට දක්ෂිණ භාරතීය නැටුමක් උගන්වන අයුරු මුදියන්සේ බලා සිටියේ සතුටින් යුතුවය.

උදිත් ශාලාවට පිවිසුනේ නැටුම නරඹමින් සිටි මොහොතේය. ඔහු සිටියේ තැතිගත් මුහුණින් යුතුවය.

kathapothak.blogspot.com



# 43

අම්මා හා අප්පච්චි සාලයේ අසුන්ගෙන සිටිනු දුටු උදිත් සිනාමුසු මුහුණින් යුතුව එදෙසට ගියේය. අම්මා හා අප්පච්චි මෙවන් මොහොතක දකීමට ඔහු කිසිසේත් බලාපොරොත්තුව සිටියේ නැත. ඉකුත් දින තමාගේ අපේක්ෂාවන් දෙමාපියන්ට දන්වා සිටි හැටි උදිත්ට සිහිවෙයි. දමිළ යුවතියක් හා විවාහ වීමට දෙමාපියන් මෙතරම් ඉක්මනින් කැමැත්ත දෙතැයි ඔහු කිසිසේත් විශ්වාස කළේ නැත.

නිවසට ගොස් පසුදින කාර්යාලයට ගියේ සතුටින් යුතුවය. අප්පච්චි දරුණු සිතැත්තෙක් නොවේ. චේතා පිළිබඳව වූ කතාවට මෙතරම් යහපත් ප්‍රතිචාරයක් දක්වතැයි ඔහු කිසිසේත් සිතුවේ නැත. කාර්යාලයට එනතෙක් වූ දිගු කාලය තුළ ඔහු සිතමින් ආවේ චේතා ගැනය. තනිවන හැම මොහොතකම සිහිවන්නේ චේතාය.

මේ ලෝකය පවතින්නේ එකිනෙකා පිළිබඳව පවතින විශ්වාසය මතය. ඇය තම ජීවිතය බාරදුන්නේ හිතිය මත නොව විශ්වාසය මතය. එය බිඳ දැමීමට කිසිසේත් පුළුවන් කමක් නැත. විදේශගතව සිටියදී විවිධ ජාති, ආගම් හා සංස්කෘතීන්හි ගැහැනු පිරිමි ආශ්‍රය කර ඇත. කවුරුත් මනුෂ්‍යයන් යන සිතුවිල්ල ඔහුගේ සිතේ තහවුරු වී තිබුණි.

අප පිළිගත්තේ නැතත් ජීවිතය අපට තෝරා මෙහෙයවන කවුරුන් හෝ ඇතැයි නොසිතා බැරිය. නැතිනම් යාපනේ චාවකච්චේරියේ උපන් දමිළ කෙල්ලෙක් තම සහකාරිය ලෙස තෝරා ගන්නේ නැත. උඩරට සිංහල බෞද්ධයෙක් ලෙසින් උපන් තමාට හිමිවිය යුතුව තිබුණේ එම රටේම වූ සිංහල තරුණියකි. මිනිසුන් තම රටේ අය සමග පමණක් විවාහවන සංස්කෘතියක් රට තුළ පවතී. විශේෂයෙන් යුද්ධයක් පවතින මෙවන් මොහොතක

ජාති දෙකක් අතර විවාහ සබඳතා ඇතිවන්නේ නැත. මෙවන් අවස්ථාවකදී ඇය තමාට ජීවිතය දුන් හැටි. ඇය තමා සමග දිවි ඇරඹීමට ගිවිසුමකට එළඹුණේ කිසිම කොන්දේසියක් නැතිවය. කවුරු නොදූන සිටියත් අද අපි අඹුසැමියන් ලෙස ජීවිත පටන් ගත්තේ දෙදෙනා අතර වූ පොදු එකඟතාවයකිනි.

සිදුවූයේ අනපේක්ෂිත දෙයක් වුවත් එයට දෙමාපියන්ගේ ආශිර්වාදය ලබාගත යුතුය. කාර්යාලයට එනවිට සවස් වී තිබුණි.

"ජයි උදිත් කොහේද ගියේ..? මම උදේ ඉඳන් උඹව හැමතැනම හෙව්වා."

ජනක ඇසුවේය.

"මම අප්පච්චි හම්බ වෙන්න ගමේ ගියා. යාන්තම් ගොඩ."

"මෙච්චර හදිස්සියෙන් ගියේ මේකටද?"

"මචං.. මම ගෙදර ගිහින් අප්පච්චිටයි අම්මටයි චේතාගේ එෆෙයාර් එක ගැන කිව්වා. උත්සවයක් ගන්නෙ නැහැ. රෙජිස්ටර් කරනවා. අම්මයි අප්පච්චියි චේතලාගෙ ගෙදර ආවා."

ජනක පිළිතුරක් නොදී මඳ වේලාවක් නිහඬව සිටියේය. මොනවා හෝ පැවසීමට ජනකට අවශ්‍ය ඇති බව උදිත්ට හැඟුණි.

"ඇයි මචං... මාව හෙව්වෙ..? මොකුත් ප්‍රශ්නයක්ද?"

"ප්‍රශ්නයක් තමී තමා. මම උදේ ආන්තම්මා බලන්න ගෙදර ගියා. ගරි වැඩක්නෙ මචං වෙලා තියෙන්නෙ.. චේතා ගෙදර නැහැ."

"ගෙදර නැහැ කිව්වෙ එයා කොහේ යන්නද?"

ඔහු මඳ සිනාවෙන් යුතුව කීවේය.

"ගේ ඇතුළෙ කිසි තැනක හිටියෙ නැහැ."

"ඉඳලා හිටලා වත්ත පල්ලෙහා ළිඳට යනවා. එයා ඒ ළිඳෙන්



නාන්ට කැමතියි."

"නෑ මචං.. මම වත්ත පහළ ළිඳ ළඟටත් ගියා. චේතා හිටියෙ නැහැ. මෙයාගෙ යාළු කෙල්ලන් එහෙම ඉන්නවද?"

"පිස්සුද මචං. එයාට යාළුවො කොහෙද? මේ ඇත්ත කියපං.. උඹ මාව අන්දවන්න හදනවද?"

"නෑ මචං... මම එහෙම කරනවද? මම කියන්නද උඹ දැන් ගෙදර පලයන්. මම තව ටිකකින් එන්නම්."

මිතුරාගේ කතාව විහිළුවක් නොවන බව හැඟිගියේ ඔහු වගකීමෙන් කතා කළ හෙයිනි. සේවා ස්ථානයෙන් පිටතට පැමිණි ඔහු ත්‍රීවීලරයකට නැඟුණේය. කොහේ ගියාද? ඇයට යන්නට තැනක් නැත. වීසා ගැනීම සඳහා තානාපති කාර්යාලයට යා යුතුව තිබුණි. එම අදහස අතැර දැම්මේ තමා නිසාය. දැන් ඇය තමාගෙන් මිදී කිසි තැනක යාමට කැමති නැත. හදිසියෙන් ගෙදරින්වත් කැඳවීමක් ලැබුණද? තමාගේ අවසරයක් නැතිව දෙමාපියන් හමුවට නොයන බැව් ඔහු දනී. නිවසේ දුරකථනයක් තිබුණි ද ඇය ඉන් ඇමතුම් ගන්නේ නැත. හේතුව වන්නේ ඉන් ප්‍රශ්නයක් ඇතිවේතැයි සිතුණ හෙයිනි.

දුරකථන ඇමතුමක් ගැනීමට යාබද නගරයට ගියාවත්ද? මුකුත් කරදරයක් නොවේවා.. ඔහු නිහඬ සිතින් පැතුවේය. ගමන් ගන්නා ත්‍රීවීලරයේ වේගය ප්‍රමාණවත් නැත.

දෙමාපියන් ඇය තමාට භාර දුන්නේ වගකීමෙනි. කිසියම් ප්‍රශ්නයක් ඇති වුවහොත් මුහුණ දෙන්නේ කෙසේද? අපි ඉන්න තැන කවුරුවත් දන්නේ නෑ. ආන්තම්මාට නොකියා කෝල් එකක් ගන්ට ටවුමට යන්ට ඇති. ඔහු සිත හදා ගැනීමට උත්සාහ කළේය.

නිවස ඉදිරිපිට කීප දෙනෙක් සිටිනු දුටු සැණින් කුමක් හෝ සිදුව ඇතැයි ඔහු සිතුවේය. ත්‍රීවීලරයෙන් බැස ඔහු නිහඬව නිවස තුළට ගියේය.

''පුතා මේ ළමයා උදේ වටුමට යනවා කියලා ගියා තවම ආවෙ නැතෙ.''

අත්තම්මා කිවාය. ඔහු පිළිතුරක් නොදී කල්පනා කළේය.

''ගෙවල් පැත්තෙ ගියාද?''

''එහෙම තනියම යන්නෙ නෑ ආත්තම්මා..''

කිසිම අයුරකින් මෙතෙක් වෙලා සිටින්නේනැත. තමාට නොදන්වා එවැනි ගමනක් ඇය කිසි විටෙක යන්නේ නැත. සාලයේ අසුනක මඳ වේලාවක් ඉඳ ඔහු කාමරයට ගියේය. කාමරයේ මුල්ලක සැඟවී එක්වරම තම දෙනෙත් වසා ගනිතැයි ඔහු සිතුවේය.

කාමරය පුරා පැතිර ඇත්තේ දැඩි නිහඬ බවකි. ඉකුත් දින රැයේ හැඳ සිටි නිදන ගවුම රෙදි වැට අසල වැටී තිබෙනු දුටු ඔහු එය අතට ගත්තේය. අඩ අඳුරේ සිට තමා විසින්ම ගලවා ඇඳුම් වැටට විසි කළ හැටි ඔහුගේ මතකයට ගලා ආවේය. ගෙවී ගිය රාත්‍රිය තුළ දෙදෙනා එකම පොරෝනයකට ගුලිව නිදා ගත් හැටි සිහිවුණි. කාමරය තුළ පැතිර පවතින්නේ ඇගේ සුවඳ පමණි. කිසියම් මොහොතක ඇය මෙහි නොඑතැයි සිතීමට කිසිම හේතුවක් නැත. ඇයට තමාගෙන් තොර වූ ජීවිතයක් නැත. සතුටක් ඇත්නම් එය තනිව ගොඩනැඟුනක් නොවේ. ඒ හැම සතුටක්ම නිර්මාණය වූයේ පොදු කැමැත්තක් ඇතිවය. එම උකුල් තලය තමාට යහනක් කර දුන්නේ ගැහැනියක සතු නිෂේධ අයිතිය අනුවය. එම සුන්දර දේහය කැමති අයුරින් හැරගීමටත්, එම ඉඩමේ එක් අයෙකුට පමණක් ගමන් කිරීමට පරවගතා අයිතියක් පවරා දුන් හැටිත් සිහිවුණි. මායිම්දමා පිළිරූපතක් සහිත ඇය සතු සින්නක්කර ඉඩමේ කැමති අයුරකින් වැතිර සිටීමේ අයිතියට ඔහු ද විරුද්ධ වූයේ නැත. සත්‍ය ලෙසම මේ යොවුන් වියේ අයිතිවාසිකමය. ඇත්තටම ඇය සතුටු වූයේ මුළු ලෝකයම හිමිකරගත් රැජිණක් ලෙසිනි.

මෙහෙම වුණේ කොහොමද?



ජනක කාමයට පිවිසි හඬින් කල්පනා දාමය බිඳී ගියේය.

''තවම ආරංචියක් නැද්ද?''

ජනක ඇසුවේය. ඔහු හිස වනා පිළිතුරු දුන්නේය.

''චේතා මෙහෙ කා එක්කවත් සම්බන්ධයක් නෑ. ගෙදර ගියා වෙන්න බැරිද?''

''මගේ අවසරයක් නැතිව කොහේවත් යන්නෙ නෑ. මං නැතුව ගෙදර යන්නෙ නෑ.''

''යමු වටුන් එක පැත්තෙ. ගිහින් පොඩ්ඩක් හොයමු. මෙන්න මේ පින්තූරෙත් ගනින්.''

ඔහු කැබිනෙට්ටුව මත වූ චේතාගේ ඡායා රුව දක්වමින් කීවේය.

මේ මෑතක ගන්නා ලද ඡායාරුව සිත් ගන්නා සුළු කෝණයක තිබුණේ එය ඇයට රහසින් ගත් එකක් නිසාය. එහි සිත් ඇද ගන්නා කදිම හැඩයක් තිබුණි.

ජනක ගරාජයේ තිබූ රථය එළියට ගත්තේය. උදිත් නිහඬව පැමිණ එහි අසුන් ගත්තේය.

''අපි ඉස්සෙල්ලා පන්සල් පැත්තෙ බලමුද?''

උදිත් යෝජනා කළේය. හින්දු ආගම ඇදහුවත් පන්සල ඇය ප්‍රිය කළ තැනකි. දහම් පාසලට නැටුම් පුහුණු කළේ ද ඇයගේ උපදෙස් අනුවය. බණ මඩුව අසල රථය නතර කළ මවුහු චේතාගේ පැමිණීම සිදුව ඇද්දැයි සොයා බැලූහ. ඇය පැමිණ නැත.

නීත්‍යානුකූල විවාහයක් සිදු නොවූවත් නැමදා අප ඕකින්. ගනින් එක්ව ජීවත් වෙමු යැයි ගිවිස ගත්තේ මේ බුදු මැදුර තුළය. බුදුන් වැඳ නිම වූ පසු ඇය තම දෙපා වැන්ද හැටි සිහිවුණි. නගරයේ ඒ මේ අත ඇවිද්දත් පලක් නොවුණි. චේතාට අසනීප වූ

දිනයේ බෙහෙත් ගත් පෞද්ගලික බෙහෙත් ශාලාව අසල වූ දුරකථන ඇමතුම් ගන්නා ස්ථානයට ගියේ විශ්වාසයකින් නොවේ.

"මල්ලි මෙන්න මේ පින්තූරෙ ඉන්න ගර්ල් වගේ කෙනෙක් මෙහාට ආවද?"

තරුණයා පින්තූරය අතටගෙන සිනාවකින් මුව සරසාගෙන ඔහුට යාබද සිටි තරුණියට දුන්නේය. එය දුටු සැණින් යුවතියගේ මුහුණේ සිනාවක් සටහන් වුණි.

"ඔව් උදේ ආවා."

"සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනම දන්නවා නේද?"

තරුණයා විමසුවේය.

"ඔව් මල්ලි. කොහාටද ගියේ..?"

"හරි වැඩක්නෙ වුණේ.. ඒ ගර්ල් ලස්සන හින්දා අපිත් බැලුවා. ෂොප් එකෙන් එළියට බැස්සා විතරයි කවුද කට්ටියක් ඒ ගර්ල්ව බලහත්කාරයෙන් වගේ වෑන් එකක දාගෙන කොළඹ පැත්තට ගියා."

හැම උත්සාහයක්ම ගන්නේ චේතා ආරක්ෂා කිරීමටය.

"අරුන් චේතාව අරන් ගිහින්."

උදිත් කීවේය.

චේතා ආරක්ෂා කිරීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක වීම පිළිබඳ සිතේ ඇති වූයේ දැඩි දුකකි. මෙවන් සිදුවීමක් සිදුවිය හැකි බව චේතා පැහැදිලිව දැන සිටියාය. කිසිම කොන්දේසියක් නිසියක් නැතිව ඇය තමාට ජීවිතයේ වටිනාම දේ පරිත්‍යාග කළේ තම කැමැත්තෙනි. ඇයගා ගත කළ කාලය කෙටි වුවත් හැම නිමේෂයකම සතුට ගෙනා නැටි මතකය.



❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

වෛත්‍යලිංගම්, සාවිස්ත්‍රි, උමා යන සැමෝම උදිත්ගේ මේ වෙනස ගැන විමතිය පළ කළහ.

"ඇයි පුතා මේ විදිහට ඉන්නවා. චේතාට සනීප නැද්ද?"

සාවිස්ත්‍රි ඇසුවාය.

"අම්මා මම නැති අතරෙ උදයන් චේතාව පැහැරගෙන ගිහින්."

# 44

නිවස අවමංගල නිවසක සිරි ගෙන තිබුණි. නිවස තුළින් සාවිස්ත්‍රි පිය දුක පවසන හඬ ඇසේ. උදිත් සිටියේ බලවත් වරදක් කළ අයෙකු පරිද්දෙනි. මෙහි සිටියා නම් මෙතෙක් කල්වත් ආරක්ෂා වීමට නොහැකි වෙන්ට ඉඩ තිබුණි.

"දැන් ඉතින් අඬලා කරලා වැඩක් නෑ. ආපහු ළමයව හොයා ගන්ට බලමු."

අප්පච්චි සැමෝම අස්වසමින් කීවේය. එය කිසිදාක නොවන වැඩකි. ඔහු චේතාව පැහැරගෙන ගියේ ඉහළින් ආ නියෝගයකිනි. නැවත ඇයට මෙහි ඒමට කිසිම අවස්ථාවක් නැත. උදයන් පැහැදිලිවම ඇය අත්පත් කරගනු ඇත.

"චේතා අපි ගිහින් එන්නම්. වෙච්ච දේ ගැන අපිත් දුක් වෙනවා. දරුවා එයි."

අම්මා කීවාය.

"එයාව ආපහු එවයි කියලා විශ්වාසයක් නෑ."

ඔහු දුක්බර හඬින් කීවේය.

"පුතා අපි එක්ක ගමේ යන්ට එනවද?"

"අප්පච්චි මම මේ වෙලාවෙ එන එක හොඳ මදි. මා නිසානෙ නැති වුණේ.."

"ඔය කිව්වට එවයි. බය නැතිව ඉන්ට."

අම්මා කීවේ තමා සැනසීමට බව උදිත් දනී. ප්‍රශ්න අතරවුව වෛතාලිංගම් දුක්වූයේ පියාට සංග්‍රහ කිරීමට නොහැකිවීම පිළිබඳවය.

"සමාවෙන්න.. අවුරුදු ගානකට පස්සෙ අපිට සන්තෝසෙ තිබුණා. ඒත් අපේ නොලැබීමට එක් නැති වුණා."

"අපි කොහොම හරි දුව නිදහස් කර ගන්ට බලමු. ජීවිතේට කරදරයක් නැතිනම් ප්‍රශ්නයක් නෑ."

අප්පච්චි සැනසීමට උත්සාහ ගන්නා හැටි ඔහු බලා සිටියේය.

අම්මා හා අප්පච්චි බසයට ඇරලූ ඔහු නැවත චේතාගේ නිවසට ගියේය.

සැවෙමා හැඬූ කඳුළෙන් සුවනු දුටු ඔහු චේතාගේ පියා වෙත ගියේය.

"මට සමාවෙන්න අප්පා."

"පුතාගෙ වරදක් නෑ පුතා."

වෛතාලිංගම් උදිත් අස්වැසමින් කීවේය.

"මේ ළමයා අපි නිසා ඕනෑවටත් වඩා කරදර වින්දා."



"චේතා මොනවටද තනියම පාරට ගියේ. එයා දැනගන්ට ඕනෑ තමුන්ගෙ තත්ත්වය."

"මේ හැමදෙයක්ම සිද්ධ වුණේ මෙයාගෙ හිතුවක්කාරකම නිසයි. විසා එක ගන්නකල් හිටියෙ නෑනෙ."

අසුනෙන් නැගී සිටි උදිත් හැටුම් පන්තියේ ලෑලි බංකුවක ඉඳගත්තේය. ඇය හා ගෙවූ අතීතයින් සුන්දර වූ කාලය මතකයට ගලා එයි. පසුපසින් පැමිණ තම දෙනෙත් වසන හැටි, උරේ මුහුණ හොවා ගන්නා හැටි කිසිසේත් අමතක කළ නොහැක. ගැහැනියකගේ සුන්දර අධිකාරි බලය තුළ කෙතරම් සතුටක් තිබුණාද? ඇය තමන්ගේ ලෝකයෙන් වෙන් වී ජීවත් වන බවක් ඔහුට හැඟෙන්නේ නැත. ඇය තම සිතින් බැහැර කිරීමට කිසිවෙකුට පුළුවන්කමක් නැත. තමා ළඟට පැමිණි උමා දෙස ඔහු බලා සිටියේය.

"සර්ගෙ වරදක් නෑ. මේ හැමදෙයක්ම සිද්ධ වුණේ අක්කාගෙ වරදින්."

"අක්කාට දොස් කියන්න එපා."

ඔහු දෑතින් මුහුණ වසා ගත්තේය.

ඇය නොදැනුවත්වම වැරදි කළා විය හැක. එහෙත් ඇය අද නෙළුම්පතක දිය බිඳුවක් මෙන් පවිත්‍රය. කිසිම වරදක් ඇය මත පැවරීමට ඔහුට නොසිතෙයි. මෙතරම් පිරිසිදු, ශක්තිමත් සිතක් ඇති ගැහැනියක් නැතැයි ඔහුට සිතේ. ඇය තරම් තමා විශ්වාස කළ ගැහැනියක් ඇත්නම් ඒ අම්මාය. මෙච්චර විශ්වාසයකින් කිසිම ගැහැනියක් වෙත තිබිය නොහැක. ඉතා කෙටි කාලයක් ඇසුරු කළ පිරිමියෙකුට ගැහැනියක් සතු වටිනාම සම්පත නැග්ගක් විදිහට පිරිනැමීම විශ්වාස කළ නොහැක. කිසිම බියක් නැතිව ආරක්ෂා වීමක් නැතිව සතුටු වීමට ඇය දිවි දුන් හැටි මතකයට ගලා එයි. දෙවියනේ මේ අනුරුදගත් වූයේ වටිනාම සම්පතක්

නොවේද? ඇය අනුරුද්ධන් වීම පිළිබඳව දුක සිතින් ඉවත් වන්නේ නැත. ඔහු අසුනින් නැගී සිටියේ නවාතැනට යාම සඳහාය.

"ඇයි නැගිට්ටේ යන්නද?"

"ඔව්. මට ඉන්ට බෑ. මම ගියා කියලා අප්පට කියන්න."

"අප්පා මෙන් උදින් සර් යන්ට හදනවා."

"යන්ට එපා පුතා. ඔයා ගියොත් අපිට තවත් දුක හිතෙයි."

සාවිත්‍රි කීවාය.

"දූත් කොයි වෙලාවක හරි උදයන් කතා කරයි. ඒ දූණියා හදන්නෙ ඒ දරුවා රිද්දවන්නයි."

"සෑහෙන කාලයක් ඉඳලයි අක්කව අල්ලන්නෙ. දූත් වද දෙනවා ඇති."

උමා දෙනෙතේ පිරි කඳුලින් යුතුව කීවාය.

"දූත් ඉතින් මෙ රෑ යන්න එපා. මේ යක්සයො මේ පුතාගෙනුත් පලි ගනීවි."

චේතාගේ මව කීවාය.

"අපිටත් බයයි. යන්නෙපා."

උමා කීවාය.

"මම බෝඩිමට ගිහින් ලියුම් බලලා එන්නම්."

"එහෙනම් රෑට මොනවා හරි කලා යන්න. දවල්ටත් කැවෙ නැහෙ."

"දූත් උයන්න කරන්න එපා අප්පා. මම ගිහින් කෑම ගේන්නම්."



උදින් කීවේය.

මෙම සිදුවීම නිසා කිසිවෙක් කෑම ගැනීම ගැන උනන්දුවක් නොදැක්වූහ. සාමාන්‍යයෙන් ඔවුන් කන කෑම වර්ග හා ඒවා තිබෙන ආපනශාලාවල් ඔහු දැන සිටියේය. උදින් සයිවර් හෝටලයකට ගොස් රාත්‍රී ආහාර ගෙනාවේය.

"අපි නිසා මේ ළමයටත් කරදරයි."

"උමා එන්න. නිවෙන්න කලින් කෑම කන්න. ගිහින් අප්පට කතා කරන්න."

ඔහු මේසය මත කෑම පාර්සලය තබමින් කීවේය.

දුරකථනය නාද වූ සැණින් උමා එදෙසට දුව ගියාය.

"අම්මා උදයන් කූපට (උදයන් කතා කරනවා.)"

ඇය දෙමළ බසින් කීවාය.

ඇය මඳ වේලාවක් කතා කරමින් සිට චේතාලිංගම්ට දෙන අයුරු උදින් දුටුවේය. චේතාලිංගම් කතා කළේ බැගෑපත් හඬිනි. ඔහු කතා කළේ හැඬුම් මුසුවය.

"චේතා.. චේතා.."

යනුවෙන් ඔහු කීප වරක් කතා කර දුරකථනය තැබුවේය.

"උදයන් කතා කළා. ඌ මට හිතාවෙනවා චේතාව ආපහු දෙන්නෙ නෑ කියලා."

ඔහු හැඬුම්බරව කීවේය.

"අක්කාව ආපහු එවන්නෙ නැහැයි කිව්වා."

උමා උදින්ට කීවේය.

''ඒක ලේසි වෙන්නෙ නෑ.''

උමා කතා කළේ තදබල වේදනාවෙන් යුතුවය.

උදිත් නිහඬව නිවසින් පිටතට බැස්සේය. එහි සිටියොත් තවත් සිත අවුල්වනු ඇත. කෑම කනවා තබා වතුර වීදුරුවක් බීමටවත් සිතක් නැත. රථය ගරාජයට දමා තැපැල් පෙට්ටිය විවෘත කළේ බොහෝමයක් ලිපි තැපැල්පත් එන්නේ රසික රසිකාවියන්ගෙනි. රූපවාහිනී නිවේදකයෙක් වූ පසු දුරකථනයට නිදහසක් නැත. ලිපි අතර තිබූ කුඩා පෙට්ටියක් දුටු එය ගලවා බැලුවේය.

ලිපි වෙනුවට අද බොහෝ දෙනෙක් කැසට්පට එවීම කරති. ඒවා ඇසීමට තරම් සතුටක් සිතේ නැත. චේතාට සිදුවූයේ කුමක්දැයි දැන සිටී නිසා සිතට ඇත්තේ දුඹ් දුකකි. ටෙලිෆෝනය නාද වූ නිසා ඔහු එය අතට ගත්තේ කැමැත්තකින් නොවේ.

''උදිත් මුදියන්සේ බණ්ඩාර ඉන්නවද?''

''යර්ස් ස්පීකින්..''

''අයිසේ මම උදයන් කතා කරන්නෙ..''

''උදයන්.. කෝ චේතා..?''

''චේතා මා ළඟ ඉන්නවා. හැබැයි තමුසෙට ආපහු දකින්ට වෙන්නෙ නෑ.''

''ප්ලීස් උදයන්.. චේතාව ගෙනියන්ට එපා. උදයන් ඉල්ලන ඕනෑම දෙයක් මම දෙන්නම්. චේතා වෙනුවෙන් ඉල්ලන ගානක් දෙන්නම්. චේතා මගේ.''

''අපේ ජාතියේ.. අපේ ආගමේ ගෑනු අයිති අපිටයි. තමුසෙට ආයෙ ජීවිතේට චේතාව දකින්නෙ ලැබෙන්නෙ නෑ. ඔන්න චේතා



තමුසෙට කියන අවසාන වචන ඔය කැසට් එකේ ඇති. අහගන්නවා.''

දුරකථනය විසන්ධි වන හඬ ඇසිණි. උදිත් කැසටය රැගෙන කාමරයට දුව ගියේය. එය ක්‍රියාත්මක වන තෙක් ඔහු ඕනෑකමින් අසා සිටියේය.

මුලින්ම ප්‍රචාරය වුණේ දෙමළ බසින් වූ සංවාදයකි. එය නිමවීමෙන් පසු තරමක නිහඬ බවක් ඇති වුණි. මිහිරි ස්වරයෙන් චේතා තමා අමතන හඬ උදිත්ට ඇසිණි.

''මගේ උදිත්..''

ඇය හැඬුම් මුසුව තමා ඇමතුවේය.

''ඔයාගෙ අවවාද පිළිගත්තෙ නැති හින්දා වෙච්ච දේට අද මම දඬුවම් විඳිනවා. මම ටවුන් එකට ගියේ ගෙදරට කෝල් එකක් ගන්නයි. උන් මාව අල්ලන්න ලොකු දැලක් එලල ඇති බව මම දැනගත්තෙ ඒ දූෂ්‍යයන්ට අහු වුණාට පස්සෙයි.

මා නැති වුණ බව ආරංචි වුණාම ඔයා ඇවිදින් මාව හොයන්ට ඇති. මා හොඳටම දන්නවා ඔයාට මට වඩා සම්පතක් නොතිබුණි බව. මටත් එහෙමයි. මුලදී මා හිතුවෙ මම යුද්ධ කරන සොල්දාදුවෙක් බවයි. මුළු හදින්ම ආදරය කළ හැකි ගැහැනියෙක් මා තුළ ජීවත් වන බව හඳුන්වා දුන්නෙ ඔබයි. මේ ලෝකයේ ඉන්න ගැහැනු අතරින් මම භාග්‍යවන්තියක් බව තේරුම් ගියේ ඔබ හමුවුණාට පසුවයි.

මේ කෙටි කාලය තුළ අප කොතරම් සතුටින් ජීවත් වුණාද? ගැහැනියකට මේ ජීවිතයේදී ලද හැකි ඉහළම සතුට ඔබ නිසා මා ලැබුවා. මා ඔබේ වී, ඔබ මගේ වී ගෙවුණ නිමේෂය කිසිදාක අමතක වෙන්නෙ නෑ. ඒ තත්ත්වය මෙතරම් උතුම් අයුරකින් කිසිම ගැහැනියකට ලබන්න බෑ.

අද මා සිරකාරියකි. මේ ජීවිත කාලය තුළ කිනම් අයුරකින් හෝ අපට හමුවීමට ලැබෙන්නෙ නෑ. මුළු ජීවිතය පුරාවට මා සිරකාරියකව ජීවත් වුවත් කිසිවෙකුට මා පිරිදක් විඳිනට තියා ගන්ට ලැබෙන එකක් නෑ.

රත්තරනේ ඔබට පිරිනැමූ ආදරය, සෙනෙහස කිසිවෙකුට දෙවරක් පරීක්ෂා කරන්නට බෑ. කිසියම් මොහොතක මා මිය යන්නේ ඔබේ පතිනිය වී ඔබේ සුන්දර ආධිපත්‍යය යටතේ ඔබට තුරුල්ව සිටි කුමාරියක පරිද්දෙන් විතරයි.

පිරිමියෙක් වෙනුවෙන් ගැහැනියෙකුට සුන්දර වුත්, නිකලෑල් වුත් අධිකාරි බලයක් පැතිරිය හැකි බව දැනගත්තේ ඔබගෙනි. මීට වඩා කතා කරන්ට දෙන්නෙ නෑ. ඔබේ දෙපා වැඳ සමාව ගන්නම්. වරදක් වූවා නම් මේ ආත්මයේදී ඔබ මගෙන් ගිලිහී යන බව ඇත්ත. මා හැර වෙනත් කෙනෙකුට ඒ භවයේ ඉඩ කියන්නට එපා. ලබන ආත්මේ ඔයා දෙමළෙක් වී මම සිංහල ගැහැනියක්ව ඉපදුනත් අපේ ආදරයට සීමා බන්ධන නෑ. අපි වෙන්වන මේ අවසන් මොහොතේ ඔබේ දෙපා වැඳ සමාව ඉල්ලන්නම්.

මම් ඔබේ දෙමළ කෙල්ල.

චේතා වෛත්‍යලිංගම් මුදියන්සේ..”

කැසට් පටයේ හඬ නේම් වී යත්ම කුටිය පුරා පැතිර ඇත්තේ කැසට් පටයෙන් මිදී ආ චේතාගේ හඬය. ක්ෂුද්‍ර දේශපාලන පටු පරමාර්ථ වෙනුවෙන් අහිංසක ජීවිත බිල්ලට දීම කෙතරම් වැරදිද? ඇගේ රූපකාය පැහැරගෙන ගියත් පිදූ සිත ගැනීමට නොහැක. ඇය නැති ජීවිතයෙන් පලක් නොවේ.

චේතා සොයා උතුරේ බලධාරීන් වෙත යාමට උදිත් සිතා ගත්තේය.

දෙවන කොටසින් හමුවෙමු...

kathapothak.blogspot.com